# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

නව සහශ්‍රයේ දී සිදු කළ පළමු විෂය මාලා සංශෝධනය වන මෙය පාසල් පද්ධතිය තුළ දැනට පවතින ගැටලු කිහිපයක් නිරාකරණය කර ගැනීමේ ප්‍රවේශයක් ලෙස සැලකිය හැකිය. මෙම විෂය මාලාව සැලසුම් කොට ඇත්තේ තරුණ පරපුර අද මුහුණ පා සිටින සිතීමේ, සමාජීය හා පුද්ගල දුර්වලතා මග හරවා ගැනීමේ අභිලාෂයෙනි.

ආසියාවේ අධ්‍යාපන ක්‍රමය සලකා බැලීමේ දී මෙයට වසර කිහිපයකට පෙර ශ්‍රී ලංකාව අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ බොහෝ ඉදිරියෙන් සිටියේ ය. නමුදු වර්තමානයේ දී ආසියාවේ අනෙකුත් රටවල් ශ්‍රී ලංකාව අභිබවා ඉදිරියෙන් සිටියි. තම දැක්මකින් තොරව පවතින දෙය මත පමණක් තීරණ ගනිමින් ඒ දේ පමණක් ම නැවත නැවත ඉදිරිපත් කිරීම මෙම පසුබෑමට එක් හේතුවකි.

මෙම තත්ත්වය මඟ හරවා ගැනීම පිණිස ජාතික අධ්‍යාපන ආයතනයේ නිලධාරීන් පැහැදිලි දැක්මකින් යුතු විෂය මාලාව සංශෝධනය කිරීමට වෙර දරා ඇත. නව විෂය මාලාවේ අරමුණු සකසා ඇත්තේ ශිෂ්‍ය පරපුර විසින් දැනට ම දන්නා දේත්, නව අදහස් හා ගවේෂණ මගින් අනාගතය ගොඩ නගා ගැනීම පිණිස ශිෂ්‍යයන්ගේ නිපුණතා වර්ධනය කර ගැනීමට හැකි වන ආකාරයෙනි. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස ගුරුවරයාගේ කාර්ය භාරයෙහි පරිපූර්ණ වෙනසක් අත්‍යවශ්‍ය වෙයි. දැනට පවතින ගුරු කේන්ද්‍රීය ක්‍රමය වෙනුවට ශිෂ්‍ය කේන්ද්‍රීය, නිපුණතා පාදක, ක්‍රියාකාරකම් මූලික ක්‍රමයක් මෙම නව අධ්‍යාපන ක්‍රමයෙන් අපේක්ෂා කෙරෙන අතර ගුරුවරුන් අභියෝගවලට මුහුණ දීමට සූදානම් විය යුතු වේ.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය ගුරුවරුන්ට එවැනි ක්‍රමයක් සකසා ගැනීමට මහත්සේ උපකාරී වනු ඇතැයි යනු පූර්ණ විශ්වාසයයි. මාර්ගෝපදේශ සංග්‍රහයෙහි දී ඇති මග පෙන්වීම පිළිපැදීම මඟින් ඔබට සාර්ථක ගුරු භවතකු වීමට හැකියාව ලැබෙනු ඇත. එය ඔබට ඉගැන්වීමේ දී මෙන් ම ශිෂ්‍යයන් ඇගයීමේ දී උපකාරී වනු ඇත. ගවේෂණය හා ගුණාත්මක යෙදුම් සම්බන්ධයෙන් දී ඇති මාර්ගෝපදේශන ශිෂ්‍යයාට උපකාරී වන ආකාරයෙන් ඉදිරිපත් කොට ඇත. එලෙස ම එය විදුහල්පතිවරුන්ට කාල සටහන් පිළියෙල කිරීමේ දීත්, සීමිත සම්පත් වෙන් කර දීමේදීත් අභ්‍යන්තර අධීක්ෂණයේ දීත් මහත් සේ උපකාරී වනු නොඅනුමාන ය.

මෙම මාර්ගෝපදේශ සංග්‍රහයෙහි ඉදිරිපත් කොට ඇති දෙයට පමණක් සීමා නොවී ගුරුවරුන් නිර්මාණශීලී බව ප්‍රදර්ශනය කරමින් තමන් විසින් ම සුදුසු ක්‍රියාකාරකම් සකසා ගැනීම කළ යුතු ය. මක්නිසා ද යත්, මෙම මාර්ගෝපදේශ සංග්‍රහයෙහි සඳහන් ක්‍රියාකාරකම් අනුරූප හෝ ආදර්ශ වන නිසාත්, ප්‍රාදේශීයව ඇති වෙනස්කම් එම ප්‍රදේශයේ ගුරුවරුන් වඩා හොඳින් දන්නා නිසාත් ඔවුනට ඒ අනුව ක්‍රියාකාරකම් සකස් කර ගත හැකිවනු ඇත.

අධ්‍යාපනඥයින්ට, ගුරු උපදේශකවරුන්ට හා බාහිර අධීක්ෂණය හා නියාමනයෙහි යෙදෙන සියලු නිලධාරීන්ට උපකාරී වන මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය පිළියෙල කිරීමට සහභාගී වූ සියලු දෙනාට ම මගේ කෘතඥතාව පිළිගන්වමි.

මහාචාර්ය ජේ.ඩබ්ලිව්. වික්‍රමසිංහ
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

# හැඳින්වීම

ශ්‍රී ලංකාවේ විෂය මාලා ප්‍රතිපත්තියට අනුව අවුරුදු අටකට වරක් පාසල් විෂය නිර්දේශ යාවත්කාලීන විය යුතු ය. මේ අනුව 2007 වර්ෂයේ සිට ආරම්භ කෙරෙන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වැඩ සටහන යටතේ විෂය නිර්දේශය සහ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය හඳුන්වනු දෙනු ලැබේ.

මෙතෙක් පැවති විෂය නිර්දේශවල යම් විෂයකට අදාළ විෂය මාතෘකා රාශියක් ද ඒ ඒ විෂය මාතෘකාවට අදාළ විෂය කරුණු ද දක්නට ලැබුණි. මෙම විෂය කරුණු ඉගැන්වීම ගුරුවරයා ගෙන් සිදු විය. මෙම ක්‍රියාවලිය නිසා බොහෝ විෂය කරුණු දන්නා සිසු පිරිසක් බිහිවූහ.

නව විෂයමාලා ප්‍රතිසංස්කරණ යටතේ හඳුන්වා දෙන විෂය නිර්දේශවල ඒ විෂය යටතේ සිසුන් අත්පත් කර ගත යුතු නිපුණතා හඳුනා ගෙන නිර්දේශ කර ඇත. මෙම නව ප්‍රවේශය තුළින් බොහෝ විෂය කරුණු දන්නා බැවින් ඔබ්බට ගිය ප්‍රායෝගික අංශයට වඩාත් නැඹුරු නිපුණතා පිරි සිසු පිරිසක් බිහිවීම අපේක්ෂා කෙරේ. එබැවින් නව විෂය නිර්දේශය භාවිත කරන ගුරු මහත්ම මහත්මීන් මෙම වෙනස පිළිබඳ විශේෂයෙන් සැලකිලිමත් විය යුතු ය.

ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙහි ක්‍රියාකාරකම් සන්තතිය නම් කොටසේ දී හමුවන නව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සහිත පන්ති කාමරයක් යෝජනා කර ඇත. මෙම ක්‍රියාවලිය යටතේ සිසුන් පුස්තකාල භාවිතය හා පොත්පත් කියවීම, පරිසරය නිරීක්ෂණය සම්පත් පුද්ගලයන්ගෙන් කරුණු රැස්කර ගැනීම, තම මතුරු මිතුරියන්ගෙන් බොහෝ දේ ඉගෙනීම සහ තම යහළු යෙහෙලියන්ට තමා දන්නා දේ කියා දීම, හැකි අවස්ථාවන්හිදී අන්තර්ජාලයෙන් තොරතුරු රැස් කර ගැනීම ආදී ගවේෂණාත්මක ව ඉගෙන ගන්නා සංස්කෘතියක් දැකිය හැකි විය යුතු ය. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවෙන් ලබා දී ඇති පෙළ පොත ද සම්පත් පොතක් ලෙස භාවිතා කළ යුතු ය. මෙසේ සොයා ගන්නා කරුණ වඩාත් නිවැරදිව සංවිධානාත්මක ව හා අංග සම්පූර්ණ ව සිසුන්ට ග්‍රහණය කරවීම ගුරුවරයාගෙන් අපේක්ෂා කෙරේ. එබැවින් ගුරුවරයාගේ භූමිකාව ද නව දැනුමෙන් පොහොසත් වූවකු විය යුතු ය. එය සිසුන් සොයා ගන්නා සියළු කරුණු අභිබවා යන බහුශ්‍රැත භාවයෙන් ප්‍රදර්ශනය කරයි. මෙම ක්‍රියාකාරී ඉගෙනුම් පරිසරය, සිසුන්ට බෙහෙවින් ආකර්ශනය වනු ඇත.

මේ සඳහා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ යෝජනා කර ඇති පාඩම් තවත් බොහෝ පාඩම් සකස් කර ගැනීමට මග පෙන්වීමක් බව සිතන්න. මේවා ඇසුරෙන් නිර්මාණශීලී ගුරුවරයකු ලෙස නව පාඩම් සකස් කර ගැනීම විශේෂයෙන් අපේක්ෂා කෙරේ.

නව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී හැම විට ම සිසුන් ක්‍රියාකාරී ය, එබැවින් ඔවුන්ගේ දක්ෂතා හා ප්‍රබලතා ප්‍රදර්ශනය වෙයි. ඒවා අගය කරන්න. දිරිමත් කරන්න. තව ද ඇතැම් විට සිසුන් මුහුණ දෙන දුෂ්කරතා ද ඔබට දක්නට ලැබේ. ඒ හැමවිට ම එම දුෂ්කරතා ඉවත් කර ගැනීමට උදව් කරන්න. ආසන්න මිතුරු මිතුරියන්ට උදවු කිරීමට යොමු කරන්න. මෙසේ පාඩමත් සමඟ කෙරෙන තක්සේරු ක්‍රියාවලිය වඩාත් ඵලදායි ඉගෙනුමකට හේතු වේ.

තව ද මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ යෝජනා කර ඇති ඉගෙනුම් දීර්ඝ කිරීමේ පැවරුම් හා අභ්‍යාස දරුවා උගත් දේ තව දුරටත් ශක්තිමත් කිරීමට සමත් වන ආකාරය ගැන අවධානය යොමු කරන්න. එම සිසුන් මෙසේ ඇගයීම් කළ හැකි හොඳ අවස්ථාවක් ලෙසට සලකන්න. මෙබඳු තවත් ඉගෙනුම් දීර්ඝ කිරීමේ බොහෝ අභ්‍යාසවල සිසුන් යොමු කිරීමට සැලකිලිමත්වන්න.


විමල් සියඹලාගොඩ
සහකාර අධ්‍යක්ෂ ජනරාල්
(භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය)
ජාතික අධ්‍යාපන ආයතනය

# ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය

## 1 කොටස - ජීවන නිපුණතා

ලේඛක මණ්ඩලය

උපදේශනය : මහාචාර්ය ජේ.ඩබ්ලිව්. වික්‍රමසිංහ මයා ( අධ්‍යක්ෂ ජනරාල්, ජා.අ.ආ)
විමල් සියඹලාගොඩ මයා (සහකාර අධ්‍යක්ෂ ජනරාල්, ජා.අ.ආ)

අධ්‍යක්ෂණය : ආචාර්ය යූ නවරත්නම් මයා
(අධ්‍යක්ෂ, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, ජා.අ.ආ)

සම්බන්ධීකරණය : එම්.කේ. කිංස්ලි ප්‍රියන්ත මයා (ව්‍යාපෘති නායක )
ඒ.එල්.එස්. අබේවික්‍රම මයා ( ව්‍යාපෘති නායක )

ලේඛක මණ්ඩලය

අභ්‍යන්තර : ආචාර්ය එච්.ඒ.ඩී.ඒ. ලලිතා බටුවිටගේ මිය - අධ්‍යක්ෂ, ජා.අ.ආ.
එම්.කේ.කිංස්ලි ප්‍රියන්ත මයා - ව්‍යාපෘති නිලධාරී, ජා.අ.ආ
බන්දුල.පී. දයාරත්න මයා - ප්‍රධාන ව්‍යාපෘති නිලධාරී, ජා.අ.ආ.
ඒ.කේ. විතානගේ මෙනවිය - ප්‍රධාන ව්‍යාපෘති නිලධාරී, ජා.අ.ආ.
මංගලිකා වීරසිංහ මෙනවිය - ප්‍රධාන ව්‍යාපෘති නිලධාරී, ජා.අ.ආ
එම්.පී.රංජනී ධනවර්ධන මිය - ප්‍රධාන ව්‍යාපෘති නිලධාරී, ජා.අ.ආ.
ඒ.එල්.එස්. අබේවික්‍රම මයා - ව්‍යාපෘති නිලධාරී, ජා.අ.ආ.
ඩී.එච්.චන්දිමා නිෂානි ධර්මපාල මිය - ව්‍යාපෘති නිලධාරී, ජා.අ.ආ.
එස් කරුණාකරන් මයා - සහකාර ව්‍යාපෘති නිලධාරී, ජා.අ.ආ
පී. එච්.එස්.පී. ඩයස් මයා - සහකාර ව්‍යාපෘති නිලධාරී, ජා.අ.ආ.

බාහිර : අයිරාංගනී රණසූරිය මිය - උප පීඨාධිපති, ඌව ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය
ඒ.ඒ. කල්‍යාණවතී මිය - ගුරු උපදේශක, පිලියන්දල කලාපය
ඩබ්.ඒ.කේ. සුදර්ශනී මිය - ගුරු උපදේශක, හෝමාගම කලාපය
යූ.ඒ. භද්‍රා ගුණතිලක මිය - ගුරු උපදේශක, කැළණිය කලාපය
ජේ.එම්.එම්. ජයසුන්දර මයා - ගුරු උපදේශක, නිකවැරටිය කලාපය
එම්.ඒ.ඒ.පී. මල්ලවආරච්චි මයා - ගුරු උපදේශක, නිකවැරටිය කලාපය
ජේ. එම්.සුමනචන්ද්‍රලතා මිය - ගුරු උපදේශක , කැළණිය කලාපය

චිත්‍ර හා පිටකවර නිර්මාණය : රවීන්ද්‍ර තේනුවර - සහකාර ව්‍යාපෘති නිලධාරී, ජා.අ.ආ.

විවිධ සහාය : ඒ.එල්.එස්.පී. අතපත්තු මිය
ශිරානි සමරක්කොඩි මිය
දිල්හානි පෙරේරා මිය
ආර්.එම්. රූපසිංහ මයා

# II කොටස - පූර්වළැසි අධ්‍යාපනය

උපදේශනය : මහාචාර්ය ජේ.ඩබ්ලිව්. වික්‍රමසිංහ මයා ( අධ්‍යක්ෂ ජනරාල්, ජා.අ.ආ)
විමල් සියඹලාගොඩ මයා (සහකාර අධ්‍යක්ෂ ජනරාල්, ජා.අ.ආ)

අධ්‍යක්ෂණය : ආචාර්ය යූ නවරත්නම් මයා
(අධ්‍යක්ෂ, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, ජා.අ.ආ)

සම්බන්ධීකරණය : ඒ.එල්.එස්. අබේවික්‍රම මයා , ආචාර්ය
( ව්‍යාපෘති නිලධාරී, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව)

ලේඛක මණ්ඩලය

අභ්‍යන්තර

බී.එල්.ආර්.රෝහණ කුමාර මයා - ප්‍රධාන ව්‍යාපෘති නිලධාරී, ජා.අ.ආ
ඒ.එල්.එස්.අබේවික්‍රම මයා - ව්‍යාපෘති නිලධාරී, ජා.අ.ආ.
එම්.කේ.කිංස්ලි ප්‍රියන්ත මයා - ව්‍යාපෘති නිලධාරී, ජා.අ.ආ.
එස්. කරුණාකරන් මයා - සහකාර ව්‍යාපෘති නිලධාරී, ජා.අ.ආ
එම්.එච්.එම්. හසන් මයා - ප්‍රධාන ව්‍යාපෘති නිලධාරී, ජා.අ.ආ.

බාහිර

සී.එස් ජයසිංහ මයා - ගුරු මධ්‍යස්ථාන කළමනාකරු, හොරණ කලාපය
පී.පී. මාලිකා මිය - ගුරු උපදේශිකා, හම්බන්තොට කලාපය
ඩබ්.එම්.ඩී. බී. සපුවිද මයා - උපගුරු, ශාන්ත තෝමස් ජාතික පාසල, මාතලේ
ඒ.එම්.පී. අබේසිංහ මිය - උපගුරු, තෙල්දෙණිය ජාතික පාසල, තෙල්දෙණිය
එස්.පී. ගනේගොඩ මිය - උපගුරු, ගා/සවුත්ලන්ඩ් බා. විද්‍යාලය, ගාල්ල
එස්.එම්.පී.කේ.සමරසිංහ මිය - උපගුරු, වත්තේගම බා.ම.වි., මහනුවර
ඩබ්.එම්.ඩබ්. බණ්ඩාර මයා - උපගුරු, /බදුල්ල ම.ම.වි., (ජාතික පාසල) බදුල්ල
එස්.පී. පේමවතී මිය - උපගුරු, පිටබැද්දර ම.වි., පිටබැද්දර
එම්.එම්.පී.සී. රත්නායක මිය - උපගුරු, උසස් බාලිකා විද්‍යාලය, මහනුවර

# පටුන


- විෂය නිර්දේශය 1 - 17
  - හැඳින්වීම
  - විෂයයේ අරමුණු
  - සවිස්තර විෂය නිර්දේශය
  - පාසල් ප්‍රතිපත්ති හා වැඩ සටහන්

- ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය 18- 198
  - හැඳින්වීම
  - ආදර්ශ ක්‍රියාකාරකම්

- තක්සේරුව හා ඇගයීම 199-204

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය
දීර්ඝ කිරීමේ උපකරණ 205 - 212


Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

# 1.0 හැඳින්වීම

ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය 7 වන ශ්‍රේණිය සඳහා 2008 වර්ෂයේ දී ක්‍රියාත්මක වීමට යෝජිත ය. නව විෂය නිර්දේශය ප්‍රධාන කොටස් දෙකකින් යුක්ත ය. එහි පළමු කොටස ජීවන නිපුණතා විෂය නිර්දේශය වේ. එම කොටස ප්‍රධාන නිපුණතා පහක් පදනම් කර ගෙන සකස් වී ඇත. ආත්මාවබෝධයෙන් කටයුතු කිරීම, පෞරුෂ වර්ධනය උදෙසා විවේකය උපයෝගී කර ගැනීම, සාර ධර්ම ගරු කරමින් ආදර්ශවත් ව කටයුතු කිරීම, ජීවිත අවස්ථා සංසිද්ධි අනාවරණයට මෙන් ම ඵලදායි ඉගෙනුමක් සඳහා දත්ත හා තොරතුරු යොදා ගැනීම, යහපත් අන්තර් පුද්ගල සබඳතා පැවැත්වීම යන ක්ෂේත්‍රවලට අදාළ ව නිපුණතා සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කර ඇත.

විෂය නිර්දේශයේ දෙවන කොටස යොමු වී ඇත්තේ පුරවැසි අධ්‍යාපනය සඳහා වේ. පවුලේ සාමාජිකයින් අතර යහ පැවැත්ම සඳහා අන්තර් සබඳතා තුළින් ඔවුන්ගේ අයිතිවාසිකම්, යුතුකම් හා වගකීම් අවබෝධ කර ගෙන ජීවත්වීමට හුරුවීම. ජන සමාජය තුළ පවත්නා අන්තර් සම්බන්ධතා හඳුනා ගැනීම, පුරවැසි යුතුකම් හා වගකීම් ඉටු කිරීම, අන් අයට බාධාවක් නොවන අයුරින් අයිතිවාසිකම් භුක්ති විඳීම, සංස්කෘතික දායාද අගය කිරීම, අන්‍ය සංස්කෘතියට ගරු කිරීම, සංස්කෘතික උරුම අභිමානයෙන් යුතු ව ආරක්ෂා කිරීම, ස්වකීය සංස්කෘතික අනන්‍යතාවන් ආරක්ෂා කරමින් ජාතික සමඟිය ගොඩ නැගීම කෙරෙහි අවධානය යොමු කර ඇත. මෙම විෂය නිර්දේශය හැදෑරීම මගින් අප අපේක්ෂා කරන්නේ අනාගත දරු පරපුර මානව ගුණධර්මවලින් හා නිපුණතාවලින් පිරිපුන් සමාජයට වැඩදායක යහපත් පුරවැසියන් පිරිසක් බිහි කිරීම වේ.

එකී අවශ්‍යතා ඉටුකර ගැනීමට උචිත අයුරින් මෙම ගුරුමාර්ගෝපදේශ සංග්‍රහයේ ක්‍රියාකාරකම් නිර්මාණය කර ඇත. ඒවා ආදර්ශ ක්‍රියාකාරකම් වන අතර ඒ අනුසාරයෙන් ඔබට නව ඉගෙනුම් අත්දැකීම් ඔස්සේ ක්‍රියාකාරකම් සංවිධානය කරගත හැකිය.

ඔබ සංවිධානය කරනු ලබන නව ක්‍රියාකාරකම් ඇතුලත, පාඩමට සම්බන්ධකර ගැනීමේ අවස්ථා, ගවේෂණ අවස්ථා, ඉදිරිපත් කිරීමේ අවස්ථා, විස්තාරණ අවස්ථා,  සහ ඇගයීම් අවස්ථා ඇතුලත් විය යුතුය.

මෙහි සඳහන් ඉගෙනුම් දීර්ඝකිරීමේ උපකරණ වාර තුන සඳහා යොදාගන්න. එම එක් එක් උපකරණ සකසා ඇත්තේ නිපුණතා කිහිපයක් ආවරණය වන පරිදිය.ඒ අනුව නිර්ණායක ඔස්සේ සිසුන් ඇගයීමට ලක්කර හැකිවේ.

මෙම ගුරුමාර්ගෝපදේශ සංග්‍රහයේ ඇති ක්‍රියාකාරකම් පිළිබඳ සංවර්ධනාත්මක යෝජනා ඇත්නම් අප වෙත දැනුම් දෙන්න.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

2.0 විෂය අරමුණු ( 1 කොටස )

- තම හැකියා, දක්ෂතා, විභවතා හඳුනා ගනිමින් අනාගත ජීවන ඉලක්ක ගොඩ නගා ගැනීම.
- එදිනෙදා කටයුතු මනා සැලසුමකින් හා සංවිධානාත්මක බවකින් ඉටු කිරීමට යොමුවීම.
- චිත්තවේගී තත්ත්වයන්ට සාර්ථකව මුහුණ දෙමින් ආතතිය අව ම කර ගැනීම.
- පෞරුෂ සංවර්ධනය සඳහා ක්‍රීඩාව, විනෝදාංශ හා සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්වල නිරත වී විවේකය ඵලදායීව ගත කිරීම.
- යහපත් අන්තර් පුද්ගල සබඳතා පවත්වමින් සහානුභූතියෙන් යුතුව කටයුතු කිරීම.
- ඵලදායි සන්නිවේදන කුසලතා දියුණු කිරීම.
- එදිනෙදා කටයුතු අවස්ථා වලදී ධනාත්මක ආකල්පවලින් යුක්තව කටයුතු කිරීම.
- විචාරශීලී චින්තනයෙන් හා නිර්මාණශීලී චින්තනයෙන් යුක්තව කටයුතු කිරීම.
- නායකත්ව ගුණාංග ප්‍රගුණ කරමින් නායකත්වයට ගරු කිරීම.
- ඵලදායී තීරණ ගැනීම මගින් ගැටලු විසඳීම.
- අපදා කළමනාකරණයට සක්‍රියව දායක වෙමින් අපදා අවස්ථාවලින් වැළකීම හා අව ම කර ගැනීම
- පුද්ගල මෙන්ම සමාජීය ගැටුම් අවම කර ගනිමින් කටයුතු කිරීම.

විෂය අරමුණු ( II කොටස )

- බහුවිධ සමාජයක් තුළ එක්සත් බවින් යුක්තව ජීවත් වීමට අවශ්‍ය නිපුණතා වර්ධනය කිරීම.
- මානව ගුණාංග හා සමාජ සාරධර්ම රැක ගැනීම සඳහා යෝග්‍ය පුරවැසියන් බිහි කිරීම.
- විනය ගරුක හා නීතිගරුක පුරවැසියකු සමාජයට දායාද කිරීම සඳහා යෝග්‍ය නිපුණතා වර්ධනය කිරීම.
- පුද්ගල හා සමාජයීය ක්‍රියාකාරකම්වල දී අනෝන්‍ය සහයෝගයෙන් යුක්තව කටයුතු කිරීම.
- ශ්‍රී ලංකාව හා ලෝකයේ පාලන රටා පිළිබඳව අවබෝධය ලබා දීම.
- ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්මවලට හා මානව අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තීන්ට අනුගත ව කටයුතු කරන සමාජයක් ගොඩ නැගීම.
- නිරන්තරුව වෙනස් වන ලෝකයේ අනපේක්ෂිත හා ව්‍යාකූල අවස්ථාවන්ට සාර්ථකව මුහුණදීමට අවශ්‍ය ශක්තීන් වර්ධනය කිරීම.
- අනෝන්‍ය වශයෙන් වගකීම් හා යුතුකම් අගයන සමාජයක් ගොඩ නැගීම.
- සමාජයේ යහ පැවැත්ම සඳහා සමාජ සංස්ථා හා සංවිධාන යොදා ගැනීමට යොමු කිරීම.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 3. විෂය නිර්දේශය

### 7 වන ශ්‍රේණිය ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය ( I කොටස )

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| 7.1 ආත්මාවබෝධයෙන් කටයුතු කරයි. | 7.1.1 අනන්‍යතාවය තහවුරු කර ගනිමින් ආත්මාභිමානය සංවර්ධනය කර ගනියි. | • තමා පිළිබඳ අභිමානයක් ඇති කර ගැනීමේ වැදගත්කම<br>• තම අනන්‍යතාවය හා ගරුත්වය තමා වෙත ම රැඳී තිබීම.<br>• නිරතුරුව ම ආත්මාභිමානය හා අනන්‍යතාවය සුරැකීම. | 06 |
| | 7.1.2 ජීවිත සාර්ථකත්වයට හිතකර බලවේග අදාළ පරිදි උපයෝගී කර ගනියි. | • සමාජයක පවත්නා හිතකර, අහිතකර බලවේග<br>• විෂම බලවේග නිසා සමාජය තුළ දක්නට ලැබෙන අයහපත් ප්‍රතිඵල විමර්ශනය<br>• හිතකර බලවේග ජීවිතයට ලංකර ගැනීම හා අහිතකර බලවේගවලින් ඈත්වීම. | |
| | 7.1.3 නිවැරදි ජීවන අරමුණක් කරා තම ජීවිතය මෙහෙයවයි. | • සාර්ථක දිවි පෙවෙතකට අරමුණක් තිබීමේ වැදගත්කම<br>• එම අරමුණ කරා යොමුවන පරිදි තම ක්‍රියා පටිපාටි ප්‍රමුඛතා අනුව මෙහෙය වීම.<br>• ආකර්ෂණීය විවිධ දෑ හඳුනා ගැනීම හා තමන්ට උචිත දේ කෙරෙහි පමණක් යොමු වීම. | |

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| 7.2 පෞරුෂ සංවර්ධනය උදෙසා විවේකය උපයෝගී කර ගනියි. | 7.2.1 ක්‍රීඩා හෝ විනෝදාංශ වැනි කාර්යයන් හි යෙදෙයි. | • කාර්යයක විවිධ ලක්ෂණ හඳුනා ගනියි.<br>- ඔබ කරනුයේ කුමක් ද?<br>- එය කරනුයේ කෙසේද?<br>- ඔබ එය කරනුයේ ඇයි ?<br>• විවේක අවස්ථාවල දී සංයමයෙන් යුක්ත ව නිර්මාණකරණයෙහි යෙදීම.<br>• විවේකය ඵලදායි ලෙස ගත කිරීම. | 06 |
| | 7.2.2 සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් ඇසුරින් පෞරුෂ සමබරතාවක් ඇති කර ගනියි. | • සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්වල පවත්නා අගය<br>- විනෝදය<br>- වින්දනය<br>- චිත්තවේග ප්‍රකාශනය<br>- ජීවිතාබෝධය | |

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| 7.3 සාරධර්ම ගරු කරමින් ආදර්ශවත් ව කටයුතු කරයි. | 7.3.1 සාර්ථක දිවි පෙවෙතක් සඳහා සාරධර්ම උපයෝගී කර ගනියි. | • සමාජ යහපැවැත්ම සඳහා සාරධර්මවල අවශ්‍යතාව<br>• අප විසින් සුරැකිය යුතු හා ගරු කළ යුතු සාරධර්ම.<br>• පුද්ගල සංවර්ධනය සඳහා සාරධර්ම උපයෝගී කර ගැනීම. | 06 |
| 7.4 ජීවිත අවස්ථා හා සංසිද්ධි අනාවරණයට මෙන් ම ඵලදායී ඉගෙනුම සඳහා ද දත්ත හා තොරතුරු යොදා ගනියි. | 7.4.1 විවිධ මූලාශ්‍රවලින් ලැබෙන දත්ත හා තොරතුරු විචාරශීලී ව භාවිත කරයි. | • ජීවිත අවස්ථා හා වෙනත් අවශ්‍යතා සඳහා දත්ත හා තොරතුරුවල වැදගත්කම හා වලංගුතාව<br>• දත්ත හා තොරතුරු රැස් කිරීමේ විවිධ ක්‍රමෝපායන්<br>• දත්ත හා තොරතුරු සංවිධානය හා ඉදිරිපත් කිරීම | 06 |
| | 7.4.2 ජීවිත අභියෝග හා අවස්ථා හමුවේ නිර්මාණශීලී චින්තන-යෙන් යුතු ව කටයුතු කරයි. | • දකින ඇසෙන දෑ දෙස විවිධ කෝණවලින් බැලීමට හුරුවීම.<br>• යම් යම් සිද්ධි හා කරුණු අතර පවත්නා සබඳතා හඳුනාගෙන ඒවාට නව අර්ථකථන ඉදිරිපත් කිරීම<br>• ජීවිත අවස්ථා හා අභියෝග හමුවේ උපායශීලීව හා විචාරශීලීව කටයුතු කිරීම. | |

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| 7.5 යහපත් අන්තර් පුද්ගල සබඳතා පවත්වයි. | 7.5.1 සාර්ථක ජීවිතයක් සඳහා යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතා උපයෝගී කර ගනියි. | • තනිව ජීවත් වීමේ දී පුද්ගලයෙකු මුහුණපාන අපහසුතා<br>• බොහෝ දෙනෙකුගේ දායකත්වයෙන් සිදුවන පුද්ගල සංවර්ධනය<br>• ජීවන ගමන පහසු කරවන යහපත් අන්තර් පුද්ගල සබඳතා<br>• යහපත් අන්තර් පුද්ගල සබඳතා පැවැත්වීමේ විධි ක්‍රම | 06 |
| | 7.5.2 ගැටුම් වැළැක්වීම හා නිරාකරණයට යහපත් අන්තර් පුද්ගල සම්බඳතා උපයෝගී කර ගනියි. | • ගැටුම් ඇතිවීමට හේතු<br>• යහපත් අන්තර් පුද්ගල සබඳතා මගින් ගැටුම් අවම කර ගැනීමේ ක්‍රම ශිල්ප | |

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.


| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| 7.1 යුතුකම් හා වගකීම් ඉටු කිරීම තුළින් පවුලේ සාමාජිකයන් අතර යහපත් අන්තර් සබඳතා ගොඩ නගා ගනියි | 7.1.1 සමාජයක කුඩාම සහ වැදගත්ම ඒකකය ලෙස පවුල හඳුනාගෙන යහපත් සාමාජිකයකු ලෙස ස්ථාවර පවුල් ඒකක ගොඩ නගා ගැනීමට පෙළඹේ. | පවුල<br>පවුල් වර්ග<br>• න්‍යෂ්ටික පවුල<br>• විස්තෘත පවුල | 10 |
| | 7.1.2 පවුල හා අසල්වාසීන් අතර අන්‍යෝන්‍ය සබඳතා තහවුරු කර ගෙන සහජීවනයෙන් ජීවත් වීමට හුරු වේ. | පවුලේ සාමාජිකයන් සහ ඥාතීත්වය<br>• තම සමීප ඥාතීන් හැඳින්වීම සඳහා භාවිත කරන ඇමතුම්<br>• විවිධ ප්‍රදේශවල ඥාතීත්වය සඳහා භාවිත කරන ඇමතුම් වෙනස් වන බව<br>• පවුල තුළ ක්‍රියාත්මක වන සිරිත් විරිත් සම්ප්‍රදායන් ඇගයීම් පද්ධතිය<br>  • සිරිත් විරිත්<br>  • සම්ප්‍රදායන් | |

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 7.1.3 පවුලේ සාමාජිකයකු ලෙස තම අයිතිවාසිකම් භුක්ති විඳිමින් යුතුකම් ඉටු කරමින් විනය ගරුකව ජීවත් වීමට අවශ්‍ය මානව ගුණධර්ම වර්ධනය කර ගනියි. | • පවුලේ සාමාජිකයන්ගේ අයිතිවාසිකම්, යුතුකම්, හා වගකීම්<br>• තම පවුල හා අසල් වාසීන් අතර පවත්නා සබඳතා<br>• පවුල තුළින් බිහිවන යහපත් පුරවැසියකු සතු විය යුතු ගුණාංග | |

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| 7.2 ජන සමාජයේ සාමාජික -යකු වශයෙන් තම අයිතිවාසිකම් හඳුනාගෙන යුතුකම් හා වගකීම් ඉටු කිරීමට පෙළඹෙයි. | 7.2.1 ජන සමාජය තුළ පවත්නා අන්තර් සබඳතා විමර්ශනය කරයි. | අපේ ජන සමාජය<br>• සමාජය හැඳින්වීම<br>• ජන සමාජය තුළ පවතින අන්තර් සබඳතා | 10 |
| | 7.1.2 අයිතිවාසිකම් හා යුතුකම් හා වගකීම් ඉටු කරයි. | • සමාජයක පවත්නා හිතකර, අහිතකර බලවේග<br>• යුතුකම් හා වගකීම් ක්‍රියාත්මක කරන ආකාරය | |
| | 7.1.3 ජන සමාජයේ සාමාජිකයකු වශයෙන් නීතිමය රාමුව තුළ තම අයිතිවාසිකම් භුක්ති විඳීමට හුරුවෙයි. | • නීතිමය ආමුවක් තුළ අයිතිවාසිකම් භුක්ති විඳීම මූලික අයිතිවාසිකම් හා යුතුකම් ආශ්‍රයෙන්<br>• පවුල තුළින් බිහිවන යහපත් පුරවැසියකු සතුවිය යුතු ගුණාංග | |

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| 7.3 වර්තමාන බහුවිධ සමාජය තුළ ස්වකීය සංස්කෘතික උරුමයන් ආරක්ෂාකර ගනිමින් අන්‍ය සංස්කෘතීන් ද අගය කරමින් ජාතික සමගිය ගොඩ නැගීමට දායක වෙමින් අභිමානයෙන් යුතුව ජීවත්වෙයි. | 7.3.1 තම සංස්කෘතික දායාද අගය කරමින් අන්‍ය සංස්කෘතීන් ද අගය කිරීමට අවශ්‍ය කුසලතා වර්ධනය කර ගනියි.<br><br>7.3.2 ස්වකීය සංස්කෘතික අනන්‍යතාවයන් ආරක්ෂා කොට ගනිමින් ජාතික සමඟිය ගොඩ නැගීමට ප්‍රමුඛතාව දී කටයුතු කරයි. | අපේ සංස්කෘතිය<br>• සංස්කෘතිය නිර්වචනය කිරීම<br>• විවිධ සංස්කෘතීන්ට අයත් විශේෂ ලක්ෂණ<br>• සෑම සංස්කෘතියකම දක්නට ලැබෙන පොදු ලක්ෂණ<br><br>• ජාතික අනන්‍යතාව හා ජාතික සමගිය<br><br>• ජාතික ගීය ජාතික කොඩිය සහ රාජ්‍ය ලංඡනය<br>• ජාතික පුෂ්පය හා ජාතික වෘක්ෂය<br>• යහපත් පුරවැසියකු සතු සාරධර්ම | 10 |

# 4.0 පාසල් ප්‍රතිපත්ති හා පාසල් වැඩ සටහන් ( ජීවන නිපුණතා )

ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය විෂය පාසල තුළ ක්‍රියාත්මක කිරීමේ දී එය පන්ති කාමරයට සීමා නොවී අවශ්‍ය සෑම අවස්ථාවකදී ම, සිසුන් යොමු කිරීම වැදගත් වේ. විෂය සමගාමී ක්‍රියාකාරම් විෂය බාහිර ක්‍රියාකාරකම්වල දී දරු දැරියන් තුළ විවිධ ක්ෂේත්‍රවලට අයත් නිපුණතා සංවර්ධනය කිරීමට එය මහගු පිටුවහලක් වනු ඇත. තීරණ ගැනීම, නායකත්වය, සහභාගීත්වය, සංවිධානය, සැලසුම්කරණය ආදී විවිධ කටයුතුවල දී හැකි ආකාරයෙන් සිසුන්ගේ දායකත්වය ලබා ගැනීම සඳහා විශේෂ අවධානයක් යොමු කළ යුතුය. විශේෂයෙන් පාසල තුළ ක්‍රියාත්මක වන සැගවුණ විෂයමාලාව ක්‍රියාත්මක කිරීමේ දී විදුහල්පති තුමා ඇතුළු සියලු ම පරිපාලන නායකයින් දරු දැරියන් තුළ ජීවන නිපුණතා සංවර්ධනය කිරීමට උචිත වැඩ කටයුතු ක්‍රියාත්මක කිරීම වැදගත් වේ.

මීට අමතරව විවිධ සමාජ සේවා හා සුභ සාධක කටයුතුවල සිසුන් නිරත කරවීම සඳහා පාසල් ප්‍රතිපත්ති හා වැඩ සටහන් නවීකරණය වීම අවශ්‍ය ය. විශේෂයෙන් ගුරු, දෙමාපිය, ප්‍රජා වැඩ සටහන්වල දී සිසු දායකත්වය හා මඟ පෙන්වීම ලබා ගැනීමට අවශ්‍ය කටයුතු පාසල් ප්‍රතිපත්ති තුළ අන්තර්ගත විය යුතු වේ. එමෙන් ම පාසල තුළ "මගේ හොඳ වැඩ පොත" නමින් දින පොතක් සෑම සිසුවකු ලවා ම පවත්වා ගෙන යාමට මඟ පෙන්වීම කළ හැකි ය. මෙය වරින් වර පරීක්ෂා කිරීම මගින් සිසුන් තුළ උපස්ථම්භනයන් ඇති කිරීම වැදගත් වේ.

විශේෂයෙන් ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපන සංකල්ප ජීවන නිපුණතා ගුරුවරයා මෙන් ම අන් විෂයයන් උගන්වන ගුරුවරුන් මගින් ද සංවර්ධනය කිරීම පාසල් ප්‍රතිපත්තිවලට ඇතුළත් කළ යුතු ය. ඔවුන්ගේ සහාය ද ඒ සඳහා ලබා ගැනීම සුදුසු ය. එසේ ම මෙම විෂයය සම්බන්ධ ව සහාය ලබා දෙන බාහිර ආයතනය හා පුද්ගලයින්ගේ උපකාරක දායකත්වය ලබා ගැනීම යොමු කළ යුතු ය. පන්ති කාමරයේ දීත්, පන්ති කාමරයෙන් බැහැර ව විවිධ අවස්ථාවන්හිදීත් ක්‍රීඩා පිටිය, පුස්තකාලය, ආපනශාලාව, නේවාසිකාගාරය, පොදු ස්ථාන, උදේ රැස්වීම යන පාසල් විවිධ කාර්යය සංසිද්ධීන්හි දී ශිෂ්‍යයන්ගේ හැසිරීම් රටාවන් තුළින් ජීවන නිපුණතා ප්‍රදර්ශනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම විෂයයේ ඉගෙනුම් ඵල ලෙස පාසලේ විනය ගැටලු අඩුවීම, සිසුන් ප්‍රීතියෙන් ඉගෙනීමේ ප්‍රියජනක පරිසරයක් නිර්මාණය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## පාසල් ප්‍රතිපත්ති සහ වැඩ සටහන් ( පුරවැසි අධ්‍යාපනය )

පාසල පවතින්නේ මානව වර්ගයාට සාමානාත්මතාවෙන් යුක්තව සේවය කිරීමට ය. ලෝක වාසීන් පිළිබඳ අවබෝධය වර්ධනය කිරීමටත් මිනිස් ජීවිතයට හා මිනිස් වර්ගයාට ගෞරව කිරීමටත් උගන්වන්නේ පාසලෙනි. එසේ ම යහපත් ආකල්පවලින් යුක්ත වූ ද යහපත් චර්යාවලින් හෙබි පුද්ගලයින් බිහි කිරීම ද පාසල සතු වගකීමක් වෙයි. මානව වර්ගයාට සංවර්ධනය විය

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

හැක්කේ එකමුතුකම හා සාමූහික ප්‍රයත්න තුළින් පමණක් වන අතර ඒ සඳහා පදනම වැටෙන්නේ ද පාසල තුළිනි. ඒ බැවින් පුරවැසි අධ්‍යාපනය යන විෂයය පාසල්වල අනිවාර්යයෙන් ඉගැන්විය යුතු විෂයයක් වන්නේ ය.

විෂය නිර්දේශයේ අන්තර්ගතය වඩා සාර්ථක ඉගෙනුම් අත්දැකීම් බවට පත් කිරීම සඳහා සෑම ශිෂ්‍යයකුට ම සහභාගී විය හැකි ප්‍රදේශයට ගැළපෙන වාර්ෂික වැඩ සටහනක් සම්පාදනය කිරීම පාසල් අධිකාරීන්ගේ වගකීමකි. වසර ආරම්භයේ දී ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි වැඩ සටහනක් සකස් කිරීම ප්‍රයෝජනවත් වේ. එවැනි වැඩ සටහනකට ඇතුළත් කළ හැකි විෂය සමගාමී ක්‍රියාකාරකම් කිහිපයක් පහත දැක් වේ.

- ක්ෂේත්‍ර වැඩ සටහන් හා අධ්‍යාපන චාරිකා සංවිධානය කිරීම
- කුඩා පරිමාණයේ ව්‍යාපෘති ආරම්භ කිරීම
- දැනුම මිනුම වැඩ සටහන්, විවාද හා ප්‍රදර්ශන පැවැත්වීම
- බිත්ති පුවත්පත් හා වාර ප්‍රකාශන පළ කිරීම
- ප්‍රදේශයේ පිහිටුවා ගෙන ඇති වෙනත් සංවිධාන සමඟ එක් ව කටයුතු කිරීම
- ජාතික හා ජාත්‍යන්තර සංවිධාන සමඟ කටයුතු කිරීම
- සම්පත් පුද්ගලයින්ගේ සහභාගීත්වයෙන් වැඩ මුළු පැවැත්වීම

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය

# හැඳින්වීම

මෙම පාඨමාලාවට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය තීරණය කිරීමේ දී ගවේෂණය පදනම් කර ගෙන සිසු නිපුණතා ගොඩ නැගීමට හැකි වන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම් සැලසුම් කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත. නිපුණතා පාදක අධ්‍යාපනය සඳහා මෙසේ සූදානම් වීමේ දී ගුරු භූමිකාවේ ද පැහැදිලි වෙනසක් අපේක්ෂා කෙරේ.

ඈත අතීතයේ සිට අපේ පන්ති කාමරවල බහුල ව ක්‍රියාත්මක වූ සම්ප්‍රදායික සම්ප්‍රේෂණ භූමිකාව ( TRANSMISSION ROLE ) හා පසු කාලීනය හඳුන්වා දෙනු ලැබූ ගනුදෙනු භූමිකාව (TRANSACTION ROLE ) වර්තමාන පන්ති කාමර තුළ තවමත් කැපී පෙනේ. පාසල් හැර යන දරු දැරියන්ගේ චින්තන කුසලතා, පුද්ගල කුසලතා හා සමාජ කුසලතාවල අඩු දක්නට ලැබෙන පිරිහීම පිළිබඳ සලකා බලන වට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය සංවර්ධනය විය යුතු බවත්, එය සිදුවිය යුතු ආකාරයත් හඳුනා ගැනීම අපහසු නොවේ.

සම්ප්‍රේෂණ ගුරු භූමකාවේ දී සිසුන් උගත යුතු සියල්ල දන්නා අයෙකු ලෙස ගුරුවරයා පිළිගැනෙන අතර සිසුන් ඒ කිසිවක් නොදන්නා අය ලෙස සලකා ඔවුන් වෙත දැනුම සම්ප්‍රේෂණය කිරීම ගුරු කාර්යය බවට පත් වී තිබේ. ගුරුවරයාගෙන් සිසුනට දැනුම ගලා යාමට පමණක් සීමා වන දේශන මුහුණුවරක් ගන්නා මෙම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සිසු චින්තනය අවදි කිරීමට හෝ සිසුන්ගේ පෞද්ගලික හා සමාජ කුසලතා සංවර්ධනය කිරීමට හෝ ප්‍රමාණවත් ව දායක නොවේ.

ගුරුවරයා පන්තිය සමඟ ඇති කර ගන්නා දෙබස සංවාදාත්මක ගුරු භූමිකාවේ ආරම්භක අවස්ථාව වේ. ගුරුවරයාගෙන් සිසුන්ට හා සිසුන්ගෙන් ගුරුවරයාට ගලා යන අදහස්වලට අමතරව සිසු - සිසු අන්තර් ක්‍රියා ද පසුව ඇතිවීම නිසා මෙම දෙබස ක්‍රමයෙන් සංවාදයකට පෙරලේ. දන්නා දෙයින් නොදන්නා දෙයට, සරල දෙයින් සංකීර්ණ දෙයට මෙන් ම සංයුක්ත දෙයින් වියුක්ත දෙයට සිසුන් ගෙනයාම සඳහා ගුරුවරයා දිගින් දිගට ම ප්‍රශ්නකරනයේ නිරත වේ.

නිපුණතා පාදක අධ්‍යාපනයේ ද ශිෂ්‍ය කාර්යයන් ප්‍රබල ස්ථානයක් ගන්නා අතර පන්තියේ සෑම ළමයෙකු ම ඒ ඒ නිපුණතාව සම්බන්ධ ව අඩු තරමින් ආසන්න ප්‍රවීණතාවයට හෝ ගෙන ඒමට මැදිහත් වන සම්පත් දායකයකුගේ (RESOURCES PERSON ) තත්ත්වයට පත් වේ. ඉගෙනුමට අවශ්‍ය උපකරණ හා අනෙකුත් පහසුකම් සහිත ඉගෙනුම් පරිසරයක් සැලසුම් කිරීම, සිසුන් ඉගෙන ගන්නා අයුරු සමීප ව නිරීක්ෂණය කිරීම, ශිෂ්‍ය හැකියා හා නොහැකියා හඳුනා ගැනීම, අවශ්‍ය ඉදිරි පෝෂණ ප්‍රතිපෝෂණ ලබා දෙමින් සිසුන්ගේ ඉගැනුම් ප්‍රවර්ධනය කිරීම මෙන් ම පන්ති කාමරයෙන් බැහැරට ඉගෙනුම් හා ඉගැන්වීම් දීර්ඝ කිරීම සඳහා ඇගයීම් උපකරණ සකස් කිරීම ද මෙහි දී ගුරුවරයාගෙන් ඉටුවිය යුතු මූලික කාර්යයන් වේ. යථෝක්ත ගුරු කාර්ය භාරය ඇසුරු කොට ගත් ගුරු භූමිකාව පරිණාමන ගුරු භූමිකාව (TRANSFORMATION ROLE) ලෙස නම් කර තිබේ.

මෙම පාඨමාර්ගයේ පළමු කොටස මගින් හඳුන්වා දෙනු ලන විස්තරාත්මක විෂය මාලාව ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගත හැකි ක්‍රියාකාරකම් සන්නතිය එහි දෙවැනි කොටසට ඇතුළත් කර ඇත. මේ සෑම ක්‍රයාකාරකමක් ම අඩු තරමින් පියවර තුනක් ඇතුළත් වන පරිදි සංවර්ධනය කර තිබේ. ක්‍රියාකාරකම්වල පළමුවන පියවර මගින් සිසුන් ඉගෙනුමට සම්බන්ධ කර ගැනමට අපේක්ෂා කරනු ලැබේ. එබැවින් මෙම පියවර සම්බන්ධ කර ගැනීමේ පියවර (ENGAGEMENT STEP ) වශයෙන් නම් කර තිබේ. මෙහි ආරම්භයක් ලෙස ගුරුවරයා ගනු දෙනු භූමිකාවේ ලක්ෂණ ප්‍රදර්ශනය කරමින් සිසුන් සමග දෙබසකට මුල පුරයි. පසු ව සංවාදයකට

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

පරිවර්තනය වන මේ දෙබස යටතේ ගවේෂණයේ යෙදීමෙන් සිසුන් සංවර්ධනය කර ගත යුතු මූලික නිපුණතාව හා සම්බන්ධ පෙර දැනුම සිහිපත් කර ගැනීමටත්, ක්‍රියාකාරකමේ ඉදිරිය පිළිබඳ ඉඟි ලබා ගැනීමටත් සිසුන්ට අවස්ථාව සැලසේ. මෙම අදහස් හුවමාරුව සඳහා යොදා ගත හැකි උපක්‍රම රාශියක් ගුරුවරයා සතුව ඇත. ප්‍රශ්න ඉදිරිපත් කිරීම, පින්තූර පුවත්පත් දැන්වීම් හා සැණ පත් ( FLASH CARDS) වැනි උත්තේජක යොදා ගැනීම, ගැටලු ප්‍රහේලිකා හෝ සිද්ධි අධ්‍යයනය භාවිතය, දෙබස් භූමිකා රංගන, කවි, ගීත හා ආදර්ශන (DEMONSTRATIONS ) ශ්‍රව්‍ය දෘශ්‍ය පට යොදා ගැනීම මෙහි දී ගුරුවරයා සතු ව ඇති උපක්‍රම කිහිපයකි. සාරාංශ වශයෙන් පහත සඳහන් අරමුණු තුන සාක්ෂාත් කර ගැනීම මුල් කොට ක්‍රියාකාරකම්වල පළමු පියවර ක්‍රියාත්මක වේ.

- පන්තියේ අවධානය දිනා ගැනීම
- අවශ්‍ය පෙර දැනුම සිහිපත් කර ගැනීමට සිසුන්ට අවස්ථාව ලබා දීම
- ක්‍රියාකාරකමේ දෙවැනි පියවර යටතේ සිසුන් යොමු කිරීමට අපේක්ෂා කරන ගවේෂණයේ මූලිකාංග සිසුන්ට හඳුන්වා දීම

ක්‍රියාකාරකමේ දෙවැනි පියවර සැලසුම් කර ඇත්තේ ගවේෂණය (EXPLORATION )සඳහා සිසුන්ට අවස්ථාව ලාබාදීමට ය. සිසුන් ගවේෂණයේ යෙදෙන්නේ ඒ සඳහා සුවිශේෂ ව සකස් කරන ලද උපදෙස් පත්‍රිකාවක් පදනම් කරගෙන ය. ගැටලුවට සම්බන්ධ විවිධ පැති කණ්ඩායම් වශයෙන් ගවේෂණය කරමින් සහයෝගී ඉගෙනුමේ යෙදීමට සිසුනට හැකි වන පරිදි මෙම ගවේෂණය සැලසුම් කිරීමට ගුරුවරයාට සිදුවේ. සපයා ඇති සම්පත් ද්‍රව්‍ය ප්‍රයෝජනයට ගනිමින්, සතිමත් බවෙන් යුතුව කණ්ඩායම් සාකච්ඡා මෙහෙයවමින් සිසුන් ගවේෂණයේ නිරතවීම මෙම පියවරේ වැදගත් ලක්ෂණ කිහිපයක් වේ. කාලයක් තිස්සේ එබඳු කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත වීම නිසා ස්වයං විනය, අන්‍යයන්ට සවන්දීම, අන්‍යයන් සමඟ සහයෝගයෙන් වැඩ කිරීම, ඔවුන්ට උදව් වීම, කාල කළමනාකරණය, ගුණාත්මක බවෙන් ඉහළ නිපැයුම් ලබා ගැනීම, අවංක බව ආදී සාමාන්‍ය ජීවිතයට අවශ්‍ය වැදගත් කුසලතා රැසක් සංවර්ධනය කර ගැනීමට ද සිසුන්ට හැකියාව ලැබේ.

සිසුන් ගවේෂණය සඳහා යොමු කිරීමේ දී ශිෂ්‍ය කණ්ඩායම්වල නායකත්වය පිළිබඳ තීරණ ගැනීමෙන් ගුරුවරයා වැළකී සිටිය යුතු අතර සිසුන් අතරින් නායකයන් මතුවීමට අවශ්‍ය පසුබිම පමණක් මැනවින් සූදානම් කළ යුතු ය. සැඟවුණු හැකියා පදනම් කර ගනිමින් අවස්ථාවෝචිත ව නායකත්වය ගැනීමේ වරප්‍රසාදය මේ අනුව සිසුන්ට හිමිවේ.

ක්‍රියාකාරකමේ තෙවන පියවරේ දී සෑම කණ්ඩායමකට ම තම ගවේෂණ ප්‍රතිඵල අන් අයගේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කිරීමට අවස්ථාව සැලසේ. මෙහි දී ගුරුවරයා කළ යුත්තේ සමූහ ඉදිරිපත් කිරීම් සඳහා සිසුන් දිරිමත් කිරීමට ය. සෑම සාමාජිකයෙකුට ම වගකීම් පැවරෙන පරිදි ඉදිරිපත් කිරීම සැලසුම් කිරීමට සිසුන් මෙහෙයවීම ද වැඩදායක ය. සිසු අනාවරණ පැහැදිලි කිරීම ( EXPLANATION) හා සම්බන්ධ මෙම පියවරේ වැදගත් ලක්ෂණයන් වන්නේ පන්ති කාමර තුළ නිතර ඇසෙන ගුරු කථනය වෙනුවට සිසු හඬ මතු වීමට අවස්ථා සම්පාදනය වී තිබීමය.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

ක්‍රියාකාරකම්වල තෙවන පියවරේ දී සොයා ගැනීම් පැහැදිලි කිරීමෙන් අනතුරුව වැඩි දියුණු කිරීමට නැත්නම් විස්තාරණයට (ELABORATION ) සිසුන් යොමු කිරීමට අවශ්‍ය වේ. එක් එක් කණ්ඩායම ඔවුන්ගේ ඉදිරිපත් කිරීම අවසන් කළ පසු ඒ පිළිබඳ සංවර්ධනාත්මක යෝජනා මතු කිරීමට ඉදිරිපත් කළ කණ්ඩායම්වල සිසුන්ට දෙවනුව ද මේ සඳහා අවස්ථාව ලැබේ. කෙසේ වෙතත් අවසාන සමාලෝචනය යොමු වන්නේ ගුරුවරයාට ය. සිසුන් නිරත වූ ගවේෂණයට අදාළ වැදගත් කරුණු සියල්ල පැහැදිලි වන සේ මෙම සාමාලෝචනය සිදු කිරීම ගුරුවරයාගෙන් අපේක්ෂා කෙරේ.

පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළින් අපේක්ෂිත අරමුණු සාර්ථකව ඉටු වන්නේ දැයි නිරතුරුව සොයා බැලීම මෙම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම වේදය යටතේ ගුරුවරුන් සතු ප්‍රධාන වගකීමකි. මේ සඳහා තක්සේරුව හා ඇගයීම් යොදා ගත යුතු අතර ඒ සඳහා ප්‍රමාණවත් ඉඩකඩ ඉගෙනුම ඉගැන්වීම් ක්‍රියාවලිය තුළදීම ලබා ගැනීමට සැළසුම්කළ ක්‍රියාකාරකම් මගින් ගුරුවරයාට අවස්ථාව සලසා දේ. ක්‍රියාකාරකමේ දෙවන පියවර යටතේ සිසුන් ගවේෂණයේ යෙදෙන විට තක්සේරුවටත් (ASSESSMENT ) ක්‍රියාකාරකමේ තෙවන පියවර යටතේ සිසුන් පැහැදිලි කිරීම හා විස්තාරණයට යොමු වන විට ඇගයීමටත් (EVALUATION ) ගුරුවරයාට ඉඩ තිබේ. තක්සේරුව හා ඇගයීම් පිළිබඳ විස්තරාත්මක විමසුමක් මෙම ලේඛනය යටතේ මතු දැක්වේ.

මේ දක්වා විස්තර කරන ලද ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය පරිණාමන භූමිකාව ක්‍රියාත්මක කිරීම සඳහා ගුරුවරයා යොමු කරවයි. මෙහ දී කණ්ඩායම් ගවේෂණයට මුල් තැන ලැබෙන අතර ගනුදෙනුව, සංවාදය හා කෙටි දේශන සඳහා ද ගුරුවරයාට අවකාශ සැලසේ. ප්‍රවේශ පියවරේ දී ගනුදෙනුවට හා සංවාදයට අවස්ථා ඇති අතර අවසාන පියවරේ සමාලෝචනය යටතේ කෙටි දෙසුමකට ගුරුවරයාට ඉඩ ඇත. නව සහශ්‍රකයේ පළමු විෂය මාලා ප්‍රතිසංස්කරණ යටතේ ඉදිරිපත් වන මෙම විෂය මාලාව හා සම්බන්ධ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය සංවර්ධනය කිරමේ දී පරිණාමන ගුරු භූමිකාවට අමතරව සම්ප්‍රේෂණ හා ගනුදෙනු ගුරු භූමිකාවන්ට අදාළ වැදගත් ලක්ෂණ ගැන ද සැලකිලිමත්වීම මෙම ක්‍රමවේදයේ විශේෂත්වය ලෙස සඳහන් කළ හැකි වේ.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

## යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද ( ජීවන නිපුණතා ) I කොටස

ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය විෂය නිර්දේශය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය මෙහෙයවීමේ දී, ගුරුවරයා විසින් ඉගැන්වීමට වඩා සිසුන්ට ඉගෙනීමට අවස්ථාවන් සලසා දීම වැදගත් වේ. මෙම විෂය මගින් අපේක්ෂා කරන ආකාරයට පුද්ගල සංවර්ධනය මගින් සමාජ සංවර්ධනයට දායකත්වය ලබා දීමට දරු දැරියන් තුළ නිපුණතා සංවර්ධනය කළ යුතු බැවින් එකී හැකියා වර්ධනයට ඉගෙනුම් ඉගැන්වීම් පරිසරයක් නිර්මාණය වීම අතිශයින් වැදගත් වේ.

නව විෂය ක්ෂේත්‍රය තුළ ඉගෙනුම්-ඉගැන්වීම් උපාය මාර්ග වඩාත් නම්‍යශීලී විය යුතු අතර දේශන හා සාකච්ඡාවලට වඩා ව්‍යාවහාරික සමාජයට වඩාත් උචිත සජීවී ජීවන අත්දැකීම් ලබා දීම යෝග්‍ය වේ.

විශේෂයෙන් සහයෝගී කණ්ඩායම් ක්‍රම මගින් ඉගෙනුම් අත්දැකීම් ලබා දීම මගින් දරු දැරියන් තුළ සමාජශීලී කුසලතා වර්ධනය කිරීම අපේක්ෂිතයි. ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී පන්ති කාමරය, පාසල් සමාජය, පාසල් පරිසරය, අවට පරිසරය හා අවට සමාජ ආයතන, සජීවී ඉගෙනුම් අත්දැකීම් ලබා ගැනීම සඳහා යොදා ගත හැකිය.

මෙවැනි ඉගෙනුම් - ඉගැන්වීම් පරිසර තුළ දී නිරීක්ෂණය, සිද්ධි අධ්‍යයනය, ක්‍රීඩා, භූමිකා රංගන, සම්මුඛ සාකච්ඡා, සමීක්ෂණ, ගවේෂණ, ස්වයං අධ්‍යයන, අත්හදා බැලීම්, බුද්ධි කලම්බන සාකච්ඡා, ප්‍රදර්ශන, ව්‍යාපෘති ක්ෂේත්‍ර අධ්‍යයන වැනි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම ගුරුවරයාට අභිමත පරිදි යොදා ගත හැකි ය.

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේද ( පුරවැසි අධ්‍යාපනය ) II කොටස

දීර්ඝ කාලයක් තිස්සේ පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ ප්‍රමුඛ ස්ථානයක් ගත් දේශන ක්‍රමය තව දුරටත් වැදගත් ඉගැන්වීමේ උපාය මාර්ගයක් වශයෙන් පවත්වා ගෙන යාම මෙහි දී අවධාරණය නොකෙරේ. ශිෂ්‍ය ශිෂ්‍යාවන් තරගකාරී අධ්‍යාපනික පරිසරයක් කරා මෙහෙයවනු වෙනුවට සාමූහිකත්වය හා වැඩ ලෝකයට අදාළ නිපුණතා වර්ධනය කරන, ප්‍රීතිදායක ඉගෙනුම් පරිසරයක් ඇති කරන ස්වයං අධ්‍යයනයට පොළඹවන ඉගෙනුම් ක්‍රමවේද කෙරෙහි අපගේ අවධානය යොමු විය යුතු ය.

පුරවැසි අධ්‍යාපනය විෂයයෙන් අවසන් වශයෙන් අපේක්ෂා කෙරෙන්නේ මිනිස් ගුණ ධර්මවලින් හෙබි සාමකාමී සහජීවනයෙන් යුත් අනාගත පරපුරක් බිහි කිරීම ය. මේ අරමුණ මුදුන්පත් කර ගැනීම සඳහා ශිෂ්‍යයාට පන්ති කාමරයේ උගත් කරුණු ජීවිත අත්දැකීම්වලට සම්බන්ධ කර ගැනීමට අවස්ථා ලබා දිය යුතු අතර ඒ සඳහා ප්‍රායෝගික ක්‍රියාකාරකම් අත්‍යවශ්‍ය වෙයි. එබැවින් විෂය කරුණු ඉගැන්වීමට වඩා ප්‍රායෝගික අත්දැකීම් පෙරදැරි කර ගෙන ඉගෙනුම් ඉගැන්වීම් හා ඇගයීම යන ස්වාධීන පන්ති කාමර ක්‍රියාවලිය සංවිධානය කර ගත යුතු ය.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

පාසලෙන් බාහිර ආයතන හා පුද්ගලයින් සමග සබඳතා පවත්වා ගැනීමෙන් සිසුන්ගේ සමාජමය කුසලතා වර්ධනය වේ. ප්‍රජාතන්ත්‍රවාදී අගයන් හා සම්බන්ධ චර්යාමය රටා වර්ධනය වන ආකාරයේ ඉගෙනුම් සිද්ධී මගින් අත්දැකීම් වර්ධනය කරීම පිණිස පන්ති කාමරයෙන් බැහැර ක්‍රියාකාරකම්වලට සිසුන් යොමු කිරීමත් එම ක්‍රියාකාරකම් ශිෂ්‍යයාගේ වයස් මට්ටමට ගැළපෙන පරිදි සංවිධානය කරීමත් සඳහා ගුරු භවතුන් විසින් මනා සැලැස්මක් සකස් කර ගැනීම කළ යුතුය.

කරුණු ඉගැන්වීමට වඩා ස්වයං අධ්‍යයනයට, නිරීක්ෂණයට, තොරතුරු රැස් කිරීමට හා ඒවා විශ්ලේෂණය කිරීමට, කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත වීමට, සහ ශිෂ්‍ය පෞරුෂ වර්ධනයට අදාල වන නායකත්වයට ගරු කිරීම, නායකත්වය ඉසලීම, අන්‍ය මත ඉවසීම, විනීත හා විනය ගරුක ව හැසිරීම පිළිබඳ ලක්ෂණ ශිෂ්‍යයන් තුළ වර්ධනය කිරීම සඳහා ප්‍රායෝගික ක්‍රියාකාරකම් වැදගත් වෙයි. ඒ සඳහා පන්ති කාමරය තුළ දී හා ඉන් පිටත ද ගුරු මග පෙන්වීම වැදගත් වේ. පහත දැක්වෙන ඉගෙනුම් ක්‍රමවේද පුරවැසි අධ්‍යාපනය විෂය ඉගැන්වීම සඳහා යෝජනා කරනු ලැබේ. ඒ පිළිබඳ වැඩිදුර තොරතුරු ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ හා සේවාස්ථ පුහුණු කාර්ය සැසි ඇසුරෙන් ලබා ගැනීම මැනවි.

- නිරීක්ෂණය
- ගවේෂණය
- සම්මුඛ සාකච්ඡා මගින් තොරතුරු රැස් කිරීම
- තොරතුරු විශ්ලේෂණය කිරීම
- ක්ෂේත්‍ර වැඩ
- ළමා පාර්ලිමේන්තුව, (එක් එක් අමාත්‍යාංශ හා විවිධ ජනවර්ග නියෝජනය වන පරිදි පාර්ලිමේන්තුවේ සංයුතිය සකස් කර ගැනීමට සිසුන්ට උපදෙස් දෙන්න. එක් එක් පක්ෂ හෝ ජනවර්ග නියෝජනය වන පරිදි පාර්ලිමේන්තු සභාචාරයේ කටයුතු සකස් කර ගනිමින් වර්තමාන පාර්ලිමේන්තුවේ ආදර්ශයකට අනුව ළමා පාර්ලිමේන්තුව සකස්කර ගැනීමට කටයුතු කරන්න.)
- සුභ සාධක සමිති සමාගම්, ශ්‍රමදාන හා ශ්‍රමාභිමානී කඳවුරු, ශිෂ්‍යයා හා බාල දක්ෂ කඳවුරු
- ගිලානෝපාස්ථානය
- අපදා කළමනාකරණයට දායකවීම
- විවිධ සමිති සමාගම්, සමාජ සුභසාධන, පරිසර සුරැකීම, පෞරාණික සම්පත් සුරැකීම
- ව්‍යාපෘති
- ගැටලු විසඳීමේ ක්‍රමය
- විමසුම් ඉගැන්වීමේ ක්‍රමය
- ප්‍රශ්නෝත්තර ක්‍රමය
- බිත්ති පුවත්පත්
- ප්‍රදර්ශන

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය

ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

((1)- කොටස )- ජීවන නිපුණතා

# ජීවන නිපුනතා හා පුරවැසි අධ්‍යාපනය - I කොටස

## 1.0 ආත්මාවබෝධයෙන් කටයුතු කරයි.

### හැඳින්වීම

සෑම පුද්ගලයකු ම ඔහුට ම සුවිශේෂී වූ අනන්‍යතාවයකින් යුක්ත බවත්, එම අනන්‍යතාවය තුළින් මතුවන ගරුත්වය හා ආත්මාභිමානය සුරැකිය යුතු බවත් පෙන්වා දීම මෙහි දී අපේක්ෂිත ය. සමාජය තුළ ඇති අනිසි ඵලවිපාක දෙන අහිතකර බලවේග හැඳින ඒවායින් ඈත්වීමටත්, හිතකර බලවේග ළඟා කර ගැනීමටත්, එසේ ම විවිධ ආකර්ෂණීය දේ ඇසුරින් උචිත දේ පමණක් තෝරා ගෙන නිවැරදි ජීවිත අරමුණක් කරා ජීවිතය මෙහෙයවීමත් මෙහි දී අවධාරණය කෙරේ.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

1.1 අනන්‍යතාව තහවුරු කර ගනිමින්, ආත්මාභිමානය සංවර්ධනය කර ගනියි.

**විෂය අන්තර්ගතය**

- තමාට සුවිශේෂී අනන්‍යතාවක් ඇති බව නිශ්චය කිරීම ( ලෝකයේ වෙනත් කිසිම කෙනෙකුට සර්වප්‍රකාරයෙන් ම තමා සමාන නොවන බව )
- තමා අධ්‍යාත්මික සත්ත්වයකු බව ( ස්වයං අවබෝධය මිනිසාට හැර වෙනත් කිසිදු සත්ත්වයකුට නොමැති බව )
- තමා තුළ ඇති ආත්මාභිමානයට තුඩු දෙන ලක්ෂණ තමන් විසින් ම හඳුනා ගැනීම. (තමන් තුළ ඇති විශේෂ යහපත් ගති ගුණ හඳුනා ගැනීමේ වැදගත්කම )
- අන්‍යයන් විසින් පෙන්වාදෙනු ලබන, තම අභිමානයට හේතුවන ලක්ෂණ හඳුනා ගැනීම.
- අන්‍යයන් විසින් පෙන්වා දෙනු ලබන, තම ආත්මාභිමානය පලුදුවන ලක්ෂණ හඳුනා ගැනීම.
- හඳුනා ගත්, වර්ධනය කළ යුතු ගුණාංග පෝෂණය කිරීම. ( තමන් තුළ තවමත් සපුරා වර්ධනය වී නැති යහපත් ගති ලක්ෂණ සංවර්ධනය කර ගැනීම.)
- අනන්‍යතාව හා ආත්මාභිමානය සුරැකෙන ලෙස කටයුතු කිරීම ( තමන්ගේ යහපත් ගුණාංග ස්ථාවර ලෙස පවත්වා ගෙන යා යුතු බව )

**1.2 ජීවිතයේ සාර්ථකත්වයට හිතකර බලවේග අදාළ පරිදි උපයෝගී කර ගනියි.**

- සමාජයේ පවත්නා හිතකර බලවේග හඳුනා ගැනීම ( නිවස, පාසල, පන්සල, පල්ලිය ඇසුරෙන් ලැබෙන යහපත් දෑ විමසීම. යහපත් මිතුරන් හඳුනා ගැනීම, හොඳ පොත පත මාධ්‍ය වැඩ සටහන් හඳුනා ගැනීම.)
- සමාජයේ පවත්නා අහිතකර බලවේග හඳුනා ගැනීම. ( දුම්වැටි, මත්ද්‍රව්‍ය, අශෝභන පොත් පත්, නුසුදුසු මාධ්‍ය වැඩ සටහන් ආදිය අහිතකර දේ ලෙස හඳුනා ගැනීම.)
- එම අහිතකර බලවේගවලට හසු වූ අය මුදවා ගැනීමට දායක වීම.
- හිතකර බලවේග ජීවිතයට ළඟා කර ගැනීම

**1.3 නිවැරදි ජීවන අරමුණක් කරා තම ජීවිතය මෙහෙයවයි.**

විෂය අන්තර්ගතය

- සාර්ථක ජීවිතයකට අරමුණක් තිබිය යුතු බව
- එම අරමුණ යහපත් විය යුතු බව
- එම අරමුණ කරා යන ක්‍රියා පටිපාටිය ප්‍රමුඛතා අනුව මෙහෙයවීම
    - අරමුණ සටහන් කිරීම
    - නැවත කියවීම හා සැකසීම
    - ඉටු කර ගැනීම සඳහා නියමිත ඉලක්ක ගොඩ නගා ගැනීම
    - ඒ වෙනුවෙන් කැපවීම
    - අධිෂ්ඨානයෙන් අරමුණ සාක්ෂාත් කර ගැනීමේ අවසාන ඉලක්ක කරා යොමු වීම.
- තමා හමුවට එන විවිධ ආකර්ෂණීය දේ හඳුනා ගැනීම. (විද්‍යුත් මාධ්‍ය, මුද්‍රිත මාධ්‍ය, වෙළඳ පොළ හා විවිධ පුද්ගලයන් හා සමාජ කණ්ඩායම්වලින් )
- විවිධ ආකර්ෂණීය දෙයින් තමාගේ ජීවිතයට උචිත දේ කෙරේ පමණක් යොමු වීම.

නිපුණතාවය 1.0 : ආත්මාවබෝධයෙන් කටයුතු කරයි.

නිපුණතා මට්ටම :
- අනන්‍යතාව තහවුරු කර ගනිමින් ආත්මාභිමානය සංවර්ධනය කර ගනියි.

ක්‍රියාකාරකම1.1.1 : "රටක් වටින කෙනෙකු වන්න"

කාලය : මිනිත්තු 40 යි.

ගුණාත්මක යෙදවුම් :
- ලියන කඩදාසි
- පෑන්
- ඇමුණුම 1.1.1.1 විශිෂ්ට චරිත දැක්වෙන පින්තූර

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 1.1.1.1 :
- ඇමුණුම් අංක 1.1.1.1 සඳහන් පින්තූර සිසුන් හට පෙන්වන්න.
- පින්තූරයේ සඳහන් පුද්ගලයින් හඳුනා ගැනීමට මූලික වූ කරුණු සාකච්ඡා කරන්න.
- පහත සඳහන් කරුණු මතුවන සේ සාකච්ඡාවක යෙදෙන්න.

> - ඔවුන් සතුව විවිධ හැකියාවන් නිසා විශේෂත්වයන් හඳුනා ගත හැකි වූ බව
> - ඒ හැකියාවන් මත අනන්‍යතාවය ගොඩ නැගී ඇති බව
> - සෑම පුද්ගලයා තුළ ම සැඟවුන දක්ෂතාවයන් හා හැකියාවන් ඇති බව
> - කුඩා කළ සිට ම විවිධ දක්ෂතාවයන්, හැකියාවන් ඇති කර ගැනීමටත්, ඒවා වර්ධනය කර ගැනීමටත් කටයුතු කළ යුතු බව

මිනිත්තු 10යි

පියවර 1.1.1.2 :
- සිසුන් කණ්ඩායම් 04කට බෙදන්න.
- කණ්ඩායම්වල සිසුන් සියළු දෙනාට ලියන කඩදාසිය බැගින් දෙන්න.
- එහි තමන්ගේ නම ලියන්නට උපදෙස් දෙන්න.
- නම ලියූ කඩදාසි කණ්ඩායම තුළ හුවමාරු කරමින් නම සඳහන් මිතුරාගේ හෝ මිතුරියන්ගේ තමන් දන්නා හෝ දකින හැකියාවන් හෝ ගුණාංගයන් ලිවීමට උපදෙස් දෙන්න.

මිනිත්තු 15යි

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

පියවර 1.1.1.3 :

- ලියා අවසන් කළ පත්‍රිකා තුළින් අනුව තමන්ගේ කොළය ලබා ගැනීමට උපදෙස් දෙන්න.
- තම මිතුරු මිතුරියන් තමා ගැන ලියා අගය කර තිබෙන ආකාරය පිළිබඳව ඔබේ සිතේ ඇතිවන අදහස් මොනවා ද?
- ඒ ඔබේ සිත තුළ සතුට හා අභිමානය ඇති වුණේ ඇයි?
- එම ගුණ හා හැකියාවන් රැක ගැනමටත් වර්ධනය කළ යුතු දෑ කුමක් ද? යන්න විමසන්න.
- පහත කරුණු මතු වන සේ සමාලෝචනයේ යෙදෙන්න.

| |
|---|
| • සැම දෙනා විසින්ම යහපත් ගුණාංග හා හැකියාවන් ඇති කර ගත යුතු බව<br>• එම ගුණාංග සහ හැකියාවන් තුළ තමා පිළිගැනීමට ලක්වන බව<br>• ඒ පිළිගැනීම තුළ අනන්‍යතාවය හා ආත්මාභිමානය ගොඩ නැගෙන බව<br>• එම ගුණාංග හා හැකියාවන් වර්ධනය කිරීමට සහ රැක ගැනීමට කටයුතු කළ යුතු බව |


මිනිත්තු 15යි

තක්සේරුව හා ඇගයීම

- අනන්‍යතාවය හා ආත්මාභිමානය ගොඩ නැගෙන ආකාරය ප්‍රකාශ කරයි.
- තමා පිළිබඳ අනන්‍යතාවයක් සහ අභිමානයක් ගොඩ නගා ගැනීමේ වැදගත්කම පිළිගනියි.
- තම අනන්‍යතාවය හා ගරුත්වය තමා වෙත ම රඳවා තබා ගැනීමට කළ යුතු දේ හඳුනා ගනියි.
- තම හැකියා හා ගුණාංග වර්ධනය කර ගනිමින් ආත්මාභිමානය හා අනන්‍යතාවය ගොඩ නගා ගනියි.
- ආත්මාභිමානයෙන් හා අනන්‍යතාවයෙන් යුත් පුද්ගලයෙකු ලෙස සමාජයට හා රටට වැඩදායී ලෙස ක්‍රියාකරයි.


ඇමුණුම් 1.1.1.1





සෙනරත් පරණවිතාන මහතා

ආතර් සී ක්ලාක් මහතා






මුත්තයියා මුරලිදරන් මහතා

විශාරද ඩබ්. ඩී. අමරදේව මහතා





සුසන්තිකා ජයසිංහ මහත්මිය

මයුම් රහමන් සිසුවිය

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාවය 1.0 : ආත්මාවබෝධයෙන් කටයුතු කරයි.

නිපුණතා මට්ටම : • ජීවිත සාර්ථකත්වයට හිතකර බලවේග අදාළ පරිදි උපයෝගී කර ගනියි.

ක්‍රියාකාරකම 1.2.1 : " සුමගට ද නොමගට ද"

කාලය : මිනිත්තු 40 යි.

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 1.2.1.1 පුවත් සිරස්තල ( ඔබ විසින් සූදානම් කරගන්න)
- ඇමුණුම 1.2.1.2 නොමග නොයන් පුතේ පැදි පෙළ
- ලියන කඩදාසි
- පෑන්

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 1.2.1.1 :
- පෙර පුහුණුව ලත් සිසුවෙකු / සිසුවියක ලවා ඇමුණුම 1.2.1.1 පුවත් සිරස්තල ප්‍රචාරය ඉදිරිපත් කරන්න.
- ඒවා ප්‍රචාරය තුළින් මතුවන හිතකර අහිතකර ප්‍රතිඵල විමසමින් පාඩමට ප්‍රවේශ වන්න.
- පහත සඳහන් කරුණු ඉස් මතුවන සේ සමාලෝචනයක යෙදෙන්න.

> - සමාජය තුළ හිතකර මෙන් අහිතකර බලවේග ද ඇති බව
> - හිතකර බලවේග පුද්ගලයා සුමගට යොමු කරන අතර අහිතකර බලවේග පුද්ගලයා නොමගට යොමු කරන බව

මිනිත්තු 10යි

පියවර 1.2.1.2 :
- සිසුන් කණ්ඩායම් 05කට බෙදන්න.
- ලියන කඩදාසි පෑන් සපයන්න.
- ඇමුණුම 1.2.1.2 පැදපෙලින් එක කණ්ඩායමකට කවි දෙක බැගින් ලියා ගැනීමට සලස්වන්න.
- කවියෙන් මතුවන හිතකර අහිතකර බලවේග වෙන් ව හඳුනා ගැනීමට අවස්ථාව සලස්වන්න.
- හිතකර බලවේග ලංකර ගැනීමට හා අහිතකර බලවේගවලින් ඈත්වීමට ඔබ ගත යුතු ක්‍රියාමාර්ග යෝජනා කරන්න.

මිනිත්තු 15යි

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

පියවර 1.2.1.3 :

- කණ්ඩායම්වලට තම ක්‍රියාකාරකම් පන්තිය වෙත ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- තම කණ්ඩායමට ලැබුණු කවි දෙක දක්ෂ සිසුවකු ලවා ගායනා කරවන්න.
- එම පැදි පන්ති වලින් නිරූපනය වන හිතකර අහිතකර බලවේග පිළිබඳව අන්‍ය කණ්ඩායම්වලට අදහස් දීමට අවස්ථාව දෙන්න.
- පහත කරුණු මතු කරමින් සමාලෝචනයේ යෙදෙන්න.

| |
|---|
| • සංකීර්ණ සමාජය තුළ හිතකර බලවේග මෙන් ම අහිතකර බලවේග නිරතුරුව හඳුනා ගත හැකි බව.<br>• ඒ සඳහා විවිධ මාධ්‍යවල බලපෑම් දක්නට ලැබෙන බව.<br>• විචාරශීලී චින්තනය මගින් හිතකර අහිතකර බලවේග තෝරා බේරා ගෙන කටයුතු කිරීම වැදගත් බව |

මිනිත්තු 15යි

## තක්සේරුව හා ඇගයීම

- අවට සමාජයේ හිතකර/අහිතකර බලවේග නම් කරයි.
- හිතකර බලවේග ජීවිතයට සමීප කර ගැනීමෙන් ජීවිතය ආලෝකමත් වන බව පිළිගනියි.
- හිතකර අහිතකර බලවේග වෙන් කර දක්වයි.
- අහිතකර බලවේගවලින් ඈත්වෙයි.
- හිතකර බලවේග ජීවිතයට සම්බන්ධ කර ගනියි.

| |
|---|
| පසුවැඩ :- හිතකර බලවේග නිසා ජීවිතය ආලෝකවත් කර ගත් පුද්ගලයින් පිළිබඳ ජාතක කතා, ජනශ්‍රැති හෝ ඔබේ අත්දැකීම් ඇසුරින් කෙටි කතාවක් නිර්මාණය කරන්න. |

**(ඇමුණුම 1.2.1.2)** පෙළ පොතෙහි පිටු අංක 8 හා 9 හි සඳහන් " නොමග නොයන් පුතේ කවි පංතිය අදාල කර ගන්න.

නිපුණතාවය 1.0 : ආත්මාවබෝධයෙන් කටයුතු කරයි.

නිපුණතා මට්ටම :
- ජීවිත සාර්ථකත්වයට හිතකර බලවේග අදාළ පරිදි උපයෝගී කර ගනියි.

ක්‍රියාකාරකම 1.2.2 : " කටු අකුලක මල වුව මැන"

කාලය : මිනිත්තු 40 යි.

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 1.2.2.1 ඇතුළත් ගීතය
- ඇමුණුම 1.2.2.2 සිද්ධි අධ්‍යයනය අඩංගු කාර්ය පත්‍රිකා 04
- ලියන කඩදාසි, පෑන්

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 1.2.2.1 :
- ඇමුණුම අංක 1.2.2.1 ඇතුළත් ගීතය සවන් දීමට හෝ ගායනා කිරීමට සලස්වන්න.
- එයින් මතුවන අදහස පිළිබඳ ශිෂ්‍ය ප්‍රතිචාර විමසමින් පාඩමට පිවිසෙන්න.
- පහත සඳහන් කරුණු මතුවන සේ සාකච්ඡාවක් මෙහෙයවන්න.

> - සමාජය තුළ හිතකර මෙන් ම අහිතකර බලවේග ද ඇති බව
> - අයහපත් බලවේගවලට ගොදුරු වීම නිසා අයහපත් ප්‍රතිඵල ලැබෙන බව
> - හිතකර බලවේගවලට එකතුවීම තුළින් යහපත් ප්‍රතිඵල ලැබෙන බව

මිනිත්තු 10යි

පියවර 1.2.2.2 :
- සිසුන් කණ්ඩායම් 04කට බෙදන්න. ලියන කඩදාසි පෑන් කණඩායම් අතර බෙදා දෙන්න.
- ඇමුණුම අංක 1.2.2.2 ඇති කාර්ය පත්‍රිකා කණ්ඩායම්වලට ලබා දී සිසුන් අදාළ කාර්යයෙහි නිරත කරවන්න.

මිනිත්තු 15යි

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

පියවර 1.2.2.3 :

- කණ්ඩායම් වාර්තා පන්තියට ඉදිරිපත් කරවන්න.
- සෙසු කණ්ඩායම්වල සංවර්ධනාත්මක යෝජනා විමසන්න. ඌණ පූරණයේ යෙදෙන්න.
- පහත කරුණු මතුවන සේ සමාලෝචනයේ යෙදෙන්න.

- සමාජය තුළ පවත්නා හිතකර අහිතකර ලවේග වලට ගොදුරු වීම නිසා ලැබෙන ප්‍රතිඵල යහපත් හා අයහපත් වන බව
- අහිතකර බලවේගවලට ගොදුරු වීම තුළින් තමා පිරිහීමට පත්වන බව
- හිතකර බලවේගවලට එකතුවීම තුළ තමා දියුණුවට පත් වන බව
- හිතකර හා අහිතකර බලවේග හඳුනා ගෙන හිතකර බලවේග ජීවිතයට ළංකර ගැනීම හා අහිතකර බලවේගවලින් ඈත්වීම කළ යුතු බව.
- සමාජ සංකීර්ණත්වය තුළ අහිතකර බලවේගවල ක්‍රියාකාරීත්වය වැඩි බැවින් විචාරශීලී ව හා නිර්මාණශීලී ව කටයුතු කිරීම වැදගත් බව.

මිනිත්තු 15යි

තක්සේරුව හා ඇගයීම

- හිතකර බලවේග හා අහිතකර බලවේග ලියා දක්වයි.
- හිතකර බලවේගවලට එකතුවීම තුළීන් ලැබෙන ප්‍රතිඵල අගය කරයි.
- අහිතකර බලවේගවලට ගොදුරු වීමෙන් ලැබෙන අහිතකර ප්‍රතිඵල පිළිබඳ පන්තියේ කථා කරයි.
- හිතකර බලවේග ඔස්සේ ජීවිතය සකස් කර ගැනීමට උනන්දු වෙයි.
- අහිතකර බලවේගවලට ගොදුරු වූවන් එයින් මුදවා ගැනීමට කටයුතු කරයි.

පසුවැඩ :- විෂම බලවේගවලට ගොදුරුවී විනාශ වූ පුද්ගලයෙක් ඉන් මුදවා ගැනීම පිළිබිඹු වන නාට්‍යයක් පන්තියේ රඟදක්වන්න.

ඇමුණුම් අංක 1.2.2.1

මල්ලියෙ නරක මිතුරන් පිළිගන්න එපා
නංගියෙ නොහොබිනාකම් හුරුවෙන්න එපා
බෝගම්බර සිපිරි ගෙදරට එන්න එපා
සතුරෙකුටවත් මට වන් දුක වෙන්න එපා

දළඳා මැදුරෙ තේවා හඬ රැව් දෙනවා
කළ පව් මතක් වී දෑස ම තෙත් වෙනවා
සියක් වාරයක් මැරී මැරී උපදිනවා
තිබහට වතුර වෙනුවට කඳුලැලි බොනවා

ලැබුවේ අවවාද නොහොබින ආරකය
දුදනන් නිසා විය සෙනසුරු මාරකය
මං පෙර ගියේ වරදින් පිරි පාරකය
ඒ ගිය මගේ අවසානය පෝරකය

ගායනය :- විශාරද සුනිල් එදිරිසිංහ

ඇමුණුම අංක 1.2.2.2

පහත සිද්ධියේ දැක්වෙන පුද්ගලයන් දෙදෙනා අතීතයේ එකම පාසලේ එකම පන්තියේ ඉගෙන ගත් දක්ෂ ශිෂ්‍යයන් දෙදෙනෙකි. ඔවුන්ගේ වර්තමාන ජීවිත පිළිබඳ පහත විස්තර දැක් වේ.

| සුනිල් | නිමල් |
|---|---|
| * හොඳින් අධ්‍යාපනය නිම කර ඇත. | * අධ්‍යාපනය අතර මග කඩාකප්පල් කර ගෙන ඇත. |
| * ස්ථිර ආදායම් මාර්ගයක් ඇත | * ස්ථිර ආදායම් මාර්ගයක් නැත |
| * යහපත් සෞඛ්‍ය තත්ත්වයකින් යුතු අයෙකි | * පිරිහුණු සෞඛ්‍ය තත්ත්වයකින් යුතු අයෙකි. |
| * සමාජ ශුභ සාධක කටයුතුවල දී ප්‍රමුඛ ව කටයුතු කරයි. | * සමාජ ශුභ සාධක කටයුතු වලදී පසුබට බවක් දක්වයි. |
| * සමාජ ගෞරවය ලබමින් සතුටින් ජීවත් වෙයි. | * අඟහිඟකම් අඬදබර මැද අසහනයෙන් ජීවත් වෙයි. |
| * පවුල් ජීවිතය සාර්ථක ය | * පවුල් ජීවිතය අසාර්ථක ය. |

- මෙම පත්‍රිකාව කියවා සුනිල්ගේ ජීවිතය යහපත් වීමට බලපෑ හිතකර බලවේග ඔබට සිතෙන පරිදි කවර ඒවා විය හැකි ද?
- නිමල්ගේ ජීවිතය අයහපත් වීමට බලපෑ අහිතකර බලවේග මොනවා ද?
- නිමල්ගේ ජීවතය යහපත් මාර්ගයට යොමු කර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග යෝජනා කරන්න.

කණ්ඩායම් වශයෙන් සාකච්ඡා කර ඔබේ අදහස් යොජනා ලියා දක්වන්න.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 1.0 : ආත්මාවබෝධයෙන් කටයුතු කරයි.

නිපුණතා මට්ටම : • නිවැරදි ජීවන අරමුණක් කරා තම ජීවිතය මෙහෙයවයි.

ක්‍රියාකාරකම 1.3.1 : "දැන ගෙන යන්නෝ හරි මග යන්නෝ"

කාලය : මිනිත්තු 40 යි.

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම් අංක 1.3.1.1 අඩංගු පාඨය
- ඇමුණුම අංක 1.3.1.2 අඩංගු සටහනේ පිටපත් (ශිෂ්‍ය සංඛ්‍යාවට ප්‍රමාණවත් පරිදි )
- ලියන කඩදාසි, පෑන්

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 1.3.1.1 :
- ඇමුණුම අංක 1.3.1.1 හි අඩංගු වැකිය පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- එයින් මතුවන අදහස පිළිබඳ ශිෂ්‍ය ප්‍රතිචාර විමසමින් පාඩමට පිවිසෙන්න.
- පහත සඳහන් කරුණු ඉස් මතුවන සේ සමාලෝචනයක යෙදෙන්න.

> - ගමනක් යාමේ දී අප යන්නේ කොතැනට ද යන අරමුණ ඇති ව ගමන ආරම්භ කිරීම වැදගත් බව.
> - ඒ අනුව ජීවන ගමන ද එසේ අරමුණක් ඇති ව යා යුතුබව.
> - අරමුණක් ඇතිව යන ගමන සාර්ථක වන බව

මිනිත්තු 10යි

පියවර 1.3.1.2 :
- ඇමුණුම 1.3.1.2 කණ්ඩායම්වලට බෙදා දෙන්න. ලියන කඩදාසි පෑන් ලබා දෙන්න.
- සිසුන් අදාළ කාර්යයෙහි නිරත කරවන්න.

මිනිත්තු 15යි

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

පියවර 1.3.1.3 :
- සිසු අදහස් පන්තියට ඉදිරිපත් කරවන්න.
- සංවර්ධනාත්මක යෝජනා ඉදිරිපත් කරමින් ඌණ පූරණයේ යෙදෙන්න.
- පහත කරුණු මතු වන සේ සමාලෝචනයේ යෙදෙන්න.

- සාර්ථක ජීවිතයකට අරමුණක් තිබිය යුතු බව හා අවශ්‍ය බව.
- අරමුණු සහිත ජීවිතය අර්ථ සම්පන්න බව හා ඒ තුළින් ඉලක්කය කරා යා හැකි බව.
- අරමුණු කරා ලඟ වීමට බොහෝ කැප කිරීමක්, අධිෂ්ඨානයක් තිබිය යුතු බව
- අරමුණු කරා යාමට යම් යම් ක්‍රියා පටිපාටි අනුගමනය කළ යුතු බව
- එම ක්‍රියා පටිපාටි ප්‍රමුඛතා අනුව හඳුනා ගෙන ඒ අනුව කටයුතු කළ යුතු බව

මිනිත්තු 15යි

තක්සේරුව හා ඇගයීම

- එකිනෙකාගේ ජීවිත අරමුණු විවිධ බව හඳුනා ගනියි.
- ජීවිතයට අරමුණක් තිබීමේ වැදගත්කම අගය කරයි.
- තමන්ගේ ජීවන අරමුණු ගොඩ නගයි.
- ජීවන අරමුණු කරා ළගා වීමේ ක්‍රියා පටිපාටි අනුගමනය කරයි.
- ඇසුරු කරන අයට නිවැරදි ජීවන අරමුණු ගොඩනගා ගැනීමට සහාය වෙයි.


පසුවැඩ :- තමන්ගේ ජීවන අරමුණු සටහන් කර ඒවා කරා යාමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටි ලියා දක්වන්න. දිනෙන් දින ඒවා අනුගමනය කරමින් අඛණ්ඩව ප්‍රගතිය සටහන් කරන්න.

ඇමුණුම අංක 1.3.1.1

**දැන ගියොත් කතරගම නොදැන ගියොත් අතරමග**

ඇමුණුම අංක 1.3.1.2

පහත දැක්වෙන්නේ ඔබේ ඉදිරි ජීවන අරමුණු පිළිබඳ ඔබට සිතා බැලීමට ලබා දෙන අවස්ථාවකි. ඔබ හොඳින් කල්පනා කර ඔබේ ඉදිරි ජීවන අරමුණු මේ සටහනේ රවුම් තුළ ලියා දක්වන්න. ඔබේ ජීවන අරමුණු වැදගත්කම අනුව අංක යොදා ප්‍රමුඛතාව දෙන්න. ( 1, 2, 3, . . . . ආදී වශයෙන් ) රවුම්වලට සම්බන්ධ කඩ ඉරි මත, අරමුණු කරා ළගා වීමට ඔබ කළ යුතු දේ ලියා දක්වන්න.




ඔබේ ජීවන අරමුණු වැදගත්කම අනුව අංක යොදා ප්‍රමුඛතාව දෙන්න. ( 1, 2, 3, . . . . ආදී වශයෙන් ) අරමුණු කරා ළගා වීමට ඔබ කළ යුතු දේ එහි ලියා දක්වන්න.

නිපුණතාවය 1.0 : නිවැරදි ජීවන අරමුණක් කරා තම ජීවිතය මෙහෙයවයි.

නිපුණතා මට්ටම : • ආකර්ෂණීය විවධ දෑ හඳුනා ගනිමින් තමාට උචිත දෑ කෙරෙහි පමණක් යොමු වෙයි.

ක්‍රියාකාරකම 1.3.2 : "දැරිය හැකි ජීවන ක්‍රමයක් "

කාලය : මිනිත්තු 40 යි.

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම් අංක 1.3.2 ගීතය
- ඇමුණුම අංක 1.3.2 ගවේෂණ උපදෙස් පත්‍රිකාව
- ඩිමයි, මාකර් පෑන්
- ලියන කඩදාසි

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 1.3.2.1 :
- ඇමුණුම අංක 1.3.2 ඇතුළත් ගීතය සුදුසු ශිෂ්‍යයකු/ශිෂ්‍යාවක ලවා පන්තය ඉදිරියේ ගායනා කරවන්න.
- රසකැවිලි විසිතුරු සෙල්ලම් බඩු, දැක දරුවා ඉවත බලා ගෙන යන්නේ ඇයි? ආදී වශයෙන් ප්‍රශ්න විමසමින් සිසු සිසුවියන් ගීතයේ අරුත් රසය වින්දනයට යොමු කරන්න.
- පහත සඳහන් කරුණු ඉස් මතුවන සේ සාකච්ඡාව මෙහෙයවන්න.

> - ආකර්ෂණීය විවිධ දෑ හඳුනා ගැනීම ඔස්සේ සෞන්දර්යාත්මක මනසක් සංවර්ධනය වන බව.
> - රස වින්දනාත්මක හැකියාවන් වර්ධනය කර ගැනීමෙන් ආතතිය සමනය කිරීමේ ක්‍රමයක් ප්‍රගුණ වන බව.
> - අපේ ආර්ථික හැකියාව, ප්‍රයෝජනවත් බව වැනි සාධක අනුව මිල දී ගැනීම්/ ලබා ගැනීම් පිළිබඳ තීරණ ගත යුතු බව.
> - ආශාවන්ට/රැල්ලට/ බලපෑම්වලට වහල් වී තීරණ නොගත යුතු බව.

මිනිත්තු 10යි

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

පියවර 1.3.1.2 :

- සෑම ළමයෙකුට ඇමුණුම 1.3.2.2 හා ලියන කඩදාසි එක බැගින් දෙන්න.
- කණ්ඩායම්වලට ඩිමයි කොළ හා මාකර් පෑන් බෙදා දෙන්න.
- ගවේෂණයේ මුල් කොටස ආත්ම ගවේෂණය වන අතර එය තනිතනිව කළ යුතු බව පහදා දෙන්න. ඒ සඳහා සිසුන් යොමු කරවන්න. ඇමුණුම 1.3.2.2 අදාළ කර ගන්න.
- ගවේෂණයේ දෙවන අදියර කණ්ඩායම් ක්‍රියාකාරකමක් වන බව දන්වා සිසුන් කණ්ඩායම් කර ක්‍රියාකාරකමේ නිරත කරවන්න.
- ගවේෂණ ආකාර දෙකේ ම ඉදිරිපත් කිරීම්,
    - නූල් ඇද/ බිත්තියේ ඇලවීම ඇසුරෙන් ප්‍රදර්ශනය - (කේවල ක්‍රියාකාරකම)
    - කණ්ඩායම් ඉදිරිපත් කිරීම් වශයෙන් සිදු වන බව දන්වා, සිසුන් ගවේෂණයේ යොදවන්න.
- ඉදිරිපත් කිරීම් සඳහා සූදානම් කරවන්න.

මිනිත්තු 10යි

පියවර 1.3.1.3 :

- තනි තනිව ලියූ කොල (ලණුවල) නූල් වැල් වල එල්ලීම හෝ බිත්තියේ ඇලවීම මගින්) පන්තියේ ප්‍රදර්ශනය කරවන්න.
- කණ්ඩායම් ඉදිරිපත් කිරීම්වලට ඉඩ සලසන්න.
- කෙටි කාලීනව ලබා ගැනීමට තීරණය කළ/නොකළ දෑ සහ හේතු ඉදිරිපත් කිරීමට උනන්දු වන්න.
- කණ්ඩායමේ අයට පළමු ඌණ පූරණය සඳහා අවස්ථාව දෙන්න.
- සෙසු කණ්ඩායම්වල සංවර්ධනාත්මක යෝජනා විමසන්න.
- පහත කරුණු මතු වන සේ සමාලෝචනයේ යෙදෙන්න.

- කාර්මික දියුණුවත් සමග භාණ්ඩ නිෂ්පාදනය ඉහළ ගොස් ඇති බව.
- වෙළඳ පොළ අප ආකර්ෂණය කර ගැනීමට සමත් විවිධ නිෂ්පාදනවලින් පිරී ඇති බව.
- අප ආකර්ෂණය වන හැම දෙයක් ම මිල දී ගැනීමට, අපේ ආදායම ඇතුළු (සාධකවල) සීමිත බව නිසා අසීරු වන බව.
- ඒ නිසා අප ආකර්ෂණය කර ගන්නා දේවලින්, අප ලබා ගත යුතු දේවල් මොනවා ද? යන්න පිළිබඳ අපේ ආර්ථික ශක්තිය ඇතුළු හැකියා මත තීරණය කිරීමට සිදු වන බව.

- තේරීම් කිරීමේ දී හැඟීම්වලට වඩා බුද්ධියට/ප්‍රඥාවට මුල් තැන දීමට සිදු වන බව.
- සමහර විට මෙය මුල දී මෙම තේරීම් කිරීම වේදනාකාරී බව දැනුනත් ක්‍රමයෙන් උචිත දේ පමණක් ලබා ගැනීම පහසු වන බව

- අප ආකර්ෂණය වන දේ අතරින් හරසුන් දේ හඳුනා ගෙන හරවත් දේ තෝරා බේරා ගැනීමට තරම් ප්‍රඥාව දියුණු කර ගත යුතු බව

මිනිත්තු 10යි

තක්සේරුව හා ඇගයීම

- තමා ආකර්ෂණය කර ගන්නා දේ නම් කරයි.
- තමා කැමති හැම දෙයක් ම උචිත දේ නොවිය හැකි බව පිළි ගනියි.
- තමා කැමති දේ අතරින් උචිත දේ තෝරා ගැනීමේ නැඹුරුව විදහා දක්වයි.
- ප්‍රයෝජනවත්/ප්‍රයෝජනවත් නොවන හරවත්/හරසුන් දේ එකිනෙකින් වෙන්කර දක්වයි.
- තම (හිතවතුන් ) සම පදාස්ථයන් ප්‍රයෝජනවත්/හරවත් තේරීම් සඳහා උනන්දු කරයි.

ඇමුණුම අංක 1.3.2.1

රජ මැදුරක ඉපදී සිටියානම් නුඹත් රජෙකි පුතුනේ
හිරිකඩ බාගෙන පොල් අතු ඉගිලෙයි අද නුඹෙ සිරි යහනේ
හීනෙන් හිනා නොවී මා හඬවාපන් මේ රෑ යාමේ

පුංචි පැටික්කන් මගදිග හඬවන සිල්ලර රස කැවිලි
දිවයන ඉගිලෙන විසිතුරු සෙල්ලම් යානා පෙනී පෙනී
ඉවත බලා ගෙන මග දිග යන විට නෑ හිත වාවන්නේ
හීනෙන් හිනා නොවී මා හඬවාපන් මේ රෑ යාමේ

ඉඳහිට මොලවන ලිපත් දනී පුත කැඳ රස සුනු සහලේ
දිව බොජුනක් සේ දිවගා ඇල්මෙන් අකුරට දිවයන්නේ
ඇඳලා කල් රෙදි වැරලී නෑ හිත වාවන්නේ
හීනෙන් හිනා නොවී මා හඬවාපන් මේ රෑ යාමේ

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

ගායනය; විශාරද මාලනී බුලත්සිංහල මහත්මිය

ඇමුණුම 1.3.2.2

## ගවේෂණ උපදෙස්

දැරිය හැකි ජීවන ක්‍රමයක්

**පළමු ක්‍රියාකාරකම (කේවල)**

තමාගේ කැමති අනුව දී ඇති කොළයේ හතරට නමා කොලයේ දෙපැත්තේ එක් කොටුවේ පහත තොරතුරු සටහන් කරන්න.

- තමා කැමති කෑම
- තමා කැමති බීම
- තමා කැමති ඇඳුම් පැළඳුම්
- තමා කැමති සෙල්ලම් බඩු
- තමා කැමති පොත්
- තමා කැමති පත්තර
- තමා කැමති ගුවන් විදුලි වැඩ සටහන්
- තමා කැමති රූපවාහිනී වැඩ සටහන්

ඔබ සඳහන් කළ දේ අතුරින් ඔබට එය කෙටි කාලයකින් නැතහොත් (දවසකින්, සතියකින්, මාසයකින් ) ලබා ගත හැකි ඒවා හරි ලකුණකින් සලකුණු කරන්න.

- කෙටි කාලීනව ලබා ගත හැකි ඒවා ලබා ගන්නා ආකාරය සිතා බලන්න.
- කෙටි කාලීනව ලබා නොගන්නා බව සිතූ දෑ එසේ කිරීමට හේතු සිතා බලන්න.

**දෙවන ක්‍රියාකාරකම**

- ගවේෂණයේ දෙවන අදියර සඳහා ඔබට අයත් කණ්ඩායමට යන්න.
- එම කණඩායම් හතර පහත සඳහන් අයුරින් සැකසෙන්න.

  කණඩායම්

  - තමා කැමති කෑම හා පොත්
  - බීම හා පත්තර
  - ඇඳුම් පැළඳුම් හා ගුවන් විදුලි වැඩ සටහන්
  - සෙල්ලම් බඩු හා රූපවාහිනී වැඩ සටහන්

- ඔබේ අදහස් කණ්ඩායමේ මාතෘකා කට්ටලය අනුව සුදුසු ඉදිරිපත් කිරීමක් උදෙසා ගොනු කරන්න.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 2.0 පෞරුෂ සංවර්ධනය උදෙසා විවේකය උපයෝගී කර **ගනියි.**

හැඳින්වීම

ජීවත්වීම කවර වයස් මට්ටමක සිටිය ද, පුද්ගලයන් සෑම දෙනා ම විවිධාකාර වශයෙන් කුමන හෝ කාර්යයක යෙදෙන බව අපි දනිමු. නොකඩවා කාර්යයන්හි නියුතු වීම නිසා පුද්ගලයන් තුළ ඇතිවන කායික මානසික විඩාව දුරු කර ගැනීමට ද, නව ජීවයකින් යුතුව නැවත වැඩ ආරම්භ කිරීමට ද විවේකය අත්‍යවශ්‍ය වේ. විවේක කාලය ඵලදායීව ගත කරන ආකාරය ද එසේ ගත කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන ද පිළිබඳ දැනුවත් වීම නිසා ද අර්ථවත්ව විවේක කාලය ගත කිරීමට හැකි වේ. දෛනික වැඩ සැලසුම් කිරීමේ දී වවේකය පිළිබඳව සැලකිලිමත්විය යුතු අතර, විවේක කාලය තුළ ක්‍රීඩා හා විනෝදාංශ මෙන් ම සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්වල ද යෙදිය හැකි ය. ඵලදායී විවේකයක් තුළ දිගු කාලීන සතුටක් ලැබිය යුතු ය.
මෙම පරිච්ඡේදය මගින් පෞරුෂ සංවර්ධනය සඳහා විවේකය උපයෝගි කර ගන්නා ආකාරය ඔබට අත්විඳිමට අවස්ථාව සැලසේ.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතා මට්ටම්

2.1 ක්‍රීඩා හෝ විනෝදාංශ වැනි කාර්යයන් හි යෙදෙයි.

- කාර්යයක විවිධ ලක්ෂණ
  - කරන කාර්යය පිළිබඳ පැහැදිලි අවබෝධයක් තිබීම
  - ඒ තුළින් මනා සැලසුමක් සකසා ගැනීම
  - සැලසුම් ක්‍රියාත්මක කරන්නේ කෙසේ ද? ඒ සඳහා තිබෙන පහසුකම් හා අවශ්‍ය දේ මොනවා ද? යන්න හඳුනා ගැනීම
- කරන කාර්යය තුළින් ලැබෙන ප්‍රයෝජන පිළිබඳ අවබෝධය
  - තමන්ට සහ අන් අයට ලැබෙන ප්‍රයෝජන

- විවේක අවස්ථාවල යෙදෙන ක්‍රීඩා හා විනෝදාංශ හා අලුත් අත්හදා බැලීම් සංයමයෙන් කළ යුතු වීම.
  - එම කාර්යයන්ගෙන් තමාට තෘප්තියක් ලැබිය යුතු අතර, අන් අයට ද සංයමයකින් යුතුව එය කළ හැකි බව
- විවේකය ලැබෙන ඕනෑම අවස්ථාවක ඵලදායී ලෙස ගත කිරීම වැදගත් බව

නිපුණතා මට්ටම

2.2 සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් ඇසුරෙන් සමබර පෞරුෂයක් ඇති කර ගනියි.

- විනෝදය හා වින්දනය
  - තමන්ටත් අන් අයටත් හානි නොවන විනෝදාංශ තෝරා ගැනීම.
  - ශාරීරික හා මානසික සෞඛ්‍යයට හානිදායක නොවන ආකාරයෙන් වින්දනය ලැබීම.
- චිත්තවේග ප්‍රකාශනය
  - තම ආවේග නිර්මාණාත්මකව ප්‍රකාශ කිරීම සඳහා සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්හි නිරත වීම හා ඒ තුළින් ලැබෙන ජීවිතාබෝධය

නිපුණතාව : පෞරුෂ සංවර්ධනය උදෙසා විවේකය උපයෝගී කර ගනියි

නිපුණතා මට්ටම : ක්‍රීඩා හා විනෝදාංශ වැන කාර්යයන්හි යෙදෙයි.

ක්‍රියාකාරකම : " සැහැල්ලුවෙන් නිමේෂයක් "

කාලය : මිනිත්තු 40

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම් 2.1.1.1 - බැලුන් චිත්‍රය
- ඇමුණුම් 2.1.1.2 - බහාලුම්
- ඇමුණුම් 2.1.1.3 - ක්‍රීඩාව සඳහා උපදෙස්

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 2.1.1.1 :
- ඇමුණුම 2.1.1ට සිසුන්ට බෙදා දෙන්න.
- සිසුන් ක්‍රියාකාරකමෙහි යොදවන්න.
- පහත දැක්වෙන කරුණු ඉස්මතු වන පරිදි සාකච්ඡාවක් මෙහෙයවන්න.

> - විවේක කාලය ඵලදායීව ගත කිරීමට කළ හැකි ක්‍රීඩා විනෝදාංශ රාශියක් ඇති බව.
> - එවැනි විනෝදාංශ තෝරා ගෙන අප ද ඒවායේ යෙදවිය යුතු බව.
> - ඵලදායී ක්‍රීඩා/විනෝද කාර්යවල යෙදීමෙන් ශාරීරික හා මානසික සෞඛ්‍යය තත්ත්වය යහපත් වන බව.
> - ක්‍රීඩාව තුළින් සතුට, දැනුම, නායකත්ව හා පෞරුෂ ගුණාංග වර්ධනය වන බව.

මිනිත්තු 10 යි

පියවර 2.1.1.2 :
- පන්තියේ සිසුන් ක්‍රීඩා පිට්ටනිය වැනි නිදහස් තැනකට ගෙන යන්න.
- ඇමුණුම 2.1.2 හි සඳහන් ක්‍රීඩාවේ සිසුන් යොදවන්න.

මිනිත්තු 10 යි

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

පියවර 2.1.1.3 : • ඇමුණුම 2.1.3 සිසුන්ට බෙදා දෙන්න.
• සිසුන් ක්‍රියාකාරකමේ යොදවන්න.
• සිසුන් ඉදිරිපත් කරන කරුණු අනුව සාකච්ඡාවක මෙහෙයවන්න.
• පහත දැක්වෙන කරුණු ඉස්මතු වන පරිදි සමාලෝචනයක යෙදෙන්න.

- එදිනෙදා ජීවිතයේ දී ලැබෙන විවේකය ඵලදායීව ගත කළ යුතු බව.
- විවේකය ගත කිරීම සඳහා ක්‍රීඩාව යොදා ගත හැකි බව.
- ක්‍රීඩාව නිසා කායික හා මානසික වර්ධනය සිදු වන බව.
- ක්‍රීඩාව මගින් ජය පරාජය විඳ ගැනීම තීරණ ගැනීම, සංවේදී බව ඇති කර ගැනීම උගත හැකි බව.
- ලැබෙන විවේකය ඵලදායව ගත කිරීමෙන් දැනුම, සතුටක් හා විනෝදයක් ලැබිය හැකි බව.

මිනිත්තු 20 යි

## තක්සේරුව හා ඇගයීම

- ක්‍රීඩාවේ යෙදීමෙන් ලැබෙන ප්‍රයෝජන නම් කරයි.
- ක්‍රීඩාව වවේකය ගත කිරීමේ හොඳ මාධ්‍යයක් බව පිළිගනිමින් අදහස් දක්වයි.
- ක්‍රීඩාවල යෙදෙයි.
- ජය පරාජය විඳ ගැනීමට හුරුවෙයි.
- සහයෝගයෙන් එදනෙදා කටයුතුවල නිරතවෙයි.
- පාසලේ, පළාතේ, දිස්ත්‍රික්කයේ හා ජාතික ක්‍රීඩා කණ්ඩායම් නියෝජනය කරයි.

ඇමුණුම 2.1.1.1

- ඔබට සපයා ඇති පින්තූරය දැක්වෙන බැලුන් තුළ විවේක කාලය ගත කිරීම සඳහා කළ හැකි ක්‍රීඩාවන් ලියන්න.



ඇමුණුම 2.1.1.2

- පහත සඳහන් පින්තූර දෙකෙහි ඔබ විවේකය ගත කිරීමට යොදා ගන්නා ක්‍රීඩා ගෘහස්ථ ක්‍රීඩා හා එළිමහනේ කළ හැකි ක්‍රීඩා ලෙස වෙන වෙන ම සටහන් කරන්න.

ක්‍රීඩා

ගෘහස්ථ



එළිමහන්



Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඇමුණුම 2.1.1.3

- සිසුන් ක්‍රීඩා පිට්ටනියට හෝ නිදහස් තැනකට රැගෙන යන්න.
- සිසුන් රවුමක් වන සේ කණ්ඩායම් කරන්න.
- පහත සඳහන් ක්‍රීඩාවේ සිසුන් යොදවන්න.
- ක්‍රීඩාවේ නීති රීති සිසුන්ට පහදා දෙන්න.

නීති රීති

1. එක දෙක තුන හතර ලෙස ගනන් කිරීමට උපදෙස් දෙන්න.
2. හත කීම තහනම් ඒ වෙනුවට" ජබෝස් " යන වචනය යොදන්න.
3. හත හෝ හතේ වර්ගය හෝ හත යෙදෙන ඉලක්කම් වෙනුවට ජබෝස් යන වචනය කිවයුතු බව පවසන්න.

   උදා : 7, 14, 21 . . . . . . . .

   හෝ

   17, 27 . . . . වෙනුවට "ජබෝස් "
4. එම ඉලක්කම් කිවූ කෙනා ක්‍රීඩාවෙන් ඉවත්වන අතර නැවත එක දෙක ලෙස ගණන් කිරීම කරන්න.
5. අවසානය දක්වා සිසුන් ක්‍රීඩාවේ යොදවන්න.

ක්‍රීඩාව අවසානයේ පහත සඳහන් ප්‍රශ්න සිසුන්ගෙන් විමසන්න.

ප්‍රශ්න :- 1. ඔබ කුමක් කලේ ද?

2. ක්‍රීඩාව යොදා ගත හැකි කුමන කාර්යයන් සඳහා ද?

විවේකය ගත කිරීම සඳහා,

විනෝදය ලැබීමට ආදී වශයෙන් සිසුන්ගෙන් ලැබෙන පිළිතුරු අනුව විවේකය ඵලදායී වීමට ක්‍රීඩාව වැදගත් බව මත කර ගන්න.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතා : පෞරුෂ වර්ධනය උදෙසා විවේකය උපයෝගී කර ගනියි.

නිපුණතා මට්ටම : ක්‍රීඩා හෝ විනෝදාංශ වැනි කාර්යයන්හි යෙදෙයි.

ක්‍රියාකාරකම 2.1.2 : විවේකය සරු කරන අරුත්බර විනෝදය
කාලය : මිනිත්තු 40

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 2.1.2.1 - පෙළ පොත ඇසුරෙන් වචන සෙවීම
- ඇමුණුම .2.1.2..2 - ළමයා සහ කණ්ණාඩිය රංගනය
- ඇමුණුම 2.1.2.3 - ගැහැණු /පිරිමි/මල්/ පලතුරු/සත්තු/නගර ලිවීම

.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 2.1.2.1. :
- "විනෝදාංශ" යන වචනය කළු ලෑල්ලේ ලියන්න.
- ඒ පිළිබඳ සිසු ප්‍රතිචාර විමසමින් සිසුන් බුද්ධි කලම්බන සාකච්ඡාවක යොදවන්න.
- මතු වන සියලු අදහස් කළු ලෑල්ලේ කෙටියෙන් සඳහන් කරන්න.
- එම අදහස් ද පදනම් කර ගනිමින් පහත කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාවක යෙදෙන්න.

> - කායික මානසික වින්දනය සඳහා කරණු ලබන විවිධ ඵලදායී ක්‍රියාකාරකම් විනෝදාංශ යනුවෙන් හඳුන්වන බව.
> - විනෝදාංශ පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් විය හැකි බව.
> - අත්‍යවශයෙන් ම තම විනෝදාංශ තමාටත් අන්‍යයන්ටත් හානියක් නොවිය යුතු බව
> - සමාන විනෝදාංශ ඇති අයට එක්ව කටයුතු කළ හැකි බව.
> - වෙනස් වූ විනෝදාංශවල යෙදෙන අයගෙන් තමා නොදන්නා දේ උගත හැකි බව

මිනිත්තු 08යි

පියවර 2.1.2.2 :
- සියලු සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කීපයකට වෙන් කරන්න.
- ඇමුණුම 2.1.2.1 කාර්ය පත්‍රිකාව කණ්ඩායමකට එක බැගින් දී එම ක්‍රියාකාරකම සඳහා විනාඩි පහක් ලබා දෙන්න.
- ඇමුණුම 2.1.2.2 කාර්ය පත්‍රිකාව කණ්ඩායමකට එක බැගින් දී එම ක්‍රියාකාරකම සඳහා විනාඩි පහක් ලබා දෙන්න.
- ඇමුණුම 2.1.2.3 කාර්ය පත්‍රිකාව කණ්ඩායමකට එක බැගින් දී එම ක්‍රියාකාරකම සඳහා විනාඩි පහක් ලබා දෙන්න.
- ඉහත ක්‍රියාකාරකම් තුනේ දී තමන්ට දැනුනු හැඟීම් හා ඒ ඒ

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

ක්‍රියාකාරකමෙන් ලැබෙන ප්‍රයෝජන කණ්ඩායම එක් ව සාකච්ඡා කරන්න

මිනිත්තු 20 යි

පියවර 2.1.2.3 :
- කණ්ඩායම්වල අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- සිසුන් මීට පෙර දී ඇති විනෝදාංශවලින් ලැබෙන එක් ප්‍රයෝජනයක් කීමට ද සියලු සිසුන්ට අවස්ථාව දෙන්න.
- සිසු අදහස් ද පදනම් කර ගනිමින් පහත දැක්වෙන කරුණු අවධාරණය වන පරිදි සමාලෝචනයක යෙදෙන්න.

- විනෝදංශක යෙදීමෙන් ජීවිතයේ ඒකාකාරී බවින් මිදිය හැකි බව
- විනෝදාංශ මගින් සතුට මෙන් ම දැනුම, කුසලතා, මිත්‍රත්වය හා සහයෝගය ආදිය වැඩි දියුණු කර ගත හැකි බව
- පාසල් ඉගෙනුම් සම්පත් ඇසුරින් ද විනෝදාංශ නිර්මාණය කළ හැකි බව
- ඵලදායී නොවන විනෝදාංශවල යෙදීමෙන් කාලය, ශ්‍රමය හා සම්පත් නාස්ති වන බව
- ඵලදායී විනෝදාංංශ දිගු කාලීන ව ජීවිතයේ සාර්ථකත්වයට හේතු වන බව

මිනිත්තු 12 යි

## තක්සේරුව හා ඇගයීම

- ' විනෝදය ' අර්ථ දක්වයි.
- ඵලදායී විනෝදාංශවල යෙදීම ජීවිතයට ප්‍රයෝජනවත් වන බව හේතු දක්වමින් අනුමත කරයි.
- සහයෝගයෙන් යුතුව විනෝදාංශවල යෙදෙයි.
- ඵලදායී විනෝදාංශවලට යොමු වෙයි.
- මිතුරන් සමග එක් ව යහපත් විනෝදාංශවල යෙදෙමින් අත්දැකීම් හුවමාරු කර ගනියි.

ඇමුණුම 2.1.2.1

කාර්ය පත්‍රිකාව I                                                                                    කාලය විනාඩි 05 යි

- ඔබේ කණ්ඩායම දෙදෙනා බැගින් වෙන් වන්න.
- ඔබගේ ජීවන නිපුණතා පෙළ පොත ගෙන කැමති පිටුවක් පෙරළා ගන්න.
- එක් අයෙක් එහි තබෙන එක් වචනයක් කියා අනිකාට එය පෙන්වන්න.
- අනිකා එය සොයන තෙක් වචනය කියූ තැනැත්තා 1 - 50 ට ගණන් කරන්න.
- 50ට ගණන් කරන තෙක් එම වචනය සොයා ගැනීමට අනිකාට නොහැකි වුවහොත් වචනය කියූ තැනැත්තා ට 50ක් ලැබේ. ඊට අඩු සංඛ්‍යාවක දී වචනය සොයා ගත හොත් එම සංඛ්‍යාව ලැබේ. එම ලකුණු දෙදෙනා වෙන වෙන ම ලියා ගන්න.
- මේ ආකාරයට අලුත් පිටු පෙරලමින් මාරුවෙන් මාරුවට ලකුණු රැස් කරන්න.
- දෙදෙනා ම වාර පහක් කළ පසු ලකුණු එකතු කර බලන්න.

ඇමුණුම 2.1.2.2

කාර්ය පත්‍රිකාව 2                                                                                    කාලය විනාඩි 05යි

- දෙදෙනා බැගින් එක් ව මුහුණට මුහුණලා නැගිට සිටින්න.
- එක් අයකු ළමයා ලෙසින් ද අනිකා කණ්ණාඩිය ලෙසින් ද හඳුන්වා දෙන්න.
- ළමයාට සිටින තැනැත්තා කණ්ණාඩිය ඉදිරියේ සිට තමාට කැමති දෙයක් කරන්න.
- කණ්ණාඩිය ලෙස සිටින තැනැත්තා ඒ අනුව හැසිරෙන්න.
- ගුරුතුමා/ගුරුතුමී විසින් දෙනු ලන සංඥාව අනුව දෙදෙනා මාරුවී නැවත කරන්න.

ඇමුණුම 2.1.2.3

කාර්ය පත්‍රිකාව 3 කාලය විනාඩි 05යි

- කණ්ඩායමේ සියලු දෙනා ම තම සටහන් පොතේ පිටු දෙකක් ගෙන පහත දක්වා ඇති පරිදි වගුවක් සකස් කර ගන්න.

| ගැහැණු | පිරිමි | මල් | පලතුරු | එළවළු | සත්තු | නගර |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

- එක් අයෙකු විසින් කියනු ලබන අකුර මුලට යොදා ගෙන ඉහත වගුවට අදාළ නම් තනිව ම සිහිපත් කරමින් ඉක්මණින් ලියන්න. ( අවශ්‍ය නම් අ, ආ, ඇ, ඈ, ආදී ස්වර සහිත ව අකුර වෙනස් කරන්න.
- පළමුව ලියා නිම කළ තැනැත්තා ' stop ' යනුවෙන් කියූ පසු සෙස්සන් ලිවීම නවතා ඉතිරි වූ තැන්වලට ඉරි ගසන්න.
- සියලු දෙනා ම තමන් ලියූ පිළිතුරු ඉදිරිපත් කරමින් එක් එක් නිවැරදි පිළිතුර ළගින් ලකුණු දහයක් බැගින් ලියා ගන්න.
- එකම පිළිතුර දෙදෙනකු හෝ ඊට වැඩි දෙනෙකු ලියා තිබුණහොත් එයාට ලකුණු පහක් බැගින් ලියා ගන්න.
- සියලු දෙනා විසින් ම කියනු ලැබූ අකුරුවලින් එසේ ලියා අවසානයේ ලකුණු එකු කරන්න.

නිපුණතා : පෞරුෂ වර්ධනය උදෙසා විවේකය උපයෝගී කර ගනියි.

නිපුණතා මට්ටම : සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් ඇසුරින් පෞරුෂ සමබරතාවක් ඇතිකර ගනියි.

ක්‍රියාකාරකම 2.2.1 : "රස විදිමු ගී මියුරු"

කාලය : මිනිත්තු 40

ගුණාත්මක යෙදවුම් :

- ඇමුණුම 2.2.1.1 - ප්‍රවේශය සඳහා ගීතය " මේක සොදුරු ලෝකයක් "
- ඇමුණුම .2.2.1.2 - ගීත ඇතුළත් ප්‍රමාණවත් පිටපත් සංඛ්‍යාවක්
- ඇමුණුම 2.2.1.3
- ලියන කඩදාසි
- පෑන්

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 2.2.1.1. :

- සිසුන් පන්තියෙන් බැහැර ස්ථානයකට ගන්න.
- ඇමුණුම 2.2.1.1 හි සඳහන් ගීතය සිසුන්ට හඬ පටයකින් ඇසෙන්නට සලසමින් ඊට තාල තබමින් ගීතය ගයන්නට ඉඩ හැරීම හෝ ඇමුණුමෙහි සඳහන් ගීතය කණ්ඩායමක් වශයෙන් ගායනයට සැලැස්වීම.
- ඉහත ඉදිරිපත් කිරීම ඇසුරෙන් සිසුන්ගේ අදහස් විමසමින් පහත සඳහන් කරුණු ඉස්මතු කිරීම.

- හොඳ ගීත ඇසීමෙන් යහපත් වින්දනයක් ලැබෙන බව
- විවේක කාලය අර්ථවත් කිරීම සඳහා ගීත රස විඳීම කළ හැකි බව
- ගීත තුළ ඇති අර්ථය වටහා ගැනීමෙන් ආදර්ශයක්, පණිවිඩයක් ජීවිතයට එක් කර ගත හැකි බව
- අර්ථාන්විත හා මියුරු බවකින් යුත් ගීතයක් රස විඳීමෙන් මනස සුවපත් වන බව

මිනිත්තු 10යි

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

පියවර 2.2.1.2 : 

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් දෙකකට බෙදන්න.
- එක් එක් කණ්ඩායමට ඇමුණුම 2.2.3.2 , 2.2.3.3 අදාළ කාර්ය පත්‍රිකා ලබා දෙන්න.
- සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල යොදවන්න.
- කාර්ය පහසු කිරීමට අවශ්‍ය සහාය මග පෙන්වීම කරන්න.

මිනිත්තු 10යි

පියවර 2.2.1.3. : 

- කණ්ඩායම්වලට තම නිර්මාණාත්මක ක්‍රියාකාරකම ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- කණ්ඩායම්වලට තමන් ඉදරිපත් කළ ක්‍රියාකාරකම පිළිබඳ අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙන්න.
- දැනුම අත්දැකීම් හුවමාරුවන අයුරින් කණ්ඩායම් ක්‍රියාකාරකම් සන්සන්දනාත්මක ව සාකච්ඡා කරන්න.

- සිසුන් ඉදිරිපත් කළ ගායන හා රංගන ක්‍රියාකාරකම්වල අඩුපාඩු ඇත්නම් ඒවා පෙන්වා දෙමින් සංවර්ධනාත්මක අදහස් ඉදිරිපත් කරන්න.
- පහත සඳහන් කරුණු ගැන සැලකිලිමත් වෙමින් සමාලෝචනයක යෙදෙන්න.

| |
|---|
| • සෞන්දර්ය නිර්මාණ ඇසුරින් සියලු දෙනාට ම ප්‍රබෝධයක් ඇති වන බව.<br>• නිර්මාණකරණය මගින් ජීවිත අවස්ථා සෞන්දර්යාත්මකව දැකිය හැකි බව<br>• කෙටි කාලයක් තුළ සියලු දෙනාට ම නිර්මාණාත්මක අත්දැකීමක් ලබා ගැනීමට හැකි වූ බව<br>• නිර්මාණවලින් කියවුණ දේ හා ජීවිතය අතර සමීප සබඳතාවක් ඇති බව<br>• නිර්මාණ රස වින්දනයට හුරුවීමෙන් විවේකය ඵලදායී ලෙස ගත කළ හැකි බව<br>• නිර්මාණාත්මක ගීතයකට පුද්ගලයාට සමාජයේ යහපත් පුද්ගලයන් කළ හැකි බව<br>• කවි, ගීත, නාට්‍ය චිත්‍ර ආදී සෑම සෞන්දර්ය නිර්මාණයක් ම ඇසුරෙන් අපගේ දිවි මඟ අර්ථවත් වන බව |

මිනිත්තු 20යි

තක්සේරුව හා ඇගයීම

- රස වින්දනයට යෝග්‍ය වන නිර්මාණ නම් කරයි.
- විවේක කාලය අර්ථවත් කර ගැනීමට නිර්මාණ උපයෝගී කර ගත හැකි බව පිළිගනියි
- ගීතයක් ගායනා කරමින් රඟ දක්වයි.
- හොඳ නිර්මාණ තෝරා ගෙන මිතුරන් සමඟ රස විඳියි.
- උසස් වින්දනයෙන් යුක්ත ගීතයක්, කවියක් නිර්මාණය කිරීමට යොමු වෙයි.

පසුවැඩ :- | ඔබගේ සිත් ගත් ළමා ගී එකතු කොට පොත් පිංචක් තනන්න. |
|---|---|

ඇමුණුම 2.2.1.1

**මේක සොඳුරු ලෝකයක්**
**සතුටු සිනා පිරුණු සාදයක්**
**මහතුනේ රැගෙන යන්න ඉන්බිදක් .......//**

**ඇසට කඳුළු එපා සොඳුරු දසුන් බොදවී යාවි**
**ළයට සුසුම් එපා සෙනෙහෙ පැතුම් පිට වී යාවී**
**මහතුනේ ..........අපි නටමු ගයමු වයමු හිනා වී .........//**
**මේක සොඳුරු ලෝකයක් ......//**

**සුර ලෝකෙන් ඇදී සුරස පහස**
**නිබඳ හමා වී**
**පෙර පිනකින් අපේ මෙහෙම ලොවක උපත ලබා වී**
**මහතුනේ ........ අපි නටමු ගයමු වයමු හිනාවී**
**මේක සොඳුරු ලෝකයක් .....//**

ගායනය : - හර්ෂණ දිසානායක

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඇමුණුම 2.2.3.2

අදාළ කාර්ය පත්‍රිකාව

1 කණ්ඩායම - කාර්ය පත්‍රිකාව

වැහි පොද වැටිලා බිම්මල් පිපිලා
සුදු පාටට මුතු කුඩ ඉහලා //
සුදු මුතු කුඩ යට පැන පැන වට පිට
කඩියෙක් යනවා රජෙක් වගේ

කඩියට යන්නට පාර තියෙන කොට
කඩියට ඉන්නට ගෙයක් තියෙන කොට
කඩියට කන්නට කෑම තියෙන කොට
ඌ නම් මේ ලොව රජෙක් වගේ

පද රචනය : ස්වර්ණා ශ්‍රී බණ්ඩාර

ඇමුණුම 2.2.3.3

ක්‍රියාකාරකමට අදාළ උපදෙස්

1. කණ්ඩායමේ සියලු ම දෙනා එක්ව ගීතය කියවා අර්ථය වටහා ගන්න.
2. එම ගීතයෙන් කියවෙන සිද්ධිය රිද්මයානුකූල චලන භාවිතයෙන් රඟ දක්වන්න.
3. සිසුන් කීප දෙනෙකු ගීතය ගයන විට අනෙක් පිරිස ගීතය ගායනා කළ යුතු ය.

නිපුණතා : පෞරුෂ වර්ධනය උදෙසා විවේකය උපයෝගී කර ගනියි.

නිපුණතා මට්ටම : සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් ඇසුරින් පෞරුෂ සමබරතාවක් ඇතිකර ගනියි.

ක්‍රියාකාරකම 2.2.2 : කලා රසයෙන් වැඩේ දිවිමග

කාලය : මිනිත්තු 40

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 2.2.2.1 ට අදාළ "මා වවුලන් රෑ පුරා ම රංචු ගැසීලා " ගීතය
- ඇමුණුම 2.2.2.1ට අදාළ කාර්ය පත්‍රිකාව

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 2.2.2.1 :
- සිසුන් නිදහස් පරිසරයකට ගෙන යන්න.
- ඇමුණුම අංක 2.2.2.1 හි ඇතුළත් ගීතය හඬපටයක් මගින් වාදනය කරන්න. හෝ සංගීත ගුරු භවතකු මගින් සිසුන්ට ඉදිරිපත් කරන්න.
- සිසුන්ට දෙනෙත් පියා ගෙන ගීතය රසවිඳින්නට අවස්ථාව ලබා දෙන්න.
- අවස්ථා දෙකක් පමණ ගීතය රසවින්දනයට අවස්ථාව ලබා දෙන්න.
- එම ගීතය ඇසුරින් සිසුන් තුළ ඇති වූ හැඟීම් පිළිබඳව බුද්ධි කලම්බන සාකච්ඡාවක යෙදෙන්න. එහි දී පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාව පෝෂණය කරන්න.

> - දුක දනවන ගීතයක් මගින් වුව ද ජීවිතය පිළිබඳ පුළුල් අවබෝධයක් ලැබෙන බව
> - උසස් ගීතයක් ඇසීමෙන් රස විඳීමෙන් සිත තුළ ප්‍රබෝධයක් ඇති වන බව.
> - ගීතයක් ඇසීමෙන් සිතේ දුක කෝපය වැනි ආවේග පහව යන බව
> - දුක කෝපය, සතුට වැනි ආවේග පාදක කොට ගෙන උසස් සෞන්දර්ය නිර්මාණ කළ හැකි බව

මිනිත්තු 10යි

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

පියවර 2.2.2.2 :

- සිසුන් කණ්ඩායම් තුනකට වෙන් කරන්න. අදාළ කඩදාසි, පෑන් ලබා දෙන්න.
- ඇමුණුම් අංක 2.2.3.2 ගවේෂණ පත්‍රිකා කණ්ඩායම් වෙත ලබා දෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම්හි යොදවන්න.

මිනිත්තු 10යි

පියවර 2.2.2.3 :

- ශිෂ්‍ය නිමැවුම් ඉදිරිපත් කිරීමට කණ්ඩායම්වලට අවස්ථාව ලබා දෙන්න.
- ඉදිරිපත් කිරීම් සියල්ල එක්වර ම ඉදිරිපත් කිරීමට ද අවස්ථාව ලබා දෙන්න.
- ගීත ගායනය, චිත්‍රය, රංගනය පිළිබඳව ඇගයීමට කණ්ඩායම් සඳහා අවස්ථාව ලබා දෙන්න.
- ශිෂ්‍ය අදහස් අගයමින් හා ඉදිරිපත් කළ කණ්ඩායම් අගයමින් පහත කරුණු මතුවන සේ සමාලෝචනයක යෙදෙන්න.

- විවේකය තුළ අර්ථවත් විනෝදාංශවලට හුරුවීමෙන් ජීවිතය ඵලදායීව ගත කළ හැකි බව
- චිත්තවේග නිර්මාණාත්මකව ප්‍රකාශ කිරීමෙන් අපූර්ව වින්දනාත්මක නිර්මාණ බිහි වන බව ( චිත්‍ර, ගීත, කවි, නාට්‍ය, කතා )
- අර්ථවත් සෞන්දර්ය නිර්මාණ රස විඳීමට යොදා ගැනීමෙන් ජීවිතාවබෝධය ලැබෙන බව
- ප්‍රබෝධයෙන් යුතුව කටයුතු කරීමට සෞන්දර්ය ක්‍රියාකාරකම් ඉවහල් වන බව

මිනිත්තු 20යි

තක්සේරුව හා ඇගයීම

- චිත්තවේග නිර්මාණාත්මක ප්‍රකාශ කිරීමේ ක්‍රම ප්‍රකාශ කරයි.
- සෞන්දර්ය ක්‍රියාකාරකම්වල යෙදී ජීවිතය සාර්ථක කර ගැනීමට හැකි බව ඉවහල් වන බව පිළිගනියි.
- නිර්මාණයක් තුළින් මතුවන සෞන්දර්ය චමත්කාරය මතුකර දක්වයි.
- විවේකය තුළ ද නිර්මාණශීලීව අර්ථවත් සෞන්දර්ය ක්‍රයාකාරකම් හි යෙදෙයි.
- තමා ආශ්‍රිත සමාජ සමාජිකයින් ද අර්ථවත් සෞන්දර්ය ක්‍රියාකාරකම්වලට හවුල් කර ගනියි.

ඇමුණුම 2.2.4.1

මා වවුලන් රෑ පුරාම
රංචු ගැසීලා
මී ගස්යට මී වැහි වැහැලා
බාලේ මෙන් පාන්දරින්
ඇහිඳින්නට යන්නට බෑ
මට තනියක් දැනෙනවා........

දරට ගිහින් කුරුඳු කැලේ
මග වැරදීලා
මං එනතුරු හඬා වැටෙද්දී
නුඹට දැනුනු පාළුව දුක
මෙදා මටත් මලේ
නුඹ නැතිදා මට තනිකම දැනෙනවා
මා වවුලන් රෑ පුරාම....................

පැදුරු තොටේ තුරුළු වෙලා
ගොම්මන් යාමේ
හොල්මන් ගැන කථා කියද්දී
මගේ ඇගේ දැවටීගෙන අසා උන්නු මලේ
නුඹ නැතිදා මට තනිකම දැනෙනවා

ගායනය : විශාරද ඩබ්ලිව් ඩී. අමරදේව ශූරීන්

## කාර්ය පත්‍රිකාව

1. කණ්ඩායම
   ඉහත සඳහන් ගීතයේ කියැවෙන දේ පිළිබඳ ව ඔබ කණ්ඩායම චිත්‍රයක් නිර්මාණය කරන්න.
2. කණ්ඩායම
   ඔබ කණ්ඩායම ගීතයට සුදුසු පරිදි රංගනයක යෙදමට හුරු වී සූදානම් වන්න.
3 කණ්ඩායම
   ඉහත සඳහන් ගීතය ගායනය කරීමට කණ්ඩායම හුරුවන්න. ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

කාලය විනාඩි 10 ක් මේ සඳහා ලැබේ.

## 3.0 සාරධර්ම ගරු කරමින් ආදර්ශවත්ව කටයුතු කරයි.

හැඳින්වීම

සෑම පුද්ගලයකු ම තම ජීවිතය සාර්ථක කර ගැනීමට උත්සාහ කරයි. එසේ උත්සාහ ගැනීමේ දී ආර්ථික වශයෙන් ලබන වර්ධනය තුළින් පමණක් සාර්ථක පුද්ගලයකු බිහි නොවේ. සාර්ථක පුද්ගලයකු වන්නට නම්, සාර ධර්ම අගයන, ගරු කරන, පිළිපදින අයෙක් විය යුතු ය. සාර ධර්ම යනු පුද්ගලයා, සමාජය හා ජීවිතය සාරවත් කරන, පොහොසත් කරන හා අර්ථවත් කරන මානුෂික ගුණයකි. සත්ගුණ, ගුණධර්ම, පුරුෂාර්ථ, මිනිස්කම්, ආදියෙන් අදහස් කරන්නේ ද සාර ධර්ම යන්න ය. සාර ධර්මානුකූලව හැසිරෙන පුද්ගලයා සමාජයේ සම්මානයට පාත්‍ර වෙයි. යහපත් සමාජයක් ගොඩ නැගෙන්නේ තම සමාජයේ පවතින සාර ධර්ම හඳුනා ගෙන ඒවා පුද්ගලයන් විසින් දිවි පෙවෙතට උපයෝගී කර ගන්නේ නම් පමණි. ඒ සඳහා තමා ජීවත්වන නිවසේ දී සාරධර්ම හඳුනා ගෙන ඒවා ක්‍රියාත්මක කිරීම, පාසල හා පන්ති කාමරය තුළ සාර ධර්ම ක්‍රියාත්මක කිරීම සඳහා සිසුන් පෙළඹවීම අපේක්ෂිත ය. එසේ ම සාර ධර්ම අරමුණු කොට ගත් ආචාර ධර්ම අනුගමනය කිරීම තුළින් ලබන විපුල ඵල අත් විඳිමින් සාර්ථක පුද්ගලයකු ලෙස ආදර්ශවත්ව කටයුතු කිරීමට අවශ්‍ය නිපුණතා සංවර්ධනය කිරීම මෙම ඒකකයෙන් අපේක්ෂිත ය.

නිපුණතා මට්ටම්

**3.1 සාර්ථක දිවි පෙවෙතක් සඳහා සාර ධර්ම උපයෝගී කර ගනියි.**

- සමාජ යහ පැවැත්ම සඳහා සාර ධර්මවල අවශ්‍යතාව
  - සාරධර්ම අර්ථ දැක්වීම ( සාර ධර්ම යනු පුද්ගලයා, සමාජය හා ජීවිතය සාරවත් කරන, පොහොසත් කරන හා අර්ථවත් කරන මානුෂික ගුණයකි. ජීවිතය සාරවත් කරන්නේ සාර ධර්මය.)
  - සාර ධර්ම තුළින් යහපත් සමාජයක් ගොඩ නැගෙන අයුරු
  - පෞද්ගලිකව ගොඩ නගා ගත යුතු සාරධර්ම ( සත්‍ය ගරුක වීම, අවංක බව, කරුණාව, සාමය, සහයෝගය )
  - එක් එක් සාරධර්ම අනුගමනය කිරීම මගින් තමාට හා සමාජයට ලැබෙන ප්‍රතිඵල
- අප විසින් සුරැකිය යුතු හා ගරු කළ යුතු සාර ධර්ම
  - තමා ජීවත්වන සමාජයේ පවතින සාර ධර්ම ගවේෂණය කිරීම, ලැයිස්තු ගත කිරීම.
  - තමා අනුගමනය කරනු ලබන සාර ධර්ම පිරික්සමින් සමාජ සාර ධර්ම අනුගමනය කිරීම.
  - තමා අනුගමනය කරනු ලබන සාර ධර්ම පිරික්සමින් සමාජ සාරධර්ම අනුගමනය කිරීම.
  - පොදු දේපල හා පරිසරයට අදාළව සාර ධර්ම හඳුනා ගැනීම හා ආරක්ෂා කිරීම.
- පුද්ගල සංවර්ධනය උදෙසා සාර ධර්ම උපයෝගී කර ගැනීම
  - නිවෙස තුළ දී පැවතිය යුතු සාර ධර්ම (කතා බහ, ඇවතුම් පැවතුම්, හැසිරීම් ආදිය . . . . . )

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව : සාර ධර්ම ගරු කරමින් ආදර්ශවත්ව කටයුතු කරයි.

නිපුණතා මට්ටම : සාර්ථක දිවි පෙවෙතක් සඳහා සාර ධර්ම උපයෝගී කර ගනියි.

ක්‍රියාකාරකම 3.1.1 : සරුදම පිරි ලොව මනරම්

කාලය : මිනිත්තු 40

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 3.1.1.1 - කවි පන්තිය
- ඇමුණුම 3.1.1.2 - කාර්ය පත්‍රිකාව
- ලියන කඩදාසි
- පෑන්

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 3.1.1.1. :
- ඇමුණුම 3.1.1.1 "බෙදා හදා ගෙන කමු" කවි පන්තිය සිසුන් ලවා ගායනා කරවන්න.
- පැදි පෙළ සම්බන්ධ ප්‍රතිචාර විමසන්න.
- පහත සඳහන් කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාවක් මෙහෙයවන්න.

- බෙදා හදා ගැනීම, සහකම්පනය, සංවේදීබව, පරිත්‍යාගය, දයාව වැනි උසස් ගුණාංග සමාජයේ යහ පැවැත්මට හේතු වන බව.
- තමාගේත්, අන්‍යයින්ගේත් යහපතට හේතුවන මෙම උසස් ගුණාංග සාර ධර්ම යන නමින් හැඳින්වෙන බව.
- සාර ධර්ම පිළිපැදීම තුළින් සමාජයට යහපතක් වන අතර තමන් හට ආත්ම තෘප්තියක් ද ලැබෙන බව.

මිනිත්තු 10යි

පියවර 3.1.1.2. :
- පන්තියේ සිසුන් A, B, C, D ලෙස කණ්ඩායම් හතරකට බෙදන්න.
- නායකයින් පත් කර ගැනීමට සලස්වන්න.
- ඇමුණුම 3.1.1.2 සඳහන් අවස්ථා 4 වෙන වෙන ම කණ්ඩායම් හතරට දෙන්න.

මිනිත්තු 15යි

පියවර 3.1.1.3 :
- සිසුන් ක්‍රියාකාරකමෙහි යොදවන්න.
- නිරූපණය කරන ලද සාර ධර්ම කලුලෑල්ලේ පෙළ ගැන්වීමට උපදෙස් දෙන්න.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

- සියලුම කණ්ඩායම් තම රංගනයන් ඉදිරිපත් කළ පසු ඒවා විමර්ශනයට ලක් කරමින් ඌණ පූරණයක් කරන්න.
- පහත සඳහන් කරුණු මතුවන සේ සමාලෝචනයක යෙදෙන්න.

| |
|---|
| • සාර ධර්ම යනු පුද්ගලයා හා සමාජය සාරවත් කරන, අර්ථවත් කරන, මානුෂික ගුණාංග බව.<br>• සාර ධර්ම පිළිපැදීම තුළින් ආත්ම තෘප්තියක් මෙන් ම අන්‍යයින්ට යහපතක් ද වන බව.<br>• සාර ධර්ම ජීවිතය සුන්දර කර සමාජයේ යහපැවැත්ම ඇති කරන බව.<br>• සාර ධර්ම මගින් පාලනය කරනු ලබන ජීවිතයේ බොහෝ කාර්යයන් සාර්ථක වන බව. |

මිනිත්තු 15යි

## තක්සේරුව හා ඇගයීම

- සාර ධර්ම යනු මොනවාදැයි ප්‍රකාශ කරයි.
- තමාගේ මෙන් ම අන්‍යයින්ගේ ද යහපැවැත්මට සාර ධර්ම අවශ්‍ය බව පිළිගනියි.
- ඒ ඒ අවස්ථාවන්ට අදාළ සාර ධර්ම සුරකියි.
- එදිනෙදා ජීවන කටයුතුවල දී සාර ධර්ම වලට මුල් තැන දෙයි.
- සමාජයේ යහපැවැත්ම සඳහා සාර ධර්මානුකූලව ඇපකැප වෙයි.

පසුවැඩ :- ඔබ ජයග්‍රාහී ක්‍රීඩා කණ්ඩායමක නායකයා යයි සිතන්න. පරාජයට පත් වූ පිළ අවමානයට අපහසුතාවට පත් කිරීමේ ප්‍රයත්නයක යෙදෙන පිලේ සෙසු සාමාජිකයින්ට සාර ධර්ම සුරකින නායකයකු වශයෙන් ඔබ දෙන උපදෙස් පෙළ ගස්වන්න.

ඇමුණුම 3.1.1.1

විවේකයක් එළ ඹුණා
පුංචි පැටව් රොක් වුණා
කෑම බඳුන් හිස් වුණා
හැම මුණෙ ම මල් හිනා

බී පන්තියෙ පස් ලිනා
සාගින්නෙන් ඇඹ රුනා
අනුන්ගේ දුක හඳු නනා
නෙත් යුවලක් තෙත් වුණා

වෙරළු ගෙඩිය හත් දෙනා
කෑ අන්දම සිහි වුනා
පාන් පෙත්ත ඇය ගෙනා
කැබලි දෙකට වෙන් වුනා

උපුටා ගැනීම
සුපහන් හැඟුමන් - සුමන චන්ද්‍රලතා ජයසුන්දර

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

කාර්ය පත්‍රිකාව

ඇමුණුම 3.1.1.2

**කාර්ය පත්‍රිකාව 01**

- ඔබේ කණ්ඩායමට පැවරෙන්නේ අන්තර් පුද්ගල සබඳතා පැවැත්වීමේ දී අවශ්‍ය වන සාර ධර්ම පිළිඹිඹු වන ලෙස භූමිකා රංගනයක් හෝ අභිරූපනයක් ඉදිරිපත් කිරීමයි. අන්තර් පුද්ගල සබඳතා පැවැත්වීමේ දී අවශ්‍ය සාර ධර්ම කීපයක් පහත දැක්වෙන අතර එම ලැයිස්තුවට තවත් සාර ධර්ම එකතු කරන්න.
- රංගනය සඳහා ඔබ කණ්ඩායමට ලැබෙන්නේ මිනිත්තු . . . . . . . කාලයකි.

අන්තර් පුද්ගල සබඳතා සඳහා අවශ්‍ය වන සාර ධර්ම

- සිනා මුසු මුහුණින් සිටීම
- ප්‍රසන්න ඉරියව් පැවැත්වීම
- ප්‍රිය වචන කථා කිරීම
- අවංකකම
- අපක්ෂපාතී බව
-
-
-
-

ඇමුණුම 3.1.1.2

**කාර්ය පත්‍රිකා අංක 02**

- ඔබේ කණ්ඩායමට පැවරෙන්නේ පරිසර සංවේදිතාවයට අදාළ සාර ධර්ම පිළිබිඹු වන ලෙස භූමිකා රංගනයක් හෝ අභිරූපනයක් ඉදිරිපත් කිරීමයි.
- පරිසර සංවේදිතාව සඳහා අවශ්‍ය සාර ධර්ම කීපයක් පහත දැක්වෙන අතර එම ලැයිස්තුවට තවත් සාර ධර්ම කීපයක් එකතු කරන්න.
- රංගනය සඳහා ඔබ කණ්ඩායමට ලැබෙන්නේ මිනිත්තු . . . . . ක කාලයකි.

පරිසර සංවේදිතාවයට අදාළ සාර ධර්ම

- ස්වභාවධර්මයට ආදරය කිරීම
- ස්වභාවධර්මය අගය කිරීම
- සතුන්ට කරුණාව දැක්වීම
- පරිසරයේ සොඳුරු බව ආරක්ෂා කිරීම.
-
-
-
-

**කාර්ය පත්‍රිකා අංක 03**

- ඔබේ කණ්ඩායමට පැවරෙන්නේ සෞඛ්‍යමත් ජීවිතටක් සඳහා අදාළ සාර ධර්ම පිළිබිඹු වන ලෙස භූමිකා රංගනයක් හෝ අභිරූපනයක් ඉදිරිපත් කිරීමයි.
- සෞඛ්‍යවත් ජීවිතයක් සඳහා අවශ්‍ය සාර ධර්ම කීපයක් පහත දැක්වෙන අතර එම ලැයිස්තුවට තවත් සාරධර්ම කීපයක් එකතු කරන්න.
- රංගනය සඳහා ඔබ කණ්ඩායමට ලැබෙන්නේ මිනිත්තු . . . . . ක කාලයකි.

සෞඛ්‍යවත් ජීවිතයකට අදාළ සාර ධර්ම

- පවිත්‍රතාවය
- ශරීර සුවතාවය
- නිතර සතුටින් සිටීම
- ක්‍රීඩාවක නිරත වීම
-
-
-

**කාර්ය පත්‍රිකා අංක 04**

- ඔබේ කණ්ඩායමට පැවරෙන්නේ ජීවිත සාර්ථකත්වයට අදාළ සාරධර්ම පිළිබිඹු වන ලෙස භූමිකා රංගනයක් හෝ අභිරූපනයක් ඉදිරිපත් කිරීම යි.
- ජීවිත සාර්ථකත්වය සඳහා අවශ්‍ය සාර ධර්ම කීපයක් පහත දැක්වෙන අතර එම ලැයිස්තුවට තවත් සාර ධර්ම කීපයක් එකතු කරන්න.
- රංගනය සඳහා ඔබ කණ්ඩායමට ලැබෙන්නේ මිනිත්තු . . . . . ක කාලයකි.

ජීවිත සාර්ථකත්වයට අදාළ සාර ධර්ම

- වගකීමෙන් කටයුතු කිරීම
- ලද දෙයින් සතුටු වීම
- දැනුම ගවේෂණය
- වේලාවට වැඩ කිරීම.
-
-
-

| | | |
|---|---|---|
| නිපුණතාව | : | සාර ධර්ම ගරු කරමින් ආදර්ශවත්ව කටයුතු කරයි. |
| නිපුණතා මට්ටම | : | සාර්ථක දිවි පෙවෙතක් සඳහා සාරධර්ම උපයෝගී කර ගනියි. |
| ක්‍රියාකාරකම 3.1.2 | : | යහ පැවතුම් දෙයි සැනසුම් |
| කාලය | : | මිනිත්තු 40 |
| ගුණාත්මක යෙදවුම් | : | • ඇමුණුම 3.1.2.1 චිත්‍රය<br>• ඇමුණුම 3.1.2.2<br>• පෑන්<br>• කඩදාසි |

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 3.1.2.1 :
- ඇමුණුම් අංක 3.1.2.1 සඳහන් සාර ධර්ම ඇතුළත් සිතුවම් පත්‍රිකාව සිසුන්ට ඉදිරිපත් කරන්න.
- එහි දැක්වෙන අවස්ථා පිළිබඳව සිසුන්ගෙන් විමසන්න.

> - නිවස, පාසල, පන්සල, පල්ලිය වැනි පූජනීය ස්ථාන වල දී මෙන් ම විවිධ සමාජමය අවස්ථාවල ද සාරධර්මානුකූල ලෙස හැසිරිය යුතු බව.
> - මිනිසත් බව තුළ සාර ධර්ම රැකීම අත්‍යාවශ්‍ය බව
> - සාර ධර්ම රැකීමෙන් යහපත් පුද්ගලයෙකු වීමට මඟ සැලසෙන බව

මිනිත්තු 10 යි

පියවර 3.1.2.2 :
- ඇමුණුම 3.1.2.2ට අදාළ පරිදි වගුවක් සකස් කර ගැනීමට සිසුන්ට උපදෙස් දෙන්න.

මිනිත්තු 15 යි

පියවර 3.1.2.3 :
- සිසුන් ලියූ කරුණු ඉදිරිපත් කරන්නට අවසථාව ලබා දෙන්න.
- එදිනෙදා ජීවින අවස්ථාවල දී ඒවා සාර ධර්ම ලෙස පිළිපැදීමට හේතු වූ විවිධ යහපත් කරුණු අගයන්න.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

- පහත සඳහන් කරුණු මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.

| |
|---|
| • පුද්ගල සංවර්ධනයට සාර ධර්ම සෑම අවස්ථාවකදී ම දායක වන බව<br>• සමාජයක යහ පැවැත්ම රඳා පවතින්නේ සාර ධර්ම සුරැකීම මත බව<br>• හැසිරීම, කතා කිරීම, ඇඳුම පැළඳුම භාවිත කිරීම පවා සාරධර්මානුකූලව සිදු කළ යුතු බව.<br>• 'සාරධර්ම' පිළිබඳ මනා අවබෝධයකින් හා සැබෑ ආකල්පයන් ගෙන් යුක්තව ක්‍රියා කළ යුතු බව. |

මිනිත්තු 15 යි

## තක්සේරුව හා ඇගයීම

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

- සමාජයේ යහ පැවැත්ම මෙන් ම පුද්ගල සංවර්ධනය සඳහා බලපාන සාර ධර්ම ප්‍රකාශ කරයි.
- සාර ධර්ම පිළිපැදීමෙන් ජීවිතය යහපත් වන බව පිළිගනියි.
- එක් එක් සාර ධර්ම පිළිපැදිය යුත්තේ ඇයි ද යන්නත් ඒවා ගරු කළ යුත්තේ ඇයි ද යන්නත් ලියා දක්වයි.
- එදිනෙදා ජීවිත අවස්ථාවල දී සාර ධර්ම සුරකිමින්, පිළිපදිමින් යහපත් පුද්ගලයකු බවට පත්වෙයි.
- නිවසේ දී, පාසලේ දී සමාජයේ දී සාර ධර්මානුකූල ලෙස හැසිරෙයි.

ඇමුණුම 3.1.2.1



ඇමුණුම 3.1.2.1

| සාරධර්ම | එසේ කළ යුත්තේ ඇයි?<br>ඔබේ අදහස් ලියන්න. |
|---|---|
| 1. මාපියන්ට ආදර ගෞරව දැක්වීම | |
| 2. ගුරුවරුන් හමුවෙහි ආචාරශීලී වීම | |
| 3. අන් අයගේ අදහස්වලට සවන්දීම හා ගරු කිරීම | |
| 4. කලට වේලාවට වැඩ කිරීමට පුරුදු වීම | |
| 5. තැනට උචිත ලෙස ඇඳුම් පැළඳුම් ඇඳීම | |

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 4.0 ජීවිත අවස්ථා හා සංසිද්ධි අනාවරණයට මෙන් ම ඵලදායි ඉගෙනුම සඳහා ද දත්ත හා තොරතුරු යොදා ගනියි.

කාලපරිච්ඡේද 06යි

හැඳින්වීම

සෑම කෙනෙකුට ම මුළු ජීවිත කාලය පුරා ම විවිධ අභියෝගවලට, ප්‍රශ්නවලට හා ගැටලුවලට මුහුණ දීමට සිදුවේ. එය ජීවිතයට ආවේණික අංගයකි. එසේම කෙනෙක් ජීවත් වීම යන්නෙන් අදහස් වන්නේ ද මේ ආකාරයෙන් විවිධ අභියෝගවලට, ප්‍රශ්නවලට හා ගැටලුවලට මුහුණ දෙමින් ඒවාට විසඳුම් ලබා දෙමින්, ඒවා ජය ගනිමින් කටයුතු කිරීමයි. ඒ නිසා කෙනෙකුට ජීවිතය තුළ විවිධ අභියෝග, ගැටලු හා ප්‍රශ්න ඇති වීම තමන්ගේ ශක්තිය උරගා බැලීමට අගනා අවස්ථාවකි. වඩාත් නිර්මාණශීලී ව සිතීමට හා එසේ කටයුතු කිරීමට පුලුවන් තැනැත්තාට තම ජීවිත අභියෝග, ගැටලු හා ප්‍රශ්න සතුටුදායක ලෙස විසඳා ගත හැකිය. නැතිනම් ඒවාට සතුටින් මුහුණු දිය හැකිය. නිරමාණශීලීව සිතන්නට පුරුදුවීමෙන් යමක් නිසි ලෙස විමර්ශනය කිරීමට ද, ඒවාට යෝග්‍ය විකල්ප විසඳුම් අනාවරණය කර ගැනීමට ද වඩා හොඳ විසඳුම් තෝරා ගැනීමට අවකාශ තිබේ. යම් ජීවිත අභියෝග, ගැටලු හා ප්‍රශ්නවලට නිවැරදි විසඳුම් නොමැති අතර, ඇත්තේ අවස්ථානුකූලව යොදා ගත හැකි ප්‍රශස්ථ විසඳුම් පමණි. එය පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වේ.

නිපුණතා මට්ටම්

4.1 විවිධ මූලාශ්‍රවලින් ලැබෙන දත්ත හා තොරතුරු විචාරශීලීව භාවිත කරයි.

- ජීවිත අවස්ථා හා වෙනත් අවශ්‍යතා සඳහා දත්ත හා තොරතුරුවල වැදග්තකම හා වලංගුතාව
  - සෑම කෙනෙකුගේ ම ජීවිතයේ පරිණාමනයක් ඇති බව, ඒ අනුව විවිධ ජීවන අවස්ථා (ළදරු, ළමා, නව යොවුන්, තරුණ, වැඩිහිටි, මැදිවිය හා මහළු )
  - ඒ ඒ ජීවිත අවස්ථාවල දී පුද්ගලයකුගේ දැනුම, ආකල්ප හා කුසලතාවන්හි ද, අවශ්‍යතා හා උවමනාවන්හි ද වෙනස්කම් සහිත බව හා පුද්ගලයාගෙන් පුද්ගලයාට ද වෙනස් කම් පවතින බව
  - ඒ ඒ ජීවිත අවස්ථාවන්හි අවශ්‍යතා හා උවමනා සපයා ගැනීමට හා විවිධ සංසිද්ධිවලට සාර්ථකව මුහුණ දීම සඳහා තීරණ ගැනීමේ දී තමා සතු දත්ත හා තොරතුරු යොදා ගන්නා බව

4.2 ජීවිත අභියෝග හා අවස්ථා හමුවේ නිර්මාණශීලී චින්තනයෙන් යුතුව කටයුතු කරයි.

විෂය අන්තර්ගතය

- දකින - ඇසෙන දෑ දෙස විවිධ කෝණවලින් බැලීමට පුරුදු වීම
  - සමාජය යනු පුද්ගල සබඳතා ජාලයක් බව
  - සෑම කෙනෙකුටම මෙම ජාලය තුළ යම් ස්ථානයක් හිමි වන අතර, ඒ අනුව සිදු වන විවිධ සන්නිවේදන කාර්යයන්ට මුහුණ දීමට සිදු වන බව
  - සබඳතා ජාලය තුළ පුද්ගලයාගේ භූමිකාව විවිධ වන අතර තමාට ඇසෙන-දකින හා තමා අත් විඳින දේ අර්ථකථනය කළ යුත්තේ ඒ අනුව බව

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව : ජීවින අවස්ථා හා සංසිද්ධි අනාවරණයට මෙන්ම ඵලදායි ඉගෙනුම සඳහා දත්ත හා තොරතතුරු යොදා ගනියි.

නිපුණතා මට්ටම : විවිධ මුලාශ්‍රවලින් ලැබෙන දත්ත හා තොරතුරු විචාරශීලීව භාවිත කරයි.

ක්‍රියාකාරකම 4.1.1 : " මා සතු දැනුමෙන් ඔබට පිහිට වෙමු"

කාලය : මිනිත්තු 40

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 4.1.1.1 - විවිධ අවස්ථා දැක්වෙන පිංතූර
- ඇමුණුම 4.1.1.2 - සිද්ධි අධ්‍යයන
- ෆෙල්ට් පෑන්
- ඩිමයි කොළ

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 4.1.1.1. :
- ඇමුණුම 4.1.1.1 පින්තූර පන්තියට ඉදිරිපත් කරන්න.
- එම පින්තූරවලින් නිරූපණය වන අවස්ථා විමසන්න.
- එම අවස්ථාවලට ඔබ මුහුණ දුන්නේ නම් ඔබ කුමක් කරන්නේ ද යන්න පිළිබඳව බුද්ධි කලම්බන සාකච්ඡාවක් මෙහෙයවන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

> - අපට සෑම මොහොතක ම විවිධ ජීවිත අවස්ථාවලට හා සිද්ධිවලට මුහුණ දීමට සිදු වන බව.
> - ඒ සඳහා අප සතු දැනුම මෙන් ම බාහිර සාධක ද උපයෝගී කර ගෙන යම් යම් තීරණ ගන්නා බව.
> - ඒ සඳහා අපට විවිධ දත්ත හා තොරතුරු අවශ්‍ය වන බව

මිනිත්තු 10යි

පියවර 4.1.1.2. :
- සිසුන් කණ්ඩායම් කිහිපයකට බෙදන්න.
- ඇමුණුම 4.1.1.2 බෙදා දෙන්න.
- ඒ අනුව ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

මිනිත්තු 20යි

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

පියවර 4.1.1.1. : • සිසුන් යෝජනා ඉදිරිපත් කිරීමට අවස්ථාවන් ලබා ගන්න.

- ඒ පිළිබඳ අන් කණ්ඩායම්වල අදහස් විමසන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

> - සෑම කෙනෙකු සතුව ම විවිධ දත්ත හා තොරතුරු ඇති බව
> - යම් යම් තීරණ ගැනීමේ දී තමා සතු දත්ත හා තොරතුරු ප්‍රමාණවත් නොවන බව.
> - වෙනත් අයගේ උදව්, දත්ත හා තොරතුරු ඒ සඳහා ලබා ගත හැකි බව.
> - හොඳ උපදෙස්, නිවැරදි තොරතුරු මඟින් නිවැරදි හා ප්‍රශස්ථ තීරණ ගත හැකි බව.
> - ඔබගේ අතීත අත්දැකීම් විවිධ ජීවන අවස්ථාවල දී විචාරශීලීව භාවිත කළ යුතු බව.

මිනිත්තු 10යි

## තක්සේරුව හා ඇගයීම

- දත්ත හා තොරතුරුවල අවශ්‍යතාව විස්තර කරයි.
- නිවැරදි දත්ත හා තොරතුරු ජීවන අවස්ථාවල දී භාවිතා කිරීමේ වැදගත්කම පිළිගනියි.
- විවිධ විසඳුම් යෝජනා කර ඉදිරිපත් කරයි.
- නිවැරදි තීරණ ගනියි.
- විවිධ ජීවිත අවස්ථාවල දී අන් අයට උදව් වෙයි.

ඇමුණුම 4.1.1.1 (චිත්‍රය)







Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඇමුණුම 4.1.1.2

## කාර්ය පත්‍රිකාව

| |
|---|
| මිදුලේ කෙළවරේ ළිං පඩිය මත සිටි පූසා හදිසියේ පය ලිස්සා වැටී ඇත. ළිඳ ඇතුළේ පූසකු හඬන හඬ ඇසී ගොස් බැලූ විට පූසා ළිං වලේ අයිනේ පඳුරක එල්ලී කෑගසන බව පෙණින. |

1. ඉහත සිද්ධිය ඔබ කණ්ඩායමට මුහුණදීමට සිදුවුව හොත් පූසා බේරා ගැනීමට ඔබ කුමක් කරන්නේ ද?

2. ඔබ යෝජනා කරන ලද විසඳුම් දීමට ඔබට උපකර වූයේ කවර තොරතුරු ද?

3. මෙවන් අවස්ථාවක දී අතීත අත්දැකීම් තුළින් නිවැරදි තීරණ ලබා ගැනීමට විමසිලිමත් විය යුතු ආකාරය පෙන්වා දෙන්න.

නිපුණතාව : ජීවිත අවස්ථා හා සංසිද්ධි අනාවරණයට මෙන් ම ඵලදායී ඉගෙනුම සඳහා දත්ත හා තොරතුරු යොදා ගනියි.

නිපුණතා මට්ටම : විවිධ මූලාශ්‍රවලින් ලැබෙන දත්ත හා තොරතුරු විචාරශීලීව භාවිත කරයි.

ක්‍රියාකාරකම 4.1.2 : " තොරතුරු සොයමු නිරතුරු "

කාලය : මිනිත්තු 80

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 4.1.2.1. පෝස්ටර් දෙක
- ලියන කඩදාසි
- පෑන්
- දත්ත හා තොරතුරු ඇතුළත් විවිධ මූලාශ්‍ර

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 4.1.2.1. :
- ඇමුණුම 4.1.2.1 ප්‍රදර්ශනය කරවන්න.
- ඒ ඇසුරින් එහි ඇති දේ පිළිබඳව විමසීමක් කරන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

> - විවිධ දත්ත හා තොරතුරු විවිධ මාධ්‍ය මගින් අපට සන්නිවේදනය වන බව.
> - එක ම තොරතුරක් වුවද විවිධ ආකාරයෙන් මාධ්‍ය මගින් ඉදිරිපත් වන බව.
> - දත්ත හා තොරතුරු ලබා ගැනීමට විවිධ මූලාශ්‍ර යොදා ගත හැකි බව.

මිනිත්තු 15යි

පියවර 4.1.2.2. :
- සිසුන් කණ්ඩායම් කිහිපයකට බෙදන්න.
- ඇමුණුම අංක 4.1.2.1.පෝස්ටර් දෙකට අදාළව හෝ වෙනත් ඕනෑම මෙවැනි ම සිද්ධියට අදාළ තොරතුරක් සොයා ගෙන ඒමට අවස්ථාව දෙන්න.
- පාසල තුළින් ම මේ සඳහා කුමන හෝ තොරතුරක් හා දත්ත සොයා ගෙන ඒමට යොමු කරවන්න.
- තමා දත්තය ලබා ගත් මූලාශ්‍රය ද සටහන් කර ගෙන ඒමට දන්වන්න.

මිනිත්තු 25යි

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

පියවර 4.1.2.3. :
- සිසුන් සොයා ගෙන ආ තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- ඒවා ප්‍රදර්ශනය කරවන්න.
- ඒ පිළිබඳව කණ්ඩායම්වල අදහස් විමසන්න.
- දත්ත හා තොරතුරු රැස් කිරීමේ දී මතුවූ ගැටලු, ප්‍රශ්න සාකච්ඡා කරන්න.
- පහත සඳහන් කරුණු මතු වන පරිදි සමාලෝචනයක යෙදෙන්න.

- දත්ත හා තොරතුරු ලබා ගැනීමට විවිධ මූලාශ්‍ර භාවිත කළ හැකි බව
- පොත්, පුවත්පත්, සඟරා, වාර්තා, වීඩියෝ පට, ගුවන් විදුලිය, රූපවාහිනී, වීසීඩී පට, විශ්ව කෝෂ, පරිගණකය, අන්තර්ජාලය ආදිය දත්ත තොරතුරු ලබා ගැනීමේ ප්‍රධාන මූලාශ්‍ර බව.
- පුද්ගලයකුගේ මතකය ජීවිත අවස්ථා හා සිද්ධිවල දී දත්ත හා තොරතුරු ලබා ගැනීමේ ප්‍රධාන මූලාශ්‍රය බව.
- මිනිස් මනස තුළ විශාල තොරතුරු ප්‍රමාණයක් තැන්පත්වී ඇති අතර නව තොරතුරු සමඟ එම මතකයන් අලුත් වන බව.
- තොරතුරු ගවේෂණය මගින් පුද්ගල මතකය පුළුල් කරන බව.
- දත්ත හා තොරතුරු ලබා ගත හැකි ප්‍රධාන ආයතන ඇති බව.
- රාජ්‍ය ලේඛනාගාරය, ජාතික කෞතුකාගාරය, පේරාදෙණිය විශ්ව විද්‍යාලයීය පුස්තකාලය, ශ්‍රී ලංකාවේ ඇති පැරණි ම හා ජාතික මට්ටමේ මධ්‍යස්ථාන බව.
- ජාතික පුස්තකාලය ද 1976 සිට ශ්‍රී ලංකාවේ තොරතුරු හා දත්ත රැස් කිරීමේ ජාතික මධ්‍යස්ථානයක් ලෙස පිහිටුවන ලද බව.
- ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ ජාතික මට්ටමින් සියලු ම දත්ත හා තොරතුරු රැස් කරන බව.
- ඉහත සඳහන් ආයතන ජාතික මට්ටමින් ශ්‍රී ලංකික ජනතාවට අවශ්‍ය දත්ත හා තොරතුරු ලබා දීමට බැඳී සිටින බව.
- එහෙත් මෙම ආයතන සාමාන්‍ය පුස්තකාලවලට වඩා වෙනස් බව
- මෙම ජාතික මධ්‍යස්ථානවලට අමතරව රට පුරා ම මහජන පුස්තකාල මගින් ද විවිධ තොරතුරු ලබා ගත හැකි බව.
- අප අවශ්‍යතා අනුව විධිමත්ව එම ආයතනවලට සම්බන්ධවීමෙන් පහසුවෙන් අපට අවශ්‍ය දත්ත හා තොරතුරු පහසුවෙන් ලබා ගත හැකි බව.
- එමෙන් ම ඒවා පරිහරණය කිරීමේ දී මූලාශ්‍රවලට හානි නොවන අයුරින් භාවිතා කළ යුතු බව

මිනිත්තු 40යි

තක්සේරුව හා ඇගයීම

- දත්ත හා තොරතුරු ලබා ගැනීමේ මූලාශ්‍ර නම් කරයි.
- දත්ත හා තොරතුරු ඇති ස්ථාන, සඳහන් මූලාශ්‍ර හා ආයතන හඳුනා ගැනීම මගින් පුද්ගල කටයුතු පහසුවන බව පිළිගනියි.
- විවිධ මූලාශ්‍ර මගින් දත්ත රැස් කරයි.
- දත්ත හා තොරතුරු රැස් කිරීම මගින් නව දැනුම ගවේෂණය කරයි.
- අධ්‍යයන අවශ්‍යතා සඳහා මූලාශ්‍ර භාවිත කරයි.

පසුවැඩ :-

1. පහත සඳහන් මූලාශ්‍රවල ඇතුළත් තොරතුරු ගවේෂණය කරන්න.
   * උප්පැන්න සහතිකය
   * ජාතික හැඳුනුම් පත
   * තැපැල් හැඳුනුම් පත
   * එන්නත් වාර්තා
   * අධ්‍යාපන සහතික

2. ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය භාවිතය මගින් ඔබට ලබා ගත හැකි සේවාව පිළිබඳ ව පත්‍රිකාවක් පහත දැක්වේ. එය හොඳින් අධ්‍යයනය කර ජාතික පුස්තකාලය මගින් අප අධ්‍යයනය කාර්යයන්ට ලැබෙන මෙහෙය යනුවෙන් කෙටි වාර්තාවක් පිළියෙල කරන්න. (ඇමුණුම 4.1.2.2 අදාළ කර ගන්න)

ඇමුණුම 4.1.2.1

1. පහත සඳහන් ප්‍රකාශය පන්තියේ සියල්ලන්ට දර්ශනය වන සේ ඉදිරිපත් කරන්න. කල් ඇතිව සකස් කර ගෙන ආ පත්‍රිකාවක් යොදා ගැනීම වඩාත් යෝග්‍ය ය.

පාසලේ දරු දැරියන්ගේ සහභාගීත්වයෙන් අධ්‍යාපන චාරිකාවක් ලබන මාසයේ දී යාමට විදුහල්පතිතුමා/තුමිය විසින් තීරණය කර ඇත.

- ඉහත සඳහන් ප්‍රකාශය පිළිබඳව සිතන්නට දරුවන්ට ඉඩ දෙන්න.
- මෙම ප්‍රකාශය කුමන අයට කුමන ආකාරයෙන් බලපෑමක් ඇති කරන්නේ දැ යි දරුවන් ලවා ප්‍රකාශ කරවමින් එය ලෑල්ලේ ඉදිරිපත් කරන්න.

අවධානයට යොමු විය යුතු කරුණු/සාකච්ඡාවට

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

| | | |
|---|---|---|
| * දරුවන්ට | : | යන්නේ කවුරුන්දැයි තීරණය කිරීමට, මුදල් සොයා ගැනීමට, අවශ්‍ය ඇඳුම් පැළඳුම් සොයා ගැනීමට |
| * දෙමාපියන්ට | : | තමන්ගේ දරුවන් කී දෙනෙකු යනවාදැ යි තීරණය කිරීමට, මුදල් සොයා දීමට, අවශ්‍ය ඇඳුම් පැළඳුම් හා වෙනත් දේ සොයා දීමට, දරුවන්ගේ ආරක්ෂාව පිළිබඳ ව සිතීමට |
| * ගුරුවරුන්ට | : | මුදල් සොයා ගැනීමට, අවශ්‍ය දේ සොයා ගැනීමට, ගෙදර සියල්ලන් කැඳවා ගෙන යන්නේදැ යි තීරණය කිරීමට, ගෙදර ආරක්ෂාව ගැන කල්පනා කිරීමට |

2. වසංගත උණ රෝගයක් පැතිරී යන බව සෞඛ්‍ය අමාත්‍යාංශය නිවේදනය කරයි. මෙය බෝවන්නේ ජලයෙනි. ජලය උණු කර නිවා පානය කිරීමෙන් මෙම රෝගය පැතිරීම වළක්වා ගත හැකි ය.

- පළමු ප්‍රකාශය පරිදි ම මෙම ප්‍රකාශය ද සාකච්ඡා කරන්න.
- මෙයින් බලපෑම් ඇති වන පාර්ශවයන් පහක් හඳුනා ගන්න. ඒවා මෙසේ විය හැකි ය. දෙමාපියන්, ළමයින්, ආපනශාලා හිමියන්, වෛද්‍යවරුන්, සෞඛ්‍යනිලධාරීන්

- මෙම පාර්ශවයන් පහේ භූමිකාව නිරූපණය කිරීමට කැමති දරුවන් පස් දෙනෙකු ස්වේච්ඡාවෙන් තෝරා ගන්න. එම පස් දෙනා වටා අනෙක් අය රැස් කර කණ්ඩායම් සකස් කරන්න.
  - එක් එක් කණ්ඩායම අදාළ පාර්ශ්වයේ ස්වභාව අනුව එම ප්‍රශ්නය අර්ථ කථනය කරන ආකාරය හා ගන්නා පියවරයන් පිළිබඳව සාකච්ඡා කරවන්න.
  - එක් එක් කණ්ඩායම සාකච්ඡා කරන ලද කරුණු, මුලින් ම එම භූමිකාව නිරූපණය කිරීමට ඉදිරිපත් වූ දරුවා ලවා පන්තිය ඉදිරියේ ඉදිරිපත් කරවන්න. මෙහි දී පන්තිය අදාළ පරිදි වෙනත් අසන්නන් පිරිසක් බවට පත් කරවන්න.

## ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ මුද්‍රිත, ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය සහ තොරතුරු තාක්ෂණ සම්පත් ඇතුළු ප්‍රමාණාත්මක මෙන් ම ගුණාත්මක ද උසස් පුස්තකාල ද්‍රව්‍ය එකතුවක් විමර්ශන කටයුතු සඳහා තැන්පත් කර ඇත. ජාතික පුස්තකාලයක අභිමතාර්ථ සමඟ ගැළපෙන විවිධ මාදිලියේ අනු එකතුවලින් සමන්විත ජාතික පුස්තකාල එකතුව පිළිබඳ සංෂිප්ත හැඳින්වීමක් මෙහිදී සිදුකෙරේ.

### මූලික විමර්ශන එකතුව

ජාතික පුස්තකාලයේ මූලික විමර්ශන එකතුව ශ්‍රී ලංකාවේ ඇති හොඳ ම විමර්ශන ග්‍රන්ථ එකතුවක් ලෙස සැලකේ. විශ්වකෝෂ, ශබ්දකෝෂ, ග්‍රන්ථ නාමාවලී හා වෙනත් නාමාවලී ආදී විවිධ මාදිලියේ විමර්ශන ග්‍රන්ථ සම්භාරයක් ජාතික පුස්තකාලය සතුව ඇත. විමර්ශන එකතුවෙන් බහුතරයක් අන්තර් ජාතික මට්ටමේ ප්‍රශස්ත විමර්ශන ග්‍රන්ථ වන අතර ශ්‍රී ලංකාවට අදාළ බොහෝ දුරට අංග සම්පූර්ණ මූලික විමර්ශන ග්‍රන්ථ එකතුවක් ද තිබේ. කාලීන අවශ්‍යතාවලට අනුව දැනට වඩවඩාත් සංගිත තැටි (CD- ROM) ස්වරූපයෙන් විමර්ශන කෘති අත් කර ගැනීමේ ප්‍රවණතාවක් ඇත. නූතනයේ පාඨකයන් බොහොමයක් අන්තර් ජාල පහසුකම් උපයෝගී කර ගනිමින් විමර්ශන කටයුතුවල යෙදෙන බැවින් ඒ සඳහා අවශ්‍ය පහසුකම් ද සලසා තිබේ. මූලික විමර්ශන එකතුව ජාතික පුස්තකාලයේ බිම් මහලේ ඇත.

### ප්‍රධාන ශ්‍රී ලංකා එකතුව

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ ඇති ප්‍රධාන ම එකතුව ශ්‍රී ලංකා එකතුව වේ. ජාතික පුස්තකාලය හා ප්‍රලේඛන මධ්‍යස්ථානය මෑතක දී පිහිටු වීම නිසා එය සතු ශ්‍රී ලංකා එකතුව බොහෝ දුරට සමකාලීන එකක් වේ. 1976 ට පසු ශ්‍රී ලංකාවේ පළ වූ ප්‍රකාශනවල අංග සම්පූර්ණ එකතුවක් ජාතික පුස්තකාලයේ ඇත. මීට අමතරව පසුගිය දශක කිහිපය තුළ ගෙන ගිය ප්‍රතිග්‍රහණ කටයුතු හේතුවෙන් ඊට පෙර පළ වූ ප්‍රකාශනවල ද අංග සම්පූර්ණ නොවූ නමුත් විශාල එකතුවක් එය සතුව තිබේ. 19 වන සියවසේ දී ශ්‍රී ලංකාවේ පැන වූ නීතිමය තැන්පත් ආඥාපනත් ආධාරයෙන් දැනට පැරණි ශ්‍රී ලංකා එකතු ප්‍රධාන වශයෙන් ම ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ, ජාතික කෞතුකාගාර දෙපාර්තමේනතුවේ පුස්තකාලවල ද බ්‍රිතාන්‍ය ජාතික පුස්තකාලයේ ද තැන්පත් ව ඇත. රාජකීය ආසියාතික සංගමයේ ශ්‍රී ලංකා ශාඛාව, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව,පේරාදෙණිය විශ්ව විද්‍යාලය ඇතුළු තවත් පුස්තකාල ගණනාවක ද ලංකාවේ පැරණි ප්‍රකාශන එකතු විසිරී පවතී. ජාතික පුස්තකාලය ජාතික ඒකාබද්ධ සූචිය, පූර්වකාලීන ජාතික ග්‍රන්ථ නාමාවලී සහ වෙනත් ග්‍රන්ථ විඥාපන ව්‍යාපෘති මගින් මෙම එකතුවල ග්‍රන්ථ විඥාපන පාලනයක් ඇති කරලීමට ප්‍රයත්න දරමින් සිටී. ප්‍රධාන ශ්‍රී ලංකා එකතුව ජාතික පුස්තකාලයේ පළමු මහලේ ස්ථාන ගත කර ඇත.

### පුස්කොළ පොත් එකතුව

ජාතික පුස්තකාලයේ සැලකිය යුතු තරම් විශාල පුස්කොළ පොත් එකතුවක් ඇති අතර එය නිරන්තරයෙන් ම වර්ධනය වෙමින් පවතී. සියවස් ගණනාවකට පෙර පළ වූ සාහිත්‍ය කෘති ගණනාවක් ඇතුළු ජාතික මට්ටමේ වැදගත්කමක් ඇති කෘති රාශියක් මෙම එකතුවට ඇතුළත් වේ. අදාළ කෘති සියල්ල ක්‍රමානුකූලව සංවිධානය කොට පහසුවෙන් පාඨකයන්ට පරිහරණය කළ හැකි සේ පළමු මහලේ විශේෂ අල්මාරිවල තැන්පත් කර ඇත.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

## වාර සඟරා එකතුව

ජාතික පුස්තකාල ප්‍රතිග්‍රහණ ප්‍රතිපත්ති අනුව රට තුළ පළ වන සියලු ම වාර සඟරා ලබා ගන්නා බැවින් නිසැකව ම මෙය ශ්‍රී ලංකාවේ හොඳ ම ප්‍රවර්තන වාර සඟරා එකතුව වේ. ග්‍රන්ථ විඥාපන සේවා අංශය මගින් සම්පාදනය කරනු ලබන වාර සඟරා ලිපි අනුක්‍රමණිකාව පර්යේෂකයන්ට තමන්ට අවශ්‍ය ලිපි සොයා ගැනීමට විශාල පිටුවහලක් වී ඇත. මීට අමතරව පටුන පිටු සේවාවක් ද වාර සඟරාවල සම්පූර්ණ ලිපි අනුක්‍රමණිකා සේවාවක් ද පාඨක සේවා සහ ප්‍රලේඛන සේවා අංශ මගින් සැපයේ. විවිධ පුස්තකාල විද්‍යා ආයතනවල ශිෂ්‍යයන් විසින් සම්පාදිත වාර සඟරා අනුක්‍රමණික විශාල ප්‍රමාණයක් ද පාඨක පරිහරණය සඳහා ඇත. වාර සඟරා ඒ සඳහා ම සකස් කළ විශේෂ ආරක්ෂිත පෙට්ටිවල බිම් මහලේ තැන්පත් කර ඇත.

## පුවත්පත් එකතුව

1976 සැප්තැම්බර් මස සිට මේ දක්වා වූ සම්පූර්ණ ජාතික පුවත්පත් එකතුවක් ජාතික පුස්තකාලයේ තැන්පත් කර ඇති අතර එය පර්යේෂකයන්ගේ සහ සාමාන්‍ය පාඨකයන්ගේ විශේෂ ආකර්ෂණයට ලක් වී ඇත. මෙම පුවත්පත් දැනට සූක්ෂම ඡායා පටල ගත කරමින් පවතින අතර පාඨකයන්ට පුවත්පතේ මුල් ස්වරූපයෙන් හෝ සූක්ෂම පටල ස්වරූපයෙන් හෝ ඒවා පරිහරණය කළ හැක. මීට අමතරව ප්‍රධාන ජාතික පුවත්පත් ගණනාවක සම්පූර්ණ සූක්ෂම ඡායා පිටපත් එකතුවක් ද ලබා ගැනීම ආරම්භ කර ඇත. ප්‍රලේඛන සේවා අංශය මගින් සම්පාදිත පුවත්පත් ලිපි අනුක්‍රමණිකා, පුවත්පත්වලින් අවශ්‍ය ලිපි සහ තොරතුරු ඉක්මනින් සොයා ගැනීමට පාඨකයන්ට ආධාර වේ. මීට අමතරව විශේෂ පුවත්පත් වාර්තා, ලිපි ඇතුළත් පුවත්පත් කැපීම් එකතුවක් ද පාඨක පරිහරණය සඳහා සංවිධානය කර තිබේ. බිම් මහලේ ඇති පුවත්පත් එකතුවට විශාල පාඨක ඉල්ලුමක් ඇත.

## පශ්චාත් උපාධි නිබන්ධන එකතුව

ශ්‍රී ලංකාවේ සහ විදේශීය විශ්ව විද්‍යාලවලින් ශ්‍රී ලාංකික විද්වතුන්ට ප්‍රදානය කරනු ලබන ආචාර්ය සහ දර්ශන විශාරද උපාධිවලට අදාළ උපාධි නිබන්ධන එකතුව ජාතික පුස්තකාලයේ ඇති සුවිශේෂ අංශයක් වේ. මෑතක දී විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම මාර්ගයෙන් ශ්‍රී ලංකාවේ සියලු ම විශ්ව විද්‍යාල හා පශ්චාත් උපාධි ආයතන සමඟ ජාතික පුස්තකාලය පැමිණ ඇති එකඟතාවකට අනුව මෙම ආයතනවලින් ආචාර්ය සහ දර්ශන විශාරාද උපාධි පිරිනමනු ලබන අදාළ උපාධි නිබන්ධනවලින් පිටපතක් ජාතික පුස්තකාලයේ තැන්පත් කෙරේ. ශ්‍රී ලංකාවට සම්බන්ධ විෂයයනට වෙනත් රටවලින් පිරිනමන ආචාර්ය හා දර්ශන විශාරද උපාධිවලට අදාළ නිබන්ධන ද ලබා ගැනීමට කටයුතු කෙරේ.

## පුස්තකාල හා විඥාපන විද්‍යා එකතුව

දේශීය වශයෙන් ඇති පුළුල් ම පුස්තකාල හා විඥාපන විද්‍යා එකතුව මෙය වේ. පුස්තකාල විද්‍යා සහ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රවල පොත්පත්වලට අමතරව අදාළ විෂය ක්ෂේත්‍රවල ප්‍රධාන අන්තර්ජාතික වාර සඟරා, සංගීත තැටි විශාල ප්‍රමාණයක් එයට ඇතුළත් වී ඇත. දිවයිනේ පුස්තකාල විද්‍යා ආයතනවල ශිෂ්‍යයන් සහ ආචාර්යවරුන්ට එම එකතුව පරිහරණයට විශේෂ පහසුකම් සලසා ඇත. දෙවන මහලේ තැන්පත් කර ඇත.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

**විශේෂ එකතු**

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ විශේෂ එකතු ගණනාවක් පාඨක පරිහරණය සඳහා තැන්පත් කර ඇත. ශ්‍රී ලංකාවේ ප්‍රධාන පෙළේ ගත් කතුවරයකු වන මාර්ටින් වික්‍රමසිංහ මහතාගේ ග්‍රන්ථ එකතුව මෙන් ම එතුමා භාවිත කළ විවිධ භාණ්ඩ ද ඇතුළත් විශේෂ ප්‍රදර්ශනාගාරයක් ජාතික පුස්තකාලයේ දෙවන මහලේ පවත්වා ගෙන යනු ලැබේ. මීට අමතරව මහාචාර්ය ඩී.ඊ. හෙට්ටිආරච්චි, මහාචාර්ය එම්.එච්.පීටර් සිල්වා, මහාචාර්ය ටිකිරි අබේසිංහ, වෛද්‍ය ඊ.එම්.විජේරාම,ආචාර්ය පී.බී.සන්නස්ගල, තේජා ගුණවර්ධන, පණ්ඩිත ගුණපාල සේනාධීර යන විද්වතුන්ගේ පෞද්ගලික පොත් එකතු ද ජාතික පුස්තකාලයේ තැන්පත් කර ඇත. එසේ ම යුනෙස්කෝ, ආසියානු සංවර්ධන බැංකුව, යුරෝපීය ආර්ථික එකමුතුව වැනි අන්තර්ජාතික සංවිධානවල ප්‍රකාශන ද ජාතික පුස්තකාලයේ ඇත. විද්‍යා තාක්ෂණ විමර්ශන ග්‍රන්ථ එකතුව, නාට්‍ය අත් පිටපත් එකතුව සහ බ්‍රේල් ප්‍රකාශන එකතුවක් ද මේ විශේෂ එකු ගණයට වැටේ.

**නීතිමය තැන්පත් එකතුව**

1839 පුවත්පත් ආඥාපනතට සහ 1885 මුද්‍රණකරුවන්ගේ සහ ප්‍රකාශකයන්ගේ ආඥාපනතට 1976 දී සිදු කළ සංශෝධනයට සහ1998 ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනතට අනුව ශ්‍රීලංකාවේ පළ වන සෑම ප්‍රකාශනයක ම පිටපතක් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ තැන්පත් විය යුතුවේ. මෙම නීතිමය ප්‍රතිපාදන යටතේ ලැබෙන ප්‍රකාශන විශේෂ එකතුවක් ලෙස පළමු හා තෙවන මහල්වල පවත්වා ගෙන යනු ලැබේ.

**සිතියම් එකතුව**

සිතියම් එකතුවෙහි ශ්‍රී ලංකාවේ විවිධ මාදිලියේ සිතියම් විශාල ප්‍රමාණයක් තැන්පත් කර තිබේ. මේවා විශේෂ ආරක්ෂිත සිතියම් ඇසුරුම්වල ඇති අතර පාඨක පරිහරණය පහසුකරලීම සඳහා අදාළ ග්‍රන්ථ විඥාපන සේවා පහසුකම් සහිතව පළමු මහලේ තැන්පත් කර ඇත.

**ගැසට් එකතුව**

1888 සිට වර්තමානය දක්වා ශ්‍රී ලංකාවේ පළ වු සම්පූර්ණ ගැසට් එකතුවක් ජාතික පුස්තකාලයේ ඇත. ශ්‍රී ලංකාවේ පළ වු ප්‍රකාශන අතුරින් ජාතික පුස්තකාලයේ සතු අංග සම්පූර්ණ එකතුව වේ. රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් 1888-1975 කාලයට අදාළ ගැසට් එකතුව ජාතික පුස්තකාලයට පරිත්‍යාග කරන ලදී. මීට අමතරව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ එකතුවක් ද 1990 සිට 1995 දක්වා වු චක්‍රලේඛ පිළිබඳව ජාතික පුස්තකාලය සහ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ඒකාබද්ධ ව්‍යාපෘතියක් ලෙස සකස් කළ සුචියක් ද ඇත. ප්‍රධාන ගැසට් එකතුව තෙවන මහලේ පවත්වා ගෙන යනු ලැබේ.

**දත්ත පදනම**

විවිධ ක්ෂේත්‍රවලට අදාළ පරිගණකගත දත්ත පදනම් ගණනාවක් ම ජාතික පුස්තකාලයේ පවත්වාගෙන යනු ලැබේ. ශ්‍රී ලංකාවේ ජනවාර්ගික ගැටලුව, ISBN ප්‍රකාශන තොරතුරු, ජාතික පුස්තකාලයේ විශේෂ එකතු, විවිධ විෂය අනුක්‍රමණිකා ආදිය එහි ප්‍රධාන තැනක් ගනී

**වාර්තා එකතුව**

ශ්‍රී ලංකාවේ විවිධ සංවර්ධන ව්‍යාපෘතිවලට අදාළව රජයේ සහ අන්තර් ජාතික සංවිධානවල අනුග්‍රහයෙන් විදේශීය හා දේශීය විශේෂඥයන් විසින් සිදු කරන ලද විශේෂ අධ්‍යයන වාර්තා එකතුව විද්වතුන්ගේ විශේෂ සැලකිල්ල යොමු වී ඇති අංශයක් වේ මීට අමතරව ලංකාවේ වාණිජ ක්ෂේත්‍රයේ ප්‍රධාන ආයතනවල මෙන් ම රජයේ දෙපාර්තමේන්තු හා සංස්ථාවල පාලන වාර්තා ඇතළු වාර්තා එකතුව දෙවන මහලේ ඇත.

**ජන සාහිත්‍ය එකතුව**

ජන සාහිත්‍යය පිළිබඳ විශාරදයකු වු අභාවප්‍රාප්ත පීටර් විජේසිංහ මහතා විසින් ලබා දෙන ලද අත් පිටපත් එකතුවක් ඇතුළු විවිධ මාර්ගවලින් ලැබුණු අත්පිටපත් හා මුද්‍රිත පිටපත්වලින් මෙය සමන්විත වේ. පසුගිය වසර ගණනාව තුළ මණ්ඩලයේ ප්‍රකාශන ආධාර ව්‍යාපෘතිය මගින් ප්‍රකාශිත ජන සාහිත්‍ය කෘති විශාල ප්‍රමාණයක් ද මෙහි ඇතුළත් වේ.

**ප්‍රතිග්‍රහණ කටයුතු**

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ ප්‍රතිග්‍රහණ අංශය ජාතික පුස්තකාල එකතුව ගොඩනැගීමේ භාරදූර කර්තව්‍යයේ නිරත වී සිටී. අදාළ ප්‍රකාශන පිළිබඳ සෙවීම, ප්‍රකාශන තෝරා ගැනීම, ඇණවුම් කිරීම, හුවමාරු සේවා, දුර්ලභ හා විශේෂ එකතු සොයා යාම, ඒවා පරීක්ෂා කිරීම, ලැයිස්තු ගත කිරීම, මිල දී ගැනීම් ආදී සංකීර්ණ කටයුතු මාලාවක ප්‍රතිග්‍රහණ අංශයේ නිලධාරීන් නියැලේ. ප්‍රකාශන සෙවීමේ දී අන්තර්ජාලය බහුල ලෙස යොදා ගනු ලබන අතර, දේශීය ප්‍රකාශන බහුතරයක් නීතිමය තැන්පතු ක්‍රමය සහ මණ්ඩලයේ විවිධ ප්‍රකාශන ව්‍යාපෘති යටතේ නොමිලේ ජාතික පුස්තකාලයට ලැබේ. මේ හේතුවෙන් ප්‍රතිග්‍රහණ කටයුතු සඳහා ලැබෙන වාර්ෂික මුදල් ප්‍රතිපාදනවලින් විශාල ප්‍රමාණයක් මූලික විමර්ශන ග්‍රන්ථ, විදේශීය ප්‍රකාශන, වාර සඟරා, සංගීත තැටි ලබා ගැනීම සඳහා වැය කෙරේ. ජාතික පුස්තකාලයේ ප්‍රතිග්‍රහණ ලැයිස්තුව මාසිකව පළ කෙරෙන අතර ඒ ඒ මාසවල ජාතික පුස්තකාලයට ලබා දුන් ප්‍රකාශන පිළිබඳ තොරතුරු සැපයේ.

නිපුණතාව : ජීවිත අවස්ථා හා සංසිද්ධි අනාවරණයට මෙන්ම ඵලදායී ඉගෙනුම සඳහා දත්ත හා තොරතුරු යොදා ගනියි.

නිපුණතා මට්ටම : ජීවිත අභියෝග හා අවස්ථා හමුවේ නිර්මාණශීලී චින්තනයෙන් යුතුව කටයුතු කරයි.

ක්‍රියාකාරකම 4.2.1 : " නව සිතිවිලි අවදිකරමු."

කාලය : මිනිත්තු 40

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 4.2.1.1 හි ඇතුළත් ප්‍රවේශය සඳහා අදාළ කාටූනය
- ඇමුණුම 4.2.1.2 හි ඇතුළත් ක්‍රියාකාරකම සඳහා අදාළ පුවත් පත් වාර්තා දෙක ඇතුළත් ප්‍රමාණවත් පිටපත් සංඛ්‍යාවක්
- ඇමුණුම 4.2.1.3 කණ්ඩායම් උපදෙස් මාලාවේ ප්‍රමාණවත් පිටපත් සංඛ්‍යාවක්
- ලියන කඩදාසි
- පෑන්

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 4.1.2.1. :
- ඇමුණුම 4.2.1.1 හි ඇතුළත් කාටූනය ඉදිරිපත් කරමින් එම වාර්තාව පිළිබඳ සිසුන්ගේ අදහස් විමසමින් පාඩමට පිවිසෙන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක යෙදෙන්න.
  - අපට නිතර ම විවිධ දෑ දකින්නට අසන්නට ලැබෙන බව.
  - ඒ සෑම අවස්ථාවක ම මතුපිට දේට වඩා තවත් දේ ඒ තුළ සැඟව ඇති බව.
  - එවැනි දේ මතුකර ගැනීමට විවිධ පැති වලින් සිතා බැලිය යුතු බව.
  - එහි දී තමා දන්නා දත්ත හා තොරතුරු ද කරුණු අනාවරණයට ඉවහල් වන බව.

මිනිත්තු 10යි

පියවර 4.2.1.2. :
- පන්තියේ සිසුන් පස්දෙනා බැගින් වන සේ කණ්ඩායම් කරන්න.
- ඇමුණුම අංක 4.2.1.2 හි අඩංගු වාර්තා ඇතුළත් පත්‍රිකාව කණ්ඩායම් වෙත ඉදිරිපත් කරන්න.
- සිසුන් ගවේෂණයේ යොදවන්න.
- ගවේෂණයේ යෙදෙන අතරතුර දී අවශ්‍යතන්හි දී සහාය ලබා දෙන්න.

මිනිත්තු 15යි

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

පියවර 4.2.1.2 : • කණ්ඩායම් වශයෙන් ලබා ගත් පිළිතුරු පන්තියට ඉදිරිපත් කරවන්න.
- සෙසු කණ්ඩායම්වල අදහස් යෝජනා විමසන්න.
- පහත සඳහන් කරුණු මතු වන පරිදි සමාලෝචනයක යෙදෙන්න.


- එදිනෙදා ජීවිතයේ දී විවිධ දත්ත හා තොරතුරු ඇතුළත් වාර්තා අපට හමු වන බව.
- කිසියම් සිදුවීමක් හා බැඳුන තවත් සිදුවීම් ජාලයක් ඇති බව.
- යමක් පිළිබඳ එක් කෝණයකින් බලා නිවැරදි නිගමනයකට එළඹීය නොහැකි බව.
- එක ම සිද්ධියක් දෙස වුව කිහිප දෙනෙකු කිහිප ආකාරයකින් බලන බව.
- සමාජයේ අවධි බවකින් ජීවත්වීමට නම් විවිධ කෝණවලින් බලා අවස්ථා හා සංසිද්ධි අනාවරණය කර ගත යුතු බව.

මිනිත්තු 15යි

තක්සේරුව හා ඇගයීම

- සිද්ධියක් අනාවරණය කර ගැනීමේ විධි ප්‍රකාශ කරයි.
- විවිධ කෝණවලින් එක ම දෙයක් ලෙස බැලීමෙන් නිවැරදි අවබෝධයක් ලබා ගත හැකි බව පිළි ගනියි.
- පවත්නා තොරතුරු නිරවුල්ව ඉදිරිපත් කරයි.
- තොරතුරු ගවේෂණයෙන් නිවැරදි දෙය කරා යොමු වෙයි.
- කණ්ඩායමක් වශයෙන් ජීවිත අවස්ථාවල දී නිර්මාණශීලී ප්‍රවේශයන්ට යොමු වෙයි.

ඇමුණුම 4.2.1.1



Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඇමුණුම 4.2.1.2 ක්‍රියාකාරකමට අදාළ පුවත්පත් වාර්තා දෙක

රථවාහන වැරදිවලට බදුල්ලේ තිස්පහකට නඩු

( ඇල්ල ප්‍රසාද් රුක්මල් )

බදුල්ල නගරයේ සිදු කළ පැය හතරක රථවාහන මෙහෙයුමක දී විවිධ වැරදි සම්බන්ධයෙන් රථ වාහන රියදුරන් තිස් පස් දෙනෙකුට එරෙහිව නඩු පැවරූ බව බදුල්ල පොලීසියේ රථවාහන අංශය පවසයි.

පෙරේදා (17) පස්වරු 4.00 සිට රාත්‍රී 8.00 පමණ වන තෙක් එම රථ වාහන සෝදිසිය සිදු කර තිබේ.

මාලිම්බඩ පාන් අලෙවිය අඩු වෙලා

(මාලිම්බඩ සුගත් කංකානම්ගේ)

පාන් මිල ඉහළ දැමීමත් සමඟ ම පාන් සහ පිටි කෑම වර්ග අලෙවිය සීඝ්‍ර අන්දමින් පහත බැස ඇතැයි බේකරි හිමියෝ පවසති.

බේකරිවල පාන් නිෂ්පාදනය කිරීම අඩු කර ඇති හෙයින් බේකරිවල රැකියාවල යෙදී සිටි බොහෝ දෙනෙකුට රැකියා සැපයීම උගහට වී ඇති බවත් බේකරි හිමියෝ පැමිණිලි කරති.

වෙනදා රුපියල් අටකට පමණ සීමා වී විකුණූ බනිස්, සීනි විස්කෝතුවක් රුපියල් දහයකට විකිණීම අසීරු බව ද කියන බේකරි හිමියෝ පාරිභෝගිකයින්ට ඊට වඩා අඩුවෙන් ඒවා ලබා දීමට හැකියාවක් නොමැති බව ද වැඩි දුරටත් කියති.

ඉහළ මිල ගණන්වලට පාන් කෑමට වඩා බත් කෑම වඩා ලාබදායී බැව් ජනතාව පවසති.

ඇමුණුම 4.2.1.3

ගවේෂණායට අදාළ උපදෙස් හා ප්‍රශ්නාවලිය

- සෑම කණ්ඩායමක් ම වාර්තා දෙක හොඳින් කියවන්න. අනතුරුව කණ්ඩායම් සාකච්ඡා තුළින් පිළිතුරු ඉදිරිපත් කරන්න.

1. කිසියම් ප්‍රදේශයක පාන් පරිභෝජනය අඩුවීමට බලපෑ හැකි යැයි ඔබ සිතන වෙනත් හේතු 03ක් ඉදිරිපත් කරන්න.

2. පාන් අලෙවිය අඩුවීමෙන් ඇති විය හැකි යහපත් ප්‍රතිඵල 2ක් හා අයහපත් ප්‍රතිඵල 02ක් ලියන්න.

3. පළමු වාර්තාවට අලුත් ශීර්ෂ පාඨයක් යොදන්න.

4. පළමු වාර්තාවේ ශීර්ෂ පාඨයේ "රථ වාහන වැරදිවලට" යන යෙදුම කෙරෙහි ඔබේ අවධානය යොමු කරන්න.

5. මෙම වාර්තා දෙක මගින් ඉදිරිපත් කරන අදහස තුළින් සැගවී ඇති අදහස් දෙක වෙන වෙන ම මතු කර ගන්න. එය සටහන් කරන්න.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව : දත්ත හා තොරතුරු, ජීවිත අවස්ථා හා සංසිද්ධි අනාවරණයට මෙන් ම ඵලදායී ඉගෙනුම සඳහා ද යොදා ගනියි.

නිපුණතා මට්ටම : ජීවිත අභියෝග හා අවස්ථා හමුවේ නිර්මාණශීලී චින්තනයෙන් යුතුව කටයුතු කරයි.

ක්‍රියාකාරකම4.2.2 : " විමසුම් ඇසින් - ලෝකය දකිමි."

කාලය : මිනිත්තු 40

ගුණාත්මක යෙදවුම් :

- ඇමුණුම් අංක 4.2.2.1 තේරවිල්ල ඇතුළත් පිටපත්
- ඇමුණුම් අංක 4.2.2.2 ගවේෂණයට අදාළ සිද්ධි අධ්‍යයන පිටපත් අවශ්‍ය පමණ
- ලියන කඩදාසි
- පෑන්

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 4.2.2.1. :

- ඇමුණුම් අංක 4.2.2.1 සඳහන් තේරවිල්ල ශිෂ්‍යයකු මගින් පන්තියට ඉදිරිපත් කරන්න.
- ඒ ඇසුරින් ගැටලුව තනි තනිව හෝ කීපදෙනෙකු එක්ව විසඳීමට දරුවන් යොමු කරන්න.
- නිවැරදි පිළිතුර ගොඩ නැගීමට උදව් කරමින් එම පිළිතුර ලබා ගැනීමට ගත් විවිධ පියවර සාකච්ඡා කරමින් පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාව මෙහෙය වන්න.

> - ගැටලුව විසඳීමට ගැටලුව හා සම්බන්ධ තොරතුරු සියල්ල නිවැරදිව අවබෝධ කර ගත යුතු බව.
> - ඉක්මන්වීමෙන් ද දත්ත හා තොරතුරු නිවැරදිව වටහා නොගැනීමෙන් ද නිවැරදි විසඳුමට යා නොහැකි බව
> - නිසි විසඳුමක් සෙවීමේ දී උපායශීලීව කටයුතු කළ යුතු බව
> - ජීවිත අභියෝග ජය ගැනීමට නම් නිසි උපායන් භාවිතා කළ යුතු බව.

මිනිත්තු 10යි

පියවර 4.2.2.2. : 
- පන්තියේ සිසුන් දෙදෙනා බැගින් කණ්ඩායම් කරවන්න.
- ඇමුණුම අංක 4.2.2.2 හි අඩංගු පැවරුම් පත්‍රිකා කුඩා කණ්ඩායම් වෙත ලබා දෙන්න.
- ක්‍රියාකාරකම්හි යොදවන්න.

මිනිත්තු 10යි

පියවර 4.2.2.3. : 
- සියලු ම කණ්ඩායම්වලට තම නිමැවුම් ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- සෙසු කණ්ඩායම් මගින් එම නිමැවුම් වල ප්‍රබලතා දුර්වලතා පෙන්වා දෙන්නට අවස්ථාව ලබා දෙන්න.
- උපායශීලී නිර්මාණශීලී නිමැවුම් පන්තියේ ප්‍රදර්ශනය කරමින් පොදු නිමැවුමක් ගොඩ නගන්න.
- සිසු නිමැවුම් අගයමින් පහත සඳහන් කරුණු අවධාරනය කරමින් සමාලෝචනයක යෙදෙන්න.

- ජීවිතයේ දී හමුවන විවිධ අභියෝග අවස්ථාවල දී උපායශීලීව කටයුතු කළ යුතු බව.
- ජීවිත අභියෝග ජයගැනීමට උපාය ශීලීවීමේ දී තමා මෙන්ම අන් අය ද සහයෝගීව කටයුතු කළ යුතු බව.
- නිර්මාණශීලීව නව උපාය මාර්ග අනුගමනය කිරීමෙන් ජීවිතයට ජයග්‍රහණයන් ප්‍රබෝධයන් අත් වන බව.
- විවිධ ආකාරයෙන් එක ම සිද්ධියක් හා අවස්ථා දෙස බැලීමට පුරුදුවීමෙන් පුළුල් ජීවිත අවබෝධයක් ලැබෙන බව.

මිනිත්තු 10යි

## තක්සේරුව හා ඇගයීම

- ජීවිතයේ අභියෝගාත්මක අවස්ථාවල දී ඊට මුහුණ දීමට විචාරශීලී උපාය මාර්ග ප්‍රකාශ කරයි.
- විවිධ දෘෂ්ටිකෝණවලින් බැලීමෙන් නිවැරදි අනාවරණයකට මඟ පෙන්වන බව පිළිගනියි.
- උපායශීලීව හා නිර්මාණශීලීව ගැටලු විසඳයි.
- දකින ඇසෙන දේ දෙස විචාරශීලීව බලයි.
- තමා හා අවට සමාජ ජීවිත අවස්ථා සඳහා නිර්මාණශීලීත්වයෙන් කටයුතු කරයි.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

පසුවැඩ :-

උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල පිට වී ඇත. විශ්ව විද්‍යාලයට අයදුම් කිරීම සඳහා පියල්ට එක ලකුණක් අඩු ය. ඔහු විෂයයන් තුනට ම B සමාර්ථය ලබා ඇත. ඔහු හදාරා ඇත්තේ කලා විෂයයන් වන දේශපාලන විද්‍යාව, ආර්ථික විද්‍යාව හා සිංහලය. ඔහුගේ අපේක්ෂාව වූයේ විශ්ව විද්‍යාලයට ඇතුළත් වීමය. මේ ඔහු උසස් පෙළ විභාගයට පෙනී සිටි පළමුවැනි අවස්ථාවයි. පියල් ගේ පියා ගොවියෙකි. මව පවුල් සෞඛ්‍ය සේවිකාවක් ලෙස කටයුතු කරයි. පියල්ට වැඩිමහල් සහෝදරියක් හා සහෝදරයෙකි. වැඩිමහල් ම අක්කා විවාහ වී අවුරුදු පහකි. දෙවැනි අයියා නගරයේ කර්මාන්තශාලාවක කාර්මික පුහුණුවක් ලබයි. ඔහු සාමාන්‍ය පෙළ විභාගයෙන් පසු පාසලෙන් ඉවත් වූවෙකි. බාල මල්ලී 10 වැනි ශ්‍රේණියේ ය. පියල්ගේ තවත් යහළුවන් දෙදෙනෙකු අවශ්‍ය ලකුණු ලබා ඇත. එහෙත් සියල්ලන්ම පාඩම් කළේ එකට ය. එසේ එකට පාඩම් කළ තවත් යහළුවන් තිදෙනෙකු පියල්ට වඩා අඩු ලකුණු ලබා ඇත.

- මෙම සිද්ධිය පන්තියේ තුන් දෙනාගේ කුඩා කණ්ඩායම්වලට භාර දී සාකච්ඡා කරන්නට අවස්ථාව දෙන්න.
- පියල් කුමන පියවරක් ගන්නේදැ යි අනුමාන කරන ක්‍රියා මාර්ගයත්, පියල්ට ගත හැකි විකල්ප ක්‍රියා මාර්ග තුනකුත් එක් එක් කණ්ඩායම ලවා ලියවන්න.
- ශිෂ්‍යයන් ලියූ අදහස් එක් එක් කණ්ඩායම ලවා ප්‍රකාශ කරවන්න.
- ශිෂ්‍යයන් ගොඩ නැගූ අදහස්වල සාර්ථකභාවය සාකච්ඡා කරන්න.

අවධානයට ලක් විය යුතු කරුණු / සාකච්ඡාවට

- එක් එක් අයගේ ඉගෙනුම් ප්‍රතිඵල අසමාන බව හා එය සාමාන්‍ය තත්ත්වයක් බව
- ඉගෙනීම සඳහා විවිධ මාර්ග ඇති බව.
- ඉගෙනීම සඳහා විවිධ අවකාශ හා ක්‍රමෝපායයන් භාවිතා කළ හැකි බව.
- විශ්ව විද්‍යාලයට යා නොහැකිවීමෙන් ජීවිත අපේක්ෂාවන්ට හානියක් නොවන බව
- අවශ්‍ය නම් වෙනත් මාර්ග ඔස්සේ විශ්ව විද්‍යාල උපාධියක් නිසි කලට ලබා ගත හැකි බව
- උපායශීලීව හා විචරශීලීව තීරණ ගෙන කටයුතු කිරීමෙන් ජීවිත ප්‍රශ්න ජය ගත හැකි බව.
- අනාගත ඉලක්ක සකස් කර ගැනීමේ දී එය නම්‍යශීලී විය යුතු අතර ම, විකල්ප ඉලක්ක සඳහා ඉඩ කඩ සකස් කර ගෙන තිබිය යුතු බව.

ඇමුණුම 4.2.2.1

පහත සඳහන් ගැටළුව ශිෂ්‍යයකු මගින් පන්තියට ඉදිරිපත් කරන්න.

එක් මගියෙක් ගඟකින් එතෙරවීමට පැමිණියේ කොටියකු, එළුවකු හා තම්පලා මිටියක් ද රැගෙන ය. ඔරුවෙන් එගොඩවීමට ඔවුන්ට එකවරක දී නොහැකි ය. ඔරුවෙන් එක් වරක දී එතෙර විය හැක්කේ මගියාට හා තම්පලා මිටිය, එළුවා, කොටියා යන තුනෙන් එකකට ය. ඔරුවේ ගමන් ගනිත්දීත්, මෙගොඩ හා එගොඩ තැබීමේදීත් කොටියා විසින් එළුවාත්, එළුවා විසින් තම්පලා මිටියත් ආහාරයට ගනී. කිසිවෙකුටත් හානියක් නොවී මගියා විසින් කොටියා, එළුවා හා තම්පලා මිටිය ගඟෙන් එගොඩ කළ ආකාරය කෙසේ ද?

ඇමුණුම 4.2.2.2

පහත සඳහන් සිද්ධිය හොඳින් ගවේෂණය කර එම තොරතුරු දත්ත ඇසුරෙන් ඔබේ නිගමන මත ඔබ ගන්නා තීරණ ඉදිරිපත් කරන්න.

"වේලාව ප.ව. 1.30 ට පමණ ඇත. හර්ෂ වෙනත් කිසිවකු නැති තම නිවසට වී තමා ඉතා ම ආශාව දක්වන රූපවාහිනී කාටූන් වැඩසටහන් නරඹමින් සිටී. කෙටි විරාමය තුළ දී නිවෙසින් එළියට පැමිණි හර්ෂට අසල්වැසි නිවෙස් කීපයකට නුදුරින් මහා ගින්නක දුමක් නැගෙනු පෙනෙයි. තම මිත්‍ර සුභාෂ්ගේ නිවෙස පිහිටා ඇත්තේ ද ඒ ආසන්නයේ ය. කලබලයට පත් හර්ෂ දුටුවේ අසල් වැසි නිවෙස්වල ද කිසිවෙකු නොමැති බවයි. තව සුළු මොහොතකින් තමාගේ නිවසත් මුළු ප්‍රදේශය පුරාත් ගින්න පැතිරෙනු ඇත. රූපවාහිනී වැඩ සටහන නැවත ආරම්භව ඇත.

1. ඔබ හර්ෂ නම් ඔබ ගන්නා පියවර පිළිවෙලින් ලියන්න.
   1.
   2.
   3.
   4.
   5.

2. මෙම සිද්ධියේ ඉදිරියේ දී සිදුවිය හැකි තත්වය ඔබ සිතෙන පරිදි නිර්මාණය කරන්න.

## 5.0 නිපුණතාව : යහපත් අන්තර් පුද්ගල සබඳතා පවත්වයි.

කාලච්ඡේද 06

හැඳින්වීම

> අපට එදිනෙදා ජීවිතයේ දී විවිධ පුද්ගලයන් සමඟ කටයුතු කිරීමට සිදු වේ. එවැනි අවස්ථාවල දී අන් අය සමඟ සුහදව, සහයෝගයෙන් කටයුතු කිරීමට හැකි වේ නම්, ඔවුන් හා අප අතර ගොඩ නැගෙන සම්බන්ධතාවය යහපත්, ප්‍රීතිදායක එකක් වනු ඇත. එවැනි සම්බන්ධතාවන් අප හඳුන්වන්නේ යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතා යනුවෙනි. එවැනි යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතා ඇති කර ගැනීමට හා පවත්වා ගැනීමට අප තුළ වර්ධනය කර ගත යුතු නිපුණතා රාශියකි. සුහද ලෙස කතා බහ කිරීම, හොඳින් සවන් දීම, ප්‍රිය වචන භාවිතය, අන් අයට ගරු කරමින් හැසිරීම, අන් අයගේ මතයන්ට ඇහුම් කන් දීම ආදිය මෙයට අයත් වේ. මෙවැනි නිපුණතා දරුවන් තුළ වර්ධනය කොට යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතා පැවැත්විය හැකි යහපත් පුරවැසියකු බිහි කිරීම මේ මගින් අපේක්ෂා කෙරේ.

නිපුණතා මට්ටම

**5.1 සාර්ථක ජීවිතයක් සඳහා යහපත් අන්තර් පුද්ගල සබඳතා උපයෝගී කර ගනියි.**

විෂය අන්තර්ගතය :

තනිව ජීවත්වීමේ දී පුද්ගලයකු මුහුණ පාන අපහසුතා

- ගෝලීයකරණය තුළ කිසි ම පුද්ගලයකුට හුදකලාව ජීවත්වීම අපහසු වේ.
- සෑම පුද්ගලයකු වටා ම ගොඩ නැගුණු විවිධ සමාජ කණ්ඩායම් පවතී. (පවුල, පාසල, සමාජය, ආදී වශයෙන් )
- එවැනි සමාජ කණ්ඩායම්වලට අනුගත විය නොහැකි පුද්ගලයන්ට විවිධ අපහසුතාවන්ට මුහුණ දීමට සිදු වේ.
- යහපත් අන්තර් පුද්ගල සබඳතා ඇති කර ගැනීමෙන් එවැනි අපහසුතා වළක්වා ගත හැකි වේ.
- බොහෝ දෙනෙකුගේ දායකත්වයෙන් සිදුවන පුද්ගල සංවර්ධනය
- ජීවිතයේ ද විවිධ ජීවන අවධි පසු කිරීමට සිදු වේ.
- එක් එක් අවධියේ දී විවිධ පුද්ගලයන් ඇසුරු කිරීමට සිදු වේ. (උදා : නිවසේ දී, පාසලේ දී )
- විවිධ පුද්ගලයන් ඇසුරින් ගොඩ නැගෙන යහපත් අන්තර් පුද්ගල සබඳතා පුද්ගල සංවර්ධනයට හේතුවකි.
- එවැනි පුද්ගලයන් සමඟ ඇසුරු කිරීමට අප තුළ වර්ධනය කරගත යුතු නිපුණතා රාශියකි.

  ( උදා : ඉවසීම, අන්මත ඉවසීම, සවන්දීම, සංවේදී බව, සහානුභූතිය, පරිත්‍යාගය ආදී ලෙස )
- ජීවන ගමන පහසු කරවන යහපත් අන්තර් පුද්ගල සබඳතා
  - යහපත් අන්තර් පුද්ගල සබඳතා පැවැත්වීම සඳහා අවශ්‍ය නිපුණතා හඳුනා ගනී.

    ( උදා : ඉවසීම, අන් මත වලට ගරු කිරීම, සවන් දීම, හා ප්‍රිය වචන භාවිතය

ආදී )

- මෙම ගුණාංග වර්ධනය තුළින් පුද්ගලයන් තුළ ඇති වන ස්වයං විනය යහපත් අන්තර් පුද්ගල සබඳතා පැවැත්වීමට රුකුළකි.
- එම ගුණාංග වර්ධනය කර ගැනීම මගින් එදිනෙදා ජීවිතයේ විවිධ පුද්ගලයන් සමග යහපත් අන්තර් පුද්ගල සබඳතා ඇති කර ගනී.
- එම සම්බන්ධතා නිසා ජීවන ගමන පහසු වන අතර, සාමකාමී සමාජීය පරිසරයක් ගොඩ නැගීමට ද ඒවා හේතු වෙයි.

- යහපත් අන්තර් පුද්ගල සබඳතා පැවැත්වීමේ විවිධ ක්‍රම
  - විවිධ පුද්ගලයන් සමඟ ඇති කර ගන්නා අන්තර් පුද්ගල සබඳතා දිගු කාලීනව පවත්වා ගෙන යාම වැදගත් වේ.
  - සුහද සිනාව, සුහද කතා බහ, සුභ පැතීම් විවිධ උත්සව සඳහා ආරාධනා හා හමුවීම් යහපත් අන්තර් පුද්ගල සබඳතා තහවුරු කර ගැනීමේ විවිධ ක්‍රම වේ.
  - විවිධ පුද්ගලයන් සමඟ ගොඩ නගා ගන්නා සුහදශීලී බව එදිනෙදා ජීවිතය සතුටින් ගත කිරීමට හා ජීවන ගමන ආලෝකමත් වීමට ද හේතු වේ.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතා මට්ටම

**5.2 ගැටුම් වැලැක්වීමට හා නිරාකරණයට යහපත් අන්තර් පුද්ගල සබඳතා උපයෝගී කර ගනියි.**

* ගැටුම ස්වභාවික වන අතර, ගැටුම වැළැක්විය නොහැකි ය.
* ගැටුම්වලට විවිධ හේතු බලපායි.
* ගැටුම් ආරම්භයේ දී හඳුනා ගැනීම වළක්වා ගැනීමට හේතු වෙයි.
* ගැටුම දුර දිග යාම විශාල හානි ඇති කරයි.
* ගැටුමෙන් තොරව ජීවත්වීමට නිවස හා පාසලෙන් අවශ්‍ය නිපුණතා ලබා ගැනීමට අවශ්‍ය ය.

- යහපත් අන්තර් පුද්ගල සබඳතා මගින් ගැටුම අව ම කර ගැනීමේ ශිල්ප ක්‍රම
  - අපට එදිනෙදා ජීවිතයේ දී විවිධ පුද්ගලයන් ඇසුරු කිරීමට සිදු වේ. ඔවුන් තුළ විවිධත්වයක් පවතී.
  - එම විවිධත්වයන් මැද ගැටුමින් තොරව සතුටින් ජීවත් වීම අවශ්‍ය ය.
  - ඒ සඳහා යහපත් අන්තර් පුද්ගල සබඳතා ගොඩ නගා ගැනීම අවශ්‍ය ය.
  - විවිධත්වය ඉවසීම, ගරු කිරීම, ගරුත්වය දැක්වීම වැනි විධි ක්‍රම අන්තර් පුද්ගල සබඳතා ශක්තිමත් කරන ගැටුම් අවම කරන විධි ක්‍රම වේ.

නිපුණතාව : යහපත් අන්තර්පුද්ගල සබඳතා පවත්වයි.

නිපුණතා මට්ටම : සාර්ථක ජීවිතයක් සඳහා යහපත් අන්තර්පුද්ගල සම්බන්ධතා උපයෝගී කර ගනියි.

ක්‍රියාකාරකම3.1.1 : " යහපත් සබඳතා දිවිමඟට වාසනා"

කාලය : මිනිත්තු 40

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම් අංක 5.1.1.1
- ඇමුණුම් අංක 5.1.2.2
- ඇමුණුම් අංක 5.1.1.3

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 5.1.1.1. :
- ඇමුණුම 5.1.1.1 සිසුන්ට බෙදා දෙන්න.
- සිසුන් ක්‍රියාකාකරකමෙහි යොදවන්න.
- පහත සඳහන් කරණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

> - අපගේ දිවිගමනේ දී විවිධ ජීවන අවධි පසු කරන බව
> - එම එක් එක් අවධියේ දී විවිධ පුද්ගලයන් සමඟ සබඳතා පැවැත්වීමට සිදුවන බව
> - තමන්ගේ දියුණුවට මේ දක්වා උපකාරී වූ පුද්ගලයින් රාශියක් සිටින බව
> - ඒ සෑම දෙනාම දායකත්වය ලැබීම නිසා අප හැම දෙනාම ජීවත් වන බව
> - ඔවුන් වෙනුවෙන් අප යුතුකම් ඉටු කළ යුතු බව හා ඔවුන් සමඟ හොඳ අන්තර් පුද්ගල සබඳතා පැවැත්වීම වැදගත් බව

මිනිත්තු 10යි

පියවර 5.1.1.2 :
- පන්තියේ සිසුන්ට ඇමුණුම 5.1.1.2 හා ඇමුණුම 5.1.1.3 බෙදා දෙන්න.
- ඒවා සම්පූර්ණ කිරීමට උපදෙස් දෙන්න.

මිනිත්තු 15යි

පියවර 5.1.1.3 :
- සිසුන් ලියූ පිළිතුරු පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- අහඹු ලෙස සිසුන් ලියූ දෑ පන්තියට ඉදිරිපත් කරන්න.
- ඒ පිළිබඳව සිසු අදහස් විමසන්න.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

- පහත සඳහන් කරුණු මතුවන සේ සමාලෝචනයක යෙදෙන්න.

- අපගේ ජීවත්වීම සඳහා විශාල පිරිසක් දායක වී ඇති බව
- ඔවුන්ගේ දායකත්වය නොලැබුනේ නම් අපට ජීවත්වීම අපහසු බව
- අපට මුණ ගැසෙන හා උදව් වූවන් සමග සුහඳ සබඳතා පැවැත්විය යුතු බව.
- සුහඳ සබඳතා පැවැත්වීමේ දී අප තුළ ද වර්ධනය කළ යුතු ගුණාංග ඇති බව ( ඇමුණුම 03 පිළිතුරු තුළින් මතු කරන්න) අපට උදව් කරන අයට ප්‍රති උපකාර කළ යුතු බව
- කළ ගුණ සැලකීම අවශ්‍ය බව

මිනිත්තු 15යි

තක්සේරුව හා ඇගයීම

- පුද්ගලයන් සමග සුහඳව ඇසුරු කිරීමට අවශ්‍ය ගුණාංග නම් කරයි.
- තමන්ගේ දියුණුවට උදව් කළ පුද්ගලයන් රාශියක් ඇති බව පිළිගනිමින් අදහස් දක්වයි.
- පවරන ලද කාර්යය නිසි ලෙස ඉටු කරයි.
- යහපත් අන්තර් පුද්ගල සබඳතා පවත්වයි.
- උදව් කළ අයට ප්‍රති උපකාර දක්වයි.

ඇමුණුම 5.1.11

මෙහි දැක්වෙන පින්තූරවලින් ජීවිත ගමනේ දී අප පසු කරන විවිධ අවධි දැක්වේ. එම එක් එක් අවධියේ දී අපට ඇසුරු කිරීමට සබඳතා පැවැත්වීමට ලැබෙන පිරිස් එක් එක් පින්තූරය ඉදිරියෙන් ලියන්න.



වැඩිහිටියෝ

..............................................

..............................................



යෞවනයින්

..............................................

..............................................



ළමයා

..............................................

..............................................



ළදරුවා

..............................................

..............................................

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඇමුණුම 5.1.1.2

ඔබ හත් වන ශ්‍රේණියේ සිසුවකු ලෙස ඔබගේ සංවර්ධනයට දායක වූවන් ගැන මොහොතක් සිතන්න. ඒවා ඉදිරියෙන් ලියන්න.

1. ළදරු විය ..............................................................................

2. ළමා විය ..............................................................................

3. නිවසේ දී ..............................................................................

4. පාසලේ දී ..............................................................................

5. අසල් වැසියන් ......................................................................

6. යහළු යෙහෙලියන් ..................................................................

ඇමුණුම5.1.1.3

## කාර්ය පත්‍රිකාව

1 කණ්ඩායම

1. ඔබ වඩාත් සම්බන්ධතා පැවැත්වීමට කැමති අසල්වැසි පවුලක් ගැන සිතන්න. ඔවුන් සමඟ ඔබ ඇසුරු කිරීමට කැමති හේතු ලියන්න.

2 කණ්ඩායම

2. ඔබ වඩාත් ආදරය කරන නෑදෑයකු ගැන සිතන්න. ඔහුට වඩාත් කැමති හේතු ලියන්න.

3 කණ්ඩායම

ඔබ වඩාත් කැමති ගුරුවරයකු ගැන සිතන්න. එසේ කැමති වීමට හේතු ලියන්න.

4 කණ්ඩායම

ඔබ හොඳම යහළුවා ගැන සිතන්න. ඔහු හොඳ යහළුවා ලෙස තෝරා ගැනීමට හේතු ලියන්න.

නිපුණතාව : යහපත් අන්තර්පුද්ගල සබඳතා පවත්වයි.

නිපුණතා මට්ටම : සාර්ථක ජීවිතයක් සඳහා යහපත් අන්තර්පුද්ගල සබඳතා උපයෝගී කර ගනී.

ක්‍රියාකාරකම : " තනිකමෙන් මිදෙමු, හොඳ මිතුරෙකු වෙමු"

කාලය : මිනිත්තු 40

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 5.1.2.1 සඳහන් සිද්ධි අධ්‍යයනය " නිලන්ත සහ කමලා "
- ලියන කඩදාසි

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 5.1.2.1. :
- ඇමුණුම අංක 5.1.2.1 සිද්ධි අධ්‍යයනය සිසුවෙකු ලවා පන්තියට ඉදිරිපත් කරන්න.
- එහි ඇතුළත් ප්‍රශ්නවලට පිළිතුරු විමසමින් පාඩමට පිවිසෙන්න.
- සිසු ප්‍රතිචාර අගය කරමින් පහත සඳහන් කරුණු මතුකරමින් සාකච්ඡාවක යෙදෙන්න.

> - සෑම පුද්ගලයකු ම සමාජයේ සාමාජිකයෙකු බව
> - සෑම පුද්ගලයකු ම සමාජයේ සමාජ කණ්ඩායම්වලට අයත්වන බව
>   උදා : නිවස, පාසල, සම වයස් කණ්ඩායම්
> - කිසිවකුට තනිව ම, හුදකලාව, සමාජයේ ජීවත් විය නොහැකි බව
> - තම අවශ්‍යතා ඉටු කර ගැනීමට අන්තර් පුද්ගල සබඳතා පැවැත්වීම අවශ්‍ය බව
> - මේ සඳහා ඵලදායි සන්නිවේදන ක්‍රම භාවිතා කළ යුතු බව

මිනිත්තු 10යි

පියවර 5.1.1.2. :
- ලියන කඩදාසි සිසුන්ට බෙදා දෙන්න.
- තනිව ජීවත් වීමේ දී පුද්ගලයකු මුහුණ පාන අපහසුතා 03ක් ලිවීමට උපදෙස් දෙන්න.
- ඒ අපහසුතා මඟ හරවා ගැනීම සඳහා ගත යුතු ක්‍රියා මාර්ග කුමක් දැ යි සොයා බැලීමට උපදෙස් දෙන්න.

මිනිත්තු 10යි

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

පියවර 4.2.1.2 :

- එක් එක් සිසුවාට තමා ගැන හා තමන් නිවසේ කාර්යයන්ට උදව්වන ආකාරය පිළිබඳ කථා කිරීමට උපදෙස් දෙන්න.
- සෑම සිසුවෙකු ම එම කථාවලට සවන්දීම අවශ්‍ය බව පවසන්න.
- එම කථා අවසානයේ අත්පොළසන් දීමට උපදෙස් දෙන්න.

- එක් පුද්ගලයෙකුට පමණක් තමන්ගේ මූලික අවශ්‍යතා ඉටු කර ගත නොහැකි බව.
- තම අවශ්‍යතා ඉටු කර ගැනීමට සමාජයේ අනෙකුත් පුද්ගලයන්ගේ සහාය අවශ්‍ය බව.
- මිත්‍රශීලී බව, ප්‍රසන්න බව, විනීත බව, කාරුණික බව, යහපත් පුද්ගල සබඳතා වර්ධනය කර ගැනීමට ඉවහල් වන බව.
- තනිව ජීවත්වන පුද්ගලයන්ට මිතුරන් අඩු බව හා ඔවුන්ට සමාජයේ පිළිගැනීම ද අඩු බව.
- තනිව ජීවත් වන පුද්ගලයා සමාජයෙන් හුදකලා ව සමාජයෙන් කොන්ව යන බව.
- මිත්‍ර සබඳතා මගින් සමාජ සබඳතා වර්ධනය වී පුද්ගලාන්තර සංනිවේදනය දියුණු වන බව.

මිනිත්තු 20යි

තක්සේරුව හා ඇගයීම

- තමා ජීවත් වන ආකාරය විස්තර කරයි.
- එකමුතුව වැඩ කිරීම අගය කරමින් අදහස් දක්වයි.
- යහපත් මිතුරු සබඳතා වර්ධනය කර ගනියි.
- අන් අයට උදව් උපකාර කරයි.
- පොදු සමාජ කටයුතුවලට සහභාගී වේ.
  උදා : ශ්‍රමදාන, ආගමික කටයුතු

පසුවැඩ :- තම පවුලේ කාර්යයන්ට උපකාරී වූ අවස්ථා නිපුණතා දින පොතේ සටහන් කරන්න.

ඇමුණුම් අංක 5.2.1.1

**නිලන්ත සහ කමල්**

නිලන්ත සහ කමල් එක ම පාසලක 7 වන ශ්‍රේණියේ ඉගෙන ගන්නා සිසුන් දෙදෙනෙක් පහත දැක්වෙන නිලන්තගේ සහ කමල්ගේ චරිත රටා නිරීක්ෂණය කරන්න.

නිලන්ත - නිලන්ත 7 වන ශ්‍රේණියේ ඉගෙන ගන්නා ශිෂ්‍යයෙකි. නිලන්තගේ පියා මිය ගොස් දැනට වසර 02ක් පමන වේ. උදෙන් ම අවදි වන නිලන්ත අම්මාගේ කඩයප්පන් සෑදීමට උදව් වී නංගී හා මල්ලීගේ ද අවශ්‍යතා ඉටු කර ඔවුන් සමග පාසල් යයි. ඔහුට පන්තියේ මිතුරු, මිතුරියෝ රාශියක් සිටිති. එමෙන් ම ඔහුට ගමේත් මිතුරු මිතුරියන්ගෙන් අඩුවක් නොමැත. නිතර ම සිනහවෙන් සිටින ඔහු තම මිතුරු මිතුරියන්ට ආදරයෙන් සෙනෙහසින් මිත්‍රශීලීව කථා කරයි. පන්තියේ, පාසලේ, ගමේ හැම දෙනාට ම උදව් කරයි. ඒ නිසා ඔහුට ප්‍රති උපකාර ද නිතර ලැබේ. මෑතක දී ඔහුගේ නිවසට තීන්ත ආලේප කළ අතර ඒ සඳහා ගමේ මෙන් ම පන්තියේ යහළුවන් බොහෝ දෙනෙක් ඔහුට උපකාර කළහ. නිලන්තගේ හොඳ ගතිගුණ නිසා හා උපකාරි ගුණය නිසා ගමේ මෙන් ම පාසලේත් හොඳ පිළි ගැනීමක් ඇත. එම නිසා නිලන්ත ඉතා ම සතුටින් කාලය ගත කරයි.

කමල් - කමල් ද නිලන්ත සමඟ එක ම පන්තියේ ඉගෙන ගනියි කමල්ගේ පියා ප්‍රදේශයේ ධනවතෙකු නිසා මුදල් අතින් ද කමල්ට හිඟයක් නැත. කමල්ට තිබෙන මුදල් බලය නිසා ඔහු පන්තියේ කිසි ම කෙනෙකු සමඟ වැඩි කථාවක් නැත. ඒ නිසා කිසි ම යහළුවෙක් ඔහු සමඟ දිගු මිත්‍ර සබඳතා ගොඩ නගා නොගනී. ඔහුගේ මුහුණේ සිනාවක් දක්නට ලැබෙන්නේ ද ඉතා ම කලාතුරකිනි. තමන්ට හැම වැඩක් ම තනියෙන් කර ගත හැකි බව හා අනෙකුත් අය නොදන්නා පිරිසක් බව ඔහු නිතර සිතයි. ඒත් ඔහුට කිසි ම වැඩක් පිළිවෙලට කර ගත නොහැක. ඔහුගේ කථා විලාස තුළ ද කිසි ම ලෙන්ගතු බවක් සුහඳ බවක් දක්නට නැත. කමල්ගේ නිවසේ මෑතක දී දානමය පින්කමක් තිබුණ අතර ඒ සඳහා ඔහු පන්තියේ හා ගමේ යහළුවන් කීප දෙනෙකුට ඇරයුම් කළත් ඔවුන්ගෙන් බහුතරයක් එයට සහභාගී නොවූ අතර එම පිංකමට කමල්ගේ දායකත්වය ද ඉතා ම අඩුවිය. කමල් ගේ අලසකම හා උඩගු කම නිසා ඔහුගේ පන්තියේ මෙන් ම ගමේ ද සමාජ පිළිගැනීම ඉතා ම අඩු ය.

පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු විමසන්න.

1. නිලන්තගේ චරිතරය ගැන ඔබට කිව හැක්කේ කුමක් ද?
2. කමල්ගේ චරිතය තුළ ඔබ දකින දුර්වලතා මොනවා ද?
3. මේ චරිත තුළින් ඔබට ලබා ගත හැකි ආදර්ශ මොනවා ද?

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව : යහපත් අන්තර්පුද්ගල සබඳතා පවත්වයි.

නිපුණතා මට්ටම : සාර්ථක ජිවිතයක් සඳහා යහපත් අන්තර්පුද්ගල සබඳතා උපයෝගී කර ගනියි.

ක්‍රියාකාරකම 5.1.3 : " එක්ව සැම දෙන ලබමු ජය මඟ "

කාලය : මිනිත්තු 80

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 5.1.3.1 පිවිසීම සඳහා පින්තූරය හා කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 5.1.3.2 විස්තර පත්‍රිකාව
- ඇමුණුම 5.1.3.3 කාර්ය පත්‍රිකාව
- ලියන කඩදාසි

ගුරුවරයාට උපදෙස්:
- ඇමුණුම අංක 5.1.3.1 හි සඳහන් පින්තූර වෙන් වෙන්ව කාඩ්බෝඩ් කැබලිවල අලවා කැබලි කපා ගන්න. ( එක් රූපයකින් පිටපත් 4ක් තිබිය යුතු ය)

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 5.1.3.1. :
- පන්තියේ සිසුන්ගෙන් දෙදෙනෙක් තේවල ක්‍රියාකාරකම් සඳහා ද, තිදෙනා බැගින් කණ්ඩායම් දෙකක් සඳහා සිසුන් 6 දෙනෙක් සමූහ ක්‍රියාකාරකම සඳහා ද, තෝරා ගෙන ඇමුණුම 5.1.3.1 ඔවුන්ට ලබා දී කාර්යයෙහි නිරත කරවන්න.
- ඔවුන් කරන කාර්ය නිරීක්ෂණයට අන් සිසුන්ට අවස්ථාව දෙන්න.
- සිසුන්ගේ ක්‍රියාකාරකමින් පසුව පහත සඳහන් කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාවක් කරන්න.

| |
|---|
| • යම් කිසි කාර්යයක් තනිව කිරීමට අපහසු බව<br>• ඒ සඳහා වැඩි කාලයක් ගත වන බව<br>• කිහිප දෙනෙකු එකතු වී එම කාර්යයට පහසුවෙන් හා ඉක්මණින් කළ හැකි බව |

මිනිත්තු 20යි

පියවර 5.1.3.2. :
- පන්තියේ සිසුන් කණ්ඩායම හතරකට බෙදන්න.
- ඇමුණුම 5.1.3.2 විස්තර පත්‍රිකාව හා ඇමුණුම 5.1.3.3 කාර්ය පත්‍රිකාව එක් කණ්ඩායමකට එක බැගින් ලබා දෙන්න.
- සිසුන් ක්‍රියාකාරකමෙහි යොදවන්න.
- අවශ්‍ය අවස්ථාවල දී ගුරු මඟ පෙන්වීම කරන්න.

මිනිත්තු 30යි

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

පියවර 5.1.3.3 :
- ශිෂ්‍ය කණ්ඩායම්වල ඉදිරිපත් කිරීම් සඳහා අවශ්‍ය කාලය ලබා දෙන්න.
- ඒ ඒ ඉදිරිපත් කිරීම් අවස්ථාවල දී අන් කණ්ඩායම්වල සංවර්ධනය යෝජනා ලබා ගන්න.
- ඉදිරිපත් කිරීම් අවසානයේ පහත සඳහන් කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.


- කිසි ම පුද්ගලයෙකුට තනිව ජීවත්වීමට නොහැකි බව
- උපතේ සිට මරණය දක්වා විවිධාකාර පුද්ගලයින් සමග සහයෝගයෙන් ජීවත් වන බව
- තනිව ජීවත් වීමට උත්සාහ කරන පුද්ගලයා හුදකලා වන බව හා අසරණ වන බව
- යහපත් අන්තර්පුද්ගල සම්බන්ධතා සෑම පුද්ගලයෙකුට ම අත්‍යවශ්‍ය බව
- යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතාවලින් පුද්ගලික සංවර්ධනයක් ඇති වන බව
- සෑම අවස්ථාවකදී ම යහපත් අන්තර්පුද්ගල සම්බන්ධතා වර්ධනය වන ලෙස කටයුතු කළ යුතු බව
- ඒ තුළින් තමාට මෙන් ම අන් අයට ද සමාජයට ද යහපතක් සිදු වන බව

මිනිත්තු 30යි

## තක්සේරුව හා ඇගයීම

- යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතාවල වාසි නම් කරයි.
- යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතාවල වටිනාකම අගය කරයි.
- ඵලදායි අන්තර් පුද්ගල සබඳතාවලින් ඇති ප්‍රයෝජන ඉදිරිපත් කරයි.
- සාමූහිකව අර්ථවත් ක්‍රියාකාරකම්වල යෙදේ.
- ඵලදායී අන්තර් පුද්ගල සබඳතා වැඩි දියුණු කළ හැකි ආකාරය පැහැදිළි කරයි.

ඇමුණුම 5.1.3.1



ඔබට/ඔබ කණ්ඩායමට/ පැවරෙන්නේ විනාඩි 2ක් ඇතුළත දෙනු ලබන කාඩ්පත් අර්ථවත් ආකාරයකට ගොඩ නැගීමටත්

ඇමුණුම 5.1.3.2

තොරතුරු පත්‍රිකාව

එක්තරා ගසක හිටියා දිමියන් රංචුවක්. එයාලා හරිම සතුටින් ජීවත් වුනේ, ඔන්න මේ පවුලට අලුතෙන් ඉපදුනා පුංචි දිමි පැටියෙක්. එයා වෙනස් පාටයි. හැමෝගෙ ම අවධානය දිමි පැටියාට යොමු වුණා. හැමෝ ම එයා ගැන සොයා බැලුවා. දිමි පැටියා ටික ටික ලොකු වුණා. හරිම ආඩම්බරයි. මේ දිමි පැටියා හැමෝගෙන් ම උදව් ගන්නවා. කාටවත් සැලකුවේ නෑ. තමන්ට ලැබෙන බඩු වෙනමම තියා ගන්නවා. කාටවත් දුන්නේ නැහැ. එයා තනිව ම ඉන්න තමයි උත්සාහ කළේ. දවසක් හරිම වැඩක් වුණේ. මහා හුලගක් ඇවිත් දිමි ගොටුව කැඩිලා ගියා. හැමෝ ම දුක්වුණා. රතු දිමියා එහෙම හිතුවේ නෑ. මට නම් හරිම හොඳයි. මට පුලුවන් වෙන ම ඉන්න. මට විතරක් ගෙයක් හදාගෙන. රතු දිමියා එහෙම හිතුවා.

හදිසියේ ම අහස කලුවෙලා ගොරවන්න පටන් ගත්තා. දිමියෝ ටික එකතුවෙලා ඉක්මණට ගෙයක් හදා ගන්නා ලෑස්ති වුණා. කට්ටියක් කොළ ලං කරනවා. අනිත් අය කොළ වහනවා. සමහරු බිම වැටුණු බඩු ගෙට ගන්නවා. රතු දිමියා ආවේ නෑ. එයා වෙනම ම ගේ හදා ගන්න ලෑස්තිය. හුළං හමනවා වේගයෙන්, දැන් දිමි රංචුව ගේ හදලා ඉවරයි. කෑම කන්නත් සූදානම්.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

රතු දිමියා තාමත් කොළ දෙක ලං කර ගන්න බැරිව සිටිනවා. එහාට මෙහාට දඟලනවා. හරිම මහන්සියි. අනේ එක පාරට ම මහ වැස්සක් ආවා. කොළ එහෙට, මෙහෙට ඇඹරුණා. රතු දිමියා එල්ලී හිටිය කොළයත් ගලවා ගෙන වතුරට වැටුණා. වැස්ස අඩු වුණා. දිමි ගෙදර හැමෝ ම කලබල වුනා. රතු දිමියගේ ගේ හදන තැනත් නෑ. රතු දිමියත් වැටිලා, කොළ රොඩු අතර හිරවෙලා, වතුර පෙවිලා බඩත් ලොකු වෙලා. තරුණ දිමියෝ ටික ඉක්මණට දුව ගෙන ගිහින් රතු දිමියා ඔසවා ගෙන ආවා. දිමි නැන්දා වතුර උණු කරනවා. දිමි අක්කා තුවායක් අර ගෙන ආවා. රතු දිමියා මුණින් අතට හරවලා බඩේ පිරුණ වතුර අහකට ඇරියා. රතු දිමියා යන්තම් ඇස් ඇරියා. හැමෝට ම සතුටුයි. ටික වේලාවකින් උණුවෙන් ම කෝපි ටිකක් දුන්නා. දැන්නම් රතු දිමියට හොඳටම හොඳයි වගේ. රතු දිමියාගේ ඇස්වල කඳුළු පිරුණා. අනේ මට සමාවෙන්න. ආයෙමත් මම තනියම ගෙවල් හදන්න යන්නේ නෑ. ඔයාලත් එක්කම හැමදාම සතුටින් ඉන්නවා රතු දිමියා හෙමින් සැරේ කිව්වා.

(රූපවාහිනී කාටූන් වැඩසටහනක් ඇසුරිනි )

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඇමුණුම 5.1.3.3

ඇමුණුම 7.5.1.2 ඇසුරින් පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

- අන්තර් පුද්ගල සම්බන්ධතාව යනු කුමක්දැ යි හඳුන්වන්න.
- පුද්ගලයෙකුට තනිව ජීවිතවීමේ දී මතුවිය හැකි ගැටලු අවස්ථා මොනවා ද?
- යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතා පැවැත්වීමේ දී තමාට හා අන් අයට සිදුවන යහපත් මොනවා ද?
- ඔබ රතු දිමියා නම් මෙවන් අවස්ථාවක ඔබ ක්‍රියා කළ යුතුව තිබුනේ කෙසේ ද?
- රතු දිමියා අපහසුවට ලක්වුණේ ඇයි?
- දිමි කණ්ඩායම වැස්සෙන් ගැලවුණේ කෙසේ ද?
- කණ්ඩායමක් ලෙස කටයුතු කිරීමේ දී සැලසෙන වාසි මොනවා ද?

නිපුණතාව : යහපත් අන්තර්පුද්ගල සබඳතා පවත්වයි.

නිපුණතා මට්ටම : ගැටුම් වැළැක්වීමට හා නිරාකරණයට යහපත් අන්තර්පුද්ගල සබඳතා උපයෝගී කර ගනියි.

ක්‍රියාකාරකම 5.2.1 : " මල් කලඹේ පාට පාට මල් ගොඩයි ලස්සනයි "

කාලය : මිනිත්තු 40

ගුණාත්මක යෙදවුම් :

- ඇමුණුම 5.2.1.1 ඇමුණුම 5.2.1.2
- කඩදාසි
- ඇල්පෙනෙත්ති
- බෝඩ් එක
- මාකර් පෑන්

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 5.2.1.1 :
- ඇමුණුම අංක 5.2.1.1 අඩංගු කවිය හා එහි අර්ථය ලියූ බ්‍රිස්ටල් බෝඩ් එක පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- සුදුසු සිසුවකු / සිසුවියක ලවා පන්තිය ඉදිරියේ ගායනය කරවන්න.
- සැවොම එක් ව ගායනය කරන්න.
- අදහස ඇසුරෙන් බුද්ධි කලම්බන සාකච්ඡාවක් මෙහෙයවන්න.
- සම වයස්කයන් තුළ තිබිය හැකි ගැටුමකට මුල් විය හැකි ගුණ විමසන්න.

> - මිනිසුන් සතු ව යහත් ගුණ මෙන් ම නුගුණ ද ඇති බව
> - කිසි ම නුගුණයකින් තොර පුද්ගලයින් සෙවීම නිශ්ඵල බව
> - එබැවින් තමාගේ හොඳ ගැන තුටු වෙමින් ඒවා වර්ධනය කර ගන්නා අතර නුගුණ අව ම කර ගැනීමට උත්සාහ දැරිය යුතු බව
> - අන්‍යයන්ට ද එසේ කිරීමට සහාය විය යුතු බව

මිනිත්තු 10යි

පියවර 5.2.1.2 :
- හැම දෙනාටම කඩදාසි තීරු (පන්තියේ ළමයින් සංඛ්‍යාවට එකක් අඩු සංඛ්‍යාවක් ) දෙන්න.
- ලියන කඩදාසි හෝ එවැනි කොළයකින් බෑගයක් සාදා ඇල්පෙනෙත්තියකින් පිටේ රඳවා ගැනීමට එකිනෙකාට උදව් වන ලෙස උපදෙස් දෙන්න.

- තමාට ලැබුණු කොළ තීරුවල පන්තියේ ළමයින්ගේ නම් ලියා ඔහු /ඇය දක්වන ගුණයක් හා එය සංවර්ධනය කර ගැනීමේ ක්‍රියාමාර්ගය පමණක් පිටට පෙනෙන සේ නමා තබා ගන්නට උපදෙස් දෙන්න.
- ඉන් පසු සියලු දෙනාට ම තමා කැමති කුරුල්ලකු/වාහනයක් අනුකරණය කරමින් කවිය, ගයමින් එලිමහන් බිම පන්තිය පුරා යන අතර පන්තියේ සිසු/සිසුවියන්ගේ පිටෙහි වූ බෑගයට තමා ලියූ කොළ තීරුව දැමීමට උපදෙස් දෙන්න.

මිනිත්තු 10යි

පියවර 5.2.1.3 :

- පළමු ව කොළ තීරු නිවැරදි ව අවසන් කළ සිසුවාට/ සිසුවියට අත ඔසවන්නට කල් තියා උපදෙස් දෙන්න.
- ක්‍රියාව අරඹන්නට සංඥාවක් දෙන්න.
- ක්‍රියාව අවසන් කළ පසු තමාගේ පිටේ බෑගයේ ඇති කොළ ගෙන කියවන ලෙස උපදෙස් දෙන්න.
- කුඩා කණ්ඩායම් ලෙස එක්ව සම වයස්කයන්ට තිබිය හැකි, ගැටුමකට මුල් විය හැකි නුගුණ ලැයිස්තුවක් සාදා ඒ ඉදිරියෙන් ඒවා වලක්වා ගැනීමට ගත යුතු ක්‍රියා මාර්ග සටහන් කරන ලෙස උපදෙස් දෙන්න.
- කණ්ඩායම් ඉදිරිපත් කිරීම්වලට ඉඩ සලස්සන්න.
- ඉදිරිපත් කළ කණ්ඩායමට පළමු ඌණ පූරණය සඳහා අවකාශ දෙන්න.
- සෙසු කණ්ඩායම්වල සංවර්ධනාත්මක යෝජනා විමසන්න.
- පහත කරුණු මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.

> - අප හැම දෙනා තුළ ම අඩුපාඩු තිබිය හැකි බව
> - ඒ සමහර නුගුණ හේතුවෙන් ගැටුම් ඇති විය හැකි බව
> - අන් අය තුළ මෙන් ම තමා තුළ ද අඩුපාඩු ඇති බව පිළි ගෙන ඒ නිසා අධෛර්යය නොවී අඩු පාඩු වලක්වා ගැනීමේ ක්‍රියාමාර්ග උදෙසා එකිනෙකාට සහාය විය යුතු බව
> - තමා තුළ මෙන් ම අන් අය තුළ ද අඩුපාඩු තිබිය හැකි බව ප්‍රත්‍යක්ෂ වූ විට පුද්ගල අනන්‍යතාව පිළිබඳ නව දැක්මක් ආරම්භ වන බව
> - අන් අයගේ අඩුපාඩු/නුගුණ ප්‍රදර්ශනය වන විට තමාට තරහ යාම වැනි ප්‍රතික්‍රියා අඩු වීමට ද මෙම දැක්ම උපකාර වන බව
> - විවිධත්වය තුළ හමුවන සුන්දරත්වය පිළිබඳ සංවේදී වීම ඔස්සේ බොහෝ ගැටුම් වළක්වා ගත හැකි බව

මිනිත්තු 20යි

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

තක්සේරුව හා ඇගයීම

- මිනිසුන් තුළ සොඳුරු ගුණ මෙන් ම නුගුණ ද හමුවිය හැකි බව ප්‍රකාශ කරයි.
- අන් අය තුළ ඇති හොඳ දැකීම හා අගය කිරීම මගින්, නුගුණ අවධානයට ලක්වීම නිසා ඇති විය හැකි ප්‍රකෝප වීම් අව ම කර ගත හැකි බව පිළිගනියි.
- අන් අයගේ සොඳුරු ගුණ අගය කරයි.
- තමාගේ අඩුපාඩු මඟ හරවා ගැනීමට උත්සාහ කිරීමේ හා අන්‍යයන්ට එසේ කරන්නට උදව් වීමේ සූදානම ප්‍රදර්ශනය කරයි.
- අන් මත ඉවසයි.

ඇමුණුම 5.2.1.1

"මිනිස් හට සොඳුරු ගුණ සහ නුගුණ ඇත
නිදොස් කෙනෙක් මෙ දියත උපදනේ නැත
වෙසෙස් සිනිඳු මුවරද බර සහස් පත
කොරොස් නලින් යුතු වෙයි. කටු පෙලිනියුත

මිනිසුන් හට සොඳුරු ගුණ මෙන් ම නුගුණ ද ඇත. සර්වප්‍රකාරයෙන් ම දොස්වලින් තොර වුවක මිහි මත නුපදී එනම් උපදින සියල්ලෝ ම අඩුපාඩු සහිත ය. අතිශයින් සිනිඳු පෙති වලින් යුක්ත පැණි පිරුණු නෙලුම්වල ද කටු සහිත වූ කොරොස් වූ නටුවකින් යුක්ත ය.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඇමුණුම 5.2.1.2

<u>ගවේෂණ උපදෙස්</u>

මල් කලඹෙ පාට පාට මල් ගොඩයි. ලස්සනයි.

1. ඔබේ පන්තියේ සිසු/සිසුවියන්ගේ ප්‍රකට කෙරෙන ගුණ පිළිබඳ අවධානය යොමු කරන්න.
2. කඩදාසි තීරුවල ශිෂ්‍යයාගේ/ශිෂ්‍යාවගේ නම, දියුණු කළ යුතු යයි ඔබ සිතන ගුණය, එය දියුණු කර ගැනීමට ගත යුතු යයි ඔබට හැඟෙන ක්‍රියා මාර්ගය කොළ තීරුවේ ලියන්න.
3. නම පමණක් පිටට පෙනෙන සේ කොළ තීරු නමා සකස් කළ ගොණුව අතට ගන්න.
4. කොළයක් බෑගයක් ලෙස නවා අනෙකකු ගේ උදව්වෙන් පිටේ අල්පෙනෙතියකින් සවි කර ගන්න.
5. ගුරු මග පෙන්වීම අනුව වාහන /කුරුල්ලකු වැනි අනුකරණයක යෙදෙමින් කවිය ගායනා කරමින් මිතුරු/මිතුරියන් පිටේ ඇති බෑග්වලට ඔබේ අත ඇති ගුණ ලියූ කොළ තීරු (අදාළ පරිදි ) දමමින් අත ඇති කොළ තීරු අවසන් කරන්න.
6. තම අත ඇති කොළ තීරු පළමු ව අවසන් කළ තැනැත්තා ක්‍රීඩාව ජයග්‍රහණය කරන නිසා අත ඔසවා "තමා අවසන් " කළ ක්‍රියාවේ සතුට හැමට ප්‍රදර්ශනය කරන්න.
7. තම පිටේ ඇති බෑගයේ බහා ඇති කඩදාසි තීරු ගණන සටහන් කර ගෙන ඒවා කියවා බලන්න.
8. තමාගේ දියුණු කළ යුතු යයි අන්‍යයන් සඳහන් කරන ගුණාංග හා ඒ සඳහා ගත යුතු යයි යෝජිත ක්‍රියා මාර්ගයට ඔබ එකඟ දැයි සිතා බලන්න.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව : යහපත් අන්තර්පුද්ගල සබඳතා පවත්වයි.

නිපුණතා මට්ටම : ගැටුම් වැළැක්වීමට හා නිරාකරණයට යහපත් අන්තර්පුද්ගල සබඳතා උපයෝගී කර ගනියි.

ක්‍රියාකාරකම 5.2.2 : " නිබඳ සුහද බව ගෙන දෙයි සැනසුම "

කාලය : මිනිත්තු 40

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 5.2.2.1 කාටූන් චිත්‍රය
- ඇමුණුම 5.2.2.2, 5.2.2.3 කාර්ය පත්‍රිකාව
- A4 කඩදාසි
- ෆෙල්ට් පෑන්
- කඩදාසි ටේප්

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 5.2.2.1. :
- ඇමුණුම අංක 5.2.2.1 හි සඳහන් කාටූනය තෝරා ගත් සිසුන් හතර දෙනෙක් ලවා භූමිකා රංගනයකින් ඉදිරිපත් කරවන්න.
- එහි සඳහන් සිද්ධි ගැටුම්කාරී තත්ත්වය මතුවීමට හේතුවිය හැකි ආකාරය සාකච්ඡා කරන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක යෙදෙන්න.

> - ගැටුම් ඇතිවීමට අප නොසලකා හරින ඉතා සරල ම හේතු වුව ද මුල්විය හැකි බව
> - අප කථා කරන වචන, අන් අයට සවන් නොදීම, ආචාරශීලී නොවීම, පුද්ගල ගෞරවයට හානි පැමිණීම ආදී හේතූන් ගැටුම්වලට මුල්විය හැකි බව
> - යහපත් අන්තර් පුද්ගල සබඳතා තුළින් ගැටුම් අව ම කර ගැනීමට හැකි බව

මිනිත්තු 10යි

පියවර 5.2.2.2 :
- සිසුන් සියළු ම දෙනාට කාර්ය පත්‍රිකා එක බැගින් ලබා දෙන්න ( ඇමුණුම 5.2.2.2)
- කාර්ය පත්‍රිකාව හොඳින් නිරීක්ෂණය කිරීමට අවස්ථාව දෙන්න.
- නිරීක්ෂණයෙන් පසු ක්‍රියාකාරකමෙහි යොමු කරවන්න.

මිනිත්තු 15යි

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

පියවර 5.2.2.3 :

- ක්‍රියාකාරකම් අවසන් වූ පසු තමා ලඟ සිටින තම යහලුවා සමඟ එය නිරීක්ෂණය සඳහා හුවමාරු කර ගන්න.
- කාර්ය පත්‍රිකා හුවමාරු කර ගෙන අධ්‍යයනයෙන් පසු පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- ඒවායේ ඇති සුවිශේෂ අවස්ථා සාකච්ඡා කරන්න.
- පහත සඳහන් කරුණු මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.

> - අපට එදිනෙදා ජීවිතයේ දී විවිධ පුද්ගලයින් ඇසුරු කිරීමටත්, කටයුතු කිරීමටත් සිදු වන බව.
> - එම විවිධත්වය තුළ ගැටුමින් තොරව සාමකාමී ව කටයුතු කළ යුතු බව.
> - ඒ සඳහා යහපත් අන්තර් පුද්ගල සබඳතා පැවැත්විය යුතු බව.
> - සිනහව, සවන්දීම, අන්මත ගරු කිරීම, සුහද කථා බහ, අන්‍යයන්ට ගරු කිරීම, ආදී ගුණාංග මගින් අන්තර් පුද්ගල සබඳතා වර්ධනය කර ගත හැකි බව.
> - යහපත් අන්තර් පුද්ගල සබඳතා වර්ධනය කර ගැනීම මගින් ජීවන ගමන පහසු කරවන බව.

මිනිත්තු 15යි

## තක්සේරුව හා ඇගයීම


- ගැටුම් ඇති වීමට හේතු දක්වයි.
- සුහදව කටයුතු කිරීම මගින් ගැටුම් අව ම කර ගත හැකි බව පිළිගනියි.
- අන්තර් පුද්ගල සම්බන්ධතා ගොඩ නගා ගත හැකි ආකාරය ලියා දක්වයි.
- ගැටුමින් තොරව කටයුතු කිරීමට අවශ්‍ය ගුණාංග ප්‍රගුණ කරයි.
- ගැටුම් අව ම කර ගනිමින් කටුතු කරයි.

ඇමුණුම 5.2.2.1













Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඇමුණුම 5.2.2.2

යහපත් අන්තර් පුද්ගල සබඳතා නොපැවැත්වීම හේතු කොට ගෙන ඔබ මුහුණ දුන් ගැටුම්කාරී අවස්ථාවක් සිහිපත් කර පහත සඳහන් ප්‍රශ්න ඇසුරු කර ගෙන ක්‍රියාකාරකමෙහි නිරතවන්න.

| ගැටුම්කාරී තත්ත්වයට මුහුණදුන් අවස්ථාව | ඔබට හිතෙන දැනෙන දේ ලියන්න. |
|---|---|
| 1. ගැටුමට තුඩු දුන් හේතුව<br><br>2. ගැටුම වූයේ කවුරුන් සමග ද?<br><br>3. එම අවස්ථාවේ ඔබ කුමක් කළේ ද?<br><br>4. ඔබ මුහුණ දුන් ගැටුම්කාරී අවස්ථාවේ ඔබ නියෝජනය වූයේ<br>* ගැටුම ඇතිකළ තැනැත්තා ලෙස ද?<br>* ගැටුමට භාජනය වූ තැනැත්තා ලෙස ද?<br><br>5. එම ගැටුම වළක්වා ගැනීමට ඔබ කළ යුතුව තිබුණේ කුමක් ද?<br><br>6. එවැනි ගැටුමක් නැවත ඇති නොවීමට ඔබ අනුගමනය කරන ක්‍රියාමාර්ග මොනවා ද?<br><br>7. පුද්ගලයින් සමඟ ගැටුමින් තොරව කටයුතු කිරීමට ඔබට කළ හැකි ක්‍රියා මාර්ග ඔබ යෝජනා කරන්න. | |

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඇමුණුම 5.2.2.3

ඇමුණුම 5.2.2.2 හි සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න. මෙම ආකෘතිය භාවිත කරන්න.

| ගැටුම්කාරී තත්ත්වයන්ට මුහුණ දුන් අවස්ථාව | ඒ අවස්ථාවේ ඔබට හිතෙන දැනුන දේ ලියන්න. |
|---|---|
| 1. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . | . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . |
| 2. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . | . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . |
| 3. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . | . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . |
| 4. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . | . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . |
| 5. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . | . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . |
| 6. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . | . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . |
| 7. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . | . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . |

# ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය

# ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

## II කොටස - පුරවැසි අධ්‍යාපනය

## 7.1 අපේ පවුල

### හැඳින්වීම

සමාජයේ මූලික තැනුම් ඒකකය වන්නේ පවුලයි. පවුල් ඒකක කිහිපයක් එක් වීමෙන් සමාජය නිර්මාණය වේ. පවුල් ඒකකයේ ශක්තිමත් භාවය මත සමාජයේ ශක්තිමත් භාවය රඳා පවතී. පුද්ගලයා මුලින් ම සාමාජිකත්වය ලබන, එමෙන් ම දීර්ඝ කාලයක් සාමාජිකත්වයේ සිටින, පුද්ගල සංවර්ධනයට මූලික වශයෙන් බලපාන, සමාජ ඒකකය වන්නේ ද පවුලයි. යහපත් සාමාජිකයන් බිහි කිරීම මගින් යහපත් සමාජ පරිසරයක් ගොඩ නැගීමට පවුල නැමැති සමාජ ඒකකය දායක වේ. විවිධ ආර්ථික හා සමාජ සාධකවල බලපෑම නිසා ඉක්මණින් වෙනස්වීම්වලට මුහුණ දෙන ලෝකය තුළ පවුල් ඒකකය ද විවිධ අභියෝගවලට ලක් වී ඇත. සාමාජිකයින් අතර සබඳතා සීමා වීම, විවේකය මඳ වීම, දෙමාපිය රැකවරණය අහිමි වීම මෙවන් තත්ත්වයන්ට නිදසුන් ලෙස දැක්විය හැකි ය. එවන් සමාජ වටපිටාවක් තුළ පවුලේ වැදගත්කම, පවුල් ජීවිතය තුළින් අත් දැකීමට හසුකර ගන්නා වැදගත් සමාජ හර පද්ධතීන්, පවුලේ සාමාජිකයන් වශයෙන් ඉටු කළ යුතු යුතුකම් හා වගකීම්, අසල්වැසි පවුල් ඒකක සමඟ අන්තර් සබඳතා පවත්වා ගැනීමේ වැදගත්කම යනාදිය පිළිබඳ අවබෝධයක් මෙම ඒකකය තුළින් ලබා දීමට අපේක්ෂිත ය. එමෙන් ම එම හැකියා ප්‍රායෝගික ව භාවිත කිරීමේ කුසලතාව සංවර්ධනය කිරීම ද, මෙම ඒකකය අධ්‍යයනය කිරීමට සැලැස්වීම මගින් ඉටු කර ගැනීමට අපේක්ෂා කෙරේ. ක්‍රියාකාරී ඉගෙනුම් අවස්ථා සම්පාදනය කර මෙම ඒකකය අධ්‍යයනය කිරීමට පහසුකම් සැලැස්වීම මගින් සමාජයේ යහ පැවැත්මට දායක වන නිපුණතා ශිෂ්‍යයා තුළ වර්ධනය කිරීමට හැකියාව ලැබෙනු ඇත.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 7.1 අපේ පවුල

නිපුණතාව : යුතුකම් හා වගකීම් ඉටු කිරීම තුළින් පවුලේ සාමාජිකයන් අතර යහපත් අන්තර් සබඳතා ගොඩ නගා ගනියි.

නිපුණතා මට්ටම :
- සමාජයේ කුඩා ම සහ වැදගත් ම ඒකකය ලෙස පවුල හඳුනා ගෙන යහපත් සාමාජිකයකු ලෙස ස්ථාවර පවුල් ඒකක ගොඩ නගා ගැනීමට පෙළඹෙයි.
- පවුල හා අසල්වාසීන් අතර අන්‍යෝන්‍ය සබඳතා තහවුරු කර ගෙන සහජීවනයෙන් ජීවත්වීමට හුරුවෙයි.
- පවුලේ සාමාජිකයෙකු ලෙස තම අයිතිවාසිකම් භුක්ති විඳිමින් යුතුකම් ඉටු කරමින් විනය ගරුක ව ජීවත්වීමට අවශ්‍ය මානව ගුණ ධර්ම වර්ධනය කර ගනියි.

විෂය අන්තර්ගතය

### 7.1.1 පවුල හැඳින්වීම

- ඥාතීත්වය පදනම් කර ගෙන ගොඩ නැගුණු කුඩා ම සමාජ ඒකකය පවුල වේ.
- පවුල් ඒකක ඒකරාශීවීමෙන් සමාජය බිහිවේ.
- පවුල පිළිබඳ සරල නිර්වචන

  " පවුල යනු ස්වාමි පුරුෂයකු හා බිරිඳකගෙන් සමන්විත සංගමයක් හෝ දරුවන් ඇති හෝ නැති එසේම බොහෝ දුරට කල් පවත්නා ස්වාමියා සහ ගැහැණියක ගෙන් හෝ දරුවන්ගෙන් සමන්විත සමූහයකි." ( Nimcoff - 1947 )
  (නිම්කොෆ් - 1947 )

  " ආර්ථික වශයෙන් හා දරුවන් හදා වඩා ගැනීමේ දී සහයෝගිව කටයුතු කරන්නාවූත්, සියල්ලන් ම හෝ වැඩි දෙනෙකු පොදු නිවසක් තුළ ජීවත්වන්නාවූත් විවාහ යුවලක් හෝ පිරිපුන් වයසැති ඥාතීන් පිරිසකි".
  ( කැතලින් ගෆ් - 1959 )


  " ආර්ථික සහයෝගීතාව, පොදු වාසස්ථානය, ප්‍රජනනය හා අන් සංස්කෘත්‍යයනය තුළින් බැඳුන සමාජ ඒකකයකි."
  ( 1949 - ඇමරිකානු මානව විද්‍යාඥ ජී.ජී. මර්ඩොක් )

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 7.1.2 පවුල් වර්ග

පවුලක සාමාජිකත්වය අනුව පවුල් වර්ග දෙකකි.

- න්‍යෂ්ඨික පවුල
- විස්තෘත පවුල




- න්‍යෂ්ඨික පවුලක ලක්ෂණ
    * පවුල් වර්ග අතරින් කුඩා ම වර්ගය යි. සමාජයක ඇති කුඩා ම ක්‍රියාකාරී ඒකකය යි.
    * පියා, මව සහ දරුවන් පමණක් අඩංගු වේ.
    * උදව් සඳහා පිටස්තරයන් මත බැඳීම අඩු ය
    * ස්වාධීනය
    * පෞද්ගලිකත්වය වැඩිය

- විස්තෘත පවුලක ලක්ෂණ
    * පියා මව සහ දරුවන්ට අමතර ව වෙනත් සාමාජිකයෝ ද අඩංගු වෙති.
    * වෙනත් අය සඳහා උපකාරක සේවා ක්‍රියාත්මක කරයි.
    * පෞද්ගලිකත්වය අඩුයි.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

න්‍යෂ්ඨික පවුල



විස්තෘත පවුල



## 7.1.2 පවුලේ සාමාජිකයන් හා ඥාතීත්වය

* මව් පාර්ශවයේ ඥාතීත්වය
* පිය පාර්ශවයේ ඥාතීත්වය
* ඥාතීත්වය සඳහා විවිධ ප්‍රදේශවල විවිධ ඇමතුම් භාවිත කරයි.

පිය පාර්ශවයේ ඥාතීත්වය

| ඔබේ පියාගේ | ඔබට ඇති ඥාතීත්වය |
|---|---|
| පියා | සීයා |
| මව | ආච්චි |
| අයියා | මහප්පා |
| මල්ලී | බාප්පා |
| අයියාගේ බිරිඳ | ලොකු අම්මා |
| මල්ලිගේ බිරිඳ | පුංචි අම්මා |
| අයියා/මල්ලීගේ පුතා | ඥාති සහෝදරයා |
| අයියාගේ/මල්ලීගේ දුව | ඥාති සහෝදරිය |
| අක්කා/නංගි | නැන්දා |
| අක්කාගේ/නංගිගේ සැමියා | මාමා |
| අක්කාගේ /නංගිගේ පුතා | මස්සිනා |
| අක්කාගේ නංගිගේ දුව | නෑනා |

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

මව් පාර්ශවයේ ඥාතීත්වය

| ඔබ මවගේ | ඔබට ඇති ඥාතීත්වය |
|---|---|
| පියා | සීයා |
| මව | ආච්චි |
| අයියා | මාමා |
| මල්ලී | මාමා |
| අයියාගේ බිරිඳ | නැන්දා |
| මල්ලිගේ බිරිඳ | නැන්දා |
| අයියාගේ/මල්ලිගේ පුතා | මස්සිනා |
| අයියාගේ/මල්ලිගේ දුව | නෑනා |
| අක්කා | ලොකුඅම්මා |
| නංගී | පුංචි අම්මා |
| අක්කාගේ සැමියා | ලොකු තාත්තා |
| නංගීගේ සැමියා | බාප්පා |
| අක්කාගේ/නංගීගේ පුතා | ඥාති සහෝදරයා |
| අක්කාගේ /නංගිගේ දුව | ඥාති සහෝදරිය |

- විවිධ ප්‍රදේශවල ඥාතීත්වය සඳහා භාවිත කරන ඇමතුම් වෙනස් වන බව

| | |
|---|---|
| පියා - | අප්පච්චි/තාත්තා |
| ආච්චි - | ආත්තා/කිරිඅත්තා/හීන්අත්තා/අත්තම්මා |
| සීයා - | මුත්තා/අත්තා/ලොකුඅත්තා |
| බාප්පා - | පුංචිතාත්තා/හීන්අප්පච්චි/බාප්පොච්චි/කුඩප්පච්චි |
| පුංචි අම්මා - | බාලම්මා/කුඩම්මා/මම්මා |
| ලොකු අම්මා - | මහම්මා |
| ලොකු තාත්තා - | මහප්පා/ලොකු අප්පච්චි |
| නැන්දා - | නැන්දම්මා |
| මාමා - | මාමණ්ඩි |

- ඥාතීත්වය පවත්වා ගැනීමේ වැදගත්කම
  - සාමුහකත්වය ගොඩ නැගීම
  - අන්‍යොන්‍ය සබඳතා වර්ධනය වීම
  - එකනෙකාට උදව් කිරීම
  - පාරම්පරික සම්ප්‍රදායන් පවත්වා ගත හැකිවීම
  - සංස්කෘතිය පවරා දීම

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 7.1.3 පවුල තුළ ක්‍රියාත්මක වන සිරිත් විරිත් සම්ප්‍රදායන්, ඇගයීම්

- සිරිත් විරිත්

පුද්ගලයකුගේ උපතේ සිට මරණය දක්වා වූ විවිධ අවස්ථාවල දී ඉටු කළ යුතු, පවත්වාගෙන යා යුතු යහපත් දේ සිරිත් ලෙස හැඳින් වේ. නොකළ යුතු හෝ අත්හළ යුතු දේවල් විරිත් ලෙස හඳුන්වයි. චාරිත්‍ර ඉටු කිරීමේ දී කළ යුතු දේ නොකිරීම ද, නොකළ යුතු දේ කිරීම ද විරිතකි. එමෙන් ම උදා. ලෙස ආහාර ගැනීමට පෙර අත් සේදීම සිරිතකි. අත් නොසෝ දා ආහාර ගැනීම, තලු මැරීම විරිත් වේ.

සිරිත් විරිත් ක්‍රියාත්මක වන අවස්ථාවලට උදා : ගෙට ගෙවදීම
ඉඳුල් කට ගෑම
අකුරු කියවීම
මල්වර උත්සව
විවාහ මංගල්‍ය උත්සව
අවමංගල්‍ය උත්සව
විශේෂ සංස්කෘතික උත්සව අවස්ථා

- **සම්ප්‍රදායන්**
  * පවුලක් තුළ දීර්ඝ කාලයක් තිස්සේ පවත්වා ගෙන යනු ලබන පිළිවෙත්
    උදා : වැඩිහිටියන්ට සැලකීම
  * පවුලේ සාමාජිකයකු වශයෙන් තමා වෙත පැවරෙන වගකීම් හා යුතුකම් ඉටු කිරීම
  * කාලයක් තිස්සේ පවත්වා ගෙන යනු ලබන ඇවතුම් පැවතුම්
    උදා : නිවසින් බැහැර යාමේ දී වැඩිහිටියන් නැමදීම
    ආගන්තුක සත්කාරය

- **පවුලක් තුළ සිරිත් විරිත් හා සම්ප්‍රදායයන් රැක ගැනීමේ වැදගත්කම**
  * පවුලක යහ පැවැත්ම ආරක්ෂා වීම
  * සාමාජිකයන් අතර සුහදත්වය ආරක්ෂා වීම
  * සිරිත් විරිත් පවත්වා ගෙන යාම
  * යහපත් පුරවැසියන් සමාජයට දායාද කිරීම

## 7.1.4 පවුලේ සාමාජිකයන්ගේ අයිතිවාසිකම්, යුතුකම් හා වගකීම්

- පවුලක සාමාජිකයකු වශයෙන් පවුල තුළින් තමාට හිමිවිය යුතු දේ අයිතිවාසිකම් වේ. උදාහරණ :
  - අධ්‍යාපනය ලබා ගැනීම
  - ආදරය, කරුණාව, දයාව, සෙනෙහස ලබා ගැනීම

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

- ආරක්ෂාව ලබා ගැනීම
- ආහාර හා පෝෂණය ලබා ගැනීම
- ඇඳුම් පැළඳුම් හා ලෙඩ රෝග සඳහා ඖෂධ ලබා ගැනීම
- සහජ හැකියාවන් වර්ධනය කර ගැනීම
- විවේකය අර්ථවත්ව ගත කිරීම

- මෙම අයිතිවාසිකම් නිසි පරිදි බුක්ති විඳීමෙන් අත් වන ප්‍රයෝජන
  - යහපත් මානසික හා ශාරීරික සෞඛ්‍යයෙන් යුත් පුද්ගලයන් බිහිවීම
  - සමබර පෞරුෂයක් ගොඩ නගා ගත හැකිවීම
  - යහපත් සමාජයක් ගොඩ නැගීමට අවශ්‍ය පසුබිම සකස්වීම

- පවුලේ සාමාජිකයකු වශයෙන් පවුලේ යහ පැවැත්ම සඳහා තමාගෙන් පවුලට ඉටුවිය යුතු කාර්යයන් යුතුකම් වේ. පවුල තුළ තම අයිතිවාසිකම් භුක්ති විඳීමේ දී ඒ හා බැඳුනු යුතුකම් ඉටු කළ යුතු වේ.
  - නායකත්වයට ගරු කිරීම
  - නායකත්වය දැරීම
  - දෙමව්පියන් හා වැඩිහිටියන්ගේ කටයුතුවලට උදව් කිරීම
  - දෙමව්පියන්ට හා වැඩිහිටියන්ට ගරු කිරීම හා සැලකීම
  - පවුලේ සාමාජිකයන්ට ආදරය හා කරුණාව දැක්වීම
  - පවුලේ සම්ප්‍රදායන් ආරක්ෂා කිරීම
  - හොඳින් අධ්‍යාපන කටයුතුවල නිරත වීම
  - දෙමව්පියන්ට වැඩිහිටියන්ට කීකරුවීම
  - තම පවුලට අයත් දේ ආරක්ෂා කර ගැනීම

- පවුලේ සාමාජිකයකු වශයෙන් යුතුකම් ඉටු කිරීමේ වැදගත්කම

- පවුලේ සාමාජිකයන්ගේ වගකීම

**පියා**
- ආදර්ශවත් ජීවිතයක් ගත කිරීම
- සාධාරණව මුදල් ඉපයීම
- ආරක්ෂාව හා රැකවරණය ලබාදීම
- දරුවන්ට නිසි පෝෂණය ලබා දීම
- පවුලට නායකත්වය සැපයීම
- දරුවන් යහ මග යැවීම

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

**මව**

- දරුවන් යහමග යැවීම
- ආදර්ශවත් ජීවිතයක් ගත කිරීම
- සාධාරණ මුදල් ඉපයීම හා ආදායම පවුලේ යහපත සඳහා යෙදවීම
- ආරක්ෂාව හා රැකවරණය ලබා දීම
- දරුවන්ට නිසි පෝෂණය ලබාදීම
- පවුලට නායකත්වය සැපයීම

**දරුවන්**

- හොඳින් අධ්‍යාපනය ලබා ගැනීම
- පවුල සතු දෑ ආරක්ෂා කිරීම
- දෙමාපියන් වැඩිහිටියන්ට උදව් උපකාර කිරීම
- මව පියා නොමැති අවස්ථාවල නිවසේ කටයුතු හා සෙසු සාමාජිකයින් පිළිබඳව සොයා බැලීම
- පවුල තුළ සමගියෙන් කටයුතු කිරීම

- වගකීම් ඉටු කිරීම පවුල් ඒකකයේ ස්ථාවර පැවැත්ම සඳහා වැදගත් වේ.
- නූතන පවුල් ඒකකවලට එල්ලවන අභියෝග
  - දෙමාපියන් රැකියා සඳහා විදේශ ගත වීම
  - දෙමව්පියන් රැකියාවල නිරත වීම
  - විවේකය මඳවීම
  - තරඟකාරීත්වය
  - මාධ්‍ය මගින් එල්ලවන අනිසි බල පෑම්
  - විලාසිතා වැඩිවීම
  - සාරධර්ම පිරිහීම
  - මත්ද්‍රව්‍ය මගින් එල්ල වන බල පෑම

7.1.5 තම පවුල හා අසල්වාසීන් අතර පවත්නා සබඳතාවල වැදගත්කම

- පවුල් ඒකක රාශියක එකතුව තුළින් සාමාජයක් බිහිවේ
- පුද්ගලයකුට තනිව ජීවත්විය නොහැකිවීම මෙන් ම පවුලකට ද සමාජයේ තනිව ජීවත්විය නොහැක
- තම පවුල් ඒකකය වටා ජීවත් වන සෙසු පවුල් ඒකක අසල්වාසීන් වේ.
  - එම පවුල් ඒකක අතර අන්තර් සබඳතා ගොඩ නගා ගැනීමෙන් සමාජ සංවර්ධනයක් බිහිවේ.
  - පවුලක විවිධ අවශ්‍යතා සපුරා ගැනීමේ දී අසල්වාසීන්ගේ සහයෝගය අවශ්‍ය වේ.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

උදා : * අවමඟුල් අවස්ථාවල දී
* විවාහ මංගල්‍ය අවස්ථාවල දී
* හදිසි විපත් අවස්ථාවල දී
* වහලක් සෙවිලි කිරීම වැනි පිරිසක් අවශ්‍ය අවස්ථාවලදී
* ගොවිතැන් කටයුතු කිරීමේ දී

- අසල්වාසීන් සමඟ මනා සම්බන්ධතාවයක් ගොඩ නගා ගැනීමේ වැදගත්කම
  - අන්‍යෝන්‍ය සහයෝගය වර්ධනය වීම
  - ප්‍රදේශය සංවර්ධනයට දායක වීම
  - අවශ්‍ය අවස්ථාවල දී උදව් උපකාර ලබා ගැනීම
  - එකමුතුකම වර්ධනය වීම

- අසල්වාසීගෙන් ජන ජීවිතයට බාධාකාරී විය හැකි ක්‍රියාකාරකම්
  - නීත්‍යානුකූල නොවන රැකියාවල නිරතවීම
  - ගුවන් විදුලිය, කැසට් රෙකෝඩරය, රූපවාහිනිය වැනි උපකරණවලින් නිකුත්වන අධික ශබ්දය
  - අපද්‍රව්‍ය නිසිලෙස බැහැර නොකිරීම
  - අසල්වාසීන් සමඟ අසමගිතා ඇතිකර ගැනීම
  - පොදු සේවා ප්‍රයෝජනයට ගැනීමේ දී සම්මතයෙන් බැහැරව කටයුතු කිරීම

## 7.1.6 පවුල තුළින් බිහිවන යහපත් පුරවැසියෙකු සතු විය යුතු ගුණාංග

- සමාජයක මුල් තැනුම් ඒකකය වන්නේ පවුලයි.
- පවුලෙන් සමාජයට දායාද කරන පුද්ලයෙකු තුළ වර්ධනය කළ යුතු ගුණාංග
  - අන්‍ය මත ඉවසීම
  - කරුණාව හා දයාව
  - අවංකබව
  - සුහදශීලීබව
  - නායකත්වය
  - පරිසරයට සංවේදී බව
  - ස්ථානෝචිත ප්‍රඥාව
  - සහකම්පනය
  - ඉවසීම
  - පරාර්ථකාමීබව
  - ස්වයං විනය

- පවුලක සාමාජිකයන් යහගුණයෙන් පිරිපුන් වූවොත් සමාජය ද යහපත් සමාජයක් බවට පත් වේ.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 7.1.1 ක්‍රියාකාරකම

නිපුණතා මට්ටම : සමාජයේ කුඩා ම සහ වැදගත් ම ඒකකය ලෙස පවුල හඳුනා ගෙන යහපත් සාමාජිකයෙකු ලෙස ස්ථාවර පවුල් ඒකක ගොඩ නගා ගැනීමට පෙළඹෙයි.

ක්‍රියාකාරකම : "එකමුතු පවුලක් ගොඩ නගමු."

කාලය : මිනිත්තු 40 යි

ගුණාත්මක යෙදවුම් :
- A 4 කඩදාසි
- මාකර් පෑන්
- ඇමුණුම 7.1.1.1 කාර්ය පත්‍රිකාව

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :

පියවර 7.1.1.1 :
- A4 කඩදාසිය බැගින් පන්තියේ සියලුම ළමුන්ට බෙදා දෙන්න.
- තම පවුලේ සාමාජිකයන් එම කඩදාසියෙහි අඳින ලෙස උපදෙස් දෙන්න.
- අඳින ලද පවුල් බිත්තියේ ප්‍රදර්ශනය කරවන්න.
- පහත දැක්වෙන කරුණු ඉස්මතු වන පරිදි සාකච්ඡාවක් මෙහෙයවන්න.

- ඔබ නිවසේ වාසය කරන්නේ ඔබ පමණක් නොවන බව
- ඔබ සමඟ ඔබට සමීපතම පුද්ගලයින් කීප දෙනෙක් ජීවත්වන බව
- ඔබ නිවසේ ජීවත්වන සියලුම සාමාජිකයින් එක්ව ගත් විට එය ඔබේ පවුල වන බව
- මව හා පියා එම පවුලේ ප්‍රධානීන් වන බව
- ඔබේ සහෝදර සහෝදරියන් පවුලේ ඉතිරි සාමාජිකයින් බව
- එවැනි සාමාජිකයන්ගෙන් සැදුම්ලත් පවුල ' න්‍යෂ්ඨික පවුල' බව
- ඔබේ ආච්චි, සීයා, නැන්දා සහ මාමා වැනි සමීපතම ඥාතීන් ද සමහර විට ඔබ සමඟ වාසය කරන බව
- එවැනි අවස්ථාවක එම පවුල් විස්තෘත පවුල් ලෙස සලකන බව
- මිනිස් සමාජයේ කුඩා ම සමාජ ඒකකය පවුල බව
- පවුලේ සාමාජිකයන් අතර පවතින අන්‍යෝන්‍ය සහයෝගය තුළින් පවුලක ස්ථාවර භාවය තහවුරු වන බව

(මිනිත්තු 10යි)

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

පියවර 7.1.1.2 : 
- පන්තියේ සිසුන් අතර ඇමුණුම 7.1.1.1ට අදාළ කාර්ය පත්‍රිකාව බෙදන්න.
- කාර්ය පත්‍රිකාව නිම කිරීමට අවශ්‍ය උපදෙස් සපයන්න.

(මිනිත්තු 15යි)

පියවර 7.1.1.3 : 
- කාර්ය පත්‍රිකාව නිම කළ පසු 'න්‍යෂ්ඨික' පවුල් හා 'විස්තෘත' පවුල් වෙන් වන පරිදි කණ්ඩායම් වන සේ උපදෙස් දෙන්න.
- කණ්ඩායම් තුළින් අනාවරණ කළ දෑ පන්තියට ඉදිරිපත් කරන්න.
- කණ්ඩායම් ඉදිරිපත් කිරීම් පිළිබඳ අනෙකුත් කණ්ඩායම්වල අදහස් විමසන්න.
- පහත දැක්වෙන කරුණු ඉස්මතු වන පරිදි සමාලෝචනයක යෙදෙන්න.

- සමාජයේ කුඩා ම ඒකකය පවුල බව
- මිනිසා සමාජශීලී සත්ත්වයෙක් බව
- ඔබ ද පවුලක සාමාජිකයකු බව
- පවුල විවිද සාමාජිකයන්ගෙන් සමන්විත බව
- පවුලේ සාමාජිකයන් අනුව පවුල් විවිධ වන බව
- දෙමවපියන් හා දරුවන් පමණක් පවුලකට අයත්නම් එය 'න්‍යෂ්ඨික' පවුලක් බව
- දෙමව්පියන් දරුවන් හා සමීපතම ඥාතීන් එකට ජීවත් වේ නම් එය ' විස්තෘත' පවුලක් බව
- පවුලක ස්ථාවර භාවය තහවුරු වීමට නම් පවුලේ සාමාජිකයන් අතර අන්‍යොන්‍ය සහයෝගයෙන් පැවතිය යුතු බව

(මිනිත්තු 15යි)

**තක්සේරුව හා ඇගයීම**

- තම නිවසේ ජීවත් වන සියලු සාමාජිකයන් එක්ව ගත් විට එය පවුල බව ප්‍රකාශ කරයි.
- පවුල තුළ ආදරයෙන් හා සෙනෙහසින් ජීවත්වීමේ වැදගත්කම අගය කරයි.
- න්‍යෂ්ඨික පවුලේ හා විස්තෘත පවුලේ සාමාජිකයන් වෙන් කොට ලියා දක්වයි.
- යහපත් පවුල් සාමාජිකයෙකුගේ ලක්ෂණ විදහා දක්වයි.
- කණ්ඩායම් හැඟීමෙන් යුක්තව කටයුතු කරයි.

**පසුවැඩ :-**

- ඔබ විසින් චිත්‍රයට නගන ලද ඔබ පවුල වර්ණ ගන්වා නම් කර ඔබේ පොතේ අලවන්න.

ඇමුණුම 7.1.1.1

## කාර්ය පත්‍රිකාව

පහත සඳහන් ප්‍රශ්නවලට සපයා ඇති කඩදාසියේ කෙටි පිළිතුරු සපයන්න.

1. පවුලක් යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද?
2. ඔබේ පවුලේ සාමාජිකයන් නම් කරන්න.
3. සමාජයේ දක්නට ලැබෙන පවුල් වර්ග නම් කරන්න.
4. ඒ අනුව ඔබේ පවුල කුමන පවුල් වර්ගයට අයත් ද?
5. පහත සඳහන් වගුව ඒ ඒ පවුල්වල ලක්ෂණ ලියමින් සම්පූර්ණ කරන්න.

| න්‍යෂ්ඨික පවුල | විස්තෘත පවුල |
|---|---|
| | |

6. ස්ථාවර හා සාමකාමී පවුලක් ගොඩ නගා ගැනීමට පවුලේ සාමාජිකයකු ලෙස ඔබ කටයුතු කරන්නේ කෙසේ ද?

## 7.1.2 ක්‍රියාකාරකම

නිපුණතා මට්ටම : සමාජයේ කුඩා ම සහ වැදගත් ම ඒකකය ලෙස පවුල හඳුනා ගෙන යහපත් සාමාජිකයකු ලෙස ස්ථාවර පවුල් ඒකක ගොඩ නගා ගැනීමට පෙළඹෙයි.

ක්‍රියාකාරකම : " ඥාති සබඳතා ගොඩ නගමු "

කාලය : මිනිත්තු 40 යි

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 7.1.2.1 ( නැළවිලි ගී )
- ඇමුණුම 7.1.2.2 කාර්ය පත්‍රිකාව
- ඩිමයි කඩදාසි, මාකර් පෑන්

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :

පියවර 7.1.2.1 :
- ඇමුණුම 7.1.2.1 දරු නැලවිලි ගී ළමුන් සමඟ ගායනා කරන්න.
- පහත දැක්වෙන කරුණු ඉස්මතු වන පරිදි සාකච්ඡාවක් මෙහෙයවන්න.

> - පවුලට සම්බන්ධ ඥාති සමූහයක් සිටින බව
> - තම පවුලට සම්පන්ධ පිය පාර්ශවයේ හා මව් පාර්ශවයේ ඥාතීන් සමූහයක් සිටින බව
> - මව් පාර්ශවයේ හා පිය පාර්ශවයේ සමීප ඥාතීන් ඇමතීමට විවිධ ඇමතුම් භාවිතා කරන බව
> - විවිධ ප්‍රදේශවල ඥාතීත්වය සඳහා භාවිත කරන ඇමතුම් වෙනස් වන බව
> - ඥාති සබඳතා ගොඩ නගා ගැනීම වැදගත්වන බව

(මිනිත්තු 10යි)

පියවර 7.1.2.1 :
- පන්තිය කුඩා කණ්ඩායම් කීපයකට බෙදන්න.
- ඇමුණුම 7.1.2.2 කණ්ඩායම්වලට ලබා දෙන්න.
- ක්‍රියාකාරකමේ නිරත වීමට අවශ්‍ය උපකරණ ලබා දෙන්න.
- ක්‍රියාකාරකමෙහි නිරත කරවීමට අවශ්‍ය කාලය ලබා දෙන්න.

(මිනිත්තු 15යි)

පියවර 7.1.2.3 : • කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කරවන්න.

- කණ්ඩායම් ඉදිරිපත් කිරීම් පිළිබඳ ව අනිකුත් කණ්ඩායම්වල සංවර්ධනාත්මක අදහස් ලබා ගන්න.
- පහත දැක්වෙන කරුණු ඉස්මතු වන පරිදි සමාලෝචනයක යෙදෙන්න.

> - මවගේ හා පියාගේ මව 'ආච්චී ' ලෙස ද පියා 'සීයා' ලෙස ද අමතන බව
> - මවගේ බාල සහෝදරියගේ ස්වාමි පුරුෂයා 'මාමා' යනුවෙන් අමතන බව
> - මවගේ වැඩි මහල් සහෝදරියගේ පියාගේ වැඩිමහල් සහෝදරයාගේ භාර්යාව ' ලොකු අම්මා' ලෙස අමතන බව
> - මවගේ බාල සහෝදරිය මෙන් ම පියාගේ බාල සහෝදරයාගේ භාර්යාව ද ' පුංචි අම්මා' යයි අමතන බව
> - පියාගේ බාල සහෝදරයා මෙන් ම මවගේ බාල සහෝදරියගේ ස්වාමි පුරුෂයා ' බාප්පා' යයි අමතන බව
> - පියාගේ වැඩමහල් සහෝදරයා මෙන් ම මවගේ වැඩිමහල් සහෝදරියගේ ස්වාමි පුරුෂයා ' ලොකු තාත්තා' ලෙස අමතන බව
> - පියාගේ සහෝදරියන් මෙන් ම මවගේ සහෝදරයන්ගේ භාර්යාවන් 'නැන්දා' යයි අමතන බව
> - එහෙත් ප්‍රාදේශීය ව්‍යාවහාරයේ දී මෙම ඇමතුම්වල විවිධත්වයක් ඇති බව
> - ඥාතීත්වය පවත්වා ගැනීම තුළින් ශක්තිමත් පවුල් පරිසරයක් ගොඩ නැගෙන බව

(මිනිත්තු 15 යි)

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

## තක්සේරුව හා ඇගයීම

- මවගේ හා පියාගේ සමීප ඥාතීන් සමඟ ඇති නෑදෑකම් ප්‍රකාශ කරයි.
- යහපත් නෑදෑ සබඳකම් ගොඩ නගා ගැනීමේ වැදගත්කම අගය කරයි.
- ඥාති සබඳතා නිවැරදිව ලියා දක්වයි.
- කණ්ඩායම් හැඟීම් වර්ධනය කර ගනියි.
- සම්ප්‍රදායයන්වලට ගරු කරමින් කටයුතු කරයි.

පසුවැඩ

1. හිස්තැන් පුරවන්න.

   i. මවගේ බාල සහෝදරයා මගේ . . . . . . . . . . . . . ය.
   ii. පියාගේ බාල සහෝදරයා මෙන් ම මවගේ බාල සහෝදරියගේ ස්වාමි පුරුෂයා ද මට නෑදෑකමට . . . . . . . . . . . වේ.
   iii. සමහර ප්‍රදේශවල 'සීයා' අමතන්නේ . . . . . . . . . . . යනුවෙනි.
   iv. මගේ ' ලොකු අම්මා' යනු මවගේ . . . . . . . . . . . වේ.
   v. මගේ පියාගේ වැඩිමහල් සහෝදරයා ඇමතීමට මා භාවිතා කරන නෑදෑකම වන්නේ . . . . . . . . . . . . . ය.

2. පහත ඔබට සපයා ඇති 'අ' හා 'ආ' කොටස් දෙකේ ඇති බෙදුම්වලින් සමාන ඒවා තෝරා යා කරන්න.

| 'අ' | 'ආ' |
|---|---|
| ආච්චි | පියාගේ නංගී |
| ඥාතී සහෝදරිය | මවගේ සහෝදරියගේ දුව |
| නෑනා | මවගේ අයියා |
| නැන්දා | මවගේ මව |
| මාමා | පියාගේ අක්කාගේ දුව |

ඇමුණුම 7.1.2.1

පහත සඳහන් දරු නැලවිලි පන්තියේ සිසුන් ලවා ගායනා කරවන්න.

* අතට වෙරලු ඇහිඳ ගෙනේ - ඉනට පලා නෙලා ගෙනේ
බරට ම දර කඩා ගෙනේ - එයි අම්මා විගසකිනේ

* පුතේ නුඹේ අප්පොච්චා - නුඹ නලවයි නොකර කතා
ඒක දැකපු පොල්කිච්චා - සද්ද නොකර ඉගිල ගියා

* පුතේ නුඹේ අත්තම්මා - ගෙලට මාලයක් දැම්මා
කියා නිමක් නැත නිම්මා - නුඹට ආදරෙයි අම්මා

* නුඹ නලවන ලොකු අත්තා - නුඹට වළල්ලක් ගත්තා
ඒ වළල්ල ලොකු හන්දා - තවත් වළල්ලක් ගත්තා

* පුතේ උඹේ ලොකු අම්මා - අතේ වළලලක් දැම්මා
හිතේ අදර නැත නිම්මා - නාඩා නිදියන් පෙම්මා

* පුංචි අම්ම සීදේවි - අතේ වලල්ලක් දාවී
මගේ පුතා හිනැහේවී - හිනැහි හිනැහි නිදියාවී

* පහළ ගෙදර ලොකු තාත්තා - පුතාට ඇඳුමක් ගත්තා
ඇඳුම ඇඳන් මගේ පුතා - යසට නිදයි නොකර කතා

* බාප්පොච්චි උඩහ ගෙදර - ගීත කියයි රස කර කර
ඒවා අසන නුඹ මා පුත - සිහින දකියි නිදි කිර කිර

* අපට පුතේ කාසි නැතේ - ලොකු මාමට හරක් ඇතේ
ලොකු අම්මා නුඹට පුතේ - ගොන් බානක් තැගි දෙතේ

* කන්දක් ගිනි ඇවිළෙන්නේ - හැන්දක් කිරි බීපන්නේ
නැන්දත් නුඹ නලවන්නේ - නින්දක් නුඹ නිදියන්නේ

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඇමුණුම 7.1.2.2

## කාර්ය පත්‍රිකා

කණ්ඩායම 1

ඔබට ඇති නෑදෑකම ඉදිරියෙන් ලියන්න.



| | |
|---|---|
| පියා | උදා : සීයා / මුත්තා / ලොකු අත්තා |
| මව | . . . . . . . . . . . . . . . . . . . . . . . . . . |
| අයියා | . . . . . . . . . . . . . . . . . . . . . . . . . . |
| මල්ලි | . . . . . . . . . . . . . . . . . . . . . . . . . . |
| අක්කා | . . . . . . . . . . . . . . . . . . . . . . . . . . |
| නංගි | . . . . . . . . . . . . . . . . . . . . . . . . . . |
| අයියාගේ බිරිඳ | . . . . . . . . . . . . . . . . . . . . . . . . . . |
| මල්ලිගේ බිරිඳ | . . . . . . . . . . . . . . . . . . . . . . . . . . |
| අක්කාගේ සැමියා | . . . . . . . . . . . . . . . . . . . . . . . . . . |
| නංගිගේ සැමියා | . . . . . . . . . . . . . . . . . . . . . . . . . . |
| අයියාගේ දූ පුතුන් | . . . . . . . . . . . . . . . . . . . . . . . . . . |
| අක්කාගේ දූ පුතුන් | . . . . . . . . . . . . . . . . . . . . . . . . . . |

පියාගේ ඥාති සබඳතා ඉහත දැක්වේ.

කණ්ඩායම 2

ඔබට ඇති නෑදෑකම ඉදිරියෙන් ලියන්න.



| | |
|---|---|
| පියා | උදා : සීයා / මුත්තා / ලොකු අත්තා |
| මව | . . . . . . . . . . . . . . . . . . . . . . . . . . |
| අයියා | . . . . . . . . . . . . . . . . . . . . . . . . . . |
| මල්ලි | . . . . . . . . . . . . . . . . . . . . . . . . . . |
| අක්කා | . . . . . . . . . . . . . . . . . . . . . . . . . . |
| නංගි | . . . . . . . . . . . . . . . . . . . . . . . . . . |
| අයියාගේ බිරිඳ | . . . . . . . . . . . . . . . . . . . . . . . . . . |
| මල්ලිගේ බිරිඳ | . . . . . . . . . . . . . . . . . . . . . . . . . . |
| අක්කාගේ සැමියා | . . . . . . . . . . . . . . . . . . . . . . . . . . |
| නංගිගේ සැමියා | . . . . . . . . . . . . . . . . . . . . . . . . . . |
| අයියාගේ දූ පුතුන් | . . . . . . . . . . . . . . . . . . . . . . . . . . |
| අක්කාගේ දූ පුතුන් | . . . . . . . . . . . . . . . . . . . . . . . . . . |

මවගේ ඥාති සබඳතා ඉහත දැක්වේ.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඇමුණුම 7.1.2.2

කණ්ඩායම 3

විවිධ ප්‍රදේශවල ඥාතීත්වය සඳහා භාවිත කරන ප්‍රාදේශීය ඇමතුම් පහත දක්වන වගුවේ සඳහන් කරන්න.

ප්‍රාදේශීය ව්‍යවහාරයන්

| | |
|---|---|
| පියා | |
| මාමා | |
| නැන්දා | |
| පුංචි අම්මා | |
| බාප්පා | |
| ලොකු තාත්තා | |
| ලොකු අම්මා | |

**කණ්ඩායම 4**

ඔබ ඥාතීන් සමඟ විවිධ කටයුතුවල යෙදුනු අවස්ථා හිස් කොටුවල සඳහන් කරන්න.

| | |
|---|---|
| පියා | |
| මාමා | |
| නැන්දා | |
| පුංචි අම්මා | |
| බාප්පා | |
| ලොකු තාත්තා | |
| ලොකු අම්මා | |

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 7.1.3 ක්‍රියාකාරකම

නිපුණතා මට්ටම : පවුල හා අසල්වාසීන් අතර අන්‍යොන්‍ය සබඳතා තහවුරු කර ගෙන සහජීවනයෙන් ජීවත්වීමට හුරුවෙයි.

ක්‍රියාකාරකම : "අසල් වැසියන් සමඟ සහජීවනයෙන් ජීවත් වෙමු."

කාලය : මිනිත්තු 40 යි

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 7.1.3.1 කාර්ය පත්‍රිකාව
- A 4 කඩදාසි
- මාකර් පෑන්

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :

පියවර 7.1.3.1 :
- අසල්වාසීන් එක්ව උදව් උපකාර කරන අවස්ථා දැක්වෙන චිත්‍ර කීපයක් පන්තියට ඉදිරිපත් කරන්න.

  උදා : පිරිත් පිංකමක්
  මංගල උත්සවයක්
  අවමංගල අවස්ථාවක්
- ළමුන්ට චිත්‍ර නිරීක්ෂණය කිරීමට ප්‍රමාණවත් කාලය සපයන්න.
- පහත දැක්වෙන කරුණු ඉස්මතු වන පරිදි සාකච්ඡාවක් මෙහෙයවන්න.

  - පවුල් ඒකක ගණනාවක එකතුවෙන් සමාජයක් බිහිවන බව
  - පුද්ගලයකු මෙන් ම පවුලකට ද සමාජයේ තනිව ජීවත්විය නොහැකි බව
  - තම පවුල් ඒකකය වටා ජීවත්වන අනිකුත් පවුල් ඒකකයන් අසල්වාසීන් බව
  - පවුලක විවිධ අවශ්‍යතා සපුරා ගැනීමේ දී අසල්වාසීන්ගේ උදව් උපකාර අවශ්‍ය බව
  - අසල්වාසීන් හා යහපත් සබඳතා ගොඩ නගා ගැනීම වැදගත් බව
  - අසල්වාසීන් හා අන්තර් සබඳතා ගොඩ නගා ගැනීමට ඉවසීම, කරුණාවන්ත බව, විශ්වාසවන්ත බව, සහයෝගය, යහපත් අදහස් හුවමාරුව වැනි ගුණාංග පුරුදු පුහුණු කළ යුතු බව
  - අසල්වාසීන්ට හිරිහැරයක් නොවන ආකාරයෙන් ජීවත් විය යුතු බව

(මිනිත්තු 10යි)

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

පියවර 7.1.3.2 : 
- සිසුන් කණ්ඩායම් කිහිපයකට බෙදන්න.
- ඇමුණුම 7.1.3.1 කණ්ඩායම්වලට බෙදා දෙන්න.
- සිසුන්ට ක්‍රියාකාරකමෙහි යෙදීමට අවස්ථාව දෙන්න.

පියවර 7.1.3.3 : 
- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කරවන්න.
- කණ්ඩායම් ඉදිරිපත් කිරීම පිලිබඳව අනෙකුත් කණ්ඩායම්වලින් සංවර්ධනාත්මක අදහස් ලබා ගන්න.
- පහත දක්වන කරුණු ඉස්මතු වන පරිදි සමාලෝචනයක යෙදෙන්න.

- අප අවට ජීවත්වන අනිකුත් පවුල් අපේ අසල් වාසීන් බව
- අතීතයේ අසල් වාසීන් සමඟ ඉතා සමීප සබඳතා ගොඩ නගා ගත් බව
- අසල්වාසීන් බොහෝ අවස්ථාවල දී නෑදෑයින්ට මෙන් ම සමීප වන බව
- අසල්වාසීන් හා සමීප වීමෙන් අපේ කාර්යයන් වඩා පහසුවෙන් ඉටු කර ගත හැකි බව
- තම ජීවන රටාව අසල්වාසීන්ට කරදරයක් නොවන ආකාරයෙන් සකස් කර ගත යුතු බව

(මිනිත්තු 15 යි)

## තක්සේරුව හා ඇගයීම

- තම පවුල වටා ජීවත් වන සෙසු පවුල් ඒකක අසල් වාසීන් බව ප්‍රකාශ කරයි.
- අසල්වාසීන් සමඟ සබඳතා ගොඩ නගා ගැනීම අගය කරයි.
- අසල් වාසීන්ගේ සහයෝගය අවශ්‍ය වන අවස්ථා ලියා දක්වයි.
- අසල් වාසීන් සමඟ යහපත් සබඳතා ගොඩ නගා ගනියි.
- සහයෝගයෙන් කටයුතු කරයි.

පසුවැඩ :-

1. ඔබ අසල් වාසීන් සමඟ යහපත් සබඳතා පැවැත් වූ අවස්ථාවක් දෙබසකින් ඉදිරිපත් කරන්න.

ඇමුණුම 7.1.3.1

කාර්ය පත්‍රිකාව

සෑම කණ්ඩායමකටම මෙම කාර්ය පත්‍රිකාව බැගින් ලබා දෙන්න.

- ඔබ අසල්වැසියන්ට උදව්කළ අවස්ථා සඳහන් කරන්න.
- ඔබට අසල්වැසියන් උදව්කළ අවස්ථා සඳහන් කරන්න.
- අසල් වැසියන් සමඟ සබඳතා පැවැත්වීමේ දී තිබිය යුතු ගුණ ධර්ම මොනවා ද?
- අසල් වැසියන් සමග සමගියෙන් හා සහජීවනයෙන් කටයුතු කිරීමේ දී එකිනෙකාට උදවු කර ගැනීමේ වැදගත්කම සහ උදවු කළහැකි ආකාර සඳහන් කරන්න.

## 7.1.4 ක්‍රියාකාරකම

නිපුණතා මට්ටම : පවුලේ සාමාජිකයකු ලෙස තම අයිතිවාසිකම් භුක්ති විඳිමින් යුතුකම් ඉටු කරමින් විනය ගරුකව ජීවත්වීමට අවශ්‍ය මානව ගුණ ධර්ම වර්ධනය කර ගනියි.

ක්‍රියාකාරකම : "යුතුකම් ඉටු කරමින් අයිතිවාසිකම් ආරක්ෂා කර ගනිමු"

කාලය : මිනිත්තු 40 යි

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 7.1.4.1 කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 7.1.4.2 කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 7.1.4.3 කාර්ය පත්‍රිකාව
- ෆෙල්ට් පෑන්
- ඩිමයි කොළ

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :

පියවර 7.1.4.1 :
- පවුල තුළ තම තමාගේ අයිතිවාසිකම් යුතුකම් හා වගකීම් ඉටු කරන ආකාරය පිළිබඳව බුද්ධි කලම්බන සාකච්ඡාවක් මෙහෙවන්න.
- සාකච්ඡාවෙන් ඉස්මතු වූ කරුණු ආධාර කර ගනිමින් පහත දැක්වෙන කරුණු ඉස්මතු වන පරිදි සාකච්ඡාවක් මෙහෙයවන්න.

> - පවුලක සාමාජිකයකු වශයෙන් පවුල තුළින් තමාට හිමි විය යුතු දේ අයිතිවාසිකම් බව
> - එවැනි අයිතිවාසිකම් රාශියක් පවතින බව
>   උදා :- රැකවරණය ලැබීම
>   අධ්‍යාපනය ලැබීම
>   ආහාර හා පෝෂණය ලැබීම
> - පවුලක යහ පැවැත්ම සඳහා පවුලේ සියලු සාමාජිකයන් ඉටු කරන කාර්යයන් යුතුකම් වන බව
> - ඉටුකළ යුතු යුතුකම් රාශියක් පවතින බව
>   උදා :- නායකත්වය ගරු කිරීම
>   පවුලේ සම්ප්‍රදායන් ආරක්ෂා කිරීම
>   තම පවුලට අයත් දේ ආරක්ෂා කිරීම
> - පවුලේ සියලු ම සාමාජිකයන් සතු වගකීම් පැහැර හැරීමකින් තොරව ඉටුකළ යුතු බව

(මිනිත්තු 10යි

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

පියවර 7.1.4.2 :

- පන්තිය කණ්ඩායම් 04කට බෙදන්න.
- ඇමුණුම 7.1.4.1, ඇමුණුම 7.1.4.2 හා ඇමුණුම 7.1.4.3ට අදාළ කාර්ය පත්‍රිකා ලබා දෙන්න.
- ක්‍රියාකාරකම සඳහා අවශ්‍ය උපදෙස් දෙන්න.
- ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

(මිනිත්තු 15යි)

පියවර 7.1.4.3 :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කරවන්න.
- කණ්ඩායම් ඉදිරිපත් කිරීම පිලිබඳව සෙසු කණ්ඩායම්වලින් සංවර්ධනාත්මක අදහස් ලබා ගන්න.
- පහත දක්වන කරුණු ඉස්මතු වන පරිදි සමාලෝචනයක යෙදෙන්න.

> - සියලු ම සාමාජිකයන් තම පවුල තුළ අයිතිවාසිකම් නිවැරදිව භුක්ති විඳීම වැදගත් බව
> - යුතුකම් ඉටු කිරීම තුළින් පවුලේ අභිවෘද්ධිය ලඟා කර ගත හැකි බව
> - වගකීම් ඉටු කිරීම පවුල් ඒකකයේ ස්ථාවරබව ඇති කිරීමට වැදගත්වන බව
> - පවුලෙන් ඔබට මෙන්ම ඔබෙන් පවුලට ද යුතුකම් ඉටුවිය යුතු බව.
> - අයිතිවාසිකම් නිවැරදි ව භුක්ති විඳිමින් යුතුකම් හා වගකීම් ඉටු කිරීම තුළින් එකමුතු පවුලක් ගොඩ නගා ගත හැකි බව

(මිනිත්තු 15යි)

## තක්සේරුව හා ඇගයීම

- පවුලෙන් තමාට හා තමාගෙන් පවුලට ඉටුවිය යුතු යුතුකම් හා වගකීම් ප්‍රකාශ කරයි.
- අයිතිවාසිකම් භුක්ති විඳින අතර ඒ හා බැඳුනු යුතුකම් ඉටු කිරීමට හුරුවීම අගය කරයි.
- යුතුකම් හා වගකීම් වෙන් කර ලියා දක්වයි.
- පවුලක් සමඟ එකමුතුව කටයුතු කිරීමට ඇති හැකියාව ප්‍රදර්ශනය කරයි.
- යහපත් පවුල් සාමාජිකයකු ලෙස කටයුතු කිරීමේ ලක්ෂණ පෙන්නුම් කරයි.

ඇමුණුම 7.1.4.1

## කාර්ය පත්‍රිකා

කණ්ඩායම 1

1. ඔබෙන් පවුලට හා පවුලෙන් ඔබට ඉටු වූ හා ඉටුවිය යුතු යුතුකම් පහත දක්වා ඇත. ඒවා ඇසුරෙන් දක්වා ඇති වගුව සම්පූර්ණ කරන්න.
   * රැකවරණය ලබා දීම
   * හොඳින් අධ්‍යාපනය ලැබීම
   * මුදල් නිසි ලෙස ඉපයීම හා පරිහරණය
   * වැඩිහිටියන්ට ගරු කිරීම
   * අධ්‍යාපනය ලබා දීම
   * ආහාර හා පෝෂණය ලබා දීම
   * සිරිත් විරිත් හා සම්ප්‍රදායන් අනුගමනය කිරීම
   * සහෝදර සහෝදරියන් හා සහයෝගයෙන් සිටීම
   * නිර්මාණයට වින්දනයට අවස්ථාව සැලසීම
   * නිවසේ කටයුතුවලට අවශ්‍ය අවස්ථාවල දී සහාය ලබාදීම

| පවුලෙන් ඔබට | ඔබෙන් පවුලට |
|---|---|
| | |

2. ඉහත දැක්වූ අවස්ථාවලට අතිරේකව ඔබේ නිවසේ පරිසරය තුළ පවුලේ සාමාජිකයන්ට ඔබේ උපකාරය අවශ්‍ය වන අවස්ථා කීපයක් සඳහන් කරන්න.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

කණ්ඩායම 2

1. පහත දක්වා ඇත්තේ ඔබ තනිව හා පවුලේ සාමාජිකයා සාමූහිකව කළ හැකි වැඩ කිහිපයකි.
   * දිනපතා ගෙදර හා අවට පිරිසිදු කිරීම
   * පාසල් නිල ඇඳුම් සේදීම
   * මල් පාත්තිවලට වතුර දැමීම
   * පාවහන් පිරිසිදු කිරීම
   * ගොයම් කැපීම
   * ගෙදර බිත්තිවල තීන්ත ආලේප කිරීම
   * ලිඳ ඉසීම
   * කාල සටහනට අනුව පොත් බෑගය සකස් කිරීම
   * ආහාර පිළිවෙල කිරීම


   එම තොරතුරු කියවා පහත තීරු දෙකට ගැලපෙන සේ ලියන්න.

| තනිව කළ හැකි දේ | සාමූහික ව කළ හැකි දේ |
|---|---|
| | |

2. ඔබට කළ හැකි එහෙත් මෙතෙක් ඔබෙන් අතපසු වී ඇති යුතුකම් මොනවාදැ යි සඳහන් කරන්න.

ඇමුණුම 7.1.4.2

කණ්ඩායම - 3





Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

1. චිත්‍ර හොඳින් නිරීක්ෂණය කර එක් එක් චිත්‍රය ඉදිරියෙන් ඒ පිළිබඳව ඔබට ඇති වූ අදහස් ලියන්න.
2. චිත්‍රයට ගැලපෙන මාතෘකාවක් ලියන්න.
3. ඔබ නිවසේ දී පවුලේ සාමාජිකයන්ට ඔබේ උපකාර ලබා දෙන අවස්ථා කීපයක් ලියන්න.

ඇමුණුම 7.1.4.3

කණ්ඩායම - 4





Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

1. චිත්‍ර හොඳින් නිරීක්ෂණය කර එක් එක් චිත්‍රය ඉදිරියෙන් ඒ පිළිබඳව ඔබට ඇති වූ අදහස් ලියන්න.
2. චිත්‍රයට ගැලපෙන මාතෘකාවක් ලියන්න.
3. ඔබ නිවසේ දී පවුලේ සාමාජිකයන්ට ඔබේ උපකාර ලබා දෙන අවස්ථා කීපයක් ලියන්න.

## 7.2 අපේ ජන සමාජය

### හැඳින්වීම

පවුල් සංස්ථා රාශියක් එක් වීමෙන් සමාජයක් නිර්මාණය වන අතර සමාජය තුළ විවිධතා රාශියක් දක්නට ලැබේ. විවිධ වූ මිනිස් අවශ්‍යතා මූලික කරගෙන විවිධ සමාජ සංවිධාන ගොඩ නැගී ඇත.

සමාජයේ යහපැවැත්ම සඳහා අයිතිවාසිකම් භුක්ති විඳිමින් යුතුකම් හා වගකීම් ඉටු කිරීම අවශ්‍ය වේ. වර්තමාන සමාජයේ පුරවැසියන් යුතුකම් හා වගකීම් පැහැර හරිමින් අයිතිවාසිකම් ඉල්ලීමට යාම තුළන් විවිධ ගැටලු පැන නැගී ඇත. පවුල, පාසල, සමාජය, යන සංස්ථා තුළ මෙය හොඳින් නිරූපණය වේ. එම නිසා සමාජයේ ධනාත්මක වෙනසක් කිරීමේ අවශ්‍යතාව ඉස්මතු වෙමින් පවතී.

සමාජීය සත්ත්වයකු වශයෙන් අප ජීවත් වන සමාජය පිළිබඳ ව පන්ති කාමරය තුළින් සිසුන්ට අවබෝධයක් ලබා දීමත් සමාජය තුළ ගොඩ නැගී ඇති අන්තර් සම්බන්ධතා හා එම සම්බන්ධතා පවත්වා ගෙන යාමට ඉවහල් වන සිරිත් විරිත් සම්ප්‍රදායයන් හා නීති රීති පිළිබඳව දැනුවත් කිරීමක් අපේක්ෂා කෙරේ. සදාචාරාත්මක හා නීතිමය තත්ත්වයන් යටතේ තම යුතුකම් හා වගකීම් ඉටු කරමින් නීතිමය රාමුව ආශ්‍රයෙන් අයිතිවාසිකම් භුක්ති විඳිය යුතු ආකාරය පිළිබඳව දැනුමක් ලබා දෙමින්, සමබර පෞරුෂත්වයකින් හෙබි යහපත් පුරවැසියකු බිහි කිරීමට අවශ්‍ය නිපුණතා වර්ධනය කිරීමක් මෙම මාතෘකා ඉගෙනීමෙන් අපේක්ෂා කෙරේ.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 7.2 අපේ ජන සමාජය

නිපුණතාව : ජන සමාජයේ සමාජිකයකු වශයෙන් තම අයතිවාසිකම් හඳුනා ගෙන යුතුකම් හා වගකම් ඉටු කිරීමට පෙළඹෙයි.

නිපුණතා මට්ටම් :
- ජන සමාජය තුළ පවත්නා අන්තර් සබඳතා පිළිබඳ විමර්ශනය කරයි.
- ජන සමාජයේ සාමාජිකයකු වශයෙන් නීතිමය රාමුව තුළ තම අයිතිවාසිකම් භුක්ති විඳීමට හුරුවෙයි.
- අයිතිවාසිකම් හා බැඳුනු යුතුකම් හා වගකීම් ඉටු කරයි.

විෂය අන්තර්ගතය

## 7.2 අපේ ජන සමාජය

### 7.2.1 සමාජය හැඳින්වීම

විවිධ වූ මිනිස් අවශ්‍යතා මූලික කරගෙන විවිධ සමාජ සංවිධාන ගොඩ නැගෙයි. එම සංවිධානවල සමස්ත එකතුව ජන සමාජයක් ලෙස අර්ථ දැක්විය හැක.

සමාජය පිළිබඳව සමාජ විද්‍යා විෂයයන් ඇසුරෙන් විවිධ නිර්වචන ඉදිරිපත්ව ඇත.

උදා :- " පුද්ගලයා එකිනෙකා හඳුනා ගනිමින් අන්තර් සබඳතා ගොඩ නගා ගැනීම නිසා බිහිවූ මිනිසුන් සමූහයකගේ එකතුවකි."


" වෙන් කරන ලද භූමි ප්‍රමාණයක් තුළ ස්ථිරවම වාසය කරන ජනතාවක් විසින් ආශා අවශ්‍යතා හා උවමනා එපාකම් ඉටු කර ගැනීම සඳහා ගොඩ නගා තිබෙන ආයතන සමිති සමාගම් හා සංවිධානවල සමසත එකතුවයි."

" සමාජයක් යනු හොඳින් නිර්වචනය වූ සීමාවන් ඇති සමාජ ඒකකයක් ලෙස මොවුන්ම සිතන, හා ඔවුන් එකට ජීවත් වීම තුළින් හා එකට වැඩ කිරීම තුළින් සංවිධිත වූ යම් පුද්ගල ඒකකයකි" ( ලින්ටන් රැල්ෆ් The Science of man is the world crisis Colombia University press New York 1965 )

" සමාජය යනු බලයෙන් හා අන්‍යොන්‍ය උපකාරයෙන් නිදහසට හුරු පුරුදු වූ මිනිසුන්ගේ ක්‍රියාකාරී වැඩ මුළුවක් වැන්න මෙය සමාජ සම්බන්ධතා පිළිබඳ දැලකි. නිරතුරුවම වෙනස් වන ප්‍රපංචයකි."    ( Peter L Bergear - Invitation to Sociology)

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

- ජන සමාජයක මූලික හා කුඩා ම ඒකකය පවුල යි.
- පවුල් ඒකක හා ඒවායෙහි අවශ්‍යතා පදනම් කර ගෙන ජන සමාජයක් බිහිවෙයි.
- එවැනි ජන සමාජයක දක්නට ලැබෙන සමාජ සංවිධාන කිහිපයකට උදාහරණ පහත 2.1 රූප සටහනේ දැක්වේ.




- සදාචාර සම්පන්න ජීවිතයක් ගත කිරීමට ගත් උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙස සමාජය බිහි වී තිබේ.


### 7.2.2 ජන සමාජය තුළ පවතින අන්තර් සබඳතා

- අන්තර් සබඳතා යනු පුද්ගලයන් පුද්ගලයන් අතර ආයතන හා ආයතන අතර පුද්ගලයන් හා ආයතන අතර ඇතිවන අන්‍යොන්‍ය සබඳතාවය යි.

  උදා :- * දෙමාපිය දූ දරුවන් අතර
  * ගුරුවරුන් සිසුන් අතර
  * පවුලේ සාමාජිකයින් අතර
  * අසල්වැසියන් අතර
  * සමාජයේ ඇති ආයතන, සමිති සමාගම්, සංවිධාන හා ආගමික ආයතන අතර
  * රට රටවල් අන්තර් ජාතිකව පවත්වන සබඳතා

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

- අන්තර් සම්බන්ධතා රූපිකව ඉදිරිපත් කිරීම




- සමාජයේ යහ පැවැත්මට අන්තර් සබඳතා හේතු පාදක වෙයි.

- පෞද්ගලිකව ඉටු කර ගත නොහැකි අවශ්‍යතා අන්‍යොන්‍ය විශ්වාසයක් ඇති වීමෙන් සාමූහිකව ඉටු කර ගත හැකිය.

### 7.2.3 සමාජය සම්බන්ධයෙන් අපේ යුතුකම් හා වගකීම්

- පොදු සමාජ පැවැත්ම සඳහා පුරවැසියන් විසින් තම තමන්ට පැවරෙන කාර්යයන් ඉටු කිරීමට ඇති බැඳීම යුතුකම් වේ.
- යුතුකම් ප්‍රධාන වශයෙන් නීතිමය යුතුකම් හා සදාචාරාත්මක යුතුකම් ලෙස වෙන් කළ හැකිය.

| නීතිමය යුතුකම් | සදාචාරාත්මක යුතුකම් |
|---|---|
| * රජයට අවනත වීම<br>* රාජ්‍ය නීති පිළි පැදීම<br>* බදු ගෙවීම<br>* රාජකාරී නිසි ලෙස ඉටු කිරීම<br>* නීතිය හා සාමය පවත්වා ගෙන යාමට සහාය දැක්වීම | * දෙමාපියන්ට සැලකීම<br>* වැඩිහිටියන්ට ගරු කිරීම<br>* ආචාරශීලී බව<br>* සම්ප්‍රදායන් රැකීම<br>* අන්‍ය ආගම්වලට හා ජාතීන්ට ගරු කිරීම<br>* ජාතික සංකේතවලට හා ජාතික වීරවරයන්ට ගරු කිරීමට |

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

- **වගකීම්**

යුතුකම් ඉටු කිරීමට ඇති බැදීම වගකීමයි.

උදා :- * පොදු දේපළ ආරක්ෂා කිරීම
* නීතිරීතිවලට ගරු කිරීම
* යහ පාලනයට ගරු කිරීම

- යුතුකම් හා වගකීම් අන්‍යොන්‍ය වශයෙන් එකට බැඳී ඇති වෙන්කළ නොහැකි දෙයකි

- යුතුකම් හා වගකීම් ඉටු කිරීම සමාජයේ යහ පැවැත්මට හේතු වේ
  - තමන්ගේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා වීම
  - තෘප්තිමත් හා ගෞරවාන්විත ජන සමාජයක් බිහි වීම
  - යහපත් ජීවන ක්‍රමයක් ගොඩ නගා ගත හැකි වීම
  - යහපත් අන්තර් ජාතික සබඳතා පවත්වා ගෙන යා හැකි වීම

### 7.2.4 යුතුකම් හා වගකීම් ක්‍රියාත්මක කරන ආකාරය

**රජයේ නීති / පනත්**
1 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව කටයුතු කිරීම
2 පොදු දේපල අරක්‍ෂා කිරීම

**සම්ප්‍රදායන්**
1 පාසලේ ගෞරවය හා කීර්ති නාමය ආරක්‍ෂා කිරීම
2 වත් පිළිවෙත් ඉටු කිරීම

**යුතුකම් හා වගකීම් ක්‍රියාත්මක කරන විවිධ ක්‍රම වේද**

**ස්වං විනය**
1 නියමිත වෙලාවට රැකියාවට යෑම
2 නියමිත වෙලාවට පාසලට යෑම
3 පරිසරයට ආදරය කිරීම

**සිරිත් විරිත්**
1 දෙමාපිය වැඩිහිටියන්ට ගරු කිරීම
2 ජාතික කර්තව්‍යයන් ඉටු කිරීම
3 ජාතික සංකේතවලට ගරු කිරීම උදා- ජාතික ගීය, ජාතික කොඩිය

- ස්වයං විනය තුළින් යුතුකම් හා වගකීම් ඉටු කිරීම නිසා මනා ශික්ෂණයකින් යුත් යහපත් ආකල්පවලින් හෙබි පුරවැසියන් බිහි වේ.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

### 7.2.5 නීතිමය රාමුව තුළ අයතිවාසිකම් භුක්ති විදීම

- අයිතිවාසිකම් යනු ජන සමාජය තුළින් තමන්ට ලැබී ඇති වර ප්‍රසාදය
- තමන්ගේ ජීවිතය තෘප්තිමත් කර ගැනීමට සමාජයෙන් ලැබී ඇති ඉඩ ප්‍රස්තා
- තම ජීවිතය යහපත් හා ගෞරවාන්විත ආකාරයට ගත කිරීමට සමාජයෙන් ලැබෙන ඉඩ ප්‍රස්තාව අයිතිවාසිකම් ලෙස සැලකිය හැකිය.

අයිතිවාසිකම්වල ලක්ෂණ

- සමාජය තුළින් හිමිවීම
- සමාජයේ පොදු යහපත සමඟ එකට බැඳීතිබීම
- අසීමිත නොවීම
- අයිතිවාසිකම් භුක්ති විදීමේ දී ආත්මාර්තකාමීත්වයෙන් තොරවීම
- යුතුකම් හා බැඳී තිබීම

**අයිතිවාසිකම් වර්ග**

| සිවිල් අයිතිවාසිකම් | දේශපාලන අයිතිවාසිකම් |
|---|---|
| * ජීවත්වීමේ අයිතිය<br>* අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය<br>* කැමති ආගමක් ඇදහීම<br>* අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය<br>* රැකියාවක් කිරීමට ඇති අයිතිය<br>* පවුල් ජීවිතයක් ගත කිරීමට ඇති අයිතිය<br>* සමානාත්මතාව සඳහා ඇති අයිතිය<br>* දේපල සඳහා ඇති අයිතිය<br>* කැමති තැනක ජීවත්වීමේ අයිතිය<br>* රැස්වීමට හා සංවිධානය වීමට ඇති අයිතිය | * ඡන්දය ප්‍රකාශ කිරීම<br>* ඡන්දය ලබා ගැනීම<br>* පක්ෂයට බැඳී කටයුතු කිරීම<br>* කැමති ආණ්ඩුවක් පත් කර ගැනීම<br>* ආණ්ඩුව විවේචනය කිරීම<br>* රජයේ තනතුරු දැරීම |

- **අයිතිවාසිකම් භුක්ති විඳිය යුතු ආකාරය**
  * අයිතිවාසිකම් භුක්ති විඳිය යුත්තේ අන් අයට බාධාවක් නොවන අයුරින් ය.
  * යුතුකම් හා වගකීම් ඉටු කරමින් අයිතිවාසිකම් භුක්ති විඳිය යුතු ය.
  * අයිතිවාසිකම් භුක්ති විඳිය යුත්තේ නීති රීති වලට අනුකූලව ය.

## 7.2..1 ක්‍රියාකාරකම

නිපුණතා මට්ටම : ජන සමාජයේ පවත්නා අන්තර් සබඳතා විමර්ශනය කරයි

ක්‍රියාකාරකම : " සමාජ සංවිධානවල ක්‍රියාකාරී සාමාජිකයෝ වෙමු. "

කාලය : මිනිත්තු 40 යි

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 7.2.1.1
- ඇමුණුම 7.2.1.2

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.2.1.1. :
- ඇමුණුම 7.2.1.1ට අදාළ වූ දෙබස පන්තියට ඉදිරිපත් කරන්න.
- ඒ පිළිබඳව සිසුන්ගේ අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න
- පහත දැක්වෙන කරුණු ඉස්මතු වන පරිදි සාකච්ඡාවක් මෙහෙය වන්න.

'

- විවිධ මිනිස් අවශ්‍යතා මත සමාජ සංවිධාන බිහි වන බව
- එසේ බිහි වූ විවිධ වර්ගයේ සංවිධාන සමාජය තුළ පවතින බව
- එම සංවිධානවල එකතුවෙන් සමාජය බිහි වී තිබෙන බව
- සෑම මිනිසෙක් ම යම් සංවිධානයක හෝ කිහිපයක කොටස් කරුවන් බව

(මිනිත්තු 10 යි)

පියවර 7.2.1.2 :
- සිසුන් කණ්ඩායම් 04කට බෙදන්න.
- එක් එක් කණ්ඩායමට ඇමුණුම 7.2.1.2ට අදාළ කාර්ය පත්‍රිකාව ලබා දෙන්න..
- සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

(මිනිත්තු 15යි)

පියවර 7.2.1.3 :
- එක් එක් කණ්ඩායමට තම කණ්ඩායම් වාර්තා පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- සිසුන් අතර දැනුම හුවමාරු වන අයුරින් කණ්ඩායම් ක්‍රියාකාරකම සාකච්ඡා කරන්න.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

- එක් එක් කණ්ඩායම විසින් ඉදිරිපත් කරන ලද වැදගත් කරුණු සටහන් කර ගැනීමට සියලුම සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- පහත දැක්වෙන කරුණු ඉස්මතු වන පරිදි සමාලෝචනයක යෙදෙන්න.

- සමාජ ආයතන/සමාජ සංවිධාන රාශියක එකතුවෙන් සමාජය බිහිව තිබෙන බව
- පුද්ගල අන්තර් ක්‍රියාවන්ගෙන් බැඳුණු සාමාජික එකතුව සමාජයක් බව
- සදාචාර සම්පන්න ජීවිතයක් ගත කිරීමට ගත් උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙස සමාජය බිහිව තිබෙන බව
- සමාජ සංවිධානවල සාමාජිකයන් සතුව යුතුකම් හා වගකීම් පවතින බව
- ඒවා නොපිරිහෙලා ඉටු කරන තාක්කල් සමාජ සුරක්ෂිතතාව ඇති වන බව
- යම් සමාජ සංවිධානයක සාමාජිකත්වය තුළින් තමාට හා සමාජයට විවිධ ප්‍රතිලාභ අත් වන බව

(මිනිත්තු 20 යි)

## තක්සේරුව හා ඇගයීම

- තම ප්‍රදේශයේ පවතින සමාජ සංවිධාන නම් කරයි.
- තමාට මෙන් ම සමාජයට ද ප්‍රතිලාභ අත්වන බැවින් එම සංවිධාන අගය කරයි.
- සමාජීය සංවිධාන සාමාජිකයන් සතු යුතුකම් වගකීම් ගොනු කරයි.
- කණ්ඩායම් ක්‍රියාකාරකම්වලට සක්‍රියව දායක වෙයි.
- කණ්ඩායම් ක්‍රියාකාරකම නිර්මාණශීලි ව ඉදිරිපත් කරයි.

පසුවැඩ

- පාසල් පරිසරය අලංකාර ලෙස පවත්වා ගැනීමට 7 ශ්‍රේණිය සිසුන් එකතු වී පරිසර සංවිධානයක් ආරම්භ කොට පවත්වා ගෙන යාමට කටයුතු කරන්න.

ඇමුණුම 7.2.1.1

කමල් : කොහොමද නිමල්, ඊයේ නිවාඩු නේද?

නිමල් : හොඳින් ඉන්නව. ඊයේ දවසේ වරුවක් ම මරණාධාර සමිතියේ වාර්ෂික රැස්වීම. හැම මාසෙකම පොහොය දවසට අපේ මරණාධාර සමිතියේ සමිති වාරය පවත්වනවා.

තිළිණි : මම දැක්කා දිලිනි ඔයා ඊයේ ප්‍රජා ශාලාව ළඟ ඉන්නවා

දිලිනි : ඔව් තිළිණි ඊයේ අපේ ළමා සමාජයේ මාසික රැස්වීමනේ

තිළිණි : ඔයාට පුළුවන් ද මේ සති අන්තයේ අපේ ගෙදර එන්න.

දිලිනි : කණගාටුයි. තිළිණි, මට එන්න බැරිවෙයි. මොකද? මේ සති අන්තයේ ක්‍රීඩා සමිති රැස්වීමක් ප්‍රජා ශාලාවේ තියෙනවා කිව්වා

ඇමුණුම 7.2.1.2

- ඔබට ලැබී ඇති කාර්ය පත්‍රිකාවට අදාළ ව වගුව සම්පූර්ණ කරන්න.

| අනු අංකය | සමාජ ආයතනය/ සමාජ සංවිධාන නම් කරන්න | සංවිධානයේ සාමාජිකයින් සතු | | සාමාජික වීම නිසා තමාට/සමාජයට අත්වන ප්‍රතිලාභ | |
|---|---|---|---|---|---|
| | | යුතුකම් | වගකීම් | තමාට | සමාජයට |
| උදා: 01 | පන්සල/කෝවිල පල්ලිය/දේවස්ථානය | ස්ථානයේ පූජනීයත්වය ආරක්ෂා කිරීම | ආචාරශීලී වීම | සංයමය | හික්මීම |
| 02 | පාසල | | | | |
| 03 | ක්‍රීඩා සමාජය | | | | |
| 04 | යෞවන සමාජය | | | | |
| 05 | ශ්‍රමදාන සමිතිය | | | | |

(* ඔබ ප්‍රදේශයේ ඇති සමාජ සංවිධාන/ආයතන පිළිබඳ ව තොරතුරු සපයන්න)

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 7.2.2 ක්‍රියාකාරකම

නිපුණතා මට්ටම : ජන සමාජය තුළ පවත්නා අන්තර් සබඳතා විමර්ශනය කරයි.

ක්‍රියාකාරකම : "යහපත් අන්තර් සබඳතා ගොඩ නගමු. "

කාලය : මිනිත්තු 40 යි

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 7.2.2.1 ට අදාළ චිත්‍රය
- ඇමුණුම 7.2.2.2 ට අදාළ කාර්ය පත්‍රිකාව
- ඩිමයි කොළ, ෆෙල්ට් පෑන්

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.2.2.1. :
- ඇමුණුම 7.2.2.1 ට අදාළ චිත්‍රය පන්තියට ඉදිරිපත් කරන්න.
- ඒ පිළිබඳ බුද්ධි කලම්භන සාකච්ඡාවක් මෙහෙයවන්න.
- පහත දැක්වෙන කරුණු ඉස්මතු වන පරිදි සාකච්ඡාවක් මෙහෙයවන්න.

> - පුද්ගලයින්ට තනි තනිව තමාගේ අවශ්‍යතා ඉටු කර ගත නොහැකි බව
> - සෑම පුද්ගලයෙක් ම අන්තර් සබඳතා, අනිවාර්යයෙන් ම ගොඩ නගා ගත යුතු බව
> - සෑම සමාජ සම්බන්ධතාවයක්ම අන්තර් පුද්ගල හා අන්තර් සංවිධාන මත ගොඩ නැගී ඇති බව

(මිනිත්තු 05යි)

පියවර 7.2.2.2 :
- සිසුන් කණ්ඩායම් 05කට බෙදන්න.
- එක් එක් කණ්ඩායමට ඇමුණුම 7.2.2.2 ට අදාළ කාර්ය පත්‍රකාව ලබා දෙන්න.
- සිසුන් ට කණ්ඩායම් ක්‍රියාකාරකමෙහි නිරත වීමට අවස්ථාව ලබා දෙන්න.

(මිනිත්තු 15යි)

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

පියවර 7.2.2.3 :

- එක් එක් කණ්ඩායමට තම නිර්මාණ පන්තියට කාමරයට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- සිසුන් අතර දැනුම හුවමාරු වන අයුරින් කණ්ඩායම් ක්‍රියාකාරකම් සාකච්ඡා කරන්න.
- පහත දැක්වෙන කරුණු ඉස්මතු වන පරිදි සාමාලෝචනයක යෙදෙන්න.

| |
|---|
| • සමාජය තුළ විවිධ මට්ටමේ අන්තර් සබඳතා පවතින බව<br>• එම සබඳතාවන් පෞද්ගලික / සමාජීය අවශ්‍යතාවයන් ඉතා යහපත් ආකාරයට ඉටු කරන බව<br>• පෞද්ගලිකව ඉටු කර ගත නොහැකි අවශ්‍යතා අන්‍යොන්‍ය විශ්වාසය මත සාමුහිකව ඉටු කර ගත හැකි බව<br>• අන්තර් සබඳතාවයක් පවුලට ගමට රටට පමණක් නොව අන්තර්ජාතික වශයෙන් පවත්වා ගැනීම ද වඩා යහපත් බව<br>• අන්තර්ජාතික සබඳතා ගොඩ නැගීමෙන් ලෝක පුරවැසියකු ලෙස කටයුතු කළ හැකි බව |

(මිනිත්තු 20 යි)

## තක්සේරුව හා ඇගයීම


- සමාජය තුළ පවත්නා අන්තර් සම්බන්ධතා විස්තර කරයි.
- අන්‍යොන්‍ය සබඳතා යහපත්ව පවත්වාගෙන යාම අගය කරයි.
- අන්තර් සබඳතා තුළ පවත්නා යුතුකම් හා වගකීම් ඉස්මතු කර පෙන්වයි.
- කණ්ඩායම් තුළ යහපත් අන්තර් සබඳතා ප්‍රදර්ශනය කරයි.
- කණ්ඩායම් ක්‍රියාකාරකම නිර්මාණශීලී ව ඉදිරිපත් කරයි.

පසුවැඩ

| |
|---|
| • අන්තර් සබඳතා යහපත්ව පවත්වා ගැනීම නිසා අත්වන වාසි සහ අවාසි දැක්වෙන ප්‍රවෘත්ති පත්‍ර වාර්තා එකතු කොට ගොනුවක් පිළියෙළ කරන්න. පන්තියේ සිසුන්ට කියවීමට සලස්වන්න. |

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඇමුණුම 7.2.2.1 ට අදාළ චිත්‍ර



Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඇමුණුම 7.2.2.1 චිත්‍ර මඟින්

* දෙමාපිය දූදරු * ගුරු සිසු * ස්වාමි සේවක
* හිත මිතුරු * ගිහි පූජ්‍ය * දේශීය විදේශීය

යන අය අතර අන්තර් සබඳතා නිරූපණය කර ඇත.

ඇමුණුම 7.2.2.2 ට අදාළ කාර්ය පත්‍රිකාව

ඔබට ලැබී ඇති අන්තර් පුද්ගල සබඳතා සැලකිල්ලට ගෙන මනා අන්තර් සබඳතාවක් ගොඩ නගා ගැනීමට ආධාර වන යුතුකම් හා වගකීම් දැක්වෙන වගු සටහනක් පිළියෙල කරන්න.

| | | |
|---|---|---|
| I වන කණ්ඩායම | - | දෙමාපිය දූදරු අන්තර් සබඳතා |
| II වන කණ්ඩායම | - | ගුරු සිසු අන්තර් සබඳතා |
| III වන කණ්ඩායම | - | ස්වාමි සේවක අන්තර් සබඳතා |
| IV වන කණ්ඩායම | - | හිත මිතුරු අන්තර් සබඳතා |
| V වන කණ්ඩායම | - | පූජ්‍ය ගිහි අන්තර් සබඳතා |

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 7.2.3 ක්‍රියාකාරකම

නිපුණතා මට්ටම : ජන සමාජයේ සාමාජිකයකු වශයෙන් නීතිමය රාමුව තුළ තම අයිතිවාසිකම් භුක්ති විඳීමට හුරුවෙයි

ක්‍රියාකාරකම : " නීති ගරුකව අයිතිවාසිකම් භුක්ති විඳිමු"

කාලය : මිනිත්තු 40 යි

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 7.2.3.1 ට අදාළ භූමිකා රංගනය සඳහා ඉඟි
- ඇමුණුම 7.2.3.2 ට අදාළ කාර්ය පත්‍රිකාව
- ලියන කඩදාසි

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.2.3.1. :
- ඇමුණුම 7.2.3.1ට අදාළ භූමිකා රංගනය පන්තියට ඉදිරිපත් කරන්න.
- එම රංගනය පිළිබඳ වටහා ගැනීමට පන්තියේ අන් සිසුන් යොමු කරන්න.
- ඒ පිළිබඳව අදහස් ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- පහත දැක්වෙන කරුණු ඉස්මතු වන පරිදි සාකච්ඡාවක් මෙහෙවන්න.

> - සෑම පුද්ගලයකුට ම පෞද්ගලික නිදහසට අයිතිය ඇති බව
> - නිදහසට ඇති එම අයිතිය අසීමිත නොවන බව
> - නීතියට අනුකූලව එම අයිතිය භුක්ති විඳිය යුතු බව

(මිනිත්තු 05 යි )

පියවර 7.3.3.2 :
- සිසුන් කණ්ඩායම් 04කට බෙදන්න.
- එක් එක් කණ්ඩායමට ඇමුණුම 7.2.3.2 ට අදාළ කාර්ය පත්‍රිකාව ලබා දෙන්න.
- සිසුන් ක්‍රියාකාරකමෙහි යොදවන්න.
- අවශ්‍ය කාලය ලබා දෙන්න.

(මිනිත්තු 15 යි)

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

පියවර 7.3.3.3 : 
- එක් එක් කණ්ඩායමට තම ක්‍රියාකාරකම අනුව සකසා ගත් තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- කණ්ඩායම් අතර අදහස් හුවමාරු කර ගැනීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත දැක්වෙන කරුණු ඉස්මතු වන පරිදි සමාලෝචනයක යෙදෙන්න.

> - අයිතිවාසිකම් භුක්තිවිඳිය හැක්කේ ශිෂ්ට සම්පන්න සමාජීය සත්ත්වයන්ට බව
> - අයිතිවාසිකම් හිමි වුවත් ඒවා අසීමිතව භුක්ති විඳිය නොහැකි බව
> - අයිතිවාසිකම් නීතිමය තත්වයන් සමඟ බැඳී පවතින බව
> - අයිතිවාසිකම් කඩ කිරීමෙන් දඬුවම් ලැබෙන බව
> - අයිතිවාසිකම් කඩකරීම සදාචාර විරෝධී බව
> - යුතුකම් හා වගකීම් ඉටු කරමින් අයිතිවාසිකම් භුක්ති විඳිය යුතු බව
> - යුතුකම් වගකීම් ඉටු කිරීම මගින් පුද්ගලයන් අතර සුහදතා වර්ධනය වී සමාජය තුළ අන්තර් පුද්ගල සබඳතා ගොඩ නැගෙන බව

(මිනිත්තු 20 යි)

## තක්සේරුව හා ඇගයීම

- විවිධ අයිතිවාසිකම් විස්තර කරයි.
- අන්‍යයන්ගේ අයිතිවාසිකම්වලට ගරු කිරීමේ වැදගත්කම අගය කරයි.
- අයිතිවාසිකම් නීතිමය හා සදාචාරමය වශයෙන් වෙන්කර දක්වයි.
- කණ්ඩායම් හැඟීමෙන් ක්‍රියාකාරකමෙහි යෙදෙයි.
- ගැටලු නිරාකරණය සඳහා මැදිහත්ව කටයුතු කරයි.

පසුවැඩ

> - ඔබ ජීවත් වන පරිසරය තුළ අයිතිවාසිකම් කඩවූ අවස්ථාවක් තෝරා ගෙන එයට ලැබුණු සාදාචාරාත්මක හා නීතිමය දඬුවම් වෙන් කර ලියන්න.
> ඔබ එවන් අවස්ථාවක දී ක්‍රියාකරන්නේ කෙසේදැයි යෝජනා ඉදිරිපත් කරන්න.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඇමුණුම 7.2.3.1

භූමිකා රංගනය සඳහා ඉඟි

- ප්‍රවේශ පත්‍රයක් ලබා නොගෙන දිනපතා බස් රථයෙන් සේවා ස්ථානයට ගමන් කිරීමට පුරුදුව සිටින මගියෙක්
- එය නීති විරෝධී ක්‍රියාවක් බවත් දඬුවම් ලැබිය හැකි වරදක් බවත් ඔහුගේ මිතුරන් ඔහුට අනතුරු හඟවයි.
- එක් දිනක් ටිකට් පරීක්ෂක මහත්වරුන්ට ඔහුගේ මෙම ක්‍රියාව හසු කර ගැනීමට හැකි විය.

ඇමුණුම 7.2.3.2

## කාර්ය පත්‍රිකාව

7 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන සිරිමල්, ඉදිරි සතියේ පැවැත් වෙන වාර විභාගය සඳහා පාඩම් කරමින් සිටින අතර තම පියා හෘදයාබාධයක් වැළඳී වෛද්‍ය උපදේශ මත විවේක ගනිමින් නිවසේ රැඳී සිටී. සිරිමල්ගේ යාබද නිවසේ ඇති කැසට් යන්ත්‍රය දිවා රෑ අධික හඬකින් වාදනය කරයි. එම ක්‍රියාව සිරිමල්ගේ පියාට සහ ඔහුට මහත් බාධාවක් හා හිරිහැරයක් ලෙස දැනෙන අතර එය වලක්වා ගැනීමට අවශ්‍ය වී ඇත. ඒ සඳහා සිරිමල්ට ගත හැකි ක්‍රියා මාර්ග යෝජනා කරන්න. එම යෝජනාවන් නීතිමය සහ සදාචාරමය වශයෙන් පෙළ ගස්වන්න.

| නීතිමය ක්‍රියාමාර්ග | සාදාචාරමය ක්‍රියාමාර්ග |
|---|---|
| | |

( * කණ්ඩායම් ගණනට ප්‍රමාණවත් පරිදි කාර්ය පත්‍රිකා සකසාගන්න )

## 7.2.4 ක්‍රියාකාරකම

නිපුණතා මට්ටම : අයිතිවාසිකම් හා බැඳුනු යුතුකම් හා වගකීම් ඉටු කරයි.

ක්‍රියාකාරකම : " යුතුකම් ඉටු කරමු අයිතිවාසිකම් ලබමු. "

කාලය : මිනිත්තු 40 යි

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 7.2.4.1 ට අදාළ චිත්‍ර
- ඇමුණුම 7.2.4.2 කාර්ය පත්‍රිකා
- ෆෙල්ට් පෑන්, ඩිමයි කොළ, පෙළ පොත

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.2.4.1 :
- ඇමුණුම 7.2.4.1 ට අදාළ චිත්‍රය පන්තියට ඉදිරිපත් කරන්න.
- ඒ කෙරෙහි සිසුන්ගේ නිරීක්ෂණාත්මක අවධානය යොමු කරන්න.
- සිසුන්ගේ අදහස් ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- පහත දැක්වෙන කරුණු ඉස්මතු වන පරිදි සාකච්ඡාවක් මෙහෙයවන්න.

> - යම් වෘත්තියක නියෙලෙන්නන් තම යුතුකම් නිසිලෙස ඉටුකළ යුතු බව
> - තම රාජකාරී කටයුතු වගකීමෙන් යුතුව ඉටු කළ යුතු බව
> - ජනතා අවශ්‍යතා ඉටු කර දීමට ඔවුන් කැපවී සිටිය යුතු බව
> - තම අයිතිවාසිකම් ලබා ගැනීමට ආත්මාර්ථකාමී නොවිය යුතු බව

(මිනිත්තු 10 යි )

පියවර 7.2.4.2 :
- සිසුන් කණ්ඩායම් 04කට බෙදන්න.
- එක් එක් කණ්ඩායමට ඇමුණුම 7.2.4.2 ට අදාළ කාර්ය පත්‍රිකාව ලබා දෙන්න.
- සිසුන් ක්‍රියාකාරකමෙහි යොදවන්න.
- අවශ්‍ය කාලය ලබා දෙන්න.

(මිනිත්තු 15 යි)

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

පියවර 7.2.4.2 :

- එක් එක් කණ්ඩායමට තම ක්‍රියාකාරකම අනුව සකසා ගත් තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- කණ්ඩායම් අතර අදහස් හුවමාරු කර ගැනීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත දැක්වෙන කරුණු ඉස්මතු වන පරිදි සමාලෝචනයක යෙදෙන්න.

- පවුලේ සාමාජිකයකු වශයෙන් යුතුකම් ඉටු කරමින් අයිතිවාසිකම් ලැබිය යුතු බව
- අසල් වැසි සමාජයේ සාමාජිකයකු වශයෙන් යුතුකම් ඉටු කරමින් අයිතිවාසිකම් ලැබිය යුතු බව
- පාසල් සිසුවකු වශයෙන් යුතුකම් ඉටු කරමින් අයිතිවාසිකම් ලැබිය යුතු බව
- පරිසර හිතකාමී පුද්ගලයකු වශයෙන් යුතුකම් ඉටු කරමින් අයිතිවාසිකම් ලබාගත යුතු බව

(මිනිත්තු 15 යි )

## තක්සේරුව හා ඇගයීම

- විවිධ යුතුකම් හා අයිතිවාසිකම් විස්තර කරයි.
- සමාජ යහපත සඳහා යුතුකම් ඉටු කිරීමේ වැදගත්කම අගය කරයි.
- අයිතිවාසිකම් හා යුතුකම් වර්ග කර දක්වයි.
- කණ්ඩායම් සාමාජිකයකු ලෙස තම යුතුකම් ඉටු කරයි.
- අන් අයගේ අයිතිවාසිකම්වලට ගරු කරයි.

## පසුවැඩ


- අයිතිවාසිකම් හා යුතුකම් පිළිඹිඹු වන ආකාරයට කවි, සින්දු, චිත්‍ර නිර්මාණය කරන්න.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඇමුණුම 7.2.4.1

A චිත්‍රය - මෙහි කාර්යාලයක ඇතුළත දර්ශනයක් පෙන්නුම් කරයි.

* කතා කරමින් නිකරුණේ කාලය ගත කරන අය
* පත්තර බලමින් සිටින අය
* කාර්යාලයේ විවිධ කටයුතු ඉටු කරවා ගැනීමට පැමිණ බලා සිටින පිරිසක්



B චිත්‍රය - මෙහි ඉදි කිරීම් වැඩ පළක නිසියාකාරව සේවයේ නිරත ව සිටින පිරිසක් දැක්වේ.



Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඇමුණුම 7.2.4.2

ඔබට ලැබී ඇති කාර්ය පත්‍රිකාවට අදාළ ව වගුව සම්පූර්ණ කරන්න.

| යුතුකම් | අයිතිවාසිකම් |
|---|---|
| | |

## කාර්ය පත්‍රිකාව

1. පවුලේ සාමාජිකයෙකු වශයෙන්
2. පාසල් සිසුවකු වශයෙන්
3. අසල්වැසි සමාජයේ සාමාජිකයකු වශයෙන්
4. ඔබ බලාපොරොත්තු වන අනාගත රැකියාව සම්බන්ධයෙන්
5. පරිසර හිතකාමී පුද්ගලයකු වශයෙන්

* එක් එක් අවස්ථාවේ ඉටු කළ යුතු ඉටු කරන යුතුකම් හා හිමි විය යුතු හෝ හිමි වන අයිතිවාසිකම් වගු ගත කරන්න.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 7.3 අපේ සංස්කෘතිය

### හැඳින්වීම

ශ්‍රී ලාංකික සමාජය සංස්කෘතික බහුවිධතාවයෙන් යුක්ත වූවකි. සිංහල, ද්‍රවිඩ, මුස්ලිම් මැලේ, බර්ගර් හා වෙනත් වශයෙන් විවිධ ජන වර්ග ශ්‍රී ලංකාව වාස භූමිය කොට ගෙන ජීවත් වෙති. විවිධ භාෂා කථා කරන විවිධ ආගම් අදහන මෙම පිරිස් එකිනෙකට වෙනස් සංස්කෘතිකාංගවලට උරුමකම් කියති. සංඛ්‍යාත්මක වශයෙන් සලකන විට බහුතරය සිංහල වන අතර සෙසු ජන වර්ග ද රටේ සියලු ම පළාත්වල ව්‍යාප්ත ව සිටිති. අප සමාජය තුළ දක්නට ලැබෙන සංස්කෘතික බහුවිධතාව ඈත අතීතයේ සිට ම ශ්‍රී ලාංකික සමාජය පෝෂණය කිරීමට දායක වී ඇති බැවින් අපට මෙම විවිධත්වය නොසලකා හැරිය නො හැකි ය.

ජාතික ආර්ථිකයට, ජාතික දේශපාලනයට මෙන් ම රාජ්‍ය පරිපාලනයට ද සියලු ජන වර්ග එක සේ දායක වන බැවින් සංස්කෘතික බහුවිධතාව පිළිබඳ සංවේදී විය යුතු ය. එම නිසා සංස්කෘතික බහුවිධතාව අගය කළ යුතු වන්නේ ය. මෙම තත්ත්වය යටතේ තමන් කැමති ආගමක් ඇදහීමට, භාෂාවක් කථා කිරීමට, විශ්වාසයක් දැරීමට, හුදකලාව හෝ අන් අය සමඟ සංස්කෘතිය භුක්ති විඳීමට ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාව මඟින් ඉඩ ප්‍රස්තාව සලසා ඇත.

සංස්කෘතික විවිධත්වය යටතේ ජාතික එක්සත් බව ගොඩනැගීම ශ්‍රී ලාංකික සමාජයේ කාලීන අවශ්‍යතාවයකි. අපේ සංස්කෘතිය නැමැති මෙම ඒකකය ඉගෙනීමේ ප්‍රධාන අරමුණ වන්නේ තම සංස්කෘතිය අගය කරමින් අන්‍ය සංස්කෘතීන්ට ද ගෞරව කිරීම සහ යහපත් ආකල්ප වර්ධනය කර ගැනීම තුළින් සමබර පෞරුෂයකින් හෙබි ශ්‍රී ලාංකික දරු පිරිසක් සමාජයට ද දායාද කිරීම යි.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

# 7.3 අපේ සංස්කෘතිය

නිපුණතාව : බහුවිධ සමාජය තුළ ස්වකීය සංස්කෘතික අනන්‍යතාව ආරක්ෂා කර ගනිමින් අන්‍ය සංස්කෘතීන්ට ද ගරු කරමින් ජාතික සමගිය ගොඩ නැගීමට දායක වෙයි.

නිපුණතා මට්ටම් :

- තම සංස්කෘතික දායාද අගය කරමින් අන්‍ය සංස්කෘතීන්ට ද ගරු කරයි.
- සෑම සංස්කෘතියක ම දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ විශ්ලේෂණය කරයි.
- ජාතික අනන්‍යතාව පිළිබිඹු කෙරෙන සංකේත නිවැරදිව භාවිත කරමින් ඒවාට ගරු කරයි.
- යහපත් පුරවැසියකු සතු සාර ධර්ම අගය කරයි.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

විෂය අන්තර්ගතය

# 7.3 අපේ සංස්කෘතිය

## 7.3.1 සංස්කෘතිය යනු කුමක්දැයි සරළව හැඳින්වීම

- සංස්කෘතිය හැඳින්වීම
  "සංස්කෘතියක් යනු සමජයක ජීවත්වන පුද්ගලයින්ගේ භාෂාව, ඇඳුම් පැළඳුම්, ආහාර පාන කලා ශිල්ප, සාහිත්‍ය, අධ්‍යාපනය, නීතිය, සිරිත් විරිත් හා ගුණධර්ම විශ්වාස හා ඇදහිලි ආදී සියලුම අංගයන්ය."


- සංස්කෘතිය පිළිබඳ නිර්වචන
  " සංස්කෘතිය හෝ සභ්‍යත්වය යනු දැනුම, ඇදහිලි, කලා, නීති, සදාචාර, සිරිත් විරිත් හා මිනිසා සමාජයේ ජීවත්වන පුද්ගලයකු වශයෙන් ලබාගන්නා වූ පුරුදු ඇබ්බැහිකම් හා හැකියාවන් අඩංගු සංකීර්ණ සමස්ත සමුදායයි."
  ( E.B. TYLOR ' PRIMITIVE CULTURE ' - JOHN MURRAY LONDON)

" සංකේතානුසාරයෙන් සමාජයීය ලෙස හිමි කර ගන්නා වූ ද පාරම්පරික වශයෙන් අත්පත් කොට ගන්නා වූ ද සියලු ම චර්යා රටාවන් ට දිය හැකි සාමුහික නාමය" යනුවෙනි.

( චාල්ස් ඒ එල්වුඩ් නම් සමාජ විද්‍යාඥයා විසින් 1944 දී සමාජ විද්‍යා ශබ්ද කෝෂයට ඉදිරිපත් කර තිබූ නිර්වචනය )

" සියලු සමාජයීය කර්තව්‍යයන්ට එනම් පුළුල් වශයෙන් ගත් කළ භාෂාව, විවාහය, අයිතිය පිළිබඳ ක්‍රම ආචාර සමාචාර, කර්මාන්ත, කලාව ආදී සියල්ලන්ට සංස්කෘතිය යයි ප්‍රකාශ කරන බව දක්වයි "
( සී. විස්ලර් 1920 දී ප්‍රකාශ වූ " ඇමරිකානු මානව විද්‍යාඥයා " නම් ශාස්ත්‍රීය සංග්‍රහයට අනුව )

- සංස්කෘතික අංග



- **සංස්කෘතිය පවරාදීම**
  - සමාජයේ පැවැත්ම රැදෙන්නේ සාමාජිකයින් මෙම සංස්කෘතික ලක්ෂණ පරම්පරාවෙන් පරම්පරාවට නිවැරදි ව පවරා දෙන ආකාරය අනුව ය.
  - සංස්කෘතිය පවරාදීමට මූලිකව කටයුතු කරන ආයතන වන්නේ
    - * පවුල
    - * අධ්‍යාපන ආයතන
    - * ආගමික ආයතන
  - පවුලෙන් සංස්කෘතිය පවරා දීම

    දෛනික ජීවන රටාවේ විවිධ කටයුතු විධිමත් ව පවත්වා ගැනීමට හුරු කිරීම

    උදා : ආහාර පුරුදු :- නියමිත වේලාවල දී පමණක් ආහාර ගැනීම
    කෑමට පෙර අත් සෝදා ගැනීම
    ආහාර ක්‍රමවත්ව බෙදා ගැනීම
    තලු නොමැරීම
    ආහාර ඇඟිලි තුඩුවල ගෑවෙන සේ පමණක් ඇනීම
    අන් අයට පෙර ආහාර ගෙන අවසන් වූවොත් නැගිටීමට අවශ්‍යනම් ' සමාවෙන්න ' යයි ප්‍රකාශ කර නැගිට යාම

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

- අධ්‍යාපන ආයතනවලින් සංස්කෘතිය පවරා දීම

  උදා : * පාසල
  * නියමිත වේලාවට පාසලට පැමිණීම හා පිටවීම
  * නියමිත කාල පරිච්ඡේදවල අධ්‍යාපන කටයුතුවල නිරත වීම
  * පාසල් පරිසරය පිරිසිදුව තබා ගැනීම

- ආගමක ආයතන මගින් සංස්කෘතිය පවරා දීම
  * කළ යුතු දේ හා නොකළ යුතු දේ පෙන්වා දීම
  * හරි දේ හා වැරදි දේ වටහා දීම
  * හොඳ හා නරක දේ පෙන්වා දීම
  * වඩාම හොඳ හා වඩාත් නරක දේ පෙන්වා දීම

- **සංස්කෘතිය ආරක්ෂා කිරීමේ වැදගත්කම**
  * සමාජයේ පැවැත්ම තීරණය වීම
  * ජාතික අනන්‍යතාව ආරක්ෂා වීම
  * ජාතික සමගිය ගොඩ නැගීම
  * පුද්ගල පෞරුෂ වර්ධනය කිරීම
  * මානව වර්ගයේ හැසිරීම පාලනය කිරීම
  * මානව චර්යා රටාවන් දියුණු කිරීම
  * මානව ආකල්ප හා සාරධර්ම වර්ධනය කිරීම

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 7.3.2 විවිධ සංස්කෘතින්ට අයත් විශේෂ ලක්ෂණ

- සංස්කෘතික විවිධත්වයට හේතු
  * ශ්‍රී ලංකාවේ සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් යන ජන වර්ග ජීවත් වේ.
  * එම ජන වර්ගවලට ආවේනික සංස්කෘතික ලක්ෂණ පවතී.

| ජන වර්ග අනුව විවිධත්වය | |
|---|---|
| | * සිංහල |
| | * දෙමළ |
| | * මුස්ලිම් |
| | * මැලේ |
| | * බර්ගර් |

ආගම් අනුව විවිධත්වය

* බෞද්ධ
* හින්දු
* ඉස්ලාම්
* ක්‍රිස්තියානි ආදී

ජීවනෝපාය අනුව විවිධත්වය

* ගොවිතැන්
* ධීවර
* ව්‍යාපාරික
* වතු වගාව
* හස්ත කර්මාන්ත

- ජන වර්ග හා ආගම් විවිධත්වය අනුව වෙනත් අංශවල ද වෙනස්කම් දක්නට ලැබේ.

- වෙනස්කම් දක්නට ලැබෙන අංශ
  * භාෂාව හා සාහිත්‍ය
  * කලාව
  * ආහාරපාන
  * ඇඳුම් පැළඳුම්
  * සිරිත් විරිත්

- විවිධ ආගම් හා ජන වර්ග වලට ආවේනික උත්සව දක්නට ලැබේ.

ආගම් අනුව

බෞද්ධ
* වෙසක් උත්සවය
* පොසොන් උත්සවය
* පුර පසලොස්වක පොහොය දින

හින්දු
* තෛපොන්ගල්
* මහා ශිව රාත්‍රී
* දීපවාලී

ඉස්ලාම්
* හජ්ජි උත්සවය
* නබිනායකතුමාගේ උපන් දිනය
* රාමසාන් උත්සවය

ක්‍රිස්තියානි කතෝලික
* නත්තල් උත්සවය
* මහ සිකුරාදා
* පාස්කු ඉරිදා

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

- සංස්කෘතික ලක්ෂණ හඳුනාගත හැකි වෙනත් අවස්ථා
    * දරුඋපතක් සිදු වූ අවස්ථාවක
    * ඉඳුල් කට ගෑම
    * කන් විදීම
    * අකුරු කියවීම
    * වැඩිවිය පැමිණීම
    * විවාහ මංගල්‍යය
    * අවමංගල්‍යය

### 7.3.3 සෑම සංස්කෘතියකම දක්නට ලැබෙන පොදු ලක්ෂණ

- සෑම සංස්කෘතියකම පොදු ලක්ෂණ ඇති බව

සංස්කෘතිය
- භාෂාව
- ආගම
- ඇදහිලි හා විශ්වාස
- රැකියා
- කලා ශිල්ප
- ඇඳුම් පැළඳුම්
- ආචාර සමාචාර විධි
- විවාහ / ආවාහ
- කර්මාන්ත
- චින්තන ක්‍රම
- ජීවන පිළිවෙත්
- සිරිත් විරිත් /සම්ප්‍රදායයන්
- ආහාර පාන

- විවිධ සංස්කෘතින්හි අන්තර් සබඳතා ජන සමාජයේ පැවැත්මට අවශ්‍ය බව
    - විවිධ උත්සව

      උදා : සර්ව ආගමික පූජා

    - පොදු ආගමික

      උදා : ශ්‍රී පාදය<br>කතරගම

    - විවාහ සම්බන්ධතා

      උදා : මුස්ලිම් සිංහල<br>දෙමළ - සිංහල<br>බෞද්ධ - ක්‍රිස්තියානි

- **කලා ශිල්ප**

  උදා : පොළොන්නරු අනුරාධපුර රාජධානි තුළ පැවති නෂ්ඨාවශේෂ
  මගින් විවිධ සංස්කෘතීන්ට අයත් ලක්ෂණ පැවති බව
  පොළොන්නරු යුගයේ සඳකඩ පහනින් ගවයා ඉවත් කිරීම
  ගුප්ත ආභාෂය ලද බුදු පිළිම නෙළා තිබීම

- **ඇඳුම් පැළඳුම්**

  විශේෂතාවයකින් තොරව සෑම දෙනාම විවිධ සංස්කෘතීන්ට
  අයත් ඇඳුම්, පැළඳුම් භාවිත කිරීම

  උදා : සාරිය
  ගවුම
  කලිසම
  සල්වාර් ඇඳුම


- **ආචාර සමාචාර විධි**

  උදා : ආයුබෝවන් කීම
  අතට අත දී සුභ පැතීම

- **ආගමික**

  උදා : සැරසිලි පූජාවන් හා පුද්ගලයන් පිළිගැනීම සඳහා
  මල් භාවිතා කිරීම
  පහන් පත්තු කිරීම

- සියලුම සංස්කෘතීන්ට අයත් ප්‍රජාව රටේ ආර්ථිකයට, දේශපාලනයට, නීතියට හා සාමය සුරක්ෂිත කිරීමට සහ සමාජ සුභ සාධනයට දායක වන බව




- ආර්ථික ක්ෂේත්‍රයන්හි සියලුම සංස්කෘතීන්ට අයත් ජන කොටස් නිරත වන බව

උදා : බෝග වගාව
සත්ව පාලනය
ධීවර කර්මාන්තය
කර්මාන්ත
සේවා

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

- සමාජයේ යහ පැවැත්මට අදාළ මානව ගුණ ධර්ම හා හැකියා වර්ධනය කිරීමේ අවශ්‍යතාව සෑම සංස්කෘතියකින්ම අවධාරණය කෙරෙන බව
- සමාජ අවශ්‍යතාවන්ට අනුවර්තනය වමේ හැකියාව සෑම සංස්කෘතියකටම පොදු ලක්ෂණයක් බව

  උදා : කාන්තාවන් රැකියා කරා යොමු වීම
  රෝග සුවකර ගැනීමට අනුගමනය කළ පැරණි ඇදහිලි වෙනුවට වෛද්‍ය ප්‍රතිකාර කිරීම
  තම අවශ්‍යතාවන් ඉටුකර ගැනීමට නව තාක්ෂණය යොදා ගැනීම

### 7.3.4 ජාතික අනන්‍යතාව හා ජාතික සමගිය

- එක් රටක් තුළ උපතින් සහ ලියා පදිංචියෙන් පුරවැසිභාවය ලබා සිටින මිනිසුන් ජාතියක් ලෙස පිළි ගැනීම.
- ජාතිය පිළිබඳ නිර්වචන

  " ජාතියක් සංයුක්ත වන්නේ එක ම භාෂාව කථා කිරීම හෝ එක ම වාර්ගික කාණ්ඩයකට අයත්වීම නිසා නොව අතීතයේ දී පොදුවේ ඇතිකර ගත් අර්ථ සිද්ධිය අනාගතයේ දීත් පවත්වා ගෙන යාමට ඇති කැමැත්ත මත ය.

  ( 1882 දී අර්නස්ට් රේනන් )

  " ජාතියකට රාජ්‍යයක් අවශ්‍ය ය. එහෙයින් එක ජාතියකට එක රාජ්‍යයක් යනු ජාතිකවාදයේ දේශපාලන ආකල්පය යි. එහි ජාතිය යන්නෙහි අදහස නම් රාජ්‍යයයි."

  (Hans J. Morganthan Politics Among Nations 5th Edition (Alfred A Knopf U.S.A. ) 1978)

  රාජ්‍යයේ ව්‍යුහය මෙ ලෙස විස්තර කළ හැකි ය

  - නිශ්චිත භූමිය
  - ජනගහනය
  - ආණ්ඩුව
  - ස්වාධිපත්‍ය

  ජාතිය යන්නෙහි අදහස රාජ්‍යයනම් ඉහත සඳහන් පරිදි එහි අංග ලක්ෂණවලින් සමන්විත විය යුතු ය.

- තම සංස්කෘතිය අගය කරමින් රටක ජීවත්වන සියලු පුරවැසියන් එක ම ජාතියකට අයත් ය යන හැඟීමෙන් කටයුතු කිරීමෙන් ජාතිකත්වය ගොඩ නැගෙන බව

  " පොදු ප්‍රභවයක් හා සම්ප්‍රදායයන් ඇති ජන සමූහයක කැපී පෙනෙන ගුණාංගයක්

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

ලෙස" ජාතිකත්වය අර්ථ කථනය කළ හැක.

" ජාතියක් වීමේ කැමැත්ත ඇති ව සංවිධානය වූ ප්‍රජාවක් ලෙසිනි."

(ප්‍රෙඩ්රික් හර්ට්ස්)

- ජාතිකත්වයට උදා :
  - ශ්‍රී ලාංකික
  - ඉන්දියානු
  - ඇමරිකාන
  - ජපන්

- එක් ජාතියක් තුළ විවිධ ජන වර්ග ජීවත්විය හැකි බව

  උදා : සිංහල
  දෙමළ → ශ්‍රී ලංකික
  මුස්ලිම්
  බර්ගර්

- ජන වර්ග වශයෙන් නොව ශ්‍රී ලාංකිය ජාතියක් වශයෙන් කටුයතු කිරීමෙන් සංවර්ධනය ලගා කර ගත හැකි බව

- ශ්‍රී ලාංකීය ජාතියක් වශයෙන් කටයුතු කිරීමෙන් සංවර්ධනය ළඟා කර ගැනීම

ජන වර්ග වශයෙන් බෙදී සිටින විට සංවර්ධනය කරා ළඟාවීම අපහසුය.
අසමගිය නිසා අමනාපය, එකිනෙකා අතර සැකය, වෛරය ඇති වන බව, එවිට ශක්තිමත්ව ආර්ථික කටයුතුවලට දායකවීමට ඇති ඉඩකඩ ඇහිරී යයි.

ජන වර්ග වශයෙන් බෙදී නොයා ශක්තිමත්ව එකාවන්ව ජාතියක් ලෙස නැගී සිටීමෙන් ආර්ථික කටයුතුවල වර්ධනයක් ඇති කර ගැනීම පහසු වේ.
එකිනෙකා අතර අන්‍යොන්‍ය සහයෝගය සමඟිය ඇතිව ජාතියක් ලෙස සිතීමට පුරුදු වීමෙන් ජාතියක සංවර්ධනය වඩාත් තීව්‍ර වේ.

- අප රටට නිදහස දිනා ගැනීම සඳහා මේ සියලු ම ජන වර්ගවලට අයත් ප්‍රජාව එකමුතුව කටයුතු කර ඇත.

නිදහස දිනා ගැනීම සඳහා එක් එක් ජන වර්ග වශයෙන් නොව ජාතියක් ලෙස ශ්‍රී ලංකාව තුළ කැපවීමෙන් කටයුතු කළ බව. එම ව්‍යාපාරයේ යෙදුණු අය විමසා බැලීමෙන් හෙළි කර ගත හැක.

නිදහස් සටන් ව්‍යාපාරයේ නියමුවන්

- ඩී.එස්. සේනානායක මැතිතුමා
- එෆ්.ආර්. සේනානායක මැතිතුමා
- හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි
- වාරියපොළ ශ්‍රී සුමංගල හිමි
- ටී.බී. ජායා මැතිතුමා
- සී. එම්. සිද්ධි ලෙබ්බේ මැතිතුමා
- පොන්නම්බලම් අරුණාචලම් මැතිතුමා
- පොන්නම්බලම් රාමනාදන් මැතිතුමා
- ශ්‍රී ආරුමුග නවලාර් මැතිතුමා

### 7.3.5 ජාතික කොඩිය, ජාතික ගීය සහ රාජ්‍ය ලාංඡනය

විෂය අන්තර්ගතය

- සෑම ජාතියකටම ජාතික ගීයක් ජාතික කොඩියක් හා රාජ්‍ය ලාංඡනයක් තිබෙන බව
- ඒ අනුව ශ්‍රී ලංකාවට ද ජාතික කොඩියක් ජාතික ගීයක් හා රාජ්‍ය ලාංඡනයක් තිබෙන බව

**ජාතික කොඩිය**

- වර්තමාන ජාතික කොඩිය සැකසීමේ පසුබිම
  * 1948 පෙබරවාරි 04 වැනි දින ශ්‍රී ලංකාව නිදහස ලැබීම
  * 1948 මාර්තු 16 දින එවකට ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍යව සිටි මහාමාන්‍ය ඩී.එස්. සේනානායක මහතා ජාතික කොඩිය නිර්මාණය කිරීම සඳහා කමිටුවක් පත් කිරීම.

කමිටුවේ සාමාජිකයන්

සභාපති - එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරණායක මැතිතුමා

ලේකම් - මහාචාර්ය සෙනරත් පරණවිතාන මැතිතුමා


ටී.බී. ඡායා මැතිතුමා

ජී.ජී. පොන්නම්බලම් මැතිතුමා

ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා

ශ්‍රීමත් ලලිත් රාජපක්ෂ මැතිතුමා

ශ්‍රීමත් ජෝන් කොතලාවල මැතිතුමා



- ජාතික කොඩියේ ඇතුළත් වර්ණ හා සංකේත රතු පසුබිමෙහි කඩුවක් අතින් ගත් සිංහයා බෝපත් හතර, තැඹිලි වර්ණ තීරුව, කොළ වර්ණ තීරුව, කහ වර්ණය

- ජාතික කොඩිය ඔසවනු ලබන අවස්ථා
  * නිදහස් උත්සවය
  * රාජ්‍ය උත්සව
  * ජාතික උත්සව
  * පාසලක හෝ ආයතනයක වැදගත් උත්සවයක්

- ජාතික කොඩිය භාවිත කිරීමේ දී අනුගමනය කළ යුතු පිළිවෙත්
  * එසවීමට පෙර ජාතික කොඩිය යොතට සවි කර අකුළා උස් ස්ථානයක තැබිය යුතු ය.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

( ජාතික කොඩිය කිසි ම විටෙක බිම නොතැබිය යුතු ය )

* ජාතික කොඩිය ප්‍රදර්ශනය කරනු ලබන අවස්ථාවල එයට ඉහළ ම ගෞරවණීය ස්ථානය දිය යුතු ය.
* විදේශ රාජ්‍ය නායකයකු මෙරටට පැමිණි විටක එරට ජාතික කොඩිය ප්‍රදර්ශනය කරන විට ශ්‍රී ලංකාවේ ජාතික කොඩිය ද ප්‍රදර්ශනය කළ යුතු ය.
* ආගමික කොඩි සමඟ ඔසවා තබන විට සමාන උසකින් ඔසවා තැබිය යුතු ය.
* ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ආදියේ දී අනෙක් රටවල ජාතික කොඩි ඔසවන උස ප්‍රමාණයෙන් ඔසවා තැබිය යුතු ය.
* එක්සත් ජාතීන්ගේ කොඩිය සමඟ ඔසවනු ලබන විට ජාතික කොඩියට වමෙන් හෝ දකුණෙන් ඔසවා තැබිය යුතු ය. සාමාන්‍ය ක්‍රමය වන්නේ ජාතික කොඩිය, එහි මුහුණලා ඇති දිශාවට දකුණු පසින් එසවීමයි.
* ප්‍රදේශීය කොඩි, පාසල් කොඩි ආදිය සමඟ ඔසවා තබන විට ජාතික කොඩිය සියල්ලට මැදින් ඉහළ ම ස්ථානයේ ඔසවා තැබිය යුතු ය.
* එකිනෙකට යාව පිහිටි කොඩි ගස් කිහිපයක කොඩි ඔසවා තබන විට මුලින් ම එසවිය යුත්තේත් අවසානයේ පහත් කළ යුත්තේත් ජාතික කොඩියයි.
* ජාතික කොඩිය ඔසවා තැබිය යුත්තේ එහි සිරස් තීරු දෙක කොඩි ගස දෙසින් සිටිනා පරිදි ය.
* පැහැදිළිව පෙනෙන ස්ථානයක ඔසවා තැබිය යුතු ය.
* වීදියක මැද (හරහා ) ජාතික කොඩිය ඔසවන අවස්ථාවල සිංහයා නිසි පරිදි සෘජුව සිටින සේ තිරස් අතට කොඩිය දිග පැත්තේන් එල්විය යුතු ය.

- ජාතික කොඩිය ඔසවන අවස්ථාවල දී අනුගමනය කළ යුතු පිළිවෙත්
  * ජාතික කොඩිය එසවීම හා පහත් කිරීම සෙමෙන් හා ගෞරවාන්විතව කළ යුතු ය.
  * ජාතික කොඩිය ඔසවනු ලැබී විගස ජාතික ගීය වාදනය හෝ ගායනය කළ යුතු ය.
  * සහභාගීවන සෑම දෙනා සීරුවෙන් සිට ගෞරව දැක්විය යුතු ය.
  * සෑම දෙනා ජාතික කොඩියට මුහුණ ලා සිට ගත යුතු ය.
  * හමුදා සේවාවල නිල ඇඳුම්වලින් සැරසුන අය නිසි ආචාර දැක්විය යුතු අතර සාමාන්‍ය අය හිස් වැසුම් ඉවත් කළ යුතු ය.
  * රාත්‍රී කාලයේ දී ජාතික කොඩිය ඔසවා තබන්නේ නම් විදුලි ආලෝකයෙන් ආලෝකමත් කළ යුතු ය.

- පෙරහැරවල ජාතික කොඩිය භාවිතය
  * සෑම අවස්ථාවක දී ම එහි යෂ්ඨිය සෘජුව තිබිය යුතු ය.
  * වෙනත් කොඩි පෙළක් සමඟ ගෙන යන්නේ නම් එම කොඩි පෙළේ මැදට ඉදිරියෙන් ජාතික කොඩිය ගෙන යා යුතු ය.
  * සම්මාන දැක්වීමේ දී ජාතික කොඩිය පහත් නොකළ යුතු ය.
  * වෙනත් කොඩි සමඟ ගෙන යන විට ජාතික කොඩිය පෙරහැරේ දකුණෙන් ගෙන යා යුතු ය.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

- කථික වේදිකාවක් මත ඔසවා තැබීම
    * කථිකයා සභාවට මුහුණ දුන් විට ඔහුගේ දකුණින් තිබෙන පරිදි කොඩි ගසක ඔසවා තැබිය යුතු ය.
    * එසේ නැතිනම් කථිකයාට පිටුපසින් වූ බිත්තියට හේත්තුවන සේ ඔහුට ඉහළින් ඔසවා තැබිය යුතු ය.

- අඩකුඹු කිරීම
    * ජාතික ශෝක දිනයක දී ජාතික කොඩිය අඩකුඹු කර තබනු ලැබේ. අඩකුඹු කරනු ලබන අවස්ථා රජය විසින් තීරණය කරනු ලැබේ.
    * මුලින් ම ජාතික කොඩිය කොඩි ගසෙහි ඉහළට ඔසවා තබා, අඩකුඹු කර තබන ස්ථානය ( කොඩි ගසේ මුදුනේ සිට උසින් 1/3 ක උස ප්‍රමාණයක් පහත් කර ) දක්වා පහත් කර අඩකුඹු කළ යුතු ය.

- ජාතික කොඩිය එහි ගෞරවයට හානි කර ලෙස භාවිත නොකළ යුතු ය. එසේ නොකළ යුතු දෑ
    * අඳින ඇඳුමක් හෝ ඇතිරිල්ලක් ලෙස භාවිත නොකළ යුතු ය.
    * ජාතික කොඩිය සීලිමකට ආවරණයක් ලෙස පාවිච්චි නොකළ යුතු ය.
    * ජාතික කොඩිය කිසියම් දෙයක් දැමීමට හෝ, දමා තබා ගැනීමට භාවිතයට නොගත යුතු ය.
    * වෙළෙඳ දැන්වීම් ප්‍රචාරය සඳහා ජාතික කොඩිය භාවිතයට නොගත යුතු ය.
    * ජාතික කොඩි සලකුණ කොට්ට, මෙට්ට, ලේන්සු හෝ වෙනත් භාණ්ඩවල ගෙත්තම් කිරීම නොකළ යුතු ය.
    * වාහනවල වහළ, මුහුන, දෙපස, හෝ පසුපස ආවරණය සඳහා යොදා නොගත යුතු ය.

* ආරක්ෂක හමුදා, ගිනි නිවන හමුදා, පොලිස් නිලධාරීන්ගේ නිල ඇඳුමට කොඩියේ ලාංඡනයක් තබා මසා ගනු ලැබිය හැකි ය.
* හානියට පත් වූ අවලක්ෂණ වූ හෝ විවර්ණ වූ ජාතික කොඩියක් ප්‍රදර්ශනය නොකළ යුතු ය.
* කිසිවෙකුට ආචාර කිරීම සඳහා ජාතික කොඩිය මද වශයෙන් හෝ පහත් කිරීම නොකළ යුතු ය.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

ජාතික ගීය

- 1948 පෙබරවාරි 04 ශ්‍රී ලංකාවට නිදහස අත්වීමෙන් පසු ජාතික ගීයක් අවශ්‍ය වීම.
- ඒ සඳහා පහත දක්වන සාමාජිකයන් ගෙන් සමන්විත කමිටුවක් පිහිටුවීම

  මුදලිඳු ඊ.ඒ. අබේසේකර මහතා ( සභාපති )

  එස්.එල්.ඩී. ගුණතිලක මහතා

  ලයනල් එදිරිසිංහ මහතා

  පී.බී. ඉලංගසිංහ මහතා

  ආචාර්ය ඕ.එම්.ඩී.ඒ. විජේසේකර මහතා
- ආනන්ද සමරකෝන් මහතා නිර්මාණය කළ ගීතය තෝරා ගැනීම
- ජාතික ගීය

ශ්‍රී ලංකා මාතා
අප ශ්‍රී ලංකා
නමෝ නමෝ නමෝ නමෝ මාතා
සුන්දර සිරි බරිනී - සුරඳි අති සෝබමාන ලංකා
ධාන්‍ය ධනය නෙක මල් පලතුරු පිරි ජය භූමිය රම්‍යා
අප හට සැප සිරි සෙත සදනා
ජීවනයේ මාතා
පිළිගනු මැන අප භක්ති පූජා
නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා
නමෝ නමෝ නමෝ නමෝ මාතා

ඔබ වේ අප විද්‍යා
ඔබමය අප සත්‍යා
ඔබ වේ අප ශක්ති
අප හද තුළ භක්ති
ඔබ අප ආලෝකේ
අපගේ අනුප්‍රාණේ
ඔබ අප ජීවන වේ
අප මුක්තිය ඔබ වේ
නව ජීවන දෙමිනේ
නිතින අප පුබුදුකරන් මාතා
ඥාණ වීර්ය වඩවමින රැගෙන යනු
මැන ජය භූමි කරා

එක මවකගේ දරු කැළ බැවිනා
යමු යමු වී නොපමා
ප්‍රේම වඩා සැම භේද දුරැරදා
නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා
නමෝ නමෝ නමෝ නමෝ මාතා

- ජාතික ධජය ඔසවන සෑම විට ම එය අවසන් වන්නේ ජාතික ගීය ගැයීමෙනි.
    - ජාතික ගීය ගායනා කරන විට සියලු ම දෙනා තම අසුන් වලින් නැගී සිට සීරුවෙන් සිටිය යුතු වීම.

රාජ්‍ය ලාංඡනය

- රජයේ සංකේතය රාජ්‍ය ලාංඡනයයි.
- රාජ්‍ය සතු බව සංකේතවත් කරන්නේ රාජ්‍ය ලාංඡනයයි



1972 ශ්‍රී ලංකාව ජනරජයක් වීමෙන් පසුව දැනට භාවිත කරනු ලබන රාජ්‍ය ලාංඡනය භාවිතයට ගැනිණි.

රාජ්‍ය ලාංඡනයේ ඇතුළත් සංකේත


* සිංහයා - එඩිතර බව
* පුන්කලස - සෞභාග්‍ය
* හිරු සඳු - ස්ථිර සාර බව
* ධාන්‍ය කරල් - සශ්‍රීක බව
* ධර්ම චක්‍රය - ධර්මිෂ්ඨ බව
* නෙලුම් පෙති - පවිත්‍රත්ත්වය

## 7.3.6 ජාතික පුෂ්පය හා ජාතික වෘක්ෂය


ජාතික පුෂ්පය

- ජාතික පුෂ්පය - නිල් මානෙල් ය
- මෙහි උද්භිද නාමය - නිම්ෆෙයා ස්ටෙලාටාය
- අවුරුද්ද පුරා ම මල් හට ගන්නා මෙය ජලජ පැලෑටියකි.
- නිල් මහනෙල් පත්‍රවලින් පැල හට ගනී
- නිල් මහනෙල් ඖෂධීය ගුණයෙන් ද යුක්ත ය
- නිල් මහනෙල් මල ජාතික පුෂ්පය ලෙස නිර්දේශ කිරීමට අදහස් ලබා ගැනීමේ දී එහි දේශීය බව, ඓතිහාසික හා සංස්කෘතිකමය වැදගත් කම පෙන්වා ඇත.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.



ජාතික පුෂ්පය



පාතක වෘකෂය

- ජාතික වෘක්ෂය නා ගස ය
- එහි උද්භිද නාමය මෙසුවා ෆෙර්රෙයා වේ
- ශ්‍රී ලංකාව මාතෘ භූමිය වුවත් ඉන්දියාව, බුරුමය, මලයාව වැනි රටවල ද දැකිය හැකි වේ.
- ශක්තිමත් නා ගස නා, දිය නා, සුවඳ නා, ආදී වර්ග ගණනාවකි.
- නා ගසේ සියලු කොටස් ඖෂධීය ගුණයෙන් යුක්ත ය
- නා ගස ජාතික වෘක්ෂය බවට පත් කර ගැනීමට නිර්දේශ කිරීමේ දී ඒ සඳහා දේශීය වෘක්ෂයක් වීම, ඓතිහාසික වැදගත්කම, සංස්කෘතික වැදගත්කම, බාහිර පෙනුම යන කරුණු ද සැලකිල්ලට ගෙන ඇත.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

- යහපත් පුරවැසියකු සතු සාර ධර්ම
  - දයාව, කරුණාව
  - යුතුකම් හා වගකීම් ඉටු කිරීම
  - නීති ගරුක වීම
  - ප්‍රජාතන්ත්‍රවාදී වීම
  - සාධාරණ බව
  - යුක්ති ගරුක බව
  - විනය ගරුක බව
  - මිත්‍ර ශීලී භාවය
  - සහකම්පනශීලී බව
  - මධ්‍යස්ථ බව

- **සාර ධර්ම සුරැකීමේ වැදගත්කම**
  - සමාජයේ යහපැවැත්මට දායක වීම
  - තම සංස්කෘතියට අනුවර්තනය වීම
  - සමාජය පිළිගැනීම
  - ගුණ ධර්ම වර්ධනය
  - ප්‍රජාතන්ත්‍රවාදී ජීවන රටාවකට හුරුවීම
  - සමබර චිත්තවේගී වර්ධනයක් සිදුවීම
  - සමාජ කුසලතා සංවර්ධනය

## 7.3.1 ක්‍රියාකාරකම

නිපුණතා මට්ටම : තම සංස්කෘතික දයාද අගය කරමින් අන්‍ය සංස්කෘතීන්ට ද ගරු කරයි.

ක්‍රියාකාරකම : " සංස්කෘතිය හඳුනා ගනිමු."

කාලය : මිනිත්තු 40 යි

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 7.3.1.1 ට අදාළ චිත්‍ර
- ඇමුණම 7.3.1.2 ට අදාළ කාර්ය පත්‍රිකා
- ඩිමයි කඩදාසි
- ෆෙල්ට් පෑන්

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.3.1.1. :
- ඇමුණුම 7.3.1.1ට අදාළ චිත්‍ර හා ප්‍රශ්න යොදා ගනිමින් බුද්ධිකලම්බන සාකච්ඡාවක යෙදෙන්න.
- පහත දැක්වෙන කරුණු ඉස්මතු වන පරිදි සාකච්ඡාවක් මෙහෙයවන්න.

  - ශ්‍රී ලාංකික සමාජය සංස්කෘතික බහුවිධතාවකින් යුක්ත බව
  - ශ්‍රී ලාංකික ජන සමාජය සිංහල දමිළ මැලේ, බර්ගර් වැනි ජන වර්ගවලින් සමන්විත බව
  - විවිධ ආගම් අදහන මෙම පිරිස් එකිනෙකට වෙනස් සංස්කෘතිකාංග වලට උරුමකම් කියන බව
  - සංස්කෘතික විවිධත්වය යටතේ ජාතික එක්සත්බව ගොඩ නැගීම කාලීන අවශ්‍යතාවක් බව

(මිනිත්තු 05 යි)

පියවර 7.3.1.2 :
- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- ඇමුණුම 7.3.1.2 ට අදාළ කාර්ය පත්‍රිකාව සියලු ම කණ්ඩායම්වලට ලබා දෙන්න.
- සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.
- ගුරුවරයා සිසුන් අතර ගැවෙසෙමින් අවශ්‍ය සහාය ලබා දෙන්න.

(මිනිත්තු 20 යි)

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

පියවර 7.3.1.3 : • කණ්ඩායම් ක්‍රියාකාරකම් පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

- සිසුන් අතර දැනුම හුවමාරු වන අයුරින් කණ්ඩායම් වාර්තා සාකච්ඡා කරන්න.
- පහත දැක්වෙන කරුණු ඉස්මතු වන පරිදි සමාලෝචනයක යෙදෙන්න.


    - සමාජයේ ජනතාවගේ ජීවන ක්‍රමය සංස්කෘතිය ලෙස සරලව හැඳින්විය හැකි බව
    - විවිධ ආගම් අදහන විවිධ භාෂා කතා කරන විවිධ ජන කොටස් ශ්‍රී ලාංකීය සමාජය තුළ ජීවත් වන බැවින් සමාජයේ විවිධ වෙනස්කම් දැකිය හැකි බව
    - සිරිත් විරිත්, ගුණ ධර්ම, විශ්වාස හා ඇදහිලි, ගෙවල් දොරවල්, භාෂාව හා සාහිත්‍ය , ඇඳුම් පැළඳුම්, ආහාර පාන, නීතිය, කලා ශිල්ප අධ්‍යාපනය අපේ සංස්කෘතික අංග බව
    - විවිධ ජන වර්ග අතර සහජීවනයෙන් යුතුව කටයුතු කළ යුතු බව
    - සමාජයේ පැවැත්ම සඳහා සංස්කෘතික අංග පරම්පරාවෙන් පරම්පරාවට නිවැරදි ව පවරාදීම අවශ්‍ය බව
    - සංස්කෘතිය පවරා දීමට මූලිකව කටයුතු කරන ආයතන ලෙස පවුල, අධ්‍යාපන ආයතන, ආගමික ආයතන හඳුන්වා දිය හැකි බව


(මිනිත්තු 15 යි)

## තක්සේරුව හා ඇගයීම


- ' සංස්කෘතිය ' යන්න සරලව අර්ථ දක්වයි.
- විවිධ ජන වර්ග අතර සහජීවනයෙන් කටයුතු කිරීමේ වැදගත්කම අගය කරයි.
- සංස්කෘතික අංග විස්තර කරයි.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් නිර්මාණශීලීව ඉදිරිපත් කරයි.
- සංස්කෘතික උරුම රැක ගැනීමට දායක වෙයි.

ඇමුණුම 7.3.1.1









1. ඉහත පින්තූරවලින් දැක්වෙන සංකේත මොනවා ද?
2. ඉහත එක් එක් සංකේතවලින් නිරූපණය වන ආගම් මොනවා ද?
3. විවිධ සංස්කෘතීන්හි අන්තර් සබඳතා ජන සමාජයේ පැවැත්වෙන බවට උදාහරණ දෙන්න.

ඇමුණුම 7.3.2.1

පහත දී ඇති " සංස්කෘතික' පිළිබඳ නිර්වචන අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න. කණ්ඩායම් සාකච්ඡාවට එය ඉදිරිපත් කරන්න.

නිර්වචන

සංස්කෘතිය හෝ සභ්‍යත්වය යනු දැනුම, ඇදහිලි, කලා, නීති, සදාචාර, සිරිත් විරිත් හා මිනිසා සමාජයේ ජීවත්වන පුද්ගලයෙකු වශයෙන් ලබා ගන්නා වූ පුරුදු, ඇබ්බැහිකම් හා අඩංගු සංකීර්ණ සමස්ත සමුදයයි.

( E.B. TYLOR, PRIMITIVE CULTOURE - JOHN MURRAY LONDON)

"සංකේතානුසාරයෙන් සමාජීය ලෙස හිමිකර ගන්නා වූ ද පාරම්පරික වශයෙන් අත්පත් කොට ගන්නා වූද සියලුම චර්යා රටාවන්ට දියහැකි සාමූහික නාමය " යනුවෙනි.

(චාල්ස්. ඒ. එල්වුඩ් නම් සමාජ විද්‍යාඥයා විසින් 1944 දී සමාජ විද්‍යා ශබ්ද කෝෂයට ඉදිරිපත් කර තිබූ නිර්වචනය.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

"සියලු සමාජීය කර්තව්‍යයන්ට ඒනම් පලුල් වශයෙන් ගත් කළ භාෂාව, විවාහය, අයිතිය පිළිබඳ ක්‍රම ආචාර සමාචාර, කර්මාන්ත, කලාව, ආදී සියල්ලන්ට සංස්කෘතිය යයි ප්‍රකාශ කරන බව දක්වයි.

(සී ඩිස්ලර් 1920 දී ප්‍රකාශ වු ඇමරිකානු මානව විද්‍යාඥයා නම් ශාස්ත්‍රීය සංග්‍රහයට අනුව

1. සංස්කෘතිය යන්නෙන් අදහස් කරන්නේ කුමන්දැයි සරලව ලියා දක්වන්න.

2. සංස්කෘතිය හැඳින්වීමට නිර්වචන ඉදිරිපත් කර ඇති සමාජ විද්‍යාඥයින් කවරහුද ?

3. සංස්කෘතියක ප්‍රධාන අංග නම් කරන්න.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 7.3.2 ක්‍රියාකාරකම

නිපුණතා මට්ටම : ජාතික අනන්‍යතාව පිළිඹිබු කෙරෙන සංකේත නිවැරදි ව භාවිත කරමින් ඒවාට ගරු කරයි.

ක්‍රියාකාරකම : " ජාතික ධජය හඳුනා ගනිමු."

කාලය : මිනිත්තු 40 යි

**ගුණාත්මක යෙදවුම්** :
- ඇමුණුම 7.3.2.2
- ඇමුණුම් 7.3.2.3
- A4 කොළ හා ඩිමයි කඩදාසි
- ෆෙල්ට් පෑන්

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.3.1.1. :
- ඇමුණුම 7.3.2.1 පන්තියට ඉදිරිපත් කරන්න.
- ඇමුණුමේ සඳහන් පාඨ හා ජාතික ධජය නිරීක්ෂණය කිරීමට උපදෙස් දෙන්න
- පහත දැක්වෙන කරුණු ඉස්මතු වන පරිදි සාකච්ඡාවක් මෙහෙයවන්න.

- 1948 පෙබරවාරි 04 වන දින ඔසවන ලද ජාතික ධජයේ මුළු හතරේ බීරළු හතරක් ද මධ්‍යයේ අතින් කඩුව ගත් සිංහයකුගේ රූපයක් ද පැවති බව
- ශ්‍රී ලංකාව වෙනුවෙන් අළුතෙන් ජාතික ධජයක් නිර්මාණය කිරීම සඳහා කමිටුවක් පත් කළ බව
- ජාතික ධජය පිළිබඳ කමිටුවේ සභාපතිවරයා එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා ද ලේකම්වරයා මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා ද වූ බව
- ටී.බී. ජයා මහතා සර් ජෝන් කොතලාවල මහතා ජේ.ආර්.ජයවර්ධන මහතා, ලලිත රාජපක්ෂ මහතා, ජී.ජී පොන්නම්බලම් මහතා සෙසු සාමාජිකයන් වූ බව
- ජාතික ධජයේ මුළු හතරේ ඇති බෝපත් හතරෙන් මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා යන සතර බ්‍රහ්ම විහරණ නිරූපණය කර ඇති බව
- මධ්‍යයේ ඇති කඩුවක් අතින් ගත් සිංහයාගෙන් එඩිතර බව නිරූපණය වන බව

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

- තැඹිලි වර්ණ තීරුව මගින් දමිළ ජාතිය ද, කොළ වර්ණ තීරුවෙන් මුස්ලිම් ජාතිය ද සංකේතවත් වන  බව
- ධජයේ ඇති රතු හා කහ වර්ණයෙන් සාමූහිකත්වය නිරූපණය කරන බව
- ජාතික ධජය නිර්මාණය කළ නිර්මාතෘවරුන් වූයේ එවකට රජයේ කලායතනයේ අධිපතිව සිටි කලාගුරු ජේ.සී.ඒ. පෙරේරා සහ කලාගුරු එස්.පී. චාල්ස් යන සිත්තරුන් බව
- සකස් කළ නව ජාතික ධජය ප්‍රථම වරට ඔසවනු ලැබුවේ 1952 නිදහස් උත්සවයේ දී බව

(මිනිත්තු 10 යි)

පියවර 7.3.2.2 :
- පන්තිය කුඩා කණ්ඩායම් කිහිපයකට බෙදන්න.
- ඇමුණුම 7.3.2.2  හා  ඇමුණුම 7.3.2.3 කණ්ඩායම් අතර බෙදන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකමේ නිරත වීමට අවශ්‍ය උපදෙස් දෙන්න.
- ක්‍රියාකාරකම නිම කළ යුතු  කාලය පිළිබඳ ව ළමුන් දැනුවත් කරන්න.

(මිනිත්තු 15 යි)

පියවර 7.3.3.3 :
- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කරවන්න.
- පහත සඳහන් කරුණු ඉස්මතු වන සේ සාමාලෝචනයක යෙදෙන්න.

  - වර්තමාන ජාතික ධජය භාවිතයට පෙර වෙනත් ජාතික ධජයක් පැවති බව
  - එම ජාතික ධජයන් නිර්මාණය වූයේ කමිටු තීරණයක් මත බව
  - ජාතික ධජයේ වර්ණ තීරු දෙක මඟින් මෙරට සුළු ජාතීන් නියෝජනය  වන  බව
  - මුළු හතරේ බෝපත් හතරෙන් මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ෂා යන සතර බ්‍රහ්ම විවරණ නිරූපණය වන බව
  - සෑම විටම ජාතික ධජයට ගරු කළ යුතු බව

(මිනිත්තු 15යි )

තක්සේරුව හා ඇගයම

- ජාතික ධජයේ විවිධ වර්ණ හා සංකේත මගින් නිරූපනය වන දෑ විස්තර කරයි.
- ජාතික ධජය ජාතික අනන්‍යතාව තහවුරු කරන සංකේතයක් ලෙස අගය කරයි.
- ජාතික ධජය නියමිත වර්ණ යොදා විධිමත්ව ඇඳීමට පෙළඹෙයි.
- ජාතික ධජය පිළිබඳව අන් අයට පැහැදිලි කරයි.
- සාමුහිකව ක්‍රියාකාරකම්වල නිරත වෙයි.

පසුවැඩ :-

1. ජාතික ධජයේ පින්තූරයක් සොයා ගෙන එය ඔබේ සටහන් පොතේ අලවන්න.
2. ජාතික ධජයේ ඇති වර්ණ හා සංකේතවලින් නිරූපණය වන දෑ සඳහන් කරන්න.

ඇමුණුම 7.3.2.1

" 1948 පෙබරවාරි 04 වන දින ප්‍රථම නිදහස් උත්සවය වෙනුවෙන් ඔසවනු ලැබුවේ අද භාවිතවන ජාතික ධජය නොවේ".

" ශ්‍රී ලංකාව සඳහා ජාතික ධජයක් නිර්මාණය කිරීමට කමිටුවක් පත් කරනු ලැබී ය

වර්තමාන ජාතික ධජය

(174 පිටුව බලන්න.)

ඇමුණුම 7.3.2.2

# කාර්ය පත්‍රිකාව

උපදෙස්

- පහත දැක්වෙන කාර්යය පත්‍රිකාව සියලුම කණ්ඩායම් අතර බෙදන්න.
- ඇමුණුම 7.3.2.3. ද කණ්ඩායමකට එක බැගින් බෙදන්න.
- ඇමුණුම 7.3.2.3. කියවා කාර්යය පත්‍රිකාවේ සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට උපදෙස් දෙන්න.

1. හිස්තැන් පුරවන්න.

I "ජාතික ධජ " කමිටුවේ සභාපතිවරයා වූයේ . . . . . . . . . . . . . . . . මහතා ය.
II . . . . . . . . . . . . . . මහතා "ජාතික ධජ" කමිටුවේ ලේකම්වරයාය.
III ජාතික ධජය නිර්මාණය කළ සිත්තරුන්ගේ එක් අයෙකු ලෙස කලාගුරු . . . . . . . . මහතා සැලකේ.
IV නව ජාතික ධජය ප්‍රථම වරට ඔසවනු ලැබුවේ . . . . . . . . . . . නිදහස උත්සවය වෙනුවෙනි.

2. පහත ඔබට සපයා ඇති "අ" සහ "ආ" තීරු දෙක ජාතික ධජය පිළිබඳ තොරතුරු දැක් වේ. ඒවා ගැලපෙන පරිදි යා කරන්න.

| "අ" | "ආ" |
|---|---|
| - කොළ වර්ණය | සතර බ්‍රහ්ම විහරණ |
| - තැඹිලි වර්ණය | එඩිතර බව |
| - බෝපත් හතර | සාමූහිකත්වය |
| - කඩුවක් අතින් ගත් සිංහයා | දමිළ ජාතිය |
| | මුස්ලිම් ජාතිය |

3. ජාතික ධජය පිළිබඳ පත් කළ කමිටුවේ සාමාජිකයන් නම් කරන්න.

ඇමුණුම 7.3.2.3

නිදහස් ශ්‍රී ලංකාවේ ප්‍රථම නිදහස උත්සවය වෙනුවෙන් ඔසවන ලද ජාතික ධජය මධ්‍යයේ කඩුවක් අතින් ගත් සිංහයෙක් සහ මුළු හතරේ බීරළු සතරක් විය. නිදහස ලබා ගැනීමෙන් පසු නව ජාතික ධජයක් නිර්මාණය කිරීමේ අවශ්‍යතාවක් ඇති විය. එබැවින් එවකට පැවති රජය ඒ සඳහා කමිටුවක් නිර්දේශ කරන ලදී. එහි සාමාජිකයන් පහත දැක්වේ.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරණායක මහතා ( සභාපති )

මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා - ලේකම්

සර් ජෝන් කොතලාවල

ජේ.ආර්. ජයවර්ධන මහතා

ටී.බී. ඡායා මහතා

ලලිත රාජපක්ෂ මහතා

ජී.ජී. පොන්නම්බලම් මහතා

නව ජාතික ධජය නිර්මාණය කළ නිර්මාතෘවරුන් වූයේ එවකට රජයේ කලායතනයේ අධිපතිව සිටි කලාගුරු ජේ.ඩී.ඒ. පෙරේරා සහ කලාගුරු එස්.පී. චාල්ස් යන සිත්තරුන් ය.

ජාතික ධජයේ වර්ණ හා සංකේත මගින් පහත දැක්වෙන දෑ නිරූපණය වේ.

| | | |
|---|---|---|
| පසුබිමේ ඇති රතු හා කහ වර්ණය | - | සාමූහිකත්වය |
| තැඹිලි වර්ණය | - | දමිළ ජනතාව |
| කඩුවක් අතින් ගත් සිංහයා | - | එඩිතර බව |
| බෝපත් සතර | - | මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා යන සතර බ්‍රහ්ම විවරණ |
| කොළ වර්ණය | - | මුස්ලිම් ජනතාව |

## 7.3.3 ක්‍රියාකාරකම

නිපුණතාව : ජාතික අනන්‍යතාව පිළිඹිඹු කෙරෙන සංකේත නිවැරදිව භාවිත කරමින් ඒවාට ගරු කරයි.

ක්‍රියාකාරකම : "ජාතික ගීය නිවැරදිව ගයමු"

කාලය : මිනිත්තු 40 යි

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 7.3.3.1
- ජාතික ගීය පටිගත කරන ලද හඬ පටය
- සංගීත ගුරු මහතා /මහත්මිය
- බාල දක්ෂ ශිෂ්‍යයා/ශිෂ්‍යාව
- ජාතික කොඩිය හා කොඩි ලණුව

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.3.3.1. :
- ඇමුණුම 7.3.3.1ට අදාළ චිත්‍රය පන්තියට ඉදිරිපත් කරන්න.
- ජාතික ධජය ඔසවන විට හා ජාතික ගීය ගායනා කරන විට සීරුවෙන් සිටිමින් ඊට ගරු කළ යුතු බව සාකච්ඡා කරන්න.
- ජාතික ගීය ඇතුළත් හඬ පටය සිසුන්ට ශ්‍රවණය කිරීමට අවස්ථාව සලසන්න.
- පහත දැක්වෙන කරුණු ඉස්මතු වන පරිදි සාකච්ඡාවක් මෙහෙවන්න.

> - ජාතික ගීයේ නිර්මාතෘවරයා වන්නේ ආනන්ද සමරකෝන් මහතා බව
> - ජාතික ගීය ගායනා කරන විට මෙන් ම ජාතික ධජය ඔසවන විට එයට ගෞරව දැක්විය යුතු බව
> - ජාතික ගීය ගායනා කරන විට හා ජාතික ධජය ඔසවන විට සීරුවෙන් සිටිය යුතු බව
> - ජාතික ගීය මගින් ජාතික අනන්‍යතාව හා ජාතිකාභිමානය පිළිබිඹු කරන බව

(මිනිත්තු 15 යි )

පියවර 7.3.3.2 :
- පන්තියේ සියලු සිසුන් ජාතික ධජය ඔසවන ස්ථානයට කැඳවා ගෙන යන්න.
- ජාතික ධජය හා කොඩි ලණුව ද රැගෙන යන්න
- සංගීත ගුරු මහතා/ මහත්මිය වාදන භාණ්ඩ සමඟ එම ස්ථානයට කැඳවා ගන්න.

- ජාතික ධජය විධිමත්ව එසවීම සඳහා බාලදක්ෂ ශිෂ්‍යයකු / ශිෂ්‍යාවක එම ස්ථානයට කැඳවා ගන්න.
- පන්තියේ සියලු ම සිසුන් කොඩි කණුව ඉදිරියේ පේළියකට සකස් කරන්න.
- බාල දක්ෂ සිසුවා/සිසුවිය ලවා ජාතික ධජය එසවීමට සලස්වන්න.
- ධජය එසවීමෙන් පසු සංගීත ගුරු මහතා/මහත්මියගේ ආධාරය ද ඇතුව ළමුන් ලවා ජාතික ගීය ගායනා කරවන්න.

(මිනිත්තු 15 යි)

පියවර 7.3.3.3 : • පහත දැක්වෙන කරුණු ඉස්මතු වන පරිදි සමාලෝචනයක යෙදෙන්න.

- අභිමානයෙන් යුතු ව සෘජුව සිරුවෙන් ජාතික ධජය එසවීමේ දී හා ජාතික ගීය ගායනයේ දී සිටිය යුතු බව
- ජාතික ධජය එසවීමේ දී මඟුල් රෙ වැයීම හා සක් හඬ පිඹීම පමණක් කළ යුතු බව
- ජාතික කොඩිය එසවීමෙන් පසුව ජාතික ගීය ගායනා කළ යුතු බව
- ජාතික ගීය ගායනයේ දී නිවැරදිව ශ්‍රැතියට අනුව ශබ්ද නගා එය ගායනා කළ යුතු බව

(මිනිත්තු 10 යි )


## තක්සේරුව හා ඇගයීම

- ජාතික ගීයේ නිර්මාතෘවරයා නම් කරයි.
- ජාතික ගීය ජාතික අනන්‍යතාව ආරක්ෂා කරන සංකේතයක් ලෙස අගය කරයි.
- ජාතික ගීය ගායනා කිරීමේ දී හා ජාතික ධජය එසවීමේ දී නිවැරදි ඉරියව් පවත්වා ගැනීමට හුරු වෙයි.
- ජාතික ගීය නිවැරදිව ගායනා කරයි.
- සාමූහිකව කටයුතුවල නිරත වෙයි.

පසුවැඩ

1. ජාතික ගීය නිවැරදිව ලියන්න.
2. ජාතික ගීයේ අර්ථය ඡේදයකින් දක්වන්න.
3. ජාතික ගීයේ නිර්මාතෘවරයා නම් කරන්න.

ඇමුණුම 7.3.3.1



Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 7.3.4 ක්‍රියාකාරකම

නිපුණතාව : යහපත් පුරවැසියකු සතු සාරධර්ම අගය කරයි.

ක්‍රියාකාරකම : "සාරධර්ම සුරකින පුරවැසියෝ වෙමු"

කාලය : මිනිත්තු 40 යි

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 7.3.4.1 ට අදාළ සිද්ධි අධ්‍යයනය
- ඇමුණුම 7.3.4.2 ට අදාළ කාර්ය පත්‍රිකාව
- ෆෙල්ට් පෑන්, ඩිමයි කඩදාසි, පෙළ පොත

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.3.4.1 :
- ඇමුණුම 7.3.4.1 ට අදාළ සිද්ධි අධ්‍යයනය පන්තියට ඉදිරිපත් කරන්න.
- පහත දැක්වෙන කරුණු ඉස්මතු වන පරිදි සාකච්ඡාවක් මෙහෙයවන්න.

> - සාර ධර්ම පුරුදු පුහුණු කිරීම තුළින් යහපත් සමාජයක් බිහි වන බව
> - තමා සමඟ ජීවත් වන සෑම දෙනා සමග ම සහයෝගයෙන් ජීවත් විය යුතු බව
> - මිත්‍රශීලී බව, දයාව, කරුණාව දැක්වීම පුරවැසියන් විසින් රැකිය යුතු ගුණ ධර්ම බව
> - අන් අයගේ මතයන්ට ගරු කිරීම, පුරුදු පුහුණු කළ යුතු බව
> - නීති ගරුක බව, සාධාරණ බව, යුක්ති ගරුක බව, වගකීම් ඉටු කිරීම, පුරුදු පුහුණු වූවොත් යහපත් සමාජයක් බිහි වන බව

(මිනිත්තු 10 යි)

පියවර 7.3.4.2 :
- පන්තිය සුදුසු පරිදි කණ්ඩායම් කිහිපයකට බෙදන්න.
- ඇමුණුම 7.3.4.2 කාර්ය පත්‍රිකාව කණ්ඩායම්වලට සපයන්න.
- කාර්ය පත්‍රිකාව නිම කිරීමට අවශ්‍ය උපදෙස් දෙන්න.
- නියමිත කාලය පිළිබඳ ළමුන් දැනුවත් කරන්න.
- සිසුන් පෙළ පොත භාවිතයට ද යොමු කරන්න.

(මිනිත්තු 15 යි )

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

පියවර 7.3.4.3: • කණ්ඩායම් ක්‍රියාකාරකම් අවසානයේ ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දෙන්න.

- සිසු ප්‍රබලතා අගය කරමින් සංවර්ධනය කළ යුතු ස්ථාන වේ නම් සිසු සහායෙන් සංවර්ධනය කරන්න.
- පහත දැක්වෙන කරුණු ඉස්මතු වන පරිදි සමාලෝචනයක් කරන්න.

> - වගකීම් ඉටු කිරීම, නීති ගරුක වීම, සාධාරණව කටයුතු කිරීම මගින් යහපත් සමාජයක් බිහිකළ හැකි බව
> - අන් මත ඉවසමින් මධ්‍යස්ථව විනය ගරුක භාවයෙන් කටයුතු කිරීම අත්‍යවශ්‍ය බව
> - යහපත් සමාජයක පැවැත්ම ආරක්ෂා කරන බව
> - සාර ධර්ම සුරැකීම තුළින් සමාජ යහපැවැත්මට දායක විය හැකි බව
> - පුරවැසියන් ප්‍රජාතන්ත්‍රවාදී ජීවන රටාවකට හුරු වන බව
> - සමාජ කුසලතා සංවර්ධනය වන බව
> - සාර ධර්ම සුරැකීමෙන් සමබර චිත්තවේගී වර්ධනයක් සිදුවන බව

(මිනිත්තු 15 යි )

## තක්සේරුව හා ඇගයීම

- යහපත් පුරවැසියකු සතු සාර ධර්ම ලියා දක්වයි.
- සාර ධර්ම සුරැකීමෙන් යහපත් සමාජයක් බිහි වන බව පිළිගනියි.
- යහපත් පුරවැසියකු ලෙස ප්‍රගුණ කළ යුතු සාරධර්ම වගු ගත කරයි.
- සමාජය තුළ යහපත් ජීවන රටාවක් ගොඩනගා ගැනීමට අවශ්‍ය සාරධර්ම ප්‍රගුණ කරයි.
- අවස්ථාවට අදාළව යහපත් සාරධර්ම යොදා ගනියි.

## පසුවැඩ

> 1. යහපත් පුරවැසියකු සතු සාර ධර්ම හා එම සාර ධර්ම සුරැකීමේ වැදගත්කම වගුගත කරන්න.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඇමුණුම 7.3.4.1

## සිද්ධි අධ්‍යයනය

සපුමල්ගම කණිෂ්ඨ විද්‍යාලයේ 7 ශ්‍රේණියේ ඉගෙනුම ලබන වනමලී එම ගම්වාසී දැරියකි. තම නිවසේ සිට පාසල දක්වා පයින් යන ඇය තම අසල් වාසී කුඩා දරු දැරියන් ද පාසලට කැඳවා ගෙන යන්නේ ඉතා සතුටින් ය. කුඩා දරුවන්ට වනමලී අක්කා පාසලට යන තුරු නොයෙක් කථා කවි සින්දු කියයි.

ඇය පාසල ආරම්භවීමට කලින් පාසලට පැමිණ පන්ති කාමර පිරිසිදු කිරීම්, මිදුල ඇමදීම, බුදුගෙයි වතාවත්වලට සහායවීම් ආදී සියලු කාර්යයන්හි නිරත වේ.

දිනක් පාසල ඇරී ගෙදර යන වනමලී මහ පාර මැද සැරයටිය ද ගෙන පාර මාරු වෙමින් යන මහලු කාන්තාවක් දැක, තමා සමඟ පාසල් ඇරී නිවස බලා යන කුඩා දරුවන් ආරක්ෂා සහිතව මාර්ගය අයිනේ නවත්වා එම කාන්තාවට උදව් කරනු දුටු වැඩිහිටියන් වනමලී ගැන ඉතා සතුටට පත්විය.

ඇමුණුම 7.3.4.2

## කාර්ය පත්‍රිකාව

පහත ඔබට සපයා ඇති කාර්ය පත්‍රිකාවේ සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. යහපත් පුරවැසියකු ලෙස ඔබ ප්‍රගුණ කළ යුතු සාර ධර්ම මොනවාදැයි ලැයිස්තු ගත කරන්න.
2. සමාජයේ පුරවැසියන් සාර ධර්ම සහිතව ජීවත්වීමේ දී සෙසු සමාජයට අත්වන වාසි සඳහන් කරන්න.
3. සමාජයේ පුරවැසියන් ලෙස සාර ධර්ම සුරැකීමේ ඇති වැදගත්කම ලියන්න.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 7.3.5 ක්‍රියාකාරකම

නිපුණතා මට්ටම : ජාතික අනන්‍යතාව පිළිඹිඹු කෙරෙන සංකේත නිවැරදි ව භාවිත කරමින් ඒවාට ගරු කරයි.

ක්‍රියාකාරකම : "ජාතික අනන්‍යතාව හා ජාතික සමගිය සුරකිමු."

කාලය : මිනිත්තු 40 යි

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 7.3.5.1 ට අදාළ තොරතුරු පත්‍රිකාව
- ඇමුණුම 7.3.5.2 ට අදාළ චිත්‍රය
- ඇමුණුම 7.3.5.3 ට අදාළ කාර්ය පත්‍රිකාව
- ඩිමයි කොළ, ෆෙල්ට් පෑන්

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.3.5.1 :
- ඇමුණුම 7.3.5.1ට අදාළ තොරතුරු රැගෙන එන ලෙස සතියකට පෙර සිසුන් දැනුවත් කරන්න.
- ඇමුණුම 7.3.5.2ට අදාළ චිත්‍රය පන්තියට පෙන්වන්න.
- එම චිත්‍රයෙන් දැක්වෙන ජන වර්ග පිළිබඳ ව සිසුන්ගෙන් ප්‍රශ්න කරන්න.
- පහත දැක්වෙන කරුණු ඉස්මතු වන පරිදි සාකච්ඡාවක් මෙහෙයවන්න.

> - ඕනෑ ම රටක ජනතාව විවිධ ජන වර්ගවලින් සමන්විත වන බව
> - ශ්‍රී ලංකාවේ ද වවිධ ජනවර්ග ජීවත්වන බව
> - ඒ ඒ ජනවර්ගවලට අදාළ භාෂාවක් ඇදහිලි හා විශ්වාස පවතින බව
> - සෑම ජන වර්ගයක්ම තම අනන්‍යතාව ආරක්ෂා කර ගැනීමට කැමති බව
> - ශ්‍රී ලංකාව තුළ ජීවත්වන සෑම ජන වර්ගයක් ම ශ්‍රී ලාංකීය ජාතියට අයත් වන බව

(මිනිත්තු 10 යි )

පියවර 7.3.5.2 :
- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- එක් එක් කණ්ඩායමට අදාළ මාතෘකාව කුසපත් ඇදීමකින් ලබා දෙන්න
- කණ්ඩායම් නායකයින් ලවා තම තමාට අදාළ තොරතුරු කණ්ඩායම් අතර හුවමාරු කර ගැනීමට උපදෙස් දෙන්න.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

- එක් එක් කණ්ඩායමට ඇමුණුම 7.3.5.2 ට අදාළ කාර්ය පත්‍රිකාව ලබා දෙන්න.
- කාර්ය පත්‍රකාවලට අදාළ ක්‍රියාකාරකමෙහි සිසුන් යොදවන්න.

(මිනිත්තු 15යි )

පියවර 7.3.5.3 :
- එක් එක් කණ්ඩායම් ගොනු කළ තොරතුරු පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- වෙනත් කණ්ඩායම් විසින් ඉදිරිපත් කළ තොරතුරු සාකච්ඡා කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත දැක්වෙන කරුණු ඉස්මතු වන පරිදි සමාලෝචනයක යෙදෙන්න.

> - ශ්‍රී ලංකාවේ පිහිටීම විවිධ ජන වර්ග පැමිණීම කෙරෙහි බල පෑ බව
> - සෑම ජන වර්ගයක් ම රටේ ආර්ථික සමාජයීය හා සංස්කෘතික සංවර්ධනයට දායක වන බව
> - එක්ව කටයුතු කිරීමෙන් ජාතියක් වශයෙන් නැගී සිටිය හැකි බව
> - ජාතික සමගිය ජාතික සංවර්ධනයට හේතු වන බව

( මිනිත්තු 15 යි )

## තක්සේරුව හා ඇගයීම

- ජාතියක් විවිධ ජනවර්ගවලින් සමන්විත වන බව ප්‍රකාශ කරයි.
- ජාතික සමගිය තුළින් ජාතික සංවර්ධනය කරා ළගා විය හැකි බව දැන අගය කරයි.
- ජාතික සංවර්ධනයට දායක වූ විවිධ ජන වර්ගවලට අයත් පුද්ගලයින්ගේ නාම ලේඛනයක් සකස් කරයි.
- ජාතික සමගිය ගොඩ නැගීමට දායක වෙයි.
- කණ්ඩායම් තුළ සහයෝගීව ක්‍රියා කරයි.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඇමුණුම 7.3.5.1

- පහත සඳහන් මාතෘකාවලට අදාළව තොරතුරු රැස් කරන්න.

1. ශ්‍රී ලංකාවේ ජන සංයුතිය
2. ශ්‍රී ලංකාව විවිධ ජන වර්ගවලින් සමන්විතවීම කෙරෙහි බලපෑ හේතු
3. ශ්‍රී ලංකාවට නිදහස දිනා ගැනීමට කටයුතු කළ නායකයින් හා ඔවුන් සිදු කළ සේවාවන්
4. වර්තමාන ශ්‍රී ලංකාවේ විවිධ ජනවර්ග එක්ව කටයුතු කරන අවස්ථා
   උදා :- සංස්කෘතික උත්සව
5. ශ්‍රී ලංකාවේ සංවර්ධනයට විවිධ ජන වර්ගවලින් දායකත්වය ලබා දෙන බවට සාක්ෂි

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඇමුණුම 7.3.4.2



ඇමුණුම 7.3.5.3

## කාර්ය පත්‍රිකා

1 කණ්ඩායම

- ශ්‍රී ලංකාවේ ජන සංයුතිය වෘත්ත ප්‍රස්තාරයක් මගින් ඉදිරිපත් කරන්න.

2 කණ්ඩායම

- ශ්‍රී ලංකාවට නිදහස දිනා ගැනීමට කටයුතු කළ නායකයින් හා ඔවුන් සිදුකළ සේවාවන් පෙළ ගස්වන්න.

3 කණ්ඩායම

- වර්තමාන ශ්‍රී ලංකාවේ විවිධ ජනවර්ග එක්ව කටයුතු කරන අවස්ථා ලැයිස්තුවක් සකස් කරන්න.

4 කණ්ඩායම

- ශ්‍රී ලංකාවේ සංවර්ධනයට විවිධ ජනවර්ගවලින් දායකත්වය ලබා දෙන බවට ඇති සාක්ෂි ඉදිරිපත් කරන්න.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

# තක්සේරුව හා ඇගයීම

# තක්සේරුව හා ඇගයීම

## හැඳින්වීම

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය මගින් අපේක්ෂිත ඉගෙනුම් ඵල සිසුන් විසින් සාක්ෂාත් කර ගැනීම තහවුරු කිරීම සඳහාත් සිසුන් ලඟා කර ගත් ප්‍රවීණතා මට්ටම් හඳුනාගැනීම සඳහාත් පන්ති කාමරයේ පහසුවෙන් ක්‍රියාත්මක කල හැකි අන්තර් සම්බන්ධතාවයකින් යුත් වැඩසටහන් දෙකක් ලෙස තක්සේරුව හා ඇගයීම් හඳුන්වා දිය හැකි ය. තක්සෙරුව නිසි පරිදි සිදුවන්නේ නම් පන්තියේ ඉගෙනුම් ලබන සියලු ම සිසුන්ට, අපේක්ෂිත නිපුණතාවන්ට අදාළ ආසන්න ප්‍රවීණතාවයක් ලබාගැනීම අපහසු නොවේ. ඇගැයීමෙන් අපේක්ෂා කරන්නේ සිසුන් ලඟා කර ගත් ප්‍රවීණතා මට්ටම් කවරේදැයි හඳුනා ගැනීමට ය.

තක්සේරුවේ යෙදී සිටින ගුරුවරුන්ට තම සිසුන් සඳහා දෙයාකාරයක මාර්ගෝපදේශකත්වය ලබා දිය හැකි ය. එම මාර්ගෝපදේශ පොදුවේ හඳුන්වන්නේ ප්‍රතිපෝෂණය (Feed Back) හා ඉදිරි පෝෂණය (FEED FORWARD ) යනුවෙනි. සිසුන්ගේ දුබලතා හා නොහැකියා අනාවරණය කර ගත් විට ඔවුන්ගේ ඉගෙනුම් ගැටලු මගහරවා ගැනීමට ප්‍රතිපෝෂණය; සිසු හැකියා සහ ප්‍රබලතා හඳුනා ගත්විට එම දක්ෂතා වැඩි දියුණු කිරීමට ඉදිරි පෝෂණයත් ලබා දීම ගුරු කාර්යය වේ.

ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා විෂයයේ නිපුණතා අතරෙන් කවර නිපුණතා කවර මටටමින් සාක්ෂාත් කළහැකි වුයේ දැයි සිසුන් විසින් හඳුනා ගැනීම අවශ්‍ය වේ. ඇගැයීම් වැඩ පිළිවෙළ සිසු සාර්ථකත්වය ඔස්සේ සිසුන් ලඟා කර ගත් ප්‍රවීණතා මට්ටම් විනිශ්චය කිරීම මේ අනුව ගුරුවරුන්ගෙන් බලාපොරොත්තු වන අතර සිසුන් හා දෙමව්පියන් ඇතුළු අදාළ පාර්ශවයන්ට සිසු ප්‍රගතිය සන්නිවේදනය කිරීමට ගුරුවරුන් යොමු විය යුතු වේ.

ඔබ වෙත ඉදිරිපත් කරන මෙම විෂයමාලාව ශිෂ්‍ය කේන්ද්‍රීය (STUDENT - CENTERED) නිපුණතා පාදක (COMPETENCY - BASED) ක්‍රියාකාරකම් දිශාභිමුඛ ( ACTIVITY ORIENTED) කර ගත් ප්‍රවේශයකින් යුක්ත වේ. ජීවිතය අර්ථවත් කර ගැනීම සඳහා ක්‍රියාවෙන් ඉගෙනුම, ගුරුවරයාගේ පරිණාමන භූමිකාවේ ( TRANSFORMATIONA ROLE )හරය වේ.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

පූර්වයෙන් සංවර්ධනය කළ ක්‍රියාකාරකම් සමූහයක් ඔස්සේ ක්‍රියාත්මක වන මෙම විෂය මාලාවේ ඉගෙනුම හා ඉගැන්වීම, තක්සේරුව හා ඇගයීම සමඟ සමෝධානය කිරීමට උත්සාහ දරා ඇත. ඒ ඒ ක්‍රියාකාරකම්වල දෙවැනි පියවරේ දි සිසුන් කණ්ඩායම් වශයෙන් ගවේෂණයේ යෙදෙන විට ඔවුන් තක්සේරු කිරීමටත් ක්‍රියාකාරකම්වල තුන්වැනි පියවරේ දී සිසුන් ස්වකීය අනාවරණ ඉදිරිපත් කිරීමට හා විස්තාරණයට යොමු වන විට ඔවුන් ඇගයීමටත් ගුරුවරයාට හැකි වේ. සිසුන් ගවේෂණයේ යෙදෙන විට සිසුන් අතර ගැවසෙමින් ඔවුන් ඉටු කරන කාර්යය නිරීක්ෂණය කරමින් සිසුන් මුහුණපා ඇති ගැටලු පන්ති කාමරය තුළ දී විසඳා ගැනීම සඳහා පහසුකම් සහ මාර්ගෝපදේශකත්වය සපයා දිම ගුරුවරයාගෙන් අපේක්ෂා කරන කාර්යය වේ.

තක්සේරුව හා ඇගයීම පහසුවෙන් සිදු කළ හැකි වන පරිදි පොදු නිර්ණායක පහක් යෝජනා කෙරේ. මෙම නිර්ණායක අතරෙන් පළමු නිර්ණායක තුන ඒ ඒ නිපුණතාව ගොඩ නැගීමට එකරාශී වී තිබෙන දැනුම, කුසලතා හා ආකල්ප මූලික කොටගෙන සැකසී තිබේ. අවසාන නිර්ණායක දෙක ජීවිතයට වැදගත් වන හැකියා දෙකක් ප්‍රගුණ කර ගැනීමට සිසුන්ට උපකාරී වේ. මේ නිර්ණායක හා සම්බන්ධ චර්යා වෙනස්කම් පහ පන්ති කාමරය තුළ දී සිසුන් ක්‍රියාත්මක වීමේ දී හඳුනා ගැනීමට ගුරුවරයා උත්සහ කළ යුතු අතර තක්සේරුව යටතේ එම චර්යා ශක්තිමත් කිරීමත් ඇගයීම යටතේ ඒවා ප්‍රමාණය කිරීමටත් ගුරවරයා යොමු විය යුතු ය.

ඇගයීම් වැඩපිළිවෙල වැඩි දියුණු කිරීමෙන් ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලිය පුළුල් කළ හැකිය. ඒ සඳහා ක්‍රියාකාරකම් සන්තතිය (ACTIVITY CONTINUM) ඔස්සේ ඇගයීම් අවස්ථා කිහිපයක ඇති කිරීමට ගුරුවරයාට අවස්ථාව ඇත. ඇගයීම් ලක්ෂ්‍ය (EVALUATION POINTS ) හඳුනා ගැනීමට පහසු වන පරදි ක්‍රියාකාරකම් සන්තතිය, පොකුරු ක්‍රියාකාරකම් (ACTIVITY CLUSTER) කිහිපයකට වෙන් කිරීමෙන් ඇගයීම් වැඩ පිළිවෙල අර්ථවත් කළ හැකි ය. සැම ක්‍රියාකාරකම් පොකුරක් ආරම්භයේ දී ඒ ඒ ක්‍රියාකාරකම් සඳහා ගන්නා ඇගයීම් උපකරණ කවරේ දැයි සිසුන්ට හඳුන්වා දීම අවශ්‍ය වේ. ඇගයීම් ප්‍රභේද තෝරා ගැනීමේ දී සිසු ඉගෙනුම් පෙළඹවීම විකසිත කරවන ප්‍රබෝධමත් ක්‍රියාකාරකම් යොදා ගැනීම අත්‍යවශ්‍ය වේ. මෙයට අදාළ ක්‍රියාකාරකම් ලැයිස්තුවක් මතු දැක්වේ.

සංකල්ප සිතියම් (CONCEPTMAPS)

බිත්ති පුවත්පත් (WALL NEWS PAPERS)

ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහන් (QUZZES)

ප්‍රශ්න සහ පිළිතුරු පොත් (QUESTION AND ANSWER BOOKS)

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

ශිෂ්‍ය කාර්ය සාධක ගොනු ( STUDENT PROJECT)

සිසු නිර්මාණ ප්‍රදර්ශන. (EXHIBITONS)

විවාද ( DEBATES)

සාකච්ඡා මණ්ඩල ( PANEL DISCUSSIONS)

සම්මන්ත්‍රණ ( SEMINARS)

ක්ෂණික කතා ( IMPROMPTU SPEECHES)

භූමිකා රංගන ( ROLE PLAYS)

සාහිත්‍ය විමසුම් ඉදිරිපත් කිරීම (PRESENTATION OF LITERATURE REVIEWS)

ක්ෂේත්‍ර පොත් ,ස්වාභාව අධ්‍යයනය දින පොත් ,හොඳවැඩ පොත් ( FIELD BOOK NAIURE DLARIES)

ප්‍රායෝගික පරීක්ෂණ (PRACTICCAL TESTS)

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

පාඨ මාර්ගයේ තුන්වන කොටස යෝජිත ඇගයීම් ලක්ෂ්‍යයක් හා ඒ සඳහා තෝරා ගෙන ඇති ඇගයීම් උපකරණය හඳුන්වා දීමට සැලසුම්කර තිබේ. මේ ආකාරයට ක්‍රියාකාරකම් තුළත් ඒවා අතරත් ඇගයීම් දෙයාකාරයකින් සිදු කිරීමෙන් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය තව දුරටත් පුළුල් වන අතර කැමැත්තෙන් හා ප්‍රබෝධයෙන් ඉගෙනුමෙහි නියැලීමට සිසුනට හැකි වේ.

මෙයට අමතර ව පන්ති කාමරය තුළ ලිඛිත පරීක්ෂණ ව්‍යාපෘති වැඩ ආදිය හා වසර අවසානයේ පවත්වන පාසල් මට්ටමේ හෝ කලාපීය මට්ටමේ ලිඛිත පරීක්ෂණයකට සිසුන් ඉදිරිපත් කළ හැකි ය.

එමෙන් ම වාර අවසානයේ ඇගයීම සඳහා සපයා ඇති ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය දීර්ඝ කිරීමේ උපකරණ භාවිත කරන්න.

# තක්සේරුකරණය හා ඇගයීම ( ජීවන නිපුණතා )

1.0 ස්වයං තක්සේරුව

පාඩමට අදාළ ව නිපුණතා පදනම් කර ගෙන ස්වයං තක්සේරුකරණයක් සැලසුම් කිරීම, .අදාළ පාඩම ඉගැන්වීමට ප්‍රථම සිසුන් ඒ පිළිබඳ ව දක්වන මත, අදහස්, ආකල්ප, පාඩම හෝ වාරය අවසානයේ සිසුන් අදාළ තේමාවන් පිළිබඳ ව දක්වන අදහස් ආකල්ප සංසන්දනාත්මක ව තක්සේරු කළ හැකිය. තම ප්‍රබලතා හා දුබලතා මෙකී ස්වයං තක්සේරුවෙන් අවබෝධ කර ගැනීම අපේක්ෂා කෙරේ. අදාළ නිර්ණායක පාසලේ ඇති මානව හා භෞතික සම්පත් ද අවධානයට යොමු කරමින් ගුරුවරයාගේ අභිමතය පරිදි තක්සේරුකරණය හා ඇගයීම සඳහා අදාළ නිර්ණායක හඳුනා ගත හැකි ය.

2.0 සමවයස් ඇගයීම

යම් කාර්යයක් එක් එක් කණ්ඩායමකට පවරා අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට සිසුන් දක්වන දායකත්වය සංවිධානය අන්තර් පුද්ගල සම්බන්ධතා, සැලසුම් කිරීම ආදී විවිධ නිර්ණායක පදනම් කර ගෙන ඇගයීම් කටයුතු කළ හැකි ය. කාර්ය අවසානයේ අදාළ කණ්ඩායම්වලට උපස්ථම්භනය ඇගයීම, ත්‍යාග ආදිය පිරිනැමීම වැදගත් වේ.

3.0 කාර්ය සාධක ගොනු පවත්වා ගෙන යාම

- වාරය ආරම්භයේ දී කාර්ය සාධන ගොනු සැකසීම පිළිබඳ අවශ්‍ය උපදෙස් ලබා දීම
- වාරය මැද දී අදාළ කාර්යය පරීක්ෂා කර ප්‍රතිපෝෂණය ලබා දීම
- අවසාන ඇගයීම සඳහා පහත සඳහන් නිර්ණායක භාවිතා කිරීම යෝග්‍ය වේ.
  - උපදෙස් පිළපැදීම
  - සංවිධානාත්මකබව
  - නිර්මාණශීලීත්වය
  - අදාළ සංකල්ප නිපුණතා අවබෝධ කරගෙන ඇත්ද යන්න අවසාන වශයෙන් ප්‍රදර්ශනය වේද යන්න නිගමනය කිරීම.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

4.0 ව්‍යාපෘති ඇගයීම

- වාරයක් අවසානයේ කුඩා ව්‍යාපෘතියක්, කේවල හෝ කණ්ඩායම් වශයෙන් ක්‍රියාත්මක කිරීම මේ සඳහා නිර්ණායක අභිමත පරිදි සැකසිය හැකි වේ.

5.0 විධිමත් ඇගයීම

ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය අදාළ මූලික සංකල්ප, අදහස් ප්‍රශ්න විචාරය මගින් පරීක්ෂා කිරීම කළ යුතු ය. මේ ප්‍රශ්න දැනුම, ආකල්ප, කුසලතා, භාවිතයන් හා සම්බන්ධ ව සැකසීම වැදගත් වේ. මෙය පාඩමක් හෝ වාරයක් අවසානයේ සංවිධානය කළ හැකි ය.

තක්සේරුව හා ඇගයීම ( පුරවැසි අධ්‍යාපනය )

තක්සේරු කිරීම හා ඇගයීම පිළිවෙත පහත දැක්වෙන ආකාරයේ සිදු විය යුතු වෙයි.

විෂය භාර ගුරු මහත්ම මහත්මීන් විසින් පාසල පදනම් කර ගත් ඇගයීම් කාර්යය සංවිධානය කිරීම මැනවි. ජාතික අධ්‍යාපන ආයතනය විසින් සකසන ලද පාසල පදනම් කර ගත් ඇගයීම් පටිපාටියට අනුව ඇගයීම් කටයුතු සංවිධානය කිරීම අපේක්ෂා කෙරේ.

පාසල් මට්ටමින් කලාප මට්ටමින්, පළාත් මට්ටමින් පැවැත්වෙන මධ්‍ය වාර්ෂික හා වර්ෂ අවසාන පරීක්ෂණයට සිසුන් ඉදිරිපත් කොට ඔවුන්ගේ දැනුම, අවබෝධය, භාවිතය හා ඉහළ මට්ටම්වල ඉගෙනුම් හැකියා මැන බැලීමට පුළුවන.

එක් එක් ඒකකයට නියමිත කාල පරිච්ඡේද සංඛ්‍යාවෙන් 50% පමණ පාසල පදනම් කරගත් ඇගයීම් වැඩ පිළිවෙළ ආශ්‍රිත ව ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා යොදා ගැනීම සුදුසු ය.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය දීර්ඝ කිරීමේ උපකරණය

ශ්‍රේණිය - 7

0.1 ඇගයීම් අවස්ථාව - වාරය 01
- උපකරණය 01

0.2 ආවරණය කරන නිපුණතා මට්ටම -

I කොටස

1.1 අනන්‍යතාව තහවුරු කර ගනිමින් ආත්මාභිමානය සංවර්ධනය කර ගනියි.

1.2 ජීවිත සාර්ථකත්වයට හිතකර බලවේග අදාළ පරිදි උපයෝගී කර ගනියි.

1.3 නිවැරදි ජීවන අරමුණක් කරා තම ජීවිතය මෙහෙයවයි.

2.1 ක්‍රීඩාව හෝ විනෝදය වැනි කාර්යයන්හි යෙදෙයි.

2.2 සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් ඇසුරින් පෞරුෂ සමබරතාවක් ඇති කර ගනියි.

3.1 සාර්ථක දිවි පෙවෙතක් සඳහා සාර ධර්ම උපයෝගී කර ගනියි.

4.1 ජීවිත අභියෝග හා අවස්ථා හමුවේ නිර්මාණශීලී චින්තනයෙන් යුතුව කටයුතු කරයි.

5.1 සාර්ථක ජීවිතයක් සඳහා යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතා උපයෝගී කර ගනියි.

II කොටස

- පවුල හා අසල් වාසීන් අතර අන්‍යෝන්‍ය සබඳතා තහවුරු කර ගෙන සහජීවනයෙන් ජීවත් වීමට හුරුවෙයි.
- තම සංස්කෘතිය අගය කරමින් අන්‍ය සංස්කෘතීන්ට ද ගරු කරයි.
- ජාතික අනන්‍යතාව පිළිඹිඹු කරන සංකේත නිවැරදිව භාවිත කරමින් ඒවාට ගරු කරයි.

3.0 ආවරණය වන විෂය සන්ධාරය

- ආත්ම අභිමානය තහවුරු කිරීම.
- ජීවිත සාර්ථකත්වයට අහිතකර බලවේගවලින් ඈත් වී හිතකර බලවේග උපයෝගී කර ගැනීම
- නිවැරදිව ජීවන අරමුණු ගොඩ නගා ගැනීම
- ක්‍රීඩා හා සෞන්දර්යාත්මක කටයුතුවල යොමුවීම
- ජීවිත අභියෝග හා අවස්ථා හමුවේ නිර්මාණශීලී චින්තනයෙන් කටයුතු කිරීම.
- යහපත් අන්තර් පුද්ගල සබඳතා පැවැත්වීම
- සහජීවනයෙන් කටයුතු කිරීම
- තම සංස්කෘතියට මෙන් ම අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

- ජාතික අනන්‍යතාව ගොඩ නැගීම.

4.0 උපකරණයේ ස්වභාවය - ජීවන නිපුණතා විවිධ ප්‍රසංගය

5.0 උපකරණයේ අරමුණු -

- සිසු හැකියා දක්ෂතා හඳුනා ගනිමින් ඵලදායී විවේකයක් සඳහා සෞන්දර්යාත්මක කටයුතුවල නිරත වී ආත්මාභිමානය ඇති කර ගැනීම, ජීවන අවස්ථාවල දී නිර්මාණශීලී චින්තනයෙන් යුක්තව කටයුතු කිරීම, සාර ධර්මානුකූලව හැසිරෙමින් යහපත් අන්තර් පුද්ගල සබඳතා ගොඩ නගා ගනිමින්, ජාතික අනන්‍යතාව සුරකින සිසු පිරිසක් බිහි කිරීමට අවස්ථා උදා කිරීම.

6.0 උපකරණය ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්

- ජීවන නිපුණතා විවිධ ප්‍රසංගයක් සංවිධානය කිරීම සඳහා වාරය මුලදීම සූදානම් වීම.
- විවිධ ප්‍රසංගයට අවශ්‍ය අංග සැලසුම් කිරීම
  - * නාට්‍ය
  - * විරිදු
  - * දෙබස්
  - * ගීත
  - * විවාද
  - * පද්‍ය ගායනා
  - * නර්තන
  - * චිත්‍ර ප්‍රදර්ශනය
  - * කථික තරග

  ආදී ඔබ අභිමත විචිත්‍රාංග මෙම විවිධ ප්‍රසංගය සඳහා යොදා ගත හැකි ය.
- මෙම සියලුම විචිත්‍රාංගවලින් 7 වන ශ්‍රේණියට අදාළ ජීවන නිපුනතා හා පුරවැසි අධ්‍යාපනය තේමා මතු කරමින් සිසු නිපුණතා වර්ධනය කිරීමට යොමු විය යුතු ය.
- සංවිධාන කටයුතු සඳහා විදුහල්පති තුමා ඇතුලු ආචාර්ය මණ්ඩලය, දෙමාපිය, ආදී සිසු සහාය ලබා ගැනීම කළ යුතු ය.
- මෙම සෑම ක්‍රියාකාරකමක් සඳහා 7 වන ශ්‍රේණියේ සියලු ම සිසුන් සම්බන්ධ කර ගනිමින් හැමට ම අවස්ථා උදා කර ගත යුතු ය.
- අමතර වේලාවන් යොදා ගැනීමේ දී විදුහල්පති තුමාගේ විධිමත් අවසරය ලබා ගැනීම
- විචිත්‍රාංග ඉදිරිපත් කිරීමේ විවිධ ප්‍රසංගය සඳහා පහසු දිනයක් යොදා ගන්න. පළමුවාරය අවසන් දිනය වුව ද යොදා ගත හැකි ය.
- විචිත්‍රාංග සඳහා සහභාගී වන සිසුන් සඳහා සහතික පත්‍ර හා තිළිණ ප්‍රදානය කිරීම.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

විචිත්‍රාංග සඳහා යොදා ගත යුතු තේමා

- හිතකර බලවේග ජීවිතයට ලං කර ගැනීම හා අහිතකර බලවේගවලින් ඈත්වීම
- නිවැරදි ජීවන අරමුණු ගොඩ නගා ගැනීම
- සාර ධර්මානුකූලව ජීවත්වීම
- ජීවිත අභියෝග හා අවස්ථා හමුවේ නිර්මාණශීලී චින්තනයෙන් යුක්තව කටයුතු කිරීම
- යහපත් අන්තර් පුද්ගල සබඳතා පැවැත්වීම තම සංස්කෘතියට මෙන් ම අන්‍ය සංස්කෘතීන්ට ගරු කරමින් සහජීවනයෙන් කටයුතු කිරීම.
- ජාතික අන්‍යතාව ගොඩ නැගීම

විචිත්‍රාංග සැකසීම

- මෙම විචිත්‍රාංග සැකසීම හා නිර්මාණය සිසුන්ගේ දායකත්වයෙන් ඉටු විය යුතු ය.
- ගුරු හා විශේෂ උපදේශකවරුන් ගේ සහායෙන් සිසු නිර්මාණ ඔප වත් කිරීම වැදගත් වේ.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

## ඇගයීම් ක්‍රමය

| ශිෂ්‍යයාගේ/ශිෂ්‍යාවගේ නම | ඉදිරිපත් කිරීම | නිර්මාණ ශීලීත්වය | සාමූහික කටයුතුවල | නිරතවීම | සංවිධානය | උපදෙස් පිළිපැදීම | වෙනත් |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

ඉතා හොඳයි - A
හොඳයි - B
සාමාන්‍යයි - C
සංවර්ධනය විය යුතුයි - D

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය දිරිඝ කිරීමේ උපකරණය - 2

ඇගයීම් අවස්ථාව - වාරය 02

ආවරණය කරන නිපුණතා මට්ටම

- ජන සමාජය තුළ පවත්නා අන්තර් සබඳතා විමර්ශනය කරයි.
- අයිතිවාසිකම් හා බැඳුනු යුතුකම් හා වගකීම් ඉටු කරයි.

ආවරණය කරන විෂය සන්ධාරය

- ජන සමාජය තුළ පවත්නා අන්තර් සබඳතා
- සමාජය සම්බන්ධයෙන් අපේ යුතුකම් හා වගකීම්

උපකරණයේ ස්වභාවය

- ශ්‍රමදානයන්

උපකරණයේ අරමුණු

- අන්‍යයන්ට උදව් කිරීම තුළින් අන්තර් සම්බන්ධතා පවත්වා ගැනීම
- ශ්‍රමාභිමානය ඇති කිරීම

උපකරණය ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්

පොදු උපදෙස්

- දෙවන වාරයේ ආරම්භක සතියේ ශ්‍රමදානයක් පැවැත්වෙන බව සිසුන්ට දැනුම් දෙන්න.
- සංවිධාන කටයුතු සඳහා විදුහල්පතිතුමා ඇතුළු ආචාර්ය මණ්ඩලයේ සහාය ලබා ගන්න.
- ක්‍රියාකාරකම තුළින් අදාළ ඉලක්ක කරා සිසුන් යොමු කරන්න.
- අවශ්‍ය තැන්වල දී ප්‍රතිපෝෂණය ලබා දෙන්න.
- සියලු ම සිසුන්ගේ සහභාගීත්වය ලබා ගන්න.
- ශ්‍රමදානය සඳහා සුදුසු ස්ථානය හා කළ යුතු කාර්යයන් නිසි ලෙස සැලසුම් කරන්න.
- සියලු ම සිසුන්ගේ ආරක්ෂාවට පිළිබඳ සැලකිලිමත් වන්න.
- වැඩ සටහන ආරම්භයේ සිට අවසානය දක්වා අවශ්‍ය පරිදි අභිමානය හා ගෞරවණීය බව රැකෙන අයුරින් වැඩ සටහන සැලසුම් කරන්න.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

### ගුරුවරයාට උපදෙස්

### පෙර සූදානම

- පාසලේ හෝ පාසල අයත් ගමේ හෝ ආසන්න ආගමික ස්ථානයක හෝ සුදුසු තැනක් නිරීක්ෂණය කර එම ස්ථානයෙහි සිසු සහභාගීත්වයෙන් ශ්‍රමදානයක් මගින් කළ හැකි කාර්ය කොටසක් තීරණය කරන්න. (සිසුන්ගේ වයස් මට්ටමට ගැලපෙන)
- ශ්‍රමදානය පැවැත්වෙන දිනය තීරණය කරන්න.
- මෙම වැඩ සටහන, එහි අරමුණු හා සිසුන් එවැනි කාර්යයක යෙදීමේ වැදගත්කම පිළිබඳ සිසුන්ට කරුණු පැහැදිලි කර දෙන්න.
- අවශ්‍ය උපකරණ සූදානම් කර ගන්න. (කෘෂි විද්‍යා ගුරුතුමිය/ ගුරුතුමාගේ උදව් ලබා ගන්න.
- ශ්‍රමදානය පැවැත්වෙන දිනයේ සිසුන් සහ දෙමාපියන් සමග එම ස්ථානයට ගොස් සුදුසු පරිදි කණ්ඩායම් කර අදාළ වැඩ කොටස් ඒ ඒ කණ්ඩායම් වලට පවරන්න.
- අවශ්‍ය උපකරණ ලබා දෙන්න.
- සිසුන්ගේ ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් වන්න.
- ශ්‍රමදානය අවසානයේ කරන ලද කාර්යයන්හි අගය කරමින් කෙටි දෙසුමක් කරන්න.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

### සිසුන්ට උපදෙස්

ගුරුතුමා/ ගුරුතුමියගේ උපදෙස් පරිදි උනන්දුවෙන් හා කැපවීමෙන් යුතුව ඔබට පැවරෙන කාර්ය කොටස් නිම කරන්න.

### ඇගයීම

| ශිෂ්‍යයාගේ /ශිෂ්‍යාවගේ නම | සාමූහිකව කටයුතු කරයි | පැවරුණු කාර්ය සාර්ථකව ඉටුකරයි | නියමිත කාලය තුළ කටයුතු නිම කරයි | උපදෙස් පිළිපදියි | සම්පත් බෙදා හදා ගනියි |
|---|---|---|---|---|---|
| | | | | | |

A හොඳයි B හොඳයි C සාමනයි D සංවර්ධනය විය යුතුයි

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය දීර්ඝ කිරීමේ උපකරණය - 3

1.0 ඇගයීම් අවස්ථාව - වාරය 03

2.0 ආවරණය කරන නිපුණතා මට්ටම

- ජන සමාජය තුළ පවත්නා අන්තර් සබඳතා විමර්ශනය කරයි.
- අයිතිවාසිකම් හා බැඳුණු යුතුකම් හා වගකීම් ඉටු කරයි.

3.0 ආවරණය කරන විෂය සන්ධාරය

7.22 ජන සමාජය තුළ පවත්නා අන්තර් සබඳතා

7.2.3 සමාජය සම්බන්ධයෙන් අපේ යුතුකම් හා වගකීම්

4.0 උපකරණයේ ස්වභාවය

- තම ප්‍රදේශයේ පිහිටුවා ඇති සමාගම පිළිබඳ අධ්‍යයනය කර වාර්තාවක් සකස් කිරීම

5.0 උපකරණයේ අරමුණු

- තම ප්‍රදේශයේ පිහිටුවා තිබෙන ස්වේච්ඡා සංවිධාන හඳුනා ගැනීම
- එම සංවිධාන සමාජයේ යහපතට හේතු වන ආකාරය පිළිබඳ අවබෝධය ලබා දීම
- එම සංවිධාන සම්බන්ධයෙන් සාමාජිකයන්ගේ අයිතිවාසිකම් හා යුතුකම් හඳුනා ගැනීමට අවස්ථාව ලබා දීම

6.0 උපකරණය ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්

- ගමක ක්‍රියාත්මක වන ස්වේච්ඡා සංවිධාන කීපයක් නම් කරන්න.
- එම සංවිධාන ගැන කෙටි හැඳින්වීමක් කරන්න.
- තම ගමෙහි ඇති එවන් සංවිධාන අතුරින් තමන් කැමති සංවිධාන දෙකක් තෝරා ගැනීමට සිසුන් යොමු කරන්න.
- තෝරාගත් සංවිධානවල නිලධාරියෙක් හමු වී පහත දැක්වෙන තොරතුරු සපයා ගැනීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- එම තොරතුරු ගොනු කර තෝරා ගත් සංවිධාන දෙක පිළිබඳ වාර්තා දෙකක් සකස් කිරීමට උපදෙස් දෙන්න.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

සංවිධාන දෙක පිළිබඳ පහත උප මාතෘකාවලට අදාළව තොරතුරු රැස් කිරීමට උපදෙස් දෙන්න.

සංවිධානයේ නම :-

ආරම්භය :-

අරමුණු :-

සාමාජික සංඛ්‍යාව :-

ඉටුකර ඇති සේවා :-

**සිසුන්ට උපදෙස්**

- ඔබ ගමේ පිහිටුවා ඇති ස්වේච්ඡා සංවිධාන පිළිබඳ සොයා බලන්න.
- ඉන් ඔබ කැමති සංවිධාන දෙකක් තෝරා ගන්න.
- එම සංවිධානවල නිලධාරියෙකු හමු වී ගුරුතුමිය/ගුරුතුමා දුන් උපදෙස් පරිදි අවශ්‍ය විස්තර රැස්කර වාර්තා සකස් කරන්න.

පහත සඳහන් නිර්ණායක මත වාර්තා ඇගයීමට ලක් කරන්න.

- කරුණු වල නිවැරදි බව
- අදාළ බව
- කරුණු ප්‍රමාණවත් බව
- සමස්ථ නිමාව
- කරුණු රැස් කිරීමට දක්වා ඇති උනන්දුව

A හොඳයි B හොඳයි C සාමනයි D සංවර්ධනය විය යුතුයි

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.